
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක්    www.budusarana.lk    email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ නිකිණි පුර පසළොස්වක පෝ ද, රාජ්‍ය වර්ෂ 2020 අගෝස්තු 03 සඳුද, BUDUSARANA, MONDAY AUGUST 03, 2020

55 වැනි කාණ්ඩය, 08 වැනි පත්‍රය, ආරම්භය 1965 - 06 - 13, ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 36 මිල රු. 40.00



## සෞභාග්‍යවත් දේශයකට සිරි දළදා හිමි රැකවරණයි

# දැන දැක වැඩිය යුතු කුසල් මුල්

**කුසල යන වචනය සඳහා අටුවාවන්හි අර්ථ කිහිපයක් ම දක්වා ඇත. දක්ෂ හා ලාභ ගෙන දීම එයින් වඩාත් ජනප්‍රිය ම අර්ථ දෙකයි.**

මූල යනු ස්ථිරව දරා සිටීමයි. හේතුවයි. ඉඩ සලසාලීමයි. මේ අනුව කුසල මූල යනු දක්ෂ බවට, ස්ථිරව දරා සිටීමට හේතු වන කාරණායි. ලාභ ගෙන දෙන හේතුයි. දක්ෂකමට හා ලාභයට ඉඩ සලසාලන කරුණුයි. කුසලය යනු සිතේ ඇති නිරෝගී (ආරොග්‍ය) බවයි. එසේම සිත දෝෂයන්ගෙන් (අනවජ්ජ) තොර වීමයි. යහපත් කර්ම ඵල (සුඛවිපාක) ඇති කරවීමයි. නින්දිත වූ පාප ධර්මයන් තදංග විෂ්කම්භන සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් සොලවාලන්නේ, වෙවුළවන්නේ, කම්පා කරවන්නේ වනසන්නේ කුසල් බව අටුවාව වැඩිදුරටත් කුසලය හැඳින්වීමේ දී දක්වා ඇත. මේ අනුව පාපයට විරුද්ධව නැගී සිටින්නේ කුසලයයි. ඒ බව "කුච්ජිතෙ පාපකෙධම්මෙ සලයති චලයති කම්පෙති විද්ධංසෙතීති කුසලං" යනුවෙන් දක්වා ඇත.



ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ උප සභාපති අමරපුර සිරි සද්ධම්මවංස මහා නිකායේ මහානායක

**අහුන්ගල්ලේ සිරිසීලවිසුද්ධි මහ නා හිමි**

නිවැරදි සැප විපාක ලබා දීම හා වරදට සතුරු බව කුසලයේ ලක්ෂණයයි. අකුසල් නැසීම කෘත්‍යයයි. පිරිසිදු බව ඵලයයි. යෝනිසෝ මනසිකාරය පාදස්ථානයයි. කුසලය කාම, රූප, අරූප ලෝකෝත්තර භූමි භේද වශයෙන් සිව්වැදෑරුම් වේ. සතර අපාය, සදිව්‍ය ලෝක හා මිනිස් ලෝකය යන එකොළොස් කාම භූමියෙහි පවත්නා කාමාවචර කුසල් අටකි. රූප භූමි පහළොවෙහි පවත්නා රූපාවචර කුසල් පහකි. අරූප භූමියෙහි පවත්නා අරූපාවචර කුසල් සතරකි. ලෝකෝත්තර කුසල් හතරකි. මෙහි දැක්වූ කාමාවචර කුසලයන්ගෙන් මනුෂ්‍ය ලෝකයේ හා සදිව්‍ය ලෝකයන්හි කැමැති තාක් ආයු වර්ණ සැප බල ප්‍රඥා සම්පත්තීන් ලබා දෙයි. ඒ බව "කාමාවචර කුසලං කාමසුගති සාධකං" යනුවෙන් දක්වා ඇත.

අකුසල් නසා යහපත් ගුණාංග වඩමින් කුසලයට ස්ථිරව ඉඩ සලසාලන හේතු හෙවත් මුල් තුනකි. එනම්, අලෝභ කුසල මූලය, අදෝස කුසල මූලය හා අමෝහ කුසල මූලයයි. ලෝභය හෙවත් තෘෂ්ණාවේ ප්‍රතිවිරුද්ධතාව අලෝභයයි. මෙයින් පරිත්‍යාගශීලිත්වය, බෙදාහදා ගැනීමේ කැමැත්ත, අත්හැරීම, ආත්මාර්ථකාමී නොවීම අර්ථවත් වේ. අලෝභය දීම හා සම්බන්ධ සිතිවිල්ලකි. නෙළුම් පතක වැටුණු දිය බිඳුවක් සේ නොඇලී සිටීම අලෝභයේ ස්වභාවයයි. අලෝභී කුසල මූලය සිතට නැගුණු පසු කිසිවක් ග්‍රහණය කර නොගනියි. හරියට විමුක්ති ලාභී ආර්යන් වහන්සේ නමක් ලෙසිනි. අසූචි වළකට වැටුණු අයෙකු එහි නොඇලී, එයින් මිදීමට උත්සාහ දරන්නේ යම්සේ ද අලෝභී බව සිතට නැගුණු පසු කාමය උපදවන සියලු වස්තූන් ද අසූචි වළක් මෙන් දැන දැක ඒ කාම වස්තූන්ගෙන් මිදීමට උත්සාහ කරන බව අටුවාව විස්තර කරයි. ද්වේශය හෙවත් තරහවේ ප්‍රතිවිරුද්ධතාව අදෝසයයි. මෙයින් මෛත්‍රී සහගත බව, කරුණාව, මිතුරුකම, ඉවසා සිටීමේ ගුණය අර්ථවත් වේ. අදෝසය යහපත් මිතුරෙකු හා සමාන ය. නොඉවසීම හා නුරුස්සනා ගතිය ඉවත් කිරීම අද්වේශයේ ස්වභාවයයි. සඳුන් කල්කයෙන් උණ ගතිය නැති කරන්නා සේ අද්වේශයෙන් තරහ ගතිය නැති කරන බව අටුවාව පවසයි. මෝහය හෙවත් මුළාවේ ප්‍රතිවිරුද්ධතාව අමෝහයයි. මෙයින් ප්‍රඥාවන්ත බව, අවබෝධය, බුද්ධිමත් බව, විචක්ෂණශීලි බව අර්ථවත් වේ. ලොව ඇති සියලු වස්තූන්හි යථා ස්වරූපී බව විනිවිද දැකිය හැක්කේ අමෝහයටයි. දක්ෂ දුනුවායෙකු විසින් විදින ලද හීය එම වස්තුව පසාරු කර ගෙන යන්නාක් මෙන් අමෝහයෙන් ප්‍රස්තුත වස්තුවේ ඇතුළත කිමිදී යථා ස්වභාවය දකියි. මෝහය නැමැති අන්ධකාරය දුරු කරන පහනක් මෙන් ද, වනයේ මං මුළා වූවෙකුට මඟ පෙන්වන්නෙකු මෙන් ද අමෝහය දැකිය යුතු බව අටුවාව පවසයි.

බුදු දහමෙහි දානය, සීලය, භාවනාව, පින්දීම, පින් අනුමෝදන් වීම, වතාවත් කිරීම, අපචායනය, ධර්ම දේශනා කිරීම, ධර්ම ශ්‍රවණය හා දිට්ඨිජ්ජුකම්ම යනුවෙන් කුසල් දහයක් උගන්වා ඇත. චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස බෙහෙත් පිරිකර යන සිව්පසය අතරෙන් යමක් පූජා කිරීම හා එසේ පූජා කරන විට පූර්ව මුඤ්චන අපර චේතනා පාරිශුද්ධත්වයෙන් ම සිදු කිරීම දානමය කුසලයයි. පන්සිල්, අටසිල්, දසසිල් සමාදන් ව එම සීලය මැනවින් රැකීම සීල කුසලයයි. බුද්ධානුස්සතියේ පටන් සමථ කමටහනුත්, සියල්ල ත්‍රිලක්ෂණානුකූල ව දකිමින් විදර්ශනාව වැඩීමත් භාවනා කුසලයයි. දානාදී පින්කම් කොට අසවල් අය සුවපත් වෙත්වා යි ප්‍රාප්තිමය වශයෙන් පින්දීම පත්ති අනුමෝදනා කුසලයයි. අනුන් දුන් පින් අනුමෝදන්වීම හෝ අනුන් විසින් කරන ලද පිනක් දැක මැනවැ යි සතුටු සිතින් අනුමෝදන්වීම පත්තානුමෝදනා කුසලයයි. වැඩිහිටියන්ට උපස්ථාන කිරීම්, වෙහෙර විහාර ආදියෙහි කුදුමහත් කටයුතු කිරීම් ආදී වත්පිළිවෙත් කිරීම වෙය්‍යාවච්ච කුසලයයි. වැඩිමහල් අය දැක පෙර ගමන් යාම්, අසුනින් නැගිටීම් ආදී ගෞරව දැක්වීම් අපචායන කුසලයයි. ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවන්ගෙන් තොරව ධර්මානිසංස සලකාගෙන ම අනුන්ට ධර්ම දේශනා කිරීම ධම්ම දේසනා කුසලයයි. ධර්මාවබෝධය පිණිස ම මෙහෙය වූ සිතින් ධර්මය ඇසීම ධම්මසවණ කුසලයයි. මිථ්‍යා දෘෂ්ටියෙන් මිදී සම්‍යක් දෘෂ්ටියට පැමිණීම දිට්ඨිජ්ජුකම්ම කුසලයයි.

නෙළුම් පතක වැටුණු දිය බිඳුවක් සේ නොඇලී සිටීම අලෝභයේ ස්වභාවයයි. අලෝභී කුසල මූලය සිතට නැගුණු පසු කිසිවක් ග්‍රහණය කර නොගනියි. හරියට විමුක්ති ලාභී ආර්යයන් වහන්සේ නමක් ලෙසිනි.

මීටත් අමතරව තවත් තැනක දී අටමහා කුසල් නමින් තවත් කුසල් අටක් දක්වා තිබේ. ඒ මෙසේය.

කඨින චීවර පූජාව, අෂ්ඨ පරිෂ්කාර පූජාව, ආවාස දානය, බුද්ධප්‍රමුඛ සාංඝික දානය, ධර්ම ග්‍රන්ථ ලිවීම හෝ ලියවීම, කෙත්වතු පූජා කිරීම, ප්‍රතිමා කරවීම හා වැසිකිළි තැනීම යන මේවායි.

උසස් ආත්ම භාවයක් ලැබූ මනුෂ්‍යයින් විසින් දස කුසල් හා අටමහා කුසල් නිතර නිතර බොහෝ සෙයින් සිදු කළ යුතු බවයි බුද්ධ දේශනාව. "කත්තබ්බං කුසලං බහුං" කිව්වේ ඒකයි. එසේම මෙසේ කුසල් කරන්නා වූ මිනිස්සු පිළිබඳ ශක්‍රදිව්‍ය රාජයා ඇතුළු දෙවිවරු සොයා බලන බවත්, කුසල් කරන මිනිසුන්ගේ නම් ගම් රන් පොත්වල ලියා තබන බවත් ලෝකානු විචරණ සූත්‍රයේ දැක්වේ. ඒ මෙසේයි.

අටවක පොහෝ දවස්හි ශක්‍රදිව්‍ය රාජ තෙමේ අමාත්‍ය වූ සතරවරම් දෙවිවරුන්ට ආමන්ත්‍රණය කොට "දරුවෙනි, අද අටවක පොහෝ දවස ය. මනුෂ්‍ය ලෝකයට ගොස් කුසල් කරන මනුෂ්‍යයන්ගේ නාම ගෝත්‍රයන් දැන එව" යි කීවේ ය. එවිට සතරවරම් දෙවිවරු තමන් වෙසෙන වාසස්ථානවලට පැමිණ පිරිවර අමාත්‍යයන්ට "මනුෂ්‍ය ලෝකයට ගොස් එහි හැසිර කුසල් කරන මිනිසුන්ගේ නම් ගම් රන් පතෙහි ලියා ගෙන එව" යි නියම කළාහු ය. ඒ අමාත්‍ය දේවතාවෝ එතැන් පටන් අද දක්වා ම අටවක පෝය දවසෙහි මනුෂ්‍ය ලෝකයට පැමිණ කුසල් කරන්නවුන්ගේ නම් ගම් ලියා ගෙන යන්නාහ. නැවත මාසේ පෝය දවසෙහි සතරවරම් දෙවිවරුන්ගේ පුත්‍රයෝ ද මනුෂ්‍ය ලෝකයට පැමිණ කුසල් කරන්නවුන්ගේ නම් ගම් ලියා ගෙන යන්නාහ. පසළොස්වක පෝය දවසෙහි සතරවරම් දෙවිවරුම මනුෂ්‍ය ලෝකයට පැමිණ කුසල් කරන්නවුන්ගේ නම් ගම් ලියා ගනිති. මේ පරීක්ෂණයේ දී කුසල් කරන මනුෂ්‍යයෝ බොහෝ වී නම් දෙවියෝ සතුටු වෙති. කුසල් කරන්නවුන් අල්ප වී නම් නොසතුටු වෙති යි දැක්වේ. කුසල් දැන දැක වැඩිය යුත්තේ ඒ නිසාවෙනි.



**මෙලොව කිසි දිනෙක වෛරයෝ වෛර කිරීමෙන් නොසන්සිඳෙත්. වෛරයෝ වෛර නොකිරීමෙන් සංසිඳෙත්. මෙය සැම කල්හි ම ලොව නොවෙනස් ව පවතින ධර්මතාවක්.**

ධනයට හා සැප සම්පත්වලට ඇති ගිජුකම නිසා සමහරු තමාගේ මෙලොව ජීවිතය මෙන්ම පරලොව ජීවිතය ද විනාශ කර ගන්නවා. කයට රෝගයක් ඇතිවූ විට එය ටික කලෙකින් සුවපත් කර ගන්නට හැකි වෙනවා. නැත්තම් එය මරණයත් සමඟ අවසන් වනවා. එහෙත් හිතේ හටගන්නා රෝග මෙලොවට පමණක් නොව පරලොවට ද ගෙන යන බව ධර්මානුකූල ව සඳහන් කරන්න පුළුවන්.

මේ පිළිබඳ ව හැමදෙනාම ඉතාම බුද්ධිමත්ව කටයුතු කරන්නට ඕන. එහෙම නොවුව හොත් සසර පුරාවට ම දුක් දෙමින් තමා පසුපස එන, තමාට විනාශය ගෙන දෙන දෙයක් වශයෙන් වෛරය හඳුන්වන්න පුළුවන්.

මේ සම්බන්ධව උදාහරණ ධර්මයට අනුකූල ව ඕනෑ තරම් සොයා ගන්නට පුළුවන්. තම දරුවනුත් මරා තමනුත් මැරීමට ක්‍රියා කළ කාන්තාවක් කෙරෙහි බැඳගත් වෛරය තුළින් දරුවන් සමඟින් උනුනුත් මරා ගනිමින් සසර පුරාවට පැමිණි දිගු ගමන බුදුරජාණන් වහන්සේ හමුවේදී නිරාකරණය වූ අයුරු කාලි යක්ෂණී කතාවෙන් පැහැදිලි වෙනවා.

# මෙලොවට පමණක් නොව පරලොවට ද ගෙන යන සිතේ රෝග



## නිකිණි පුර පසළොස්වක පෝ දා

## දම් දෙසුම

මෙලොව කිසිදිනෙක නව ආඝාත වස්තූන් නිසා කෙනෙකුගේ සිතේ හටගන්නා වෛරය, වෛර කිරීමෙන් නොසන්සිඳෙන බවත්, වෛරය වෛර නොකිරීමෙන් සංසිඳෙන බවත් මෙම කරුණ අරහයා බුදුරජාණන් වහන්සේ දේශනා කළා.


විශාල ධනයක් ඇති ව ජීවත් වූ සිටු පවුලක් කාලයක් යන විට දුප්පත් වුණා. එදිනෙදා කටයුතු කර ගැනීමට පවා නොහැකි තත්ත්වයකට පත් වුණා. එහි තම මිත්තණිය සමඟ ජීවත් වූ කුඩා දැරියක් පාරේ වළලු විකුණමින් යන වෙළෙන්දෙක් දැක මිත්තණියට කියා වළලු ගැනීමට සැරසුණා. මුදල් නැතැයි පැවසූ විට ගෙදර තිබූ පැරණි තලියක්දී වළලු කීපයක් ගන්නා ලෙස දැරිය ඉල්ලා සිටියා. වෙළෙන්දා කැඳවා තලියදී වළලු ඉල්ලූ විට එය නො වටිනා එකක් නිසා කිසිවක් දීමට නොහැකි බව පවසා ඔහු යන්නට ගියා.

මෙය රන් තලියක් බව දැනගෙන පසුව සුළු දෙයක්දී රැගෙන යාමටයි මේ කපටි වෙළෙන්දා හිතුවේ. තව ටික වේලාවක් යන විට තවත් වෙළෙන්දෙක් ඒ පාරේ යනවා දුටු දැරිය නැවතත් මිත්තණියට කියා එම වෙළෙන්දාට තලිය පෙන්වා වළලු දෙන ලෙස ඉල්ලා සිටියා. තලිය හොඳින් පරීක්ෂා කළ වෙළෙන්දා මේ රන් තලියක් බවත්, මීට දීමට තරම් ප්‍රමාණවත් බඩු තමා ළඟ නැතැයි පැවසුවා.

ඒත් ඒ අය ඉල්ලා සිටියේ තලිය රැගෙන පුළුවන් දෙයක් දී යන ලෙසයි. වෙළෙන්දා තමන් විකිණීමට ගෙනා සියලු දේත්, ගමන් ගාස්තු පමණක් තබාගෙන ඉතිරි මුදලුත් දී තලිය රැගෙන ගියා. ටික වෙලාවකින් කලින් ආ කපටි වෙළෙන්දා නැවත පැමිණ යමක් දීමට තලිය ගෙන එන ලෙස ඉල්ලුවා. පසුව පැමිණි තවත් වෙළෙන්දෙක් තලිය පරීක්ෂා කර බලා එය රන් තලියක් බව කියා තමා විකිණීමට ගෙනා සියලුම දේත්, ගමන් ගාස්තු පමණක් තබාගෙන ඉතිරි මුදලුත් දී තලිය රැගෙන ගිය බව පැවසුවා.

මේ පුවත අසනවාත් සමඟ වෙළෙන්දාට ඇතිවුණේ විශාල කම්පනයක්. අතට ලැබුණු ලාබය නැති වීම නිසා ඇතිවුණු කම්පනයෙන් ඒ වෙළෙන්දා ගිය දිශාව අසාගෙන දිවගෙන ගියා තලිය ගන්න. ඒ වන විට වෙළෙන්දා රැගත් පාරුව එගොඩට යන්න ගඟ මැද යනවා. කැගහල කිව්වා පාරුව ආපහු හරවා ගෙන එන්න වියදම් මම දෙන්නම් කියලා. එය ගණන් නොගෙන පාරුව ඉදිරියට ම ගියා.

ඒ කම්පනය හමුවේ තලිය ගත් කෙනා කෙරෙහි තදබල වෛරයෙන් යුක්ත ව ඒ පුද්ගලයා මිය ගියා. ඒ ඇති වූ වෛරය සසර යන ගමනේදී බෝසතාණන් වහන්සේට නොයෙක් ආකාරයේ හිරිහැර කරමින් පැමිණ බුදු වූ අවස්ථාවේ දේවදත්ත නමින් ප්‍රසිද්ධ ව බුදුරජාණන් වහන්සේට හිංසා කළ ආකාරය බෝසත් සිරිත, බුද්ධ චරිතය පරීක්ෂා කර බලන විට පෙනී යනවා. බුදුරජාණන් වහන්සේ මරණයට පත් කිරීමට ඇතෙකු යොදවා කටයුතු කිරීම, දුනුවායන් යොදා ඝාතනය කරන්නට සැලැස්වීම, ඒ සියල්ල ම සාර්ථක නොවූ තැන තමන් ම ගලක් පෙරළා ඝාතනය කරන්නට උත්සාහ කිරීම එහි විස්තර වනවා. අනුන් සතු රන් තලියක් නිසා ඇති වූ අධික ලෝභය වෛර වේගයක් ව සසර පුරාවට ම තමා පසුපස පැමිණ, තමාට දුක් දුන් අයුරුත්, අවසානයේදී බහුලව දුක් ගෙන දෙන අපායේ උපත ලබා තවමත් එහි දුක් විඳිනා ආකාරයත් විමසා බලන විට මෙහි ඇති බියකරු බව පැහැදිලි වනවා.



ප්‍රංශයේ ජේතවනාරාමාධිපති
ප්‍රංශයේ ප්‍රධාන අධිකරණ
සංඝ නායක

**මුරුංගාගස්යායේ සද්ධිස්සර නා හිමි**

දරුණු ගණයේ අපරාධකරුවෙකුට තවත් එවැනි අපරාධකරුවෙක් කරනවාට වඩා විනාශයක් නොමඟට බර ව කටයුතු කරන සිත සිදු කරන බව ධර්මයේ සඳහන් වනවා.

තමන් ඇලුම් කරන දෙය තමන්ට අහිමි වන විට ඇතිවෙන වේදනාව බියකරු අයුරින් සිත තුළින් මතු වූ විට සිදුවන විනාශය කෙතරම් දැයි සිතීමට පවා අපහසු වනවා. තමන් ඉතා ළඟින් ඇලුම් කරමින් ආශ්‍රය කරපු කෙනෙක් වෙනස් වූ විට දරුණු අයුරින් වෛරයෙන් යුතුව පළි ගැනීමට කටයුතු කරන ආකාරය සමාජය තුළ සිදුවන ඇතැම් සිදුවීම් තුළින් ඉතාම පැහැදිලි ව පෙනී යනවා.

ජීවිතයක් හෝ ජීවිත කිහිපයක් විනාශ වීමට තරම් ඒ බලවේගය ඇතැම්විට සමත් වනවා.

අසීමිත ආශාවෙන් උපයා සපයා ගත් සියලු දෙයත්, තමන් ඇසුරු කළ සියලු දෙයත් අත්හැර යම් දවසක යාමට සිදුවන බව බුද්ධිමත් ව තේරුම් ගන්නේ නම්, අපේ සිත් සතන් තුළ ඇතිවෙන බොහෝ වැරදි අදහස් නිවැරදි කර ගැනීමට අපට හැකියාව ලැබෙනවා . ඉතාමත් කෙටි කාලයක් තුළදී කොරෝනා වෛරසයට එක්කෝටි පනස් ලක්ෂයක පමණ ජනතාවක් ගොදුරු වීමෙනුත්, ලක්ෂ හයක පමණ ජනතාවක් මරණයට පත් වීමෙනුත් මෙහි නිමාව කවදා කොයි ආකාරයකින් සිදුවේ දැයි සිතා ගැනීමට නොහැකිව මුළු ලෝකය ම අවිනිශ්චිත ව, අසරණ ව බලා සිටින මොහොතක ඒ ගැන සිතීමෙනුත් සසර පවතින බියකරු බව වටහා ගැනීමට අපට අවස්ථාව දැන් උදාවෙලා තියෙන්නේ. මේ නිසා සසර දුක් ගිනි නිවීමේ වගකීම් තමන් සතු බව සිතා කටයුතු කිරීමෙන් සැනසීමක් උදාකර ගැනීමට හැකියාව ලැබෙනවා. ඒ සඳහා ශක්තිය ධෛර්යය වාසනාව ඔබට හිමි වේවා.

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

**නහි වේරෙන වේරානී සම්මන්තීධ කුදාචනං**
**අවේරේන ච සම්මන්ති ඒස ධම්මෝ සනන්තනෝ**



මීළඟ බුදුසරණ කලාපය නිකිණි අව අටවක පෝ දා අගෝස්තු 11 අඟහරුවාද

# කැමැති දේ අතහරින්න

**අතීතයේ අපගේ බෝසතාණන් වහන්සේ එක්තරා දිළිඳු පවුලක උපන්නා. ගොවිතැනින් ජීවත් වුණා. එදා උන් වහන්සේ කුද්දාල පණ්ඩිත නමින් ප්‍රසිද්ධියට පත්වෙලයි සිටියේ. එළවළු විකිණීම මේ පවුලේ ආදායම වුණා. එදා උන්වහන්සේ සතුව තිබූ එකම ධනය ගොවිතැන් කරන උදැල්ල යි.**

දවසක් මේ කුද්දාල පඬිතුමා හිතනවා " මේ ගිහි ගෙය හරි දුක් ගොඩක්. කිසිම ප්‍රයෝජනයක් නැති එකක්. කයේ වෙහෙස පමණයි ඉතිරි. මේ හැමදේ ම අතහැර පැවිදි වෙන්න තිබෙනවා නම් කො තරම් අගේ ද" කියලා.

ඔහු සතු එකම වස්තුව වූ උදැල්ල ගසක බෙනයක සඟවා තබා තවුස් වෙසින් පැවිදි වුණා. ටික කාලයක් පැවිදි ජීවිතේ ගත කරද්දී නැවත උදැල්ල මතක් වුණා. ඒ ගැන ලෝභයක් හට ගත්තා. සිත චංචල වුණා. "මේ පැවිදි ජීවිතේ ඉතා දුෂ්කර යි. කටුක යි. මම ගිහි වෙනවා"යි සිතුවා. එසේ සිතා ගිහිව නැවත උදැල්ල අරගෙන සුපුරුදු ලෙස ගොවිතැන් කළා.

ටික කලක් ගතවුණා. ගිහි ජීවිතේ නීරස බව වැටහුණා. මේ ජීවිතය දුකයි. වයසට යනවා, ලෙඩ වෙනවා. මීට වඩා හොඳයි පැවිදි ජීවිතය කියා සිතා නැවත උදැල්ල සඟවා තබා පැවිදි වුණා. පැවිදි ජීවිතය ගත කරද්දී විටින් විට තමා සඟවා තිබෙන උදැල්ල තිබේද කියා සොයා බලා පැමිණීම මේ තාපසතුමාගේ පුරුද්දක් වුණා.

ටික කලක් ගතවෙද්දී නැවත පැවිදි ජීවිතය එපා වුණා. මේ ජීවත්වන ටික කාලයට මෙ තරම් දුෂ්කර ජීවිතයක් ගත කරන්නේ මොකට ද? ටිකක් මහන්සි වුණත් ගිහි ජීවිතේ සුවයක් තිබෙනවා" සිතා නැවත ගිහි වුණා. උදැල්ල අරගෙන ගොස් නැවත ගොවිතැන් කළා.

මේ ආකාරයට මේ කුද්දාල පඬිතුමා හය වතාවක් පැවිදි වෙලා හය වතාවක් ගිහි වුණා. සත්වෙනි වතාවේදීත් ගිහි ජීවිතය දුකක් බව සිතා නැවත පැවිදි වෙන්නට සිතුවා. එතුමා සිතනවා

" මම හය වතාවක් ගිහි වුණේ මේ උදැල්ලට තිබෙන ආශාව නිසයි. මම ඒ ආශාව නැති කරලා දාන්න ඕනේ. මෙය සඟවා පැවිදි වුණොත් නැවත මට උදැල්ල සිහි වී ගිහි වීමට සිතෙයි. ඒ නිසා මම මේ උදැල්ල ගඟට වීසි කරනවා" යැයි සිතා ගං තෙරට ගියා. උදැල්ල ගඟේ වැටෙන තැන දුටුවොත් මට නැවත ගන්නට සිතෙයි. ඒ නිසා දෑස් පියාගෙන මෙය විසි කරනවා" යැයි පඬිතුමා සිතුවා. උදැලු මිට හිස වටා තුන් වරක් කරකවා හැකිතාක් වේගයෙන් උදැල්ල ගඟට වීසි කර "මම දිනුවා, මම දිනුවා" මහා හඬින් කෑ ගැසුවා.

ඒ වෙලාවේ බ්‍රහ්මදත්ත රජතුමා ද අසල්වැසි රාජ්‍යයන් සමඟ යුද වැද එයින් ජයගෙන මේ නදී තීරයේ විවේක සුවෙයන් සිටියා. රජතුමාට මේ හඬ ඇසී මේ පුරුෂ යා මම දිනුවා කියා හඬ නගන්නේ ඇයි? කුමක්ද ඔහු දිනා ඇත්තේ? ඒ ගැන විමසිය යුතුයි සිතා එතුමා ගෙන්වා "පුරුෂය නුඹ දිනුවේ කුමක් ද?" කියා ඇසුවා.

මේ කුද්දාල පඬිතුමා තමාගේ දිනුම විස්තර කරමින් ගඟේ දිය රැළි දෙස බලා එය නිමිත්ත කරගෙන ධ්‍යාන උපදවා අහසින් නැඟී අහසේ සිට රජුට දහම් දෙසුවා. ඒ දහම් අසා රජතුමාටත්, මහා පිරිසටත් පැවිදි වීමට සිතුණා. රජතුමා එතුමාගෙන් අසනවා

"ඔබතුමා දැන් කොහිද යන්නේ"

"මම හිමාලයට ගොස් පැවිදි වෙනවා"

"එසේනම් මම ද ඔබ හා පැවිදි වෙමි. " රජතුමා කිව්වා. රජතුමාගේ පිරිස ද "අපිද පැවිදි වෙමු" කියා කිව්වා. අතිවිශාල පිරිසක් පැවිදි වුණා. සියලු දෙනාම හිමාලයට පිටත් වුණා. කුද්දාල පඬිතුමාගේ පැවිදිවීම දුටු සක් දෙවිඳු විස්කම් දෙව්පුතු ලවා විශාල විහාරයක් ඉදිකර දුන්නා. කුද්දල පඬිතුමා ඔවුන් සියලු දෙනාට ම ධ්‍යාන උපදවා ගන්නට අනුශාසනා කළා. ඒ සියලු දෙනා මරණින් පසු බඹලොව ඉපදුණා. ඔවුන්ට උපස්ථාන කළ පිරිස දෙව්ලොව ඉපදුණා.

නයනා නිල්මිණී

# සතුරු බලවේගවල ගොදුරක් නොකොට දරුවන් රැක ගනිමු



ජාතික පිරිවෙන් උපදේශක
ශාස්ත්‍රපති
**දෙඩම්පහළ ශ්‍රී රාහුල හිමි**



**මව්පියන්ගේ වටිනා ම සම්පත දරුවා ය. යහපත් පුරවැසියෙක් ලෙස සමාජයේ ජීවත් වීමට තම දරුවාගේ අනාගතය ගොඩනැඟීම මව්පියන්ගේ වගකීම ය.**

වර්තමානයේ අපේ දරුවන් විවිධ සමාජ ප්‍රශ්නයන්ට ගොදුරු වෙමින් සිටී. විශේෂයෙන් වයස අවුරුදු 12-20 ත් අතර වයසේ පසුවන දරුවන් මත්ද්‍රව්‍යයන්ට ගොදුරු වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.

මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූවන් පිළිබඳ ව ඒ පිරිස් පුනරුත්ථාපනය කරන ආයතන සහ ශ්‍රී ලංකා පොලීසිය මගින් ලබාගෙන ඇති දත්ත අනුව ඒ බව පැහැදිලි කර ගත හැකි ය.

මේ මොහොතේ අපට විශාල වගකීමක් පැවරේ. ඒ වගකීම රටක ජනාධිපති, අගමැති, පාර්ලිමේන්තුව, පොලීසිය, උසාවිය, පාසල් ගුරුවරු ආදී විවිධ නායකත්වයන්, කණ්ඩායම් අතර බෙදී යන බව නොරහසකි. එහෙත් මව්පියන්ට තම දරුවන්ගේ වගකීම තවත් කෙනෙකුට පවරා නිදහස් විය හැකි ද? දරුවන් ආරක්ෂා කර ගන්නට තමන්ට ඇති වගකීම පැහැර හැරිය හැකි ද? වර්තමානයේ දරුවන් නොමඟ යාම ගැන සමාජය තුළ විශේෂයෙන් කතා බහට ලක්වේ. එහි ප්‍රධාන වගකිව යුත්තන් වන්නේ ද මව්පියන් ම ය. ඇතැම් මව්පියවරු අතර, පවුල් අතර තිබෙන විරසකකම් දරුවන්ට බරපතළ හානියක් සිදු කරයි. යම් ලෙසකින් මව විසින් පියාට ගරහනු ලැබීම, පියා විසින් මවට ගරහනු ලැබීම, දෙදෙනා අතර සිදුවන නිරන්තර අඬදබර තුළ අසරණ වන්නේ දරුවන් ය. එවිට ඔවුන් සරණක් සොයන්නේ පිටස්තරයන්ගෙනි.

අනෙක් අතට ඇතැම් මව්පියන්ට දරුවන් ගැන සොයා බැලීමට උවමනාවක් නැත. කාලයක් නැත. ඒ නොසලකා හැරීම්වලින් විශාල ප්‍රයෝජනයක් ගන්නා පිරිසක් සිටී. ඒ දරුවන්ට සතුරු බලවේග ය. දරුවා මව්පියන්ගේ දෑස් මානයෙන්, දුරස් වන්නේ යම් මොහොතක ද, නොසැලකීමට ලක්වන්නේ, සොයා බැලීමකට නතු නොවන්නේ යම් මොහොතක ද, ඒ සතුරු බලවේග ඉතා වේගයෙන් දරුවන් තමන් වෙත නතු කරගනී. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, විවිධ දූෂිත අරමුණු ඇත්තන් ඒ සතුරු බලවේග අතර ප්‍රධාන ය.

කුරුල්ලෙක් තම කුරුලු දරුවන් සඳහා ඉතා ආරක්ෂිත ව තනා ගන්නා කැදැල්ලකට වුව ද රිංගා ඒ කුරුලු බිජු ගිල ගන්නා සතුරු කුරුල්ලන්, සර්පාදීන් සිටී. බොහෝ ආරක්ෂිත කුරුලු කූඩුවට ද යම් ආකාරයක සතුරු බලවේග පැමිණේ. අම්මා, අප්පච්චි මේ තත්ත්වය හොඳින් තේරුම් ගත යුතු ය. අපගේ දරුවන් හදා වඩා ගන්නට සිදු වන්නේ, රැක ගන්නට සිදු වන්නේ දසත් දෙතිසක් මැද තිබෙන දිව ලෙස ය. සෑම මොහොතක ම එක්තරා භයානක රකුසෙක් දරුවන් ගිලගන්නට බලා සිටින බව අමතක නොකළ යුතු ය. විශේෂයෙන් තමන්ගේ රැකවරණයෙන් බැහැර වූ දරුවා තවත් කෙනෙකුට ගොදුර කර ගැනීමට ඉතාමත් පහසු ය.

මෙහිදී විශේෂයෙන් සිහිපත් කළ යුත්තක් වේ. එක්තරා කාලයක් මව්පියන් විසින් තම දරුවන් ඇදගෙන යනු ලබයි. දරුවා ගැන සොයා බලන්නට අම්මා, තාත්තා, පාසල් පන්ති කාමරයට පවා පිවිසේ. ගුරුවරු ගුරුවරියන් සමඟ ඉතාමත් සුහද වේ. ඇතැම් විට දරුවාට ඒ තුළ පන්ති නායකකම් ,ශිෂ්‍ය නායකකම්. එසේත් නැතිනම් ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකත්වය ආදි දේ බලාපොරොත්තු වේ. මේ යන ගමන තුළ දරුවා 10-11 ශ්‍රේණිවලට පිවිසීමත් සමඟ මව්පියන්ට ඔවුන් වෙනුවෙන් වැඩිපුර වියදම් කරන්නට සිදු වේ. එතැන් සිට දරුවන් ඇදගෙන යාමේ කාර්ය භාරය ඔවුන් තුළින් ටිකෙන් ටික මඟ හැරේ.

එවිට ගුරු භවතුන් මුණ ගැසී ලැබූ වරප්‍රසාද ලබා දීමට නොහැකි වේ. සමහර විට මෙතෙක් ඒ දරුවා නායකත්වයන්, විශේෂත්වයන් ලබා තිබුණේ සිය දක්ෂතා නිසා නොවීමට පුළුවන. එවැනි දරුවන් මේ පසුබිම් තුළ නිතැතින් ම කඩා වැටේ. ඒ කඩා වැටීම දරුවාට විශාල මානසික ප්‍රශ්නයක් බවට පත්වනු ඇත. විවිධ නායකත්වයන්, පිළිගැනීම්, වරප්‍රසාදයන් ටිකෙන් ටික බිඳ වැටෙන විට දරුවා තවත් පැත්තකට යොමු වේ. විශේෂයෙන් මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වීම ප්‍රධාන වේ. මේ නිසා මව්පියන් ඉතා ප්‍රවේශම් විය යුතු වේ. ඒ වගේම අම්මා , අප්පච්චි ලෙස දරුවන්ට බැරි බර පැටවීමෙන් වැළකිය යුතු ම ය.


උදේ පාසල් යන්නට සූදානම් වන මොහොතක දීවුව ඉහළින් ම විභාග සමත්වන ලෙස, ඒ සාමාර්ථ නවයක් ම ගන්නා ලෙස දරුවාගෙන් ඉල්ලා සිටිනවාට වඩා තමන්ගේ ආගම ධර්මය අනුව සෙත් ප්‍රාර්ථනා කිරීම ඉතා වටී. තමන්ගේ ඉලක්ක වලටම දරුවා නතු කිරීම තුළ දරුවාගේ සිතට දැනෙන්නේ මහා පීඩනයකි. මව්පියන්ගේ මුවින් 'ජය සිරි මහා බෝධි හාමුදුරුවන්ගේ පිහිට ලැබේවා' ආදී ලෙසින් ප්‍රාර්ථනාවක් දරුවාට ඇසෙන විට එය මොන තරම් මානසික ශක්තියක් වනවාද? එහෙත් පෙර කී ලෙස බැරි බර පැටවීම තුළ සිතට දැනෙන පීඩනය තුළ දරුවන් බොහෝවිට මත්ද්‍රව්‍යයන්ට, විෂම වැඩවලට යොමුවීමට ඇති අවස්ථා බොහෝ ය. මේ බව ද හොඳින් සිහියට ගෙන අපේ මව්පියන් තම හැසිරීම් හසුරුවා ගත යුතු ව තිබේ. එහිදී මව්පියන් විසින් දරුවන් මෙහෙයවීම අත්‍යවශ්‍ය වේ. එහෙත් බලහත්කාරයෙන් දරුවා ඉලක්ක වෙත තල්ලු කරමින් පීඩනයක් නොදිය යුතු වේ.

ඇතැම් මව්පියන් තමන් තුළ තිබෙන සිහින ඉටු කර ගන්නට උත්සාහ කරන්නේ දරුවන් වෙතිනි. වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවරයෙක් ආදි විවිධ චරිත දරුවන් තුළින් ගොඩනගන්නට ඇතැම් මව්පියවරු වෙහෙසෙති.

දරාගන්නට නොහැකි පීඩනය දරුවා නිතැතින් ම වැරැදි මගට යොමු කරයි. මානසික ව කඩා වැටුණු, නොසැලකිල්ලට ලක් වූ දරුවන්ට ආදරය සෙනෙහස දක්වන බවට රංගනයක යෙදී ඔවුන් තමන් වෙත නතු කරගෙන, තමන්ගේ ව්‍යාපාරික අරමුණු, දූෂත ක්‍රියාකාකරම්වලට යොමු කරවීමට බාලා සිටින මිනිස් වෙසින් එන යක්ෂයින්ගෙන් දරුවා මුදාගත හැකි අම්මා, අප්පච්චි ඔබට ම ය. තම මව්පියන්ගේ නිසි රැකවරණය, ආදරය, කරුණාව, දරුවාට අත්‍යවශ්‍ය ය. ඒ වගේම දරුවන්ට පීඩනයකින් තොරව ජීවත් වීමට නිවෙසේ පරිසරය ද සාමකාමී විය යුතු ය. ඒ තුළ දරුවන් බාහිර බලවේගවලට සමීප නොවනු ඇත. මත්ද්‍රව්‍ය රකුසාගේ ගොදුරක් බවට පත් නොවනු ඇත.

රමණී සුබසිංහ

# සතියට මුල් තැන දෙන
# වස්සානය



**මෙලොව ජීවත් වන අප හැම දෙනාට ම කාලය තරම් තවත් වටිනා යමක් නැහැ කියන මේ කථාව පරම සත්‍යයක්. ඇයි එහෙම වන්නේ. ගෙවීයන කාලය කවදාවත් නැවත ආපහු මේ භවය තුළ අප කිසිවෙකුට අත් විඳින්නට හැකියාවක් නැහැ. මේ නිසා අප අතර තිබෙන වැදගත් ආප්තෝපදේශයක් ලෙස කාලය රන් හා සමානයි කියන මේ කියමන ව්‍යවහාර වෙනවා.**

හැබැහින් ම රන්වලට මිලක් නියම කරන්නට පුළුවන් වුවත් කාලයේ අගය කවරමදාකවත් මිලෙන් නියම කරන්නට බැහැ. එනිසා කාලය රන්වලට සමාන කිරීමත් වැරදි යි. කාලය පිළිබඳ මේ අසාමාන්‍ය වටිනාකම තේරුම් ගත්තේත්, පැහැදිලිව අපට තේරුම් කළෙත්, අපේ බුදුරජාණන් වහන්සේ යි. ඒ නිසා ම බුදුරජාණන් වහන්සේ තමන්වහන්සේගේ දවසේ පැය විසි හතර කොටස් පහකට බෙදා වෙන්කරලා එම කාලයෙන් උන්වහන්සේ උපරිම ප්‍රයෝජන ගනිමින් දුකින් පෙළෙන සත්වයා දුකින් මුදවා ගත්තා.

මේ නිසා ම උන්වහන්සේ අපට වදාළා "අජ්ජේව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවේ" යනුවෙන්. එයින් උන්වහන්සේ අපට අනුශාසනා කළේ අද කළ යුතු දේ අද ම කරන්න. හෙටට කල් දමන්න එපා. කවුද දන්නේ අපි හෙට වෙනතුරු ජීවත් වෙයි ද කියා. මේ තමා උන්වහන්සේ එයින් අදහස් කළ අර්ථය.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත් වීමෙන් පසු ඇති කළ ප්‍රථම රහත් හැට නම අමතා ප්‍රකාශ කළේ "චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය, බහු ජන සුඛාය, අත්ථාය, හිතාය සදෙව මුනස්සානං, මා එකෙන ද්වෙ අගමිත්ථ." මෙයින් උන්වහන්සේ අදහස් කළේ මිනිසත් බවක් ලබා ඇති අප විසින් කළයුතු මෙහෙවරේ තරම යි.

භික්ෂුවක් වශයෙන් අනුන්ගෙන් යැපෙන තත්වයක් මත එම මෙහෙවර වඩාත් වේගවත් විය යුතු නිසා උන්වහන්සේ ප්‍රකාශ කරනවා, මහණෙනි, බොහෝ දෙවි මිනිසුන්ගේ යහපත පිණිස චාරිකාවේ යෙදෙන්න. එක් මගකින් දෙදෙනෙක් ගමන් කරන්න එපා. මාර්ග දෙකක් තෝරා ඒ මාර්ග දෙකේ අවට ජීවත් වන ප්‍රජාව සුඛිත කරන්න. දෙන්නෙක් එක පාරකින් වැඩියොත් ධර්ම ප්‍රචාරණ වේගය බාල වෙනවා. ප්‍රමාද වෙනවා කියලා. මෙහෙම අනුශාසනා කළ උන්වහන්සේ ද පාගමනින් තනියම චාරිකාවේ යෙදී බොහෝ මිනිසුනට මෙලොව පරලොව සුගතිය පිණිස අනුශාසනා කළා.

ඒ සත්වයා සුවපත් කරන්නට. කාලය වේගයෙන් ගෙවී යන නිසා ම යි. අප ජීවත් වන මේ කෙටි කාලය තුළ අපේ මෙහෙවරදිගු වගේ ම පුළුල් විය යුතු නිස යි. ඒ වගේම අපේ බුදුරජාණන් වහන්සේ මෙසේ පොදුජන මෙහෙවර මේ ආකාරයෙන් ඉක්මන් කරද්දී ගෙවී යන කාලය අපතේ නොයවා පරාර්ථය පමණක් ම නොව ස්වාර්ථය සකස් කර ගතයුතු ආකාරය ද අනුදැන වදාළා.

එහිදී බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් කාලසටහන සමස්ත වර්ෂයට ම අදාළ කර දැක්වූවා. ඒ අනුව බලනවිට අවුරුද්දට ඇති මාස දෙළහෙන් මාස නවයක් ම එනම් හතරෙන් තුනක් ම පොදු ජන මෙහෙවර පිණිස වෙන් කළ උන්වහන්සේ මාස තුනක් හෙවත් ඉතිරි කොටස වෙන් කළේ ඒ පොදු ජන මෙහෙවරෙහි යෙදෙන භික්ෂූන් වහන්සේගේ සුගතිය පිණිස යි. එහිදී උන්වහන්සේ සතියෙන් යුක්ත ව කල් ගත කරමින් බණ භාවනාවන්හි නියුතු වෙන්නට අවශ්‍ය කරනවා.

වස් කාලය කියන්නේ දඹදිව මධ්‍ය ප්‍රදේශයේ දේශගුණික තත්වය අනුව වැහි කාලය යි. මේ වැහි කාලය කුසීතව, මැලි කමින් අපතේ නො හැර උපරිම ඵල නෙලා ගතයුතු වෙනවා. ඉතින් මේ කාලය තුළ උපසම්පන්න භික්ෂූන් වහන්සේ පිණ්ඩපාතයෙන් වැළකී සිටින්නේ එදා දඹදිව අන්‍යාගමිකයන් වෙතින් නැගුණු චෝදනාව නිස යි. මොකක් ද? මේ චෝදනාව.

ශ්‍රමණභවත් ගෞතම ශ්‍රාවකයෝ වැහි කාලයේ පවා ළාදලු සහිත තණකොළ පවා මඩිමින්, පොළොවෙන් නැගෙන කුඩා ප්‍රාණීන් පවා ඝාතනය වන හිංසා වන ලෙස ජනපද චාරිකාවේ යෙදෙමින් ආහාරය යදිනවා වැනි දෝෂාරොපණයන්. ඉතින් මෙයට සවන් දුන් බුදුරජාණන් වහන්සේ චාරිකාවෙන් වැළකෙන මේ කාලය අපතේ නො යවා දායක පිරිස් විසින් හදා දෙන ආවාසයක් වාසස්ථාන කොට ඔවුන් විසින් පිරිනමන සිවුපසයෙන් යැපෙමින් හෝ තමන් වහන්සේලාගේ විමුක්තිය පිණිස සතියෙන් කාලය ගෙවීම බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළා.

මේ අනුදැන වදාළ ප්‍රඥප්තීන් අනුව එදා බුදුරජාණන් වහන්සේ දවසත් ඒ වගේ ම ලංකාවේ අනුරාධපුර සමයෙහි වැඩ වාසය කළ භික්ෂු භික්ෂුණීන් වහන්සේලා මෙන් ම ගිහි සැදැහැති පිරිස් සමහර විට දිවි පරදුවට තබා හෝ සතියෙන් යුක්තව කල් යවා වස් තුන් මාසය තුළ ම අවශ්‍ය පිළිවෙත් පුරා බවුන් වඩා මාර්ගඵලවලට පැමිණි බවට කොතෙකුත් නිදසුන් කථා පුවත් අපේ පාලි පෙළ පොත්වල මෙන් ම අට්ඨකථා සාහිත්‍යයෙහි සඳහන් වෙනවා.

බෞද්ධ ඉගැන්වීමට අනුව වර්ෂයේ මාස දෙළහ ඍතු තුනකට බෙදෙනවා. හේමන්ත, ගිම්හාන හා වස්සාන වශයෙන් ඒ කාල පරිච්ඡේද තුන හැඳින්වෙනවා. සිංහල බෞද්ධ මාස චක්‍රය අනුව ඉල් මාසයේ(නොවැම්බර්) අව පැලවිය සිට මැදින් මාසයේ (මාර්තු)යෙදෙන පුර පසළෙ ාස්වක පොහෝදින දක්වා වන මාස හතර හේමන්ත ඍතුව යි. ගිම්හාන ඍතුවට අයත් වන්නේ මැදින් මාසයේ(මාර්තු) අවපැලවියදින සිට ඇසළ පුරසළොස්වක් දා මාස හතරයි.

ඇසළ මාසයේ පුරපසළොස්වක ගෙවී (ජූලි) අවපැලවියදිනයේ සිට ඉල් (නොවැම්බර්) මාසයේ පුරපසළොස්වක් දා දක්වා මාස හතර වස්සාන ඍතුව යි.

ඉතින් මේ කාල චක්‍රය අනුව බලන විට හේමන්ත ඍතුව(නොවැම්බර් මාසයේ මැද සිට, දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි මාසයේ මැද දක්වා) කාලය සුව පහසු කාලය ලෙස භාරත දේශවාසීන් පොදුවේ කල්පනා කරනවා. එහෙම වුණ ත් එහි ද සනීපදායක බවක් දක්නට නැහැ. මොක ද? සාමාන්‍යයෙන් මේ මාස හතරේ මුල් කාලය එම සුවදායක බව පෙනුණත් පසුවට දැඩි ශීත සමයක් බවට පත් වෙනවා.

වර්තමානයේ වුවත් මේ දැඩි ශීත සමය නිසා විශේෂයෙන් වයස් ගත ඇතැම් ජන කොටස් මරණයට පවා පත් වෙනවා. ඊ ළඟට එන්නේ ගිම්හාන ඍතුව යි. (මාර්තු මාසයේ මැද සිට ජූලි මාසයේ මුල් කොටස දක්වා කාලය යි. මේ කාලය ඉවසුම් නොදෙන තරම් දැඩි උෂ්ණයකින් යුක්ත යි. මේ උෂ්ණය ද ඉවසිය නොහැකි තරම් තත්වයන්ට පත් වී ඇතැම් ජනකොටස් මිය යන අවස්ථා අදත් තිබෙනවා. ඉතින් මේ මාස අට තුළ ම වැස්ස නැහැ. ඒ නිසා කිසියම් විධියකින් වැසි ගතියක් ඇති වුවහොත් එය අකල් වැස්සක් ලෙස යි භාරත වැසියන් කල්පනා කරන්නේ. ජූලි මාසයේ මැද සිට ඉල් මාසයේ මැද දක්වා මාස හතරක කාල සීමාව වස්සාන ඍතුව යි. ඉතින් එකදිගට වැස්ස පවතින කාලයක්. ඒ නිසා ම යි "වස්සානය" කියන්නේ.

මේ කාලය තුළ දඹදිව ඉන්දියාවේ පරිසරය හරිම ලස්සන යි. දූවිලි නැහැ. තණ කොළ පැහැයෙන් අවට පරිසරය බබළනවා. හැබැයි ගමනක් බිමනක් යාමට හෝ වැඩක් පළක් කර ගෙන නිදහසේ ජීවිකා වෘත්තිය කර ගෙන යැමට බැරි තත්වයකයි ජනතාව ඉන්නේ. ඉතින් අද මේ සඳහා නවීන තාක්ෂණයෙන් පිළියම් යොදා ගෙන ජනතාව රැකී රක්ෂා කරමින් වර්ෂය පවත්වා ගෙන ගියත් එදා බුදුරජාණන් වහන්සේ දවස වැහි කාලය තුළ ජනතාව රැකීරක්ෂා ආදියෙන් ද වැළකී අතීකුත් කාලවල එක් රැස්කර ගන්නා ආහාරද්‍රව්‍ය වලින් ජීවිකාව කර ගෙන ගියා.

වස්විසීම පිළිබඳ ක්‍රම දෙකක් බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළා "පෙර වස් විසීම" හා "පසුවස් විසීම" යනුවෙන්. පෙරවස් වසනවා කියලා කියන්නේ ඇසළ මස පුන්පොහෝදින පොහොය කොට පසුදින හෙවත් අවපැලවියදින ඉදිරි තුන්මාසය දක්වා වස් ඉටා ගැනීම යි. මෙම කාලය ඉල්මස පුර පළොස්වක දින මහා පවාරණය සිදු කිරීමෙන් අවසන් වනවා. එමෙන් ම එසේ වස් විසූ භික්ෂූන් වහන්සේට පමණක් ඉදිරි චීවර මාසය තුළ කඨින චීවරයක් පිළිගැනීමේ සුදුසුකම් ද සපිරෙනවා.



මහනුවර අස්ගිරි මහා විහාරයේ කාරක සංඝ සභික හා උපාධ්‍යාය ධුරන්ධර වයඹ පළාතේ ප්‍රධාන සංඝ නායක මහාචාර්ය

**තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නා හිමි**

**මෙම ලිපියේ ඉතිරි කොටස තිකිණි අව අටවක (11) පෝ ද පත්‍රයේ පළ වේ.**

# ගිම්හානයේ උදාවන වස්සානයේ වසන්තය

**ඇසළ මස පුර පසළොස්වක පොහෝදායින් වස්සානයේ සුයාමය ඇරඹෙයි. කෙලෙස් ගිම්හානයෙන් වියැළුණු බොදුනු සිත් කුසල් වැස්සෙන් සිහිල් වන සමය උදා වන්නේ ද වස්සාන සමයේදී ය. පැවිදි ගිහි දෙපසම එක්සිත් ව තෙමසක් පුරාවට පිවිතුරු සිතින් යුතුව පින් දහම් කිරීමට එකමුතු වන්නේ ද මෙම වස්සාන සමය ආරම්භයේදී ය.**

බුදුරජාණන් වහන්සේගේ නියමයක් අනුව වැසි කාලයේ භික්ෂූන් වහන්සේලා වස් එළඹීම සම්බන්ධයෙන් දූරාතීතයේ සිට ලබා ඇති අත්දැකීම භාවිතය, පරිචිතය හා අවබෝධය සුළුපටු වූවක් නොවේ. ඉතිහාසයේ නොයෙක් රජවරුන් විසින් පවා ඉමහත් අභිරුචියකින් හා කැපවීමකින් කරන ලද මෙය ආගමික ශාසනික ජාතික හා සාමාජීක වටිනාකම් රාශියක් සහිත පුණ්‍යකර්මයක් වේ. වස් සමය උදාවන මෙම අවස්ථාවෙහි එය වැදගත් වන ආකාර පිළිබඳ සලකා බැලීම ඉතා වැදගත් වේ.

## කාල නියමයක් සහිත පින්කම

පින්කම් වූකලී සෑම මොහොතක ම කළ යුතු උදාර ක්‍රියාවක් ලෙස බුදුදහම සලකන බව ඔබ දන්නා කරුණකි. එහෙත් කඨින පින්කමක් එසේ කළ හැකි නොවේ. බුද්ධ නියමය අනුව වස්සාන සමය ආරම්භ වන පොහෝ දිනයේ භික්ෂුවක විසින් පෙර වස් සමාදන් විය යුතු ය. එසේ නොමැති වුවහොත් ඉන් පසු එළඹෙන පොහෝ දිනයේදී පසුවස් සමාදන් විය යුතු ය. පෙරවස් සමාදන් වූ පොහෝ දිනයේ සිට තුන් මසක කාලය වැසි තුන් මස ලෙස සැලකේ. මෙම කාලය තුළ ගිහි පැවිදි දෙපක්ෂයට පින් දහම් සපුරා ගැනීමේ ක්‍රමවේදයක් සැකසී ඇත. වස් කාලය පුණ්‍ය මාසය ලෙස ද සැලකෙනුයේ මෙකල ගිහි පැවිදි දෙපක්ෂයම මහත් වූ පුණ්‍ය සම්භාරයක් රැස් කර ගන්නා බැවිනි. ඉක්බිති ව එළඹෙන චීවර මාසය තුළ පමණක් කඨින චීවරයක් පූජා කළ හැකි හෙයින් බුදු සසුනෙහි කාල නියමයක් සඳහන් වන මහා පින්කම කඨින චීවර පූජාවයි.

## සංඛ්‍යා නියමයක් සහිත පින්කම

වස්සාන කාලයේ සිදු කෙරෙන මෙම මහා පින්කමෙහි තවත් විශේෂත්වයක් වන්නේ එයට සංඛ්‍යා නියමයක් ද තිබීම හේතුවෙනි. එක් විහාරස්ථානයක කඨින නාමයෙන් පූජා කළ හැකි වන්නේ එක් චීවරයක් පමණි. භික්ෂුවක විසින් වස් සමාදන් වී ගෙවිය යුතු දින සංඛ්‍යාව මාස තුනකි. එසේම වස් විසූ ආරාමයෙහි එම කාලය වැඩ සිටිය යුතු වන අතර ආරාමයෙන් පිට ගෙවිය හැකි උපරිම දින සංඛ්‍යාව දින හතකි. එම දින හත ඇතුළත වස් එළඹි ස්ථානයට ආපසු පැමිණෙන අධිෂ්ඨානය එම භික්ෂූන් වහන්සේ තුළ පැවතිය යුතු ය. එය සත්තාහකරණීය යන විශේෂ නාමයෙන් හැඳින්වේ. එසේම එක් ආරාමයක භික්ෂූන් වහන්සේලා කෙතරම් ප්‍රමාණයක් වස් වසා සිටිය ද සංඝයා විසින් කඨින චීවරය පැවරිය හැක්කේ වස් ඉතා මැනවින් ආරක්ෂා කළ එක් භික්ෂූන් වහන්සේ නමකට පමණකි. මේ අනුව එක් විහාරස්ථානයක, වස් ශික්ෂා පදය ආරක්ෂා කළ එක් භික්ෂූන් වහන්සේ නමකට පිළිගත හැකි එක් චීවරයක් පමණක් හෙයින් සංඛ්‍යා නියමයක් ද පවතී.

## පින් අධික පින්කම

බුදුදහමේ ඉගැන්වෙන පින් අධික පින්කම් අටකි. ඒවා අට මහ කුසල් යනුවෙන් හැඳින්වේ. එම කුසල් අටෙන් පළමුවැන්න කඨින චීවරයක් පූජා කිරීමයි. දැනට වස් තෙමස ඇතුළත ප්‍රායෝගික ව සිදුවන පින්කම් දෙස බැලීමේදී එම අටමහ කුසල්වලින් කිහිපයක් ම සිදුවන අවස්ථාව ද දක්නට ලැබේ. මෙය මහා කුසලයක් වීමට හේතුව කරුණු රාශියක් එක්වීමෙන් සිදු කළ හැකි පින්කමක් වීම නිසා ය.

## ජීවිත කාලයක සිදුකළ හැකි දුර්ලභ පින්කම

හැමදා කළ හැකි පින්කමක් නොවීම, අටමහ කුසලයෙන් එකක් වීම, බුද්ධාඥව පරිදි සිදු කරන ලද වතක් වීම, ගිහි පැවිදි දෙපිරිසම එකතුව තිසි කලට තිසි පරිදි සිදු කළයුතු ආගමික කටයුත්තක් වීම, තිසි පරිදි වස් සමාදන් වී එය මනාව ආරක්ෂා කළ භික්ෂුවක් සිටීම, තෙමසක් පුරා උන්වහන්සේට සිවුපසයෙන් ඇප උපස්ථාන කිරීම, සැදැහැයෙන් හා පරිවාර සම්පත්තියෙන් යුතුව සකසා ගත් කඨින චීවරයක් තිබීම, සාමාන්‍ය චීවරයෙන් වෙනස් වී විශේෂ චීවරයක් වීම, සංඝයා විසින් විනය කර්මානුකූල ව ඒ පිළිබඳ කටයුතු සිදු කිරීම යනාදී කරුණු රාශියක එකතුවෙන් සිදු කළ යුතු පින්කමක් වීම නිසා මෙම පින්කම කෙනෙකුට දුර්ලභ ව සිදු කිරීමට ලැබෙන පින්කමක් ද වේ.

## ගිහි පැවිදි දෙපක්ෂය ම එකුතුව කෙරෙන පින්කම

පින්කම් වූකලී හුදෙකලාව මෙන්ම සාමූහිකව ද කළහැකි දේ ය. එහෙයින් අපි තනි තනිව ද පින්කම් කරමු. එසේම ඇතැම්විට අනෙක් අය ද එකතු කොට ගෙන සාමූහික ව ද පින්කම් කරමු. එහෙත් වස්සාන සමයේ භික්ෂූන් වහන්සේලා වස් සමාදන් වී කඨින චීවරයක් පූජා කිරීමෙන් අවසන් කෙරෙන සියලු පින්කම් මුළුමණින් ම සාමූහික ව සිදුවන පින්කම් ය. ගිහියන් සාවධාන ව හා මහත් කැපවීමකින් ඇප උපස්ථාන කරන බැවින් භික්ෂූන් වහන්සේලා වෙනත් කාලවලට වඩා සවිඤ්ඤාණික ව කුරු කුහුඹුවකුටත් හිංසාවක් නොවන පරිදි බණ භාවනාදී කටයුතුවල යෙදෙමින් මෙකල කල් ගෙවති. අයං වස්සාන කාලො (මේ වස් කාලයයි) යනුවෙන් ඇතැම් භික්ෂූන් වහන්සේ ලා තමන්ට පෙනෙන ස්ථානයක එය ලියා තබා ඇත්තේ ද සෑම මොහොතකම සිහිපත් කිරීමේ අවශ්‍යතාව නිසා ය. එසේම මෙම පින්කමෙහි බලගතු බව දන්නා ගිහියෝ දදිනපතා විහාරස්ථාන කරා එළඹ භික්ෂූන් වහන්සේගේ අවශ්‍යතා වෙනදාටත් වඩා කැපවීමෙන් ඉටුකිරීම, දානමාන, බෝධිපූජා, මල් පහන් පූජා, බණ ඇසීම්, භාවනා කිරීම් ආදිය කරති. මේ නිසා මෙම වස් තෙමසෙහි සිදුවන පින්කම් ගිහි පැවිදි දෙපක්ෂයේ ම එකතුවෙන් සිදුවීම විශේෂත්වයක් වේ. වෙනත් විධියකින් කිවහොත් මෙය පෞද්ගලිකත්වය යටපත් කොට සාමූහිකත්වය ඔප් නංවන්නා වූ පින්කමකි.



කැලණිය විශ්ව විද්‍යාලයේ
පාලි හා බෞද්ධ
අධ්‍යයනාංශයේ මහාචාර්ය
**මකුරුප්පේ ධම්මානන්ද හිමි**

## කුසල කර්මයක් මෙන්ම විනය කර්මයක් ද වන පින්කම

දිව්‍ය මනුෂ්‍ය සම්පත් කෙළවර නිර්වාණ සම්පත් මුදුන්පත් කොට කෙරෙන කඨින චීවර පූජාව සිතෙහි පාපී අකුසල ධර්මයන් කම්පා කරවමින්, එහි ආදීනව මෙනෙහි කරවමින්, කෙලෙස් සිතිවිලි නිසා මිනිස් සිතට පමුණුවන විපත් අවබෝධ කරවන හා සසර දුක ඉක්මවීමෙන් ලැබෙන සැනසීම අරමුණු කොට ඇති නිසා මහත් කුසලයක් වේ.

එසේම භික්ෂූන් වහන්සේලා බුදුරදුන් අනුදැන වදාළ පරිදි සීමා සම්මත කළ උපෝෂථාගාරයකට රැස්ව ඇවැත් දෙසීම, වස් සමාදන්වීම, සත්තාහකරණයෙන් ආවාසයෙන් බැහැරවීම, පා සිවුරු අත්පස තබා පරිහරණය කිරීම, සංඝ සම්මුතියෙන් කඨිනය පැවැරීම වැනි විනය කර්ම රාශියක් මෙම කාලය තුළ ඉටු කරති. මේ නිසා වස් කාලය තුළ සිදුවනුයේ මහත් වූ කුසල් ගෙන දෙන්නා වූ ද විනය කර්ම සිදු කෙරෙන්නා වූ ද පින්කමකි.

## එකම ස්ථානයක පූජා දෙකක් එකට සිදුවන එකම පින්කම

වස් තෙමස අවසන සිදුවන කඨින චීවර පූජාවේදී පින්කම් දෙකක් එකදින සිදුවේ. ගිහි දායකයන් විසින් සාමාන්‍ය චීවරයක් හෝ චීවරයකට පොහෝනා වස්ත්‍රයක් ගෙනවුත් එය කඨින චීවරයක් වශයෙන් සකසා දෙන ලෙස මහා සංඝ රත්නයට පූජා කරනු ලබයි. ඉන් අනතුරුව මහා සංඝරත්නය විසින් එය කඨින චීවරයක් ලෙස සකසා වස් ආරක්ෂා කළ භික්ෂූන් අතුරෙන් එක් ප්‍රතිබල සම්පන්න භික්ෂුවක් තෝරා සියලු දෙනා වහන්සේගේ එකඟතාවයෙන් පූජා කරනු ලැබේ. මෙසේ එකම දිනයේදී පූජා දෙකක් සිදුවන නිසා මෙය මහත් බලසම්පන්න පින්කමක් වන බව ද දත යුතු ය.

## කවර පින්කමකින් නමුත් කඨිනානිසංශ ලැබිය හැකි පින්කම

වස් සමාදන් වූ භික්ෂූන් වහන්සේ නමකට බුද්ධ නියමය පරිදි වෙනත් කාලවලට වඩා ලැබිය හැකි ප්‍රතිලාභ රාශියක් පිළිබඳව බණ පොතෙහි සඳහන් වේ. එනම් ශික්ෂාපද පහකින් ආපත්ති පහකට පත් නොවී සිටිය හැකි ය. එසේම මෙම කාලය තුළ විවිධ පින්කම්වල දිවා රෑ නිරතවීමෙන් ගිහියෝ ද මහත් වූ කුසල් හුස් කර ගන්නා බව අමුතුවෙන් කිවයුතු නොවේ.

වඩාත් සුවිශේෂ කරුණක් වන්නේ කඨින පූජාව සිදුකළ තැන් පටන් පැය විසි හතරක් යනතුරු කරනු ලබන කවර පූජාවකින් වුව ද කඨිනානිසංශ ලබාගත හැකි වීමයි. කඨින චීවරයක් පූජා කිරීම සැම කෙනෙකුටම කළ හැක්කක් නොවේ. එබැවින් ඊට සාමූහික ව සහභාගී වීමට පෙර කල සිටම ලක්වැසි ජනයා පුරුදු වී සිටියහ. එසේම කඨින චීවර පූජාව ම පරාමර්ශනය කර ගනිමින් තම ශක්ති ප්‍රමාණයෙන් කරනු ලබන කවරාකාර පූජාවකින් හෝ ඔවුහු කඨිනානිසංශ ලබා ගනිති. එහෙයින් ද මෙය සුවිශේෂී පින්කමක් වේ.

## සංස්කෘතිකාංග රැසක් ඒකාබද්ධ වූ පින්කම

වස් තෙමස තුළ සැදැහැතියෝ භික්ෂූන් වහන්සේලාගේ අවවාද අනුශාසනා පරිදි විවිධ ආකාරයේ පින්කම් කරති. සාංඝික දාන, ධර්ම ශ්‍රවණය, භාවනා කර්ම, බුද්ධපූජා, ධාතුපූජා, බෝධිපූජා, විහාරදාන, වැසිකිළි කැසිකිළි පිළිසකර කිරීම්, පැන් පොකුණු ළිං ආදිය ඉදි කිරීම්, දහම් පොත් පත් පිදීම, ඖෂධ පූජා, පැවිදිවීම්, විහාරාරාම හුණු පිරියම් කිරීම්, සිවුරු පඬුපෙවීම් ආදී විවිධාකාරයේ පින්කම් හා ශබ්ද පූජා, පෙරහර ආදිය ද යොදා ගනිමින් ඉතා විසිතුරු ලෙස සිදු කරති. මෙම පින්කම් සංස්කෘතිකාංග රාශියක එකතුවෙන් සිදු වන්නක් හෙයින් බාල මහලු සියල්ලෝ ම ඊට මහත් අභිරුචියෙන් සහභාගී වෙති. මෙම කාලය තුළ සිදුවන පින්කම් හේතුවෙන් ජාතික සමගිය වර්ධනය වන හෙයින් ජාතික වශයෙන් ද වැදගත් වේ. එසේම සාමාජික වශයෙන් පැතිකඩ රාශියකින් ප්‍රතිලාභ හිමිවන පින්කමක් ද වේ. ආගමික භක්තිය වසරින් වසර නැවුම් වන හෙයින් ආගමික වශයෙන් වැදගත් වන අතර ඇතැමෙක් මෙම කාලය තුළ චීවර, සුවඳ දුම්, පුද පූජා භාණ්ඩ අප්‍රමාණ ව අලෙවි කොට ආර්ථික වශයෙන් ද ප්‍රතිලාභ ලබා ගන්නා පින්කමක් වේ.

මෙසේ දුලබ වශයෙන් සිදුකළ හැකි, ඒවායේ නිසැක බල මහිමයෙන් ස්වර්ග මෝක්ෂ සම්පත් ලැබිය හැකි පින්කම් රාශියක් ගිහි පාර්ශ්වයට මෙන්ම පැවිදි පාර්ශ්වයට ද සිදුවන ඉතා අගනා කාලයක් ලෙස වස්සාන තුන් මාසය හඳුනාගත යුතු ය. මෙහි දුර්ලභ බවත්, මහානීය ආනිසංශ රාශියක් සිදුවන බවත් මැනවින් තේරුම් ගැනීම නිසා පෙර සිටි රාජරාජමහාමාත්‍යාදීහු පවා මෙම පින්කම් මහත් අභිරුචියකින් සිදු කර ගත්හ. එබැවින් මෙම මහඟු කාලයේ වටිනාකමත් එම පින්කම්හි ආනිසංශත් වටහා ගැනීමෙන් ඔබත් තම ජීවිතයට සාංසාරික වටිනාකමක් හිමි කර ගැනීමට අදිටන් කර ගැනීම සුදුසු ය.

**බුදු දහමේ ඉගැන්වෙන පින් අධික පින්කම් අටකි. ඒවා අට මහ කුසල් යනුවෙන් හැඳින්වේ. එම කුසල් අටෙන් පළමු වැන්න කඨින චීවරයක් පූජා කිරීමයි. දැනට වස් තෙමස ඇතුළත ප්‍රායෝගික ව සිදුවන පින්කම් දෙස බැලීමේ දී එම අටමහ කුසල්වලින් කිහිපයක් ම සිදුවන අවස්ථා ද දක්නට ලැබේ.**

# මේ වස්සාන කාලයයි

**තථාගත බුදු සසුනෙහි වැදගත්කමින් යුතු උතුම් පොහෝ දිනයක් වශයෙන් නිකිණි පුර පසළොස්වක පොහෝ දිනය හැඳින්විය හැකි ය. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා නම් වූ සිව් පිරිසට ම උදර පෞරාණික බුද්ධ නියමයන් ඉටු කරන පෙහෝය දිනයක් ලෙස නිකිණි පුර පසළෙ ාස්වක පෝය දිනය සලකනු ලැබේ.**

බුද්ධ ශාසනය ආරක්ෂා වීමටත්, ගුණධර්ම වර්ධනයටත් භික්ෂූන් වහන්සේ මෙන් ම ගිහියාත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් තිබිය යුතු ය. ඒ වගේ ම මේ දෙපාර්ශවය තුළින් ඉටුවිය යුතු යුතුකම් නියම අවස්ථාවල නිසි ලෙස ඉටු විය යුතු ය. ඒ වගේ ම නිකිණි පුන් පොහෝ දිනය භික්ෂූන් වහන්සේ හා ගිහියා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ඇතිවන ගිහි පැවිදි දෙපාර්ශවය තුළින් යුතුකම් ඉටුවන දිනයක් ලෙසින් ද සඳහන් කළ හැකි ය.

නිකිණි පුර පසළොස්වක පොහෝ දිනය ඓතිහාසික වශයෙන් බොහෝ සෙයින් වැදගත් ය. ඒ නිකිණි මාසයේ සිදු වූ වැදගත් සිදුවීම් අතර ප්‍රධාන වන්නේ බුදුරජාණන් වහන්සේ වස් විසීමට අනු දැන වැදෑරීම ය.

බුදුරජාණන් වහන්සේ උතුම් බුද්ධත්වයට පැමිණ අවුරුදු විස්සක් තුළ එනම්, පඨම සම්බෝධිය කාලය තුළ කිසිදු විනය නීතියක් පනවා තිබුණේ නැහැ. ශාසනයෙහි ආරක්ෂාව උදෙසාත්, භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා නම් වූ සිව් පිරිසකගේ ම ශාසනික ඇවතුම්, පැවතුම් හී මාර්ගය සැකසීම උදෙසාත්, චතුරාර්ය සත්‍ය ධර්ම අවබෝධයෙන් නිවන් මග උදෙසාත් උපකාර වන ආකාරයෙන් විනය ශික්ෂා පද පැනවීම සිදුවන්නේ ඉන් අනතුරුවයි.

“පඨම සම්බෝධිය කාලය තුළ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනු ලැබුයේ “ඕවාදපාතිමෝක්ෂ” දේශනාවයි. “ඕවාදප්‍රාතිමෝක්ෂ” නම් උතුම් ශ්‍රී සද්ධර්මය නැවත නැවත මෙනෙහි කරවමින්, ඒ උතුම් ධර්ම මාර්ගයේ හැසිරෙන ලෙස භික්ෂු, භික්ෂුණීන්, උපාසක, උපාසිකා නම් සිව් පිරිසට ම මඟ පෙන්වා දෙනු ලැබූ දේශනාවයි. පඨම සම්බෝධියෙන් අනතුරුව සිදුවන විනය ශික්ෂා මාර්ග පිළිවෙළහි තවත් එක් අවස්ථාවකි, වස්සූපනායික ධර්ම මාර්ගය. එනම් වස් විසීමේ ශික්ෂා පද පැනවීමයි.

මහා වග්ග පාලියෙහි දැක්වෙන ආකාරයෙන් ප්‍රථම බෝධියෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාට වස් විසීමේ ප්‍රඥප්තියක් නො පනවන ලදී. එහෙයින් භික්ෂූහු ඉන් අව පැළවිය සිට මැදින් පුර පසළොස්වක දක්වා වූ මාස හතරක් පමණ දිනැති හේමන්ත කාලයෙහි දීත්, මැදින් දින අව පැළවිය සිට ඇසළ පුර පසළොස්වක දක්වා වූ මාස හතරක් පමණ දිනැති ග්‍රීෂ්ම කාලයෙහිදීත්, ඇසළ අව පැළවිය සිට ඉල් පුර පසළොස්වක කාලය අතර මාස හතරක් පමණ වර්ෂා කාලයේ දීත්, එනම් හේමන්ත, ගිම්හාන, වස්සාන ඍතු තුනෙහි ම සැරිසරා ධර්ම මාර්ගය කියා දී පිණ්ඩපාත චාරිකාවෙහි භික්ෂූන් වහන්සේලා හැසිරෙති.

මෙම සිදුවීම සිදු වූයේ බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ විසූ සමයේ ය. භික්ෂූන් වහන්සේලාගේ මෙම චාරිත්‍ර ධර්ම උල්ලංඝණය කරමින් සිදු කරනු ලබන චාරිකා දුටු බොහෝ මනුෂ්‍යයෝ මෙසේ ප්‍රශ්න නගන්නට විය. කුමන කරුණක් හෙයින් ශාක්‍ය පුත්‍ර වූ ශ්‍රමණයන් වහන්සේලා පණ ඇති තෘණ පැළැටි තලමින්, පොඩි කරමින්, පාගමින්, නොයෙක් ආකාරයේ ක්ෂුද්‍ර ප්‍රාණීන් තළමින්, ඔවුන් මත පා තබමින් ගමින් ගමට ගමන් කරන්නාහු ද? තීර්ථක, නිඝණ්ඨ, ජෛන, ආජීවක, පරිබ්‍රාජික තාපස ආදී විවිධ අන්‍ය ශාසනවල වෙසෙන්නා වූ තවුසන් පවා මේ වැසි සමය මාස හතරක කාලය ගත කිරීමට විවේකස්ථාන සොයා එහි වෙසෙති.

කුමක් හේතුවෙන් මේ ශාසනයේ භික්ෂූහු පමණක් එසේ අනුගමනය නොකරන්නේ ද? පක්ෂීහු පවා මේ වැසි කාලයෙහි ගස් මුදුන්වල කැදලි බැඳගෙන එක් තැන්ව වසනවා. කුමක් හේතුවෙන් මේ භික්ෂූහු එසේ නො වෙසෙත් දැයි මහත් උද්ඝෝෂණයක් සිදු කළා. මේ ආකාරයෙන් නින්ද කරන, අවමන් කරන, දෙස් කියන මනුෂ්‍යයන්ගේ බස් ඇසූ ශාක්‍ය පුත්‍ර වූ ශ්‍රමණයන් වහන්සේලා මෙම කාරණය බුදුරජාණන් වහන්සේ හමුව දන්වා සිටි සේක.

මේ නිමිති කොට ගෙන භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේට “අනුජානාමි භික්ඛවේ වස්සානේ වස්සං උපගන්තං” යනුවෙන් “මහණෙනි, මම වස්සාන ඍතුවෙහි වස් එළඹෙන්නට අනුදනිමි’යි භිකෂූ න් ඇමතූ සේක.

එනම්, වස් විසීමට භික්ෂූන් වහ්නසේලාට නියම කළාහ. මෙහි සරල අදහස වන්නේ, මහණෙනි, වස්සාන කාලයෙහි වස් එළැඹීමට අවසර දෙමි. තථාගත බුදුරජාණන් වහන්සේ ඒ සමාජ මතයට ජන මතයට ගරු කරමින්, එදිනෙදා පැවැති ඒ සිරිත් විරිත්වලට ගරු කරමින් භික්ෂූන් වහන්සේලාටත් මේ වස් තුන් මාසයක කාලය තුළ එක් තැනෙක වැඩ වාසය කරන ලෙස විනය ප්‍රඥප්තිය පැනවූහ. මහණෙනි, පෙර වස් එළඹීම ය, පසු වස් එළඹීම ය යැයි වස් එළඹීම් දෙකකි. ඇසළ අව පැළවිය දිනයෙහි පෙරවස් එළඹිය යුතු ය. නිකිණි අව පැළවිය දිනයෙහි පසු වස් එළඹිය යුතු ය.

වස් විසීමේ චාරිත්‍රය සේ ම, එය විනය ප්‍රඥප්තයක් හැටියට සැලකිය හැකියි. චාරිත්‍රයක්, විනය ප්‍රඥප්තියක් යන මේ දෙකට ම අමතර ව වඩාත් ම වැදගත් කරුණ වන්නේ, මේ කාලය භික්ෂූන් වහන්සේලා විසින් නිවන් මඟ අරමුණු කර මාර්ගඵල අවබෝධය ලබා ගැනීම උදෙසා සීල, සමාධි, ප්‍රඥා ගුණ වඩන කාලයක් හැටියට දැක්වීමයි.

මෙම ධර්ම කතාවට අනුව පිණ්ඩපාතයේ හැසිරීමත් භාවනායෝගී භික්ෂුවකට හෝ භික්ෂුණියකට බාධකයක් විය හැකියි. මෙම කාලය තුළ එක් තැනක වැඩ සිටීමෙන් සැදැහැති ගිහි පිරිස් විසින් දනය ආරාමයට හෝ විහාරයට හෝ කුටියට ම රැගෙනවිත් පිළිගැන්වීම නිසා උන්වහන්සේලාට පිණ්ඩපාතයේ හැසිරීමට තිබූ කාලය ඉතිරි කරගත හැකියි. එම කාලය චිත්ත සමාධිය පිණිස, ඵල ප්‍රඥාව, විමුක්තිය පිණිස යොදාගත හැකියි. බොහෝ භික්ෂූන් වහන්සේලා එය එසේ ම සිදු කළහ. ඒ නිසා මාර්ගඵල අවබෝධය ලැබීමට උපකාරවන වටිනා ම කාලයක් හැටියට මෙම වස් කාලය සඳහන් කළ හැකියි.

දීපා පෙරේරා

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.

ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

නිකිණි පුර පසළොස්වක 2020.08.03

## යුතුකම හා වගකීම

රටක අනන්‍යතාව ලොවට හෙළි කරන්නේ ඒ රටේ සංස්කෘතිය යි. අප කන බොන දෑයෙහි සිට, ඇඳුමේ පැලඳුමේ සිට අනේකවිධ ඇවතුම් පැවතුම්, සිරිත් විරිත් සියල්ල ද සංස්කෘතිය යන්නට අයත් ය. අනන්‍යතාව යහපත් හෝ අයහපත් වන්නේ ආකල්පයන්ගේ යහපත් අයහපත් බව අනුව ය. ශ්‍රී ලාංකිකයන් ලෙස සම්බුදු දහමින් සුපෝෂිත යහපත් ආකල්පයන්ගෙන් යුතු අසිරිමත් සංස්කෘතියකට අපි උරුමකම් කියන්නෝ වෙමු. ඒ අනුව ලොවට හෙළි කළ යුතු අපේ අනන්‍යතාව සම්බුදු දහමට අනුගත විය යුතු ම ය.

බෞද්ධ සමාජය පන්සිල් සුරකින සමාජයකි. ඈත අතීතයේ සිට ම ලක්වැසියෝ පංචසීලය සුරැකියහ. කලින් කල විදේශ ආක්‍රමණත් සමඟ මත්වතුර ඇතුළු විවිධ මත් ද්‍රව්‍ය භාවිතයට පැමිණීමත් සමඟ ඇතැම්හු වෙතින් පන්සිල්පද එකින් එක කඩා වැටෙන්නට විය. මත ඒ තරම් බරපතළ ය. කලින් කලට අඩු වැඩි වෙමින් පැවත ආ මේ දුරාචාරය ගෙවී ගිය කාලයේ අපේ තරුණ දරුවන්, පාසල් දරුවන් පවා ගිලගත් ආකාරයක් දක්නට ලැබුණි. කාන්තාවෝ පවා මත් ද්‍රව්‍යයන්ට හුරුවුණහ. මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන් නිදහසේ තම ව්‍යාපාර කරගෙන යන්නේ ඊට අවශ්‍ය පරිසරය රට තුළ වේ නම් ය. එහෙයින් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ට එරෙහි ව නැඟී සිටින නායකත්වයකට පොදු ජනතාවගේද සහයෝගය ලැබිය යුතු ම ය. අශ්වයා ගියාට පසු ඉස්තාලය වසා පලක් නොවන්නා සේ අවශ්‍ය තැන අවශ්‍ය පිළියම් නොකළේ නම් අපට සිදු වන්නේ, මතින් විනාශ වන අපගේ දරුවන් ගේ අනාගතය ගැන කඳුළු සලන්නට ය.


මනුෂ්‍ය ඝාතන, සොරකම්, දූෂණ අන්තවාදීකම් රටක සාමය බිඳ හෙළයි. ජනතාවට මරණ බිය ගෙන දෙයි. විවිධ අපරාධ කල්ලි බිහි වී මේවාට නායකත්වය දෙන්නේ රට තුළ ඔවුන් වෙනුවෙන් නීතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවන්නේ නම් ය. අපේ අනාගතය සෞභාග්‍යවත් වන්නට නම් රට තුළ එවැනි අපරාධ මැඬලිය යුතු ය. අලුත් අපරාධකරුවන් බිහි නොවන තැනටද වැඩ සිද්ධ විය යුතුය. එවැනි කාර්ය භාරයක වගකීම රාජ්‍ය නායකත්වයකට පමණක් පවරා පොදු ජනතාව මඟ හැර සිටී නම් රට වැසියන් ලෙස තමා උපන් බිමට කරන අකෘතඥ වීමකි.

අපේකම ගරු කළ අපේ පැරණි සමාජය අගය කළේ දේශීය දේ ය. බත් පතත් පිටරටින් එන තුරු ඔවුන් බලා සිටියේ නැත. තමන්ට අවැසි ආහාර පාන, තමන් ම සරි කරගත්හ. මහන්සි වී වැඩ කළහ. එදා අපේ හේන් කුඹුරු පුරන් වූයේ නැත. කඩ සාප්පු පුරා පිටරටියන්ගේ නිමැවුම්වලින් පිරී ඉතිරී ගියේ නැත. ඔවුහු අපේ දෙය, අපේ කම රැක ගත්හ. අතීතයේ රට සෞභාග්‍යවත් වූයේ ඔවුහු දහදිය මහන්සියෙන් වැඩ කළ හෙයිනි. අප නැවත ඒ අතීත සුවඳ ඔස්සේ අපට ගැළපෙන, ගමනක කඩිනම් ව යා යුතුව ඇත.

මේ රට බෞද්ධ රටකි. බෞද්ධ ආගම ඇති තැන අන්‍ය ආගම් ද සුරක්ෂිත ය. එහෙයින් බුද්ධ රත්නය ද, ධම්ම රත්නය ද, සංඝ රත්නය ද සුරක්ෂිත විය යුතු ය. උතුම් ත්‍රිවිධ රත්නය ආරක්ෂා කොට සම්බුද්ධ ශාසනය සුරක්ෂිත කර ගැනීමේ වගකීම සමස්ත බොදු ජනතාවට ම පැවරෙන්නකි. ඒ සඳහා තම යුතුකම වගකීම නිවැරැදිව ඉටු කළ යුතු ය. ආගම දහමින් සුපෝෂිත සෞභාග්‍යවත් දේශයක අරුණලු දැකිය හැකි වන්නේ එවිට ය. අපගේ බෞද්ධ අනන්‍යතාවය ලොවට හෙළි කළ හැකි වන්නේ එවිට ය.

# බෞද්ධ උරුමය ගැන දරුවන්ට කියා දෙන්න

**මිනිසාගේ ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා ලොව විවිධ ඇදහීම්, ලබ්ධීන් ක්‍රියාත්මක ය. මේ සෑම ලබ්ධියකට ම පොදුවේ භාවිත කරන්නේ ‘ආගම’ කියන වචනය යි.**



ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක, ආචාර්ය

**ඕමල්පේ සෝභිත නා හිමි**

සිංහල, පාලි, සංස්කෘත භාෂා ව්‍යවහාරයන්ට අනුව විග්‍රහ කිරීමේ දී ‘ආගම’ කියන වචනයේ තේරුම මිතුරු ස්වරූපයෙන් පැමිණීම යන්න ය. සංස්කෘත ව්‍යාකරණ රීතියේ එය දැක්වෙන්නේ “මිත්‍ර වදාගමඃ” යනුවෙනි. එනම් මිතුරකුගේ පැමිණීම යන්න යි. වචන දෙකක් අතර පවත්නා පූර්ව අපර අකුරුවලට බාධාවක් නොකොට, මැදින් පැමිණ පිහිට වන්නා, පිළිසරණ වන්නා හෙවත් මිතුරා ය, මිතුරු ස්වරූපයෙන් පැමිණෙන්නා ය, යන අදහසයි ඉන් කියැවෙන්නේ.

බෞද්ධ ධර්මය ක්‍රියාත්මක වන ආකාරය අනුව ‘ආගම’ යන වචනය බුදු දහම වෙනුවෙන් භාවිත කිරීමට ඉතාමත් සුදුසුය. බුදු දහම කියන්නේ කිසිවෙකුට හානියක් නො කොට, ඉතාමත් මිත්‍ර ස්වරූපයෙන් පැමිණ පිහිටවන ඉගැන්වීමකි.

මීට වෙනස් ක්‍රමයක් ද වේ. ඒ ආදේශ ක්‍රමය යි. ‘සත්‍රු වදාදේශඃ’ ආදේශය යනු සතුරෙකු වැනියි. ව්‍යාකරණ නීති අනුව ආදේශය නම් වචන දෙකෙහි පූර්ව අපර අක්ෂර දෙක නැති කරගෙන මැදට පැමිණීම යන අර්ථය යි. ආදේශවෙනවා යන්නෙහි අදහස සතුරෙකුගේ පැමිණීමයි. මැදින් සිටින කෙනා නැති කරගෙන, විනාශ කරගෙන අලුතින් කෙනෙක් පැමිණ එතැන පිහිටීම කියන එකයි. මේ කියන ව්‍යාකරණයට අනුව නම් බුදු දහම ඒකාන්ත වශයෙන් ම ආගමකි.

ලොව වෙනත් ආගම් හි ස්වරූපය දෙස බලන විට එම ලබ්ධීන්ට වඩාත් ගැළපෙන්නේ ආදේශ කියන ස්වරූපය යි. වචනාර්ථයෙන් ගත් කල වෙනත් ලබ්ධීන්ට ‘ආගම’ යන වචනය භාවිත කිරීමට පුළුවන්කමක් නැත.

මෙහිදී අප කෘතවේදී ව සැලකිය යුත්තක් වේ. මිනිස් ශිෂ්ඨාචාර ඉතිහාසයේ බුදුදහම තරම් සමාන කළ නොහැකි වුවත් මිත්‍රශීලි ස්වරූපයෙන් ක්‍රියාත්මක වන ආගම් හෙවත් ලබ්ධීන් දෙකක් වනුයේ හින්දු සහ ජෛන ආගම් ය. හින්දු හා ජෛන ආගම් කිසිවෙකුට හානියක් නොකොට මිත්‍ර ස්වරූපයෙන් පැළ පදියම් වන, ස්ථානගතවන ලබ්ධීන් ය.

මේ කරුණු සිහිපත් කළේ ඉතා වැදගත් සමාජ සංසිද්ධීන් කිහිපයක් මුල්කරගෙන ය. මේ දිනවල චීන බෞද්ධ ජනතාව අතර වන මිය ගිය වැඩිහිටියන් පිදීමේ උත්සවයක් ක්‍රියාත්මක වේ. හත්වන මාසයේ උත්සවය (Seven month Festival) යනුවෙන් හැඳින්වෙන මෙම උත්සවයේ දී සිදු කෙරෙනුයේ මියගිය ඥාතීන්ට සැලකීම ය. ගරු කිරීම ය. චීනයට බුදු දහම ගෙන එන අවස්ථාවේ දී අවුරුදු පන් දහසකට වැඩි ශිෂ්ඨාචාරයක් ආරක්ෂා වී තිබුණි. ඒ තුළ විවිධ ඇදහීම්, පිළිගැනීම් තිබුණි. ඒ පිළිගැනීම් අතර මළවුන් පිදීම, වසරේ හත්වැනි මාසයේ සිදුකිරීම සිරිතක් ව පැවතුණි. බුදු දහම පැමිණීමත් සමගම මේ සිරිත වඩාත් හරවත් ලෙස සංවිධානය වීමට පටන් ගැනුණි. එය ඥාතීන්ට පින් දීමේ උත්සවයක් බවට සංවිධානගත වුණි. ඒ අනුව බුදු දහම සම්බන්ධ කර ගනිමින්, චීන සංස්කෘතිය තුළ මේ උත්සවය අදටත් ක්‍රියාත්මක ය. මේ කරුණෙන් පැහැදිලි වන්නේ බුදුදහම යම් සමාජයකට ආවා නම් ඒ සමාජයේ පවත්නා සිරිත් විරිත් විනාශ නොකොට, ඒවායේ පාරම්පරික ගති සිරිත් විනාශ නොකොට, ඒවාට ධාර්මික අර්ථයක් දී ඉදිරියට පවත්වාගෙන යන ආකාරය යි.

මේ තත්ත්වය ඉතාමත් මැනවින් පෙනෙන්නේ ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ ය. මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට පැමිණීමට පෙර නොයෙක් විදිහේ පාරම්පරිකත ඇදහිලි ක්‍රම මෙහි ක්‍රියාත්ම වුණි. යක්ෂ, ප්‍රේත, අමනුෂ්‍ය වන්දනාව තිබුණි. පර්වත වන්දනාව, වෘක්ෂ වන්දනාව, මළ වුන් පිදීමේ චාරිත්‍ර තිබුණි. බුදු දහම නිසා මේ විශ්වාස පුද පූජා ක්‍රම විනාශ වූයේ නැත. එහෙත් අපූර්ව දෙයක් සිදුවුණි. ඒ, මේ පුද පූජාවන්ට නව අර්ථ ලබා දීම ය. බෝධි වන්දනාව හඳුන්වා දුන්නේ වෘක්ෂ වන්දනය වෙනුවට ය . එමගින් සිදුවූයේ වෘක්ෂ වන්දනාවේ ගතානුගතිකත්වය ඉවත් කොට නව අර්ථකථනයක් ලබා දීම ය. බෝධීන් වහන්සේට, බෝධි පූජා පවත්වන්නට ජන සමාජය යොමු වුණේ මේ බෞද්ධ සිද්ධාන්තය අනුව ය.මිය ගිය අයට පුද පූජා පැවැත්වීම වෙනුවට හත් දවසේ දානය, තුන්මාසේ දානය ආදී අලුත් චාරිත්‍රයක් බිහිවුණි. වෙනත් ලෙසකින් කියනවානම් පැරැණි සිරිත් විරිත්වලට බෞද්ධ ගතිය ආගම වුණි. මිත්‍ර ස්වරූපයක් පැමිණුනි. යාතිකා, යාග හෝම වැනි පුද වලට සෙත් පිරිත ආගම විය. එය සිරිත් සෙත් පැතීම බවට පත්වුණි. ඒ වගේම ලංකාවේ මන්ත්‍ර ශාස්ත්‍ර නිර්මාණය වුවා නම් ඒවාට ද බුදුගුණ මුල් විය. මේ සියල්ලක් ම ආධ්‍යාත්මික සංවර්ධනයට පාදක විය. ඒ නිසා ම අපි බුදු දහම ආගමක් ලෙස හඳුන්වමු.

විදේශීය ආක්‍රමණයන් සමග අපේ රටට පැමිණි ඇතැම් ලබ්ධීන්ගේ ස්වරූපය ආදේශ වීම ය. සතුරු ස්වභාවයක් ගැනීම ය. එනම්, ඒවා තිබෙන සම්ප්‍රදායට විරුද්ධ ය. උදාහරණ ලෙස ඇතැම් ලබ්ධීන් ප්‍රතිමා වන්දනයට විරුද්ධ ය. එහෙයින් ම ඒවා කඩා බිඳ දමා විනාශ කිරීමට ද පෙළඹේ. එමෙන් ම අනෙක් සිරිත් විරිත් ද විනාශ කරයි. අලුත් දේ හඳුන්වා දෙයි. එහෙත් ඒවා සිදු කෙරෙන්නේ බලහත්කාරයෙනි. සෑම රටක ම පාහේ දැකිය හැකි වන්නේ බලහත්කාරයෙන් ආදේශ වීමකි.

එහෙත් බුදු දහම ව්‍යාප්ත වූයේ ‘ආගම් කියන සංකල්පය තුළ ම ය. මෙහිදී අප උගත යුතු පාඩමක් වේ. චීන බෞද්ධ ජනතාව අතර හත්වැනි මාසයේ පූජාව, මළවුන්ට පින්දීම යන සංකල්පයට මාරු වූවා සේ , අපගේ ද සිරිත් විරිත්වලට බෞද්ධ ඌරුව, බෞද්ධ වර්ණය ,බෞද්ධ සිරිත්, බෞද්ධ චරිත ලක්ෂණ එකතු වී තිබේ. ඒ සියල්ල අපේ උරුමය යි. බුද්ධ වන්දනාව සඳහා මල්, පහන් ආදිය පූජා කිරීම, සෙත් ප්‍රාර්ථනා කිරීම ආදී මේ සියල්ල දර්ශනයට අදාළ ය. ඒ බුදු දහම නිසා අපේ අතීත උරුමය දීප්තිමත් වී තිබේ. අර්ථවත් වී තිබේ. ඒ අර්ථවත් වූ උරුමය අපේ දරුවන්ට ද නො මඳ ව ලබා දිය යුතු ය. මේ කරුණ තේරුම්ගත් පසු බුදු දහම කෙරෙහි තිබෙන ගෞරවයත්, සම්භාවනීයත්වයත් තව තවත් වඩා වර්ධනය වනු ඇත.

රමණී සුබසිංහ

**වකුගඩුවක් අවශ්‍යයි**

වයස 61 ක පිරිමි අයෙකු සඳහා
$B^+$ / $B^-$ / $O^+$ / $O^-$ රුධිර වර්ගයට අයත්
වකුගඩුවක් අවශ්‍යව ඇත. පරිත්‍යාගශීලියෙකු
සිටියි නම් කරුණාකර සම්බන්ධ වන්න.

1708fishfinder@gmail.com
FAX : 011 2565300

**නිමා නොවන දඹදිව වන්දනා**

ඔබ තුල පවතින බුද්ධ සද්ධාව, බුදුන් වහන්සේ පහල වු දඹදිව් තලය දැක බලා, වන්දනා කර ගැනීමේ සිතෙහි උපන් අවිහිංසක බලාපොරොත්තුවෙන්... පැතිරීගිය කොරෝනා වෛරසය මත කෙටි කළකට දුරස්වීමට සිදු වුවද, එදවස විශාල මහනුවරදී ඇතිවු මෙවැනිම විනාෂයක් බුද්ධානු භාවයෙන්, බුදුන් වහන්සේ දේශණා කළ මහා රතන සුත්‍ර දේශණාවෙහි බලයෙන් සුව වු ආකාරයෙන්ම මෙදවසද සියළු ලෝ සතුන් සුවපත් වේවා. විනාෂකාරි වෛරසය ලොවෙන් දුරු වේවා !!!

**සියල්ල යහපත් වූ කළ**

නැවත මේ පිංබිම වෙත ඔබව සද්ධාවෙන් රැගෙන යාම සඳහා "බුද්ධ ශාසන අමාත්‍යාශයේ" ලියාපදිංචි අවසරය ලද සංවිධාන, ආයතන සහ එම මහත්ම මහත්මීන් සැදැහැ සිතින් සුදානමින් සිටී.



ධම්මික ප්‍රේමසිංහ

ටෙම්පල් ටුවර්ස් දම්සක් උදාන
19/A/1/1, දෙහිවල පාර, පැපිලියාන
134, දුටුගැමුණු වීදිය, කළුබෝවිල.
0763 188 834 / 0753 709 709 / 0723 461 102

බුද්ධශාසන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදෙස් බෞද්ධ වන්දනාකරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා ජනරජයේ බස්නාහිර පලාත් සභාවෙහි වන්දනා සංචාරක ආයතනයක් වශයෙන් ලියාපදිංචි ආයතනයකි

**ලුම්බිණි**
රෙ:නො: W5510



වෙනත් ශාඛා නොමැත.

විශ්වාසවත්, පිරිසිදුවත්,
විනයානුකූලවත්, අටපිරිකරක්
ලබා ගැනීමට ලුම්බිණි
වෙළඳසැල වෙතම යන්න.

*අටපිරිකර සහ පූජා භාණ්ඩ ප්‍රමුඛයෝ*

**ලුම්බිණි**
ස්ටෝර්ස්
65, ඕල්කට් මාවත, පිටකොටුව
දුරකථනය: 2324814

## 01. පින් පව් කුසල් අකුසල් කියන්නේ මොනවාද?

## 02. පින් පව් කුසල් අකුසල් කරන්නේ කෙසේද?

**03. පි**න් කියන්නේ කයෙන් කරන යහපත් ක්‍රියා හා වචනින් පවසන යහපත් හොඳ වචන. **04. ප**ව් කියන්නේ කයෙන් කරන අයහපත් නරක ක්‍රියා සහ වචනින් පවසන නපුරු අයහපත් වචන. **05. කු**සල් කියන්නේ සිතින් සිතන යහපත් හොඳ සිතිවිලි වන කරුණාව, මෛත්‍රිය, දයාව, පරාර්ථකාමී සිතිවිලි. **06. අ**කුසල් කියන්නේ සිතින් සිතන නරක අයහපත් සිතිවිලි වන තණ්හා, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, වෛර, අත්මාර්ථකාමී වැනි සිතිවිලි. **07. ක**යට හා වචනයට කරුණාව, මෛත්‍රිය, දයාව, පරාර්ථකාමී සිතිවිලි ඇති කර ගැනීමට නොහැකි බැවින් කයට හා වචනයට කුසල් කිරීමට නොහැකිය. **08. ක**යට හා වචනයට තණ්හා, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, වෛර, ආත්මාර්ථකාමී සිතිවිලි ඇතිකර ගැනීමට නොහැකි බැවින් කයට හා වචනයට අකුසල් කිරීමට නොහැකිය. **09. සි**තින් සතෙකුට කන්න දෙන්න හෝ කෙනෙකුට යහපත් වචනයකින් උපදෙසක් වැනි දෙයක් කරන්න බැරි බැවින් සිතට පින් කිරීමට නොහැකිය. **10. සි**තින් කෙනෙකුට ගහන්න බණින්න වැනි නරක දෙයක් කරන්න බැරි බැවින් සිතින් පව් කිරීමට නොහැකිය. **11. සි**තට තනියෙන් කුසල් අකුසල් කිරීමට හැකියාව ඇතත් කයට හා වචනයට සිතේ ආධාර නැතුව පින් පව් කිරීමට නොහැකිය. **12. කෙ**නෙකුට යමක් දෙන්න හෝ බණින්න හෝ පළමුව සිතින් සිතිය යුතුය. **13. සි**තින් සිතන විට චේතනාවක් ඇති වේ. **14. එ**ම චේතනාව ක්‍රියාත්මක කළ යුත්තේ කය හෝ වචනයෙන් යමක් දීම, කයින් ක්‍රියාත්මක කරන විට පිනකුත් බණින විට පවකුත් සිදුවේ. **15. එ**සේම යමක් දීමට සිතීමේ දී සිතින් සිතීම නිසා කුසලයකුත් ඇති වේ. **16. බැ**ණීමට සිතින් සිතීම නිසා අකුසලයකුත් ඇති වේ.

**එන්න මේ දහම පරීක්ෂා කරන්න. බුදුරජාණන් වහන්සේ දේශනා කළ අකුසල් පරීක්ෂාකර බලන්න. ඔබට තද කෝපයක් ඇතිවන විට දී ඔබගේ හද ගැස්ම වැඩිවේ. එවිට රුධිර සංසරණ වේගය වැඩිවීම හේතු කොට ගෙන පෙණහලු මගින් රුධිරයට ලැබෙන ඔක්සිජන් අවශ්‍ය ප්‍රමාණය උරා ගැනීමට ඉඩක් නොලැබෙන විට රුධිරයේ ඔක්සිජන් ප්‍රමාණය අඩු වී කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය වැඩි වේ. වැඩි කාබන්ඩයොක්සයිඩ් රෝම කූප මගින් පිට කිරීමේ දී කැසීම ඇති වේ. කැසීමේ දී ඇතිවන තුවාල මත කාබන්ඩයොක්සයිඩ් තැවරීමෙන් දද, කුෂ්ඨ, මෙන්ම පිළිකා ඇති වීමට හේතු වේ. අධික වේගයකින් රුධිරය ගලායාමේ දී රුධිර නාළ පළල් වීමේ දී ඒ දෙපස ඇති සෛල තෙරපී හිසකැක්කුම, වෙව්ලීම, වේදනා ඇති වේ. ආහාර දිරවීමට අවශ්‍ය යුෂ නිපදවීමට රුධිරය නොලැබීම හේතු කොට ආහාර අජීර්ණය, උදරාබාධ, මලබද්ධය වැනි රෝග ඇති වීමට ද හේතු වේ. තරහ යනු අකුසලයක්, එම අකුසලය එවලේම ඔබ අත්දකිනවා. වෙනත් ආගම්වල විපාක අත්දකින්නේ මරණින් පසු දිව්‍ය ලෝකවලට, ස්වර්ගයට හෝ අපායට යාමෙන් පසුවයි. එය ද විශ්වාසය හා භක්තිය නිසා වන අතර එය කවදාවත් කිසිම කෙනෙක් අත්දැකපු බවක් නැත. බුදු දහමේ, කුසල් අකුසල්වල විපාක අත්දැකීමට, අත්විඳීමට මැරෙන තෙක් සිටිය යුතු නැත. තමුන් කළ කුසල් අකුසල්වල විපාක එකෙණෙහිම අත්දකිනු, අත්විඳිනු ඇත.**

පින් වලින් දිව්‍ය සැප සම්පත්, ස්වර්ග, සම්පත්, වාසනාව, සැප සතුට හා සසර දික් වීම ද වේ. පව් වලින් දුක, කණගාටුව, අවාසනාව, අපාගත වීම, දුක් ලැබීම. සිතේ ඇතිවන කුසල් වලින් සිතේ සතුට, ලේ පිරිසිදු වීම, මුහුණ පැහැපත් වීම හා නිවන් මඟ පෑදීම ද අකුසල් වලින් සිතේ කනස්සල්ල, දුක, කණගාටුව ඇතිවේ. නිවන් මඟ ආවරණය වේ.

**යහපත් දෙයක් කරන විට, උදව්වක් කරන විට, ගීතිකාවක් අහන විට - ගායනා කරන විට, ඔරුසන් කියන විට යාඥා කරන විට, කන්නලව් කරන විට, බජන් ගී ගයන විට, පුද පූජා පවත්වන විට, තම ආගමේ හොඳ දේශනාවකට බණකට, පිරිතකට සවන් දෙන විට සිතේ සතුට ඇති වෙනවා. සතුට ඇතිවීමෙන් ලේ පිරිසිදු වෙනවා. මුහුණ පැහැපත් වෙනවා. අතීතේ අයත් මෙවැනි යහපත් දේ කරන විට ඒවායින් සිතේ සතුට ඇති වන බව අත්දැක්ක, වර්තමානයේ අපිත් අත්දකිනවා - අත්විඳිනවා, අනාගතේ අයත් අත්දකිනවා. මේවා සිතේ ඇතිවන යහපත් සිතිවිලි වන කුසල් බව බොහෝ දෙනෙක් දන්නේ නැහැ.**

**යම් කෙනෙකුට යහපතක් උදව්වක් කළ විට තමුන්ගේ සිත සතුටු වෙනවා. වෛද්‍යවරුන් පවසන්නේ සිතේ සතුට ඇතිවීම නිසා ශරීරය තුළ එන්ඩොෆින් නමැති හෝමෝනය වැඩියෙන් ස්‍රාවය වන බවයි. එවිට එම හෝමෝනය මගින් ශරීරයේ ප්‍රධාන අවයවවල සහ පද්ධතිවල නිසි ක්‍රියාකාරීත්වය ඇතිකර මානසික ආතතිය සංසිඳුවන අතර වේදනාව ද දුරු කර නීරෝගිභාවය ඇති කරනවා. සතුටක දී සිරුරට වන දේ වෛද්‍යවරු දැනගත්තත් සිතේ ඇති වූ කුසල් සිත් ඇති වීම නිසා එසේ ඇති වන බව වෛද්‍යවරු දන්නේ නැත.**

පින් පව්, කුසල් අකුසල්වල විස්තර ඇතුළත් පිටු 8ක දහම් පත්‍රිකා පනහක් රුː 250/-, සියයක් රුː 450/- ක් ද, පිටු 4ක දහම් පත්‍රිකා පනහක් රුː 150/-, සියයක් රුː 250/- ලබා ගත හැක.

*පාඨකයාට යහපතක් කිරීමේ අරමුණින් ලේඛක ලේඛිකාවන්ට පොත් මුද්‍රණය කර දීමට අවශ්‍ය මුදල් උපයාගැනීමේ අරමුණ ඇතිව නවකතා, කෙටිකතා, කාව්‍ය, පාසල් විෂය පොත්වී සාහිත්‍ය, විද්‍යා, ඉතිහාසය, පර්යේෂණ, විවිධ විෂයයන් යටතේ ලියැවුණු විශාල පොත් ප්‍රමාණයක් 40% - 90% ට ද, අලුත්ම පොත් 30% අගෝස්තු 1 සිට සැප්තැම්බර් 31 දක්වා හිතේ හැටියට පොත් තෝරා ගන්න.*

ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කරන ලද සරල සිංහල ත්‍රිපිටක පොත් සඳහා 25% වට්ටමක්

සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
(මරදාන පාර) පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10. දුරකතනː (011) 2685369, 2686925

# කාමයන්හි ආදීනව

**උපන් මිනිසා ඇලුම් කරන, සොයා යන අඹු සැමියන්, දූ දරුවන්, වස්ත්‍රාභරණ, ආහාරපාන, ගේ දෙර, වතු කුඹුරු, නෑ හිත මිතුරන්, යාන වාහන, නැටුම් ගැයුම් වැයුම්, අනේකවිධ පරිභෝග භාණ්ඩ, මිල මුදල්, රන් රිදී, මැණික් මුතු, කෙළි සෙල්ලම් ආදියට 'කාමය'යැයි කියනු ලැබේ.**



බෙලිහුල්ඔය සීලසමාහිත යෝගාශ්‍රමවාසී
ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද
අභිධර්මය පිළිබඳ කථිකාචාර්ය
ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත
**බලංගොඩ රාධ හිමි**

ඒවායින් ලැබෙන සැප වේදනාව කාමයෙහි ආස්වාදය යි. ඒවා හේතු කරගෙන උපදින දුක් වේදනාව කාමයෙහි ආදීනවය යි. කාම වස්තූන් පිළිබඳ වූ ඡන්දරාගය දුරු කර දැමීම කාමයෙන් වෙන් වීම හෙවත් නිස්සරණය යි. ඉහත කී සියල්ල 'වස්තු කාමය' වන අතර එමගින් සිතේ ඇති වන රාගාදී ක්ලේශයන් 'කිලෙස කාමය' නම් වේ. ඒ දෙකින් ප්‍රහාණය කිරීමට අසීරු වන්නේ කිලේස කාමය යි. එකී කාමයන් රූප–ශබ්ද–ගන්ධ–රස–පොට්ඨබ්බ යන පස් ආකාරයෙන් ජීවිතය හා සම්බන්ධ වීමේ දී 'පංචකාමය' ලෙස හඳුන්වනු ලැබේ.

කාමයන්ගේ ආස්වාදය බෙලි ගෙඩියක් පමණ වේ නම් එහි ආදීනව මහ පොළොව හා සමාන වේ. හැම අතින්ම කාමයන් දුරු කර දමා, තපෝ වනයට වැඩමකොට,කාම විරාගී විදසුන් භාවනාවෙන් ලොව්තුරා බුද්ධ රාජ්‍යයට වැඩම කළ අප මහා ගෞතම බුදුරජාණන් වහන්සේ කාමයන් පිළිබඳ වීතරාගී වන සේක. වීතදෝසී–වීතමෝහී වන සේක. ඒ බුදුරදුන් කාමයෙහි ඇති නපුර උපමා ගණනාවකින් උගන්වා වදාරන ලදී. ගිහි–පැවිදි උදවිය විවිධ දුෂ්ප්‍රතිපත්තීන් හි තියැළෙන්නේ කාමයන්ට වසඟ වීමෙන් බව දැක වදාළ බුදුරජාණන් වහන්සේ, පැවිද්දෙකු විසින් කාමයන් සොයා යෑම කිසි සේත් අනුමත නො කළහ.

## අට්ඨිකංකලූපමා කාමා – කාමයෝ ලේ මස් නැති ඇට කැබැල්ලක් බඳු වෙති.

කුසගින්නේ ඇවෙන සුනඛයෙකුට මස් ලේ නැති ඇට කැබැල්ලක් හමුවූ විට එය සපන්නට පටන් ගනියි. එය කොතෙක් සැපුව ද උගේ කුස නො පිරේ. තවත් වෙහෙසට පත් වී කුසගින්න උත්සන්න වේ. එලෙසින් කාම පිපාසයෙන් යුතුව කාම වස්තූන් සොයා යන පුද්ගලයාට කොතෙකුත් වස්තු, ආහරණ කෑම බීම ආදිය ලැබුණත් සෑහීමක් ඇති නොවේ. කාමයන් විඳින විට තව තවත් එකී ආශාව වැඩි වන අතර පිපාසයට ලුණුදිය බීමක් හා සම වේ. සුනඛයාට ඇට කැබැල්ලෙන් ලැබෙන ප්‍රයෝජනයක් නැතත් එහි ඇති කුණු රසයට වසඟ වී මහත් වෙහෙසකට පත්වන බව ඌ නොදන්නාක් මෙන් මිදිය, තවත් ඕනෑ ය, මගේ ය යන හැඟීමෙන් යුතුව කාමයන් සොයන පුද්ගලයා කිසිදාක තෘප්තියක් නො ලැබම මරු මුවට පත්වන නිසා, බුදුරජාණන් වහන්සේ කාමයන් ලේ මස් නැති ඇට කැබැල්ලකට උපමා කළහ.

## මංසපේසූපමා කාමා – කාමයෝ මස් වැදැල්ලක් බඳු වෙති.

මාංශ භක්ෂක පක්ෂියෙකු විසින් තම තුඩගින් මස් වැදැල්ලක් ගෙන පියඹා යන විට එය දක්නා අන් පක්ෂීන් එය අතහරින තුරු ඌට ලුහුබඳිමින් කොටනු ලැබේ. ඌ එය අත්හළ විට අන් පක්ෂියෙකු එය ඩැහැ ගනියි නම් ඌට ද එසේම කොටනු ලැබේ. එකී මස් වැදැල්ල ඔවුන් සියලු දෙනාම බලාපොරොත්තු වීම ඊට හේතුව යි. එලෙසින්ම මිනිස් ලොව වෙසෙන්නන් රැස්කොට ගෙන ඇති කාමයන් අවස්ථාවක් ලද විට පැහැර ගැනීමේ බලාපොරොත්තුවෙන් වෙසෙන්නෝ බොහෝ වෙති. එබැවින් වස්තු හිමියාට ඒවා රැක ගැනීම හේතුවෙන් අධික පීඩාවකට පත්වන්නට සිදු වේ. ඊර්ෂ්‍යාකාරයන් බහුල වේ. සොර සතුරන් ඇති වේ. ඇතැම්විට ධනය නිසා අකාලයේ මැරුම් කන්නට ද සිදු වන බව ප්‍රසිද්ධ කරුණකි. සියල්ල දත් බුදුරදුන්, කාමයන් මාංශ පේශියකට උපමා කොට වදාළේ ඒ නිසාවෙනි.

## තිණුක්කූපමා කාමා – කාමයෝ තණසුලක් බඳු වෙති.

ගිනි ඇවිළෙන තණ කරලක් අතින් ගත්තහුට එය අත් නො හළොත් අත දැවී යනු ඇත. එසේම වස්තුව රැස් කරගෙන සිටින්නාට ඒවා අත් නො හැරීම තුළ අධිකතර කායික මානසික වෙහෙසක් ඇති වේ. කෙතරම් ආරක්ෂා කරන්නට උත්සහ කළත් වස්තු විනාශයෙන් හෝ තම මරණයෙන් හෝ අහිමි වන කාමයන් අවබෝධයෙන් අත් නො හළ හොත් ඔහුගේ හදවත දැවී යනු ඇත. තණසුල අත් නො හළ පුද්ගලයාගේ අත දැවෙන්නාක් බඳුව එකී කාමයන් අල්ලා ගැනීමෙන් වන දාහය නිසා වස්තු හිමියා අධික ව පෙළෙන බව දුටු බුදුරජාණන් වහන්සේ, කාමයෝ අතින් ගත් තණ කරලක් මෙනැ යි වදාළහ.

## අංගාරකාසූපමා කාමා – කාමයෝ ගිනි අඟුරු වලක් බඳු වෙති.

දුම්–ගිනිදලු නැති ගිනි අඟුරු වලකට වැටුණ පුද්ගලයෙකුට වන්නා වූ දාහය අමුතුවෙන් කිව යුතු නොවේ. එමගින් ඔහු දැවී කරවී යනු ඇත. මේ කාමයන් හේතුවෙන් ඇතිවන දැඩි ආශාවත් එබඳු වූ ම උෂ්ණයකි. තමා සොයන කාමය නො ලැබෙන විට ඇතැමුන් තම දිවි නසා මියැදෙන්නේ ද එකී කාම රශ්මිය හේතුවෙනි. එය දත් බුදුරජාණන් වහන්සේ, කාමයන් ගිනි වළකට උපමා කළහ.

## සුපිනකූපමා කාමා – කාමයෝ සිහිනයක් බඳු වෙති.

සිහිනයෙන් විඳින දකින කිසි දෙයක් අවදි වූ පසු නොමැත. සිහිනයේ පසුවන මොහොතේ පමණක් සුවයක් ලැබේ. එසේම මෙකී කාමයන්ගෙන් ලැබෙන සුවය මොහොතකට සීමා වේ. බොහෝ වෙහෙසී කාම වස්තූන් ළං කොට ගත් පුද්ගලයා එමගින් මොහොතක් සුව ලබයි. අතීතයේ ද අනාගතයේ ද එපරිදිම අල්ප සුවයක් ඒ මොහොතට පමණක් ලැබේ. පෙර භවයන් හි විඳි, කම්සුව දැන් නොමැත. රැස් කළ ධනය රැකගත් අඹුවන්, දූ දරුවන්, තනතුරු අතුරුදන් වී ඇත. දැන් රක්නා දේ ද සිහිනයක් බඳුව අහිමි වී යන නිසා කාම සුවය තාවකාලික බව බුදුහු වදාළහ.

## යාචිතකූපමා කාමා – කාමයෝ තාවකාලික ව ඉල්ලාගත් දෑ බඳු වෙති.

තාවකාලික පදනමක පිහිටා වාහන, ගේ දෙර, ඇඳුම්, ආභරණ ඉල්ලා ගත් පුද්ගලයා ඒවා පරිහරණය කරන මොහොතේ වස්තු හිමියෙකු සේ පෙනේ. එහෙත් අයිතිකරු ඉල්ලූ විට දිය යුතු ය. අප භුක්ති විඳින කාමයන් ද එසේම තාවකාලික වන නිසා, දින ගණනින් අත් හළ යුතු වන නිසා ඉල්ලා ගත් දේවල් හා සම වේ යැයි වදාළහ.

## රුක්ඛඵලූපමා කාමා – කාමයෝ ගෙඩි ඇති ගසක් බඳු වෙති.

ඉදුණු ගෙඩි ඇති ගසකට නැගී පුද්ගලයා ඵල රස විඳිමින් සිටින විට ගස් නැගීමට නො දත් අන් අයෙකු පැමිණ ගෙඩි කෑමේ ආශාවෙන් ගස සිඳියි නම් ගසේ සිටින්නා වහාම බැසිය යුතු ය. නො බටහොත් වැටී මැරී යනු ඇත. අත් පා හෝ සිඳී යනු ඇත. එපරිදිම කාම වස්තූන් බදා සිටින්නා ඒවා අත් නො හැර සිටී නම් මරණය හෝ මරණය සමාන දුක් විපත් වලට පත්වන බව දත් බුදුරජාණන් වහන්සේ, කාමයන් පල දරන ගසක් මෙනැ යි වදාළහ.

## අසිසිනූපමා කාමා – කාමයෝ මස් කපන කඩුව හා කොටය බඳු වෙති.

කොටයේ තබා කඩුවෙන් ගැසීමෙන් මස් වැදලි කැපී ඉරී යන්නේ ය. එසේම කාමයන් හේතුවෙන් ඈනකොටා ගන්නා උදවිය ඇනීම්, කෙටීම්, සිඳීම්, තැලීම්, මැරීම් වලට පත්වන බව ප්‍රකට කරුණකි. ලොව ඇති වන තාක් යුද ගැටුම් අරගල ඇති වන්නේ කාමයන් හේතුවෙනි. ඒ බව මනාව දත් බුදුරජාණන් වහන්සේ,කාමයෝ මස් කපන කඩුවට හා කොටයට උපමා කොට පෙන්වා වදාළහ.

## සත්තිසූලූපමා කාමා – කාමයෝ පිහි උලක් බඳු වෙති.

පිහියක හෝ කිනිස්සක උලකින් හිස හෝ ශරීරය සිදුරු කරන විට ඇතිවන වේදනාව නිසා මළ මූ පිටවී යන්නේ ය. එය ඒ තරම් බිහිසුණු ය. මේ කාමයෝ ද එලෙසින්ම සත්වයන්ගේ සිත් සිදුරු කොට පීඩාව ඇති කරයි. අවුරුදු ගණන් පවතින රිදීම් ඇති කරයි. එම පීඩාවෙන් ගැළවීමට කොතෙක් උත්සහ කළත් නො හැකි වන අවස්ථා බහුල වේ. කාම වස්තුව බැඳී ගිය සිතකට කිසිම නිදහසක් නොමැත. යටත් පිරිසයින් සුවදායක නින්දක් හෝ නො ලැබේ. කල්පනාවට වැටී ගත පවා වියළවන ස්වභාවයක් කාමයන් හි පවතින බව දත් තථාගතයන් වහන්සේ, පිහි උලක් බදු කාමයන් ගැන ඇති බැඳීම සිඳ දැමූහ. කාමයන්ගෙන් මිදී යාම පිණිස ලොවට දම් දෙසූහ.

මෙම ලිපියේ ඉතිරි කොටස තිකිණි අව අටවක (11) පෝ ද පත්‍රයේ පළ වේ.



## අඩු මිලට බෙඩ් ෂීට්

ලස්සන ඩිසයින් වලින් ඩබල් බෙඩ් ෂීට් අපේ මිල රු.290/-යි වෙළඳපළේ මිල රු.600/-යි, ඩබල් බෙඩ් ෂීට් කොට්ට උර දෙක සමඟ අපේ මිල රු.390/-යි වෙළඳපළේ මිල රු.800/-යි, ට්‍රිපල් බෙඩ් ෂීට් කොට්ට උර දෙක සමඟ අපේ මිල රු.490/-යි වෙළඳපළ මිල රු.950/-යි, තවත් බෙඩ් ෂීට් වර්ග 70ක්, තුවා, ලේන්සු, සරොන්, නයිට්ඩ්‍රස්, පාසල් ළමුන්ගේ මේස් රු.40/-, Cotton මේස් රු.90/-, සර්වියට් රු.30/- සිට, කොට්ට රු.350/- සිට, මෙට්ට කවර 3x6- රු.490/-, 4x6-රු.590/-, 5x6-රු.690/-, 6x6-රු.790/-, තොග මිලට ලබා ගත හැක

සැම්රිච්චා ක්ලෝතින් අවුට්ලට් ගුරුගේ නේචර් පාර්ක් අසල, ජා-ඇල.

**0771 964 341 / 0117 902 278**

## වැඩිහිටි කාන්තාවන් සඳහා නේවාසික පහසුකම්

**විශ්‍රාමික කාන්තාවන් සඳහා නේවාසික කාමර පහසුකම් කවුරුත් නැති තනි වූ වැඩිහිටි කාන්තාවන්ටද නේවාසික පහසුකම් ඇත.**

**රජයේ ලියාපදිංචි කාන්තා වැඩිහිටි නිවාසයකි.**

**ගමන් සෙවන කාන්තා වැඩිහිටි නිවාසය, කුරගොඩ. ගල්පාත, කළුතර - 0766233659**

## විවිධ දුෂ්කරතා සහිත කුඩා පන්සල් දෙකකට සහ බෞද්ධ පවුල් දෙකකට

මාසිකව නොකඩවා මුදල් පරිත්‍යාගයක් ලබාදීමට අදහස් කරමි.

**0705530249**

## ජීවත් වීමට මිස රජ වීමට නොවේ

වෙහෙර විහාර බුදුපිළිම දේව ප්‍රතිමා විහාර සිතුවම් අසූ මහා ශ්‍රාවක ප්‍රතිමා සියලුම කලා නිර්මාණ ඉතාම සාධාරණ මිලට නිමකර දෙමි.

**0763195173**

**ආරණ්‍යවාසයට සුදුසු කුඩා ඉඩමක් හෝ ස්ථානයක් සිල්වත්, ගුණවත් භික්ෂූන් වහන්සේ නමකට අවශ්‍යව ඇත.**

මහලු දෙමව්පියන් පෝෂණය කිරීමේ වගකීම පැවරී ඇති මේ උතුම් භික්ෂූන් වහන්සේ රැකගැනීමට උපකාර කරමු. දෙමාපියන්ද චීවරයද යන උතුම් අංග දෙකම රැකගැනීමේ අතිශය උදාර කටයුත්තට උරදෙමු.

**076-0313236**

## පිංවතුනි

**අප විහාරස්ථානයේ ඉදිවෙමින් පවතින දාන ශාලාවේ ඉතිරි වැඩ නිම කරවා ගැනීම සඳහා**

සිමෙන්ති කොට්ට 60 ක් පමණ හා තීන්ත අවශ්‍යව පවතින බැවින් හැකි අයුරින් උපකාර කරන්න.

**මෙයට, විහාරාධිපති හිමි.**

**077-3763779, 078-3628979**

## කළමනාකරුවෙකු අවශ්‍යයි

**ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති ආරණ්‍ය සේනාසනයකට නේවාසික කළමනාකරුවකු අවශ්‍යයි. වැටුප් සහිතයි.**

**සුදුසුකම් :**

1. වයස අවුරුදු 50 - 60
2. පවුල් බැරින් තොර
3. විදුහල්පති/ ගුරු සේවයේ හෝ ඊට සමාන සේවාවක පළපුරුද්ද.
4. ගිණුම් තැබීමේ හැකියාව
5. පරිගණක සාක්ෂරතාව

හැඳුනුම්පතෙහි සහ ග්‍රාම සේවා සහතිකයේ කොපි සමග අයදුම්පත යොමු කරන්න.

BOX NO - BDC 10017
බුදුසරණ බාරේ,
ලේක්හවුස්, කොළඹ - 10.

## අසරණ වැඩිහිටියන් සඳහා නවාතැනක්

**හැට වසර ඉක්මවූ සමාජයේ අසරණ වූ ඔබහට ජීවිතාන්තය දක්වා නිදහසේ ජීවත් වීමට අගනා වැඩිහිටි නිවාසයක් ඇත.**

සියල්ලම නොමිලේ සැපයේ. ඇතුළත්වීමේ ගාස්තු නොමැත. නිරෝගී අය පමණක් පැමිණ හෝ ලිපියකින් විමසන්න.

**පාලක ලේකම්, සමරසිංහ වැඩිහිටි නිවාසය, පියදිගම, ගිංතොට, ගාල්ල.**

## අනුරාධපුර පූජා නගරය තුළ පිහිටි සුළු විශ්‍රාමශාලාවකට පරිපාලනය කිරීමට මත්පැන් හා දුම්වැටියෙන් තොර දැහැමි විශ්‍රාමික මහත්මයෙක් උවමනාකර තිබේ.

**විස්තර සහිතව ඉක්මණින්. 2654071**

ගරු සභාපති, W.W.S. මෙන්ඩිස් මයා,
නො. 3, "සඳකැළුම්", ගුණවර්ධනාරාම මාවත,
කොරළවැල්ල, මොරටුව.

## රුවන්වැලි මහා සෑ රදුන් අභියස

**කිරි ආහාර පූජාව සහිත මහා කප්රුක් පූජාව සහ පැවිදි කිරීමේ මහා පිංකම. පැවිදි කිරීමට කැමති කුල දරුවන් වැඩිහිටියන් මගින් විමසන්න.**

**0773159448**

## ධර්ම දානමය පිංකමක්

**පොත් පූජා කිරීමට කැමති පින්වතුන්ට මහඟු අවස්ථාවක්**

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ කට්ටලයක් පැරණි හෝ අලුත් පොත්වලින් පූජා කිරීමට සහ ඌව වංශකථාව i - ii කොටස් දෙකම පූජා කිරීමට සහ සිංහල විශ්වකෝෂ කට්ටලයක් පූජා කිරීමට සහ තමන් සතු පුස්තකාලයක් සම්පූර්ණයෙන්ම පූජා කිරීමට කැමැති නම් පහත අංක වලට අමතා විමසීමක් කරන ලෙස ඉල්ලා සිටිමි.

**දුරකථන අංක : 071-0965814, 070-2333186**

## මහගෙදර වැඩිහිටි නිවාසය

**වැඩිහිටියන් රැකබලා ගන්නට මධ්‍යස්ථානයක් සඳහා නිවසක්, ගොඩනැගිල්ලක්, විශ්‍රාමශාලාවක්, ලැගුම්හලක් හෝ ආරාමයක් සහ ගිලන් ඇඳන්, රෝද පුටු ආදී උපකරණ පරිත්‍යාග කළ හැකි පින්වතුන් අපගේ කළමනාකරු අමතන්න.**

**නිශාන්ත මහතා**

**077-1914797**

## වකුගඩුවක් අවශ්‍යයි

වකුගඩු රෝගියෙකු සඳහා

**$O^{+}$ වර්ගයේ හෝ O- වර්ගයේ වකුගඩුවක්**

වයස 30-60 අතර අයෙකුගෙන් ඉක්මණින් අවශ්‍යව ඇත.

**අමතන්න : 076-9934605**

## දිවා රෑ පින් වැඩෙන පින්කමක්

ආරණ්‍යවාසී පින්වත් ස්වාමීන් වහන්සේලාට සුවසේ බණ භාවනා කිරීමටත්, ධර්ම ප්‍රචාරය සඳහාත් සුදුසු ආරණ්‍ය සේනාසනයක් ඉදිකිරීමට අවශ්‍ය වේ. කොළඹ හෝ ගම්පහ දිස්ත්‍රික්ක තුළ අක්කරයක පමණ බිම් කොටසක් පරිත්‍යාග කොට දිවා රෑ පින් වැඩෙන උතුම් පින්කමක හිමිකරුවකු වන්න.

තෙරුවන් සරණයි !

**විමසීම් : 076-0346033**

## සසුන් ගතවීමට ආරාධනා!

නිහඬ පරිසරයක පිහිටි පහසුකම් සහිත භික්ෂුණී ආරාමයකට සමථ හා විපස්සනා භාවනා වඩමින් සසුන් ගත වීමට කැමති වයස අවු 35-45 අතර කාන්තාවන්ට ආරාධනා...!

**විමසීම් - 077 3099133**

## සිත නිවන බණ කතා

**දෙවන මුද්‍රණය පිටඋනා !**

ප්‍රවීන චිත්‍ර ශිල්පී සාමවිනිසුරු කලා භූෂණ රාජ්‍ය සම්මාන හිමි

**වස්කඩුවේ මහින්ද සාගරගේ**

ප්‍රකාශනයකි

**(NSB හිටපු චිත්‍ර ශිල්පී)**

**බෞද්ධ දෙමාපියණි ! තම දුවා දරුවන්ට තිළිණ කළ යුතු අගනා කෘතියකි !**

**වැඩිහිටි සැමට විශේෂයි !**

**බුදුන් වහන්සේ දේශනා කළ ජාතක කතා චරිත කතා 26 ක් පිටු 58 ක් පුරා සිතුවම් කතා මගින් ... දශීනීය මුද්‍රණය !**

**පිටපත් ඉතා සීමිත ප්‍රමාණයකි. ඔබේ පිටපත දැන්ම ඇනවුම් කරන්න.**

පිටපතක මිල රු. 200/=
පාර්සල් තැපැල් ගාස්තු රු. 100/=


රු. 300/= මුදල් ඇනවුමක් සමග ගෙවන කාර්යාලය – වස්කඩුව ලෙස සඳහන් කර පහත ලිපිනයට යොමු කරන්න.

චිත්‍ර ශිල්පී – වස්කඩුවේ මහින්ද සාගර
කුඩා වස්කඩුව – වස්කඩුව

**විමසීම් : 034-2227331 / 0786343770**

# අමරණීය වූ ගෞරවනීය නාමය

# බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහා නාහිමිපාණන් වහන්සේ





බළංගොඩ ශ්‍රී ධර්මානන්ද පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහා නා හිමි**

"ඉති අහම්ධදනාදීවසා අප්පමත්තෝ
සතත මනුසරන්තෝ බෝධි සත්තේ ගතීතේ
පරහිත නිරතත්තෝ පාරමී පූරයිත්වා
විජිය සකලමාරේ බුද්ධභාවං ලභෙය්‍යං"

මෙම ගාථාව අප ගුරුදේව අග්ගමහා පණ්ඩිත, බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙයාභිධාන මහා නායක මාහිමිපාණන් වහන්සේ විසින් ලියන ලද "බෝධිසත්ව ප්‍රාර්ථනා" නැමැති ග්‍රන්ථයෙන් උපුටා ගන්නා ලද්දකි.

නිරතුරුව අතීත බෝසතාණන් වහන්සේලා අනුගමනය කරමින්, අනුන්ගේ හිතසුව පිණිස කටයුතු කරමින්, බුද්ධත්වය සඳහා අවශ්‍ය දනාදී පාරමී ධර්මයන් සම්පූර්ණ කර අනාගතයෙහි දී සියලු මාරයන් පරාජය කොට බුදු බව ලබම්වා යනු ඉහත සඳහන් ගාථාවෙන් පෙන්නුම් කරන උතුම් ප්‍රාර්ථනාව යි.

තමන් වහන්සේ විසින් ම රචිත බෝධිසත්ව ප්‍රාර්ථනා නැමැති ග්‍රන්ථය තුළින් මුළුමණින් ම පෙන්නුම් කර ඇත්තේ බුද්ධත්වය සඳහ අවශ්‍ය පිළිපැදිය යුතු පූජනීය ,උතුම් ගුණාංග සමුදායකි.

මහනාහිමියන්ගේ මුළු චරිතාපදානයම ඒ උතුම් බුද්ධත්වය අරමුණු කරගත් ප්‍රතිපත්ති සමුදායකින් අලංකෘත වූ බව ඒ ශ්‍රේෂ්ඨ චරිතය ඇසුරු කළ අධ්‍යයනය කළ හැම දෙනාටම ප්‍රත්‍යක්ෂ කරුණක් වනු ඇත.

මේ නිසාම මේ උතුම් චරිතය වන්දනීයය, පූජනීය ය. මුන් වහන්සේ සීල තේජසින් බැබළුණ හ. ගුණ තේජසින් බැබළුණහ. ප්‍රඥා තේජසින් බැබළුණහ.ධර්ම තේජසින් බැබළුණහ. පුණ්‍ය තේජසින් බැබළුණහ.

සතියෙන් හා ප්‍රඥාවෙන් යුක්ත ව පරහිතකාමී ව මුළු ජීවිතය ම කැපකළ ශ්‍රේෂ 'ඨ යතිවරයෙකි. මේ උදාර බෝසත් චරිතය අධ්‍යයනය වර්තමාන සමාජයට මහත් ආලෝකයකි.

මහනාහිමියන්ගේ උදාර මෙහෙය තුළ ජාති, ආගම්, වර්ණ, කුල, උගත් නූගත්, දුප්පත්, පොහොසත්, ලොකු කුඩා වැනි කිසිදු ප්‍රභේදයක් දක්නට නොලැබිණි. සීලයෙන් සංයුත වූ මහනාහිමි භික්ෂුවක් තුළ තිබිය යුතු උදාර ගුණ සමුදායෙන් සෝභමානවත් වූහ. නමුත් ඒ සිල්වත් බව අන් අයට ප්‍රදර්ශනය කරන්නට වත්, ඒ තුළින් ලාභ,ලෝභ, කීර්ති, ප්‍රශංසා ලබන්නටවත් නොසිතූ නොපැතූ මහනාහිමියෝ, අව්‍යාජ , අවංක චරිතාපදානයකින් යුක්ත වූහ. මේ උතුම් බුද්ධ පුත්‍රයාණෝ පරිත්‍යාගශීලීත්වයෙහි ඇලුණු කෙනෙකි. කිසිම දෙයක ඇලීමක් බැඳීමක් නො මැතිව පියාපත්වල බර පමණක් උසුලමින් කුඩුව අතහැර යන කුරුල්ලෙකු මෙන් තමන් වහන්සේ වෙත ලැබුණු සියල්ලම අන් අයට පරිත්‍යාග කළහ. පරපුරෙන් තමන් වෙත ලැබුණු ඉඩකඩම් පාසල්වලට, විහාරස්ථානවලට, අහිංසක අසරණ ජීවිතවලට පරිත්‍යාග කළ අයුරු ඒ අනුපාදන චරිතය ප්‍රත්‍යක්ෂව ම අපට පෙන්නුම් කර ඇත. සතා සිවුපාවාට පවා කරුණාවෙන්, මෛත්‍රියෙන් කටයුතු කළ මහනාහිමි මෘදු ගුණයෙන් සෝභමානවත් වූහ. උන්වහන්සේ ආශා කළේ පොතට පමණි. පොත පත කියැවීමෙන් අපමණ සතුටක් වින්දහ. එය උන්වහන්සේ තුළ පැවැති අතෘප්තිකර ආශාවකි.

උන්වහන්සේගේ දැනුම බුදුදහමට පමණක් සීමා නොවිණි. ලෝකයේ සියලුම ආගම් පිළිබඳ ව උන්වහන්සේ ගැඹුරින් හදාරා තිබිණි. විවිධ භාෂා, දර්ශන විද්‍යාව, මනෝ විද්‍යාව, ගණිතය, ඉතිහාසය, සංගීතය, චිත්‍රකලාව, ජ්‍යොතිෂය වැනි විෂයයන් පිළිබඳ ව ගැඹුරින් හදාරා තිබුණි. උන්වහන්සේ කියවා ඇති, උන්වහන්සේගේ පුස්තකාලයේ පැවැති විවිධ විෂයයන් අළලා ලියවී ඇති පොත්පත් දෙස බලන විට මේ තරම් පොත් කන්දරාවක් කියවූයේ කෙසේදැයි අපට සිතාගතවත් නොහැකි ය.

බටහිර උගතුන් සමග බුදුසමය පිළිබඳව කතා කරන විට නවතම විද්‍යාත්මක සොයා ගැනීම් ද ඉදිරිපත් කරමින් සාකච්ඡා පැවැත් වූ අවස්ථා අප බොහෝවිට දැක ඇත.

එංගලන්තයේ වැඩ සිටින විට කතෝලික පූජකයන් පුහුණු කරන ආයතනයක බුදුසමයේ දැක්වෙන පුනර්භවය පිළිබඳ දේශනයක් පවත්වන ලෙස උන්වහන්සේට ආරාධනාවක් ලැබී ඇත. දේශනය අවසන් වූ විට "පුනර්භවය විද්‍යාත්මක ව ඔප්පු කරන්නේ කෙසේද'යි කෙනෙක් ප්‍රශ්න කළහ. එයට පිළිතුරු දෙන මහනාහිමි, ඔහුට මලක් ගැන සිතන්න යැයි කීය. ඔව් මම මලක් ගැන සිතුවෙමියි කීවිට ඔබ සිතූ මලේ නම කුමක්දැයි ඇසී ය. මා සිතුවේ රෝසමලක් යැයි ඔහු පිළිතුරු දුණි. හා ! හොඳයි, ඔබ සිතුවේ රෝස මලක් බව මේ පිරිසට ඔප්පුකර පෙන්වන ලෙස ඉල්ලා සිටියහ. ප්‍රශ්නකරු නිරුත්තර විය. මේ ලෝකයේ සෑම දෙයක්ම විද්‍යාත්මක ව ඔප්පු කරන්න බැහැ. ඔබ එය තේරුම් ගන්නයැයි පිළිතුරු දෙමින් පැරණි බයිබලයේ සමහර කොටස් කටපාඩමින් කියමින් ඒ තුළින්ද කරුණු ඉදිරිපත් කළහ.

එයින් පසු හැමදෙනාම නිහඬව විශ්මයෙන් බලා සිටියහ. විවිධ සාකච්ඡාවලදී උන්වහන්සේ දෙන ලද පිළිතුරු දෙස බලන විට විවිධ විෂයයන් පිළිබඳ ව මොනතරම් දැනුම් සම්භාරයකින් යුක්ත ද යන්න ඉතා පැහැදිලිව ප්‍රදර්ශනය වී ඇත.

තමන්වහන්සේ වෙත ලැබුණු තනතුරු ගෞරව සම්මාන වැනි කිසිම දෙයක් ප්‍රදර්ශන භාණ්ඩයක් කරගන්නට උන්වහන්සේ කටයුතු නොකළහ. වෙනත් බොහෝ අය මෙන් ඒවා භාවිත නොකළහ. ලිපි ලේඛනවල තම නම පමණක් සඳහන් කිරීමට වග බලා ගත්හ. මොනතරම් ප්‍රශ්න ගැටලු පැවිදි සමාජය තුළ සුහදශලී ව ප්‍රියශීලීව අනතිමානී ව කටයුතු කළහ.

සිංහල, පාලි සංස්කෘත, ඉංග්‍රීසි වැනි භාෂාවලින් එම භාෂා ශෛලීන්ට අනුගත ව ඉතාම ව්‍යක්ත ව කතා කිරීමටත්, ලිවීමටත්. තිබූ කුසලතාවය ප්‍රදූම එළවන සුළුය. මීට අමතරව දෙමළ, හින්දි, බුරුම වැනි භාෂාවලින් කතා කිරීමටත්, ලිවීමටත් උන්වහන්සේට හැකියාව තිබිණි. ලැටින්, ග්‍රීක් වැනි භාෂාවන් පිළිබඳව ද උන්වහන්සේට පුළුල් දැනුමක් තිබිණි. කාව්‍ය රචනයෙහි මෙන්ම ගීත නිර්මාණයෙහි ද චිත්‍ර, මූර්ති, කැටයම් ශිල්පයෙහිද උන්වහන්සේ සතු කුසලතාවය පූර්ව ජන්මවලින් ලද දායාදයක් වන්නට ඇතැයි අපට සිතේ. මහනාහිමි ඇඳි චිත්‍ර, ගීත, කාව්‍ය අදත් අප සතුව ඇත. වයස අවුරුදු අනූව ඉක්මවුව ද උන්වහන්සේ සතුව තිබූ පරිගණක දැනුම ඉගෙනීමට වයස බාධාවක් නොකරගත යුතු බවට මහඟු ආදර්ශයකි.

සිත පිළිබඳවත්, සිත තුළ ගොඩනගා ගත හැකි චිත්ත ශක්තිය පිළිබඳවත් පෙර අපර දෙදිග ලියවී ඇති පොත පත කියැවීමෙන් ද, චිත්ත ශක්තිය ගොඩනගාගත් විවිධ ඍෂිවරුන් මුණ ගැසී ඔවුන් හා සාකච්ඡා කර ලැබූ අධ්‍යයනය තුළින්ද චිත්ත ශක්තිය වර්ධනය සඳහා ඔවුන් අනුගමනය කළ ක්‍රියාදමයන් ප්‍රායෝගික ව අත්හදා බැලීම් තුළින් ද, තම ආධ්‍යාත්මික ශක්තිය වර්ධනය කර ඇත. විශේෂයෙන් වායුව, ජලය , පොළොව, ආලෝකය වැනි ස්වභාවික ශක්තීන් හා විශ්ව ශක්ති තමන් තුළට ප්‍රවිෂ්ඨ කර ගැනීම තුළින් ඒ ශක්ති විශේෂ ය. අන්‍යයන්ගේ යහපත හා ශුභ සිද්ධිය වෙනුවෙන් යොදාගත් අවස්ථා අප බොහෝ විට දැක ඇත. නමුත් ඒ ශක්ති විශේෂය අන්‍යයන්ට ප්‍රදර්ශනය කරන්නට උන්වහන්සේ කටයුතු නොකළහ. 1896 අගෝස්තු 24 වන දින උපත ලද මහනාහිමියෝ 1998 ජූලි 18 දින අපවත් වී වදාළහ.

මහනාහිමි අපවත් වී අවුරුදු 22 ක් ගතවුව ද බෞද්ධ අබෞද්ධ හැම දෙනාගේම හදවත් තුළ ජීවමාන ව වැඩ සිටින උතුම් බුද්ධ පුත්‍රයකු ලෙස ආනන්ද මෛත්‍රෙය යන ගෞරවනීය නාමය අමරණීයත්වයට පත්ව ඇත. මේ නිසාම උන්වහන්සේ පිළිබඳව ලියන ලද පොතපත හා ලිපි ලේඛන පාඨකයා කියවන්නේ නොතිත් ආසාවෙනි.

මෙවැනි උදාර චරිතාපදානයකින් පාඨකයාට ගත හැකි දේ බොහෝ ය. බුදුදහම පිළිබඳ නිවැරැදි චින්තනයක් ඇතිකර ගැනීමටත්, ජීවිත නිවැරැදි මගට යොමුකර ලීමටත්, නූතන තාක්ෂණික ලෝකය තුළ අසහනයට , ආතතියට පත් ජනතාවට සුවදායක, මානසික සැනසීමක් ලබා දීමටත් මෙමෙ උතුම් චරිතය මහඟු පිටිවහලක් වනු ඇත.

ස්වාමීන්වහන්සේ නමකට පවරාදීමට කැමති විහාරස්ථානයක් බලාපොරොත්තු වෙමි. ගම්පහ දිස්ත්‍රික්කය විශේෂයි.
070-3339363

## O⁺ වර්ගයේ වකුගඩුවක්

මවකට ඉක්මණින් අවශ්‍යයි.
අමතන්න : 076-3474195
071-0531851

දුෂ්කර නොදියුණු විහාරස්ථානයට උදව්කරන්න.
දාන මානද හිඟයි.
075-5157475

බුදු මැදුරක් හා දගැබක් ඉදිකිරීමට අනුග්‍රාහක පිංවතුන් අවශ්‍යයි.
075-5157475

එක් මෙහෙණින් වහන්සේ නමක් වැඩ සිටින ආරාමයක නතර වීම සඳහා වයස 50 ට නොඅඩු උපාසිකාවක් බලාපොරොත්තු වෙයි.
0712155414

## වයඹ ගිරිඋල්ල

ආසන්නයේ යුවළක් පමණක් සිටින නිවසේ නැවතී සහායට 58 අඩු නිදහස් නිරෝගී වැදගත් බෞද්ධ කාන්තාවකට ආරාධනා.
පූර්ණ රැකවරණය දීමනා කතා කරමු.
077-3542617

පොල්ගස්ඕවිට නිවසක පැත්තකින් ඇති භාවනා කුටිය නිම කිරීමට පුණ්‍යායතනයක් ඔස්සේ උපකරයක් සොයමි.
මුදල් ආධාර අවශ්‍ය නැත.
0729754630

## සිල් මෑණියන් නමකට ඉඩමක් හෝ නිවසක් කොළඹ අවටින් සොයයි

077 - 6573706

කුඩා කුටියෙහි වැඩ නිමකිරීමට හා කඨින පිංකමට දායකත්වය ලබාදිය හැකි අයෙකු අවශ්‍යයි.
උපැවිදි/ සාමණේර අමතන්න.
0716803077 / 0778060053

## භාවනා කුටියක්

කතරගම අපේ විහාරස්ථානයේ අපේ ගුරුමාහිමිට පොඩි භාවනා කුටියක් සාදවා දෙන ලෙසට දනපතීන්ගෙන් උපකාරයක් ඉල්ලමි.
076-6555362

හෝමාගම වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථානය සඳහා 6 දෙනෙකුට පමණ පහසුකම් ඇත. කෑම බීම හා ගෘහ භාණ්ඩ සහිතයි.
071-6649455
011-2657029

කඩුවෙල සහ කුරුණෑගල ප්‍රදේශවල පිහිටි විහාරස්ථාන කිහිපයක පැවිදි කිරීම සඳහා සෑම ප්‍රදේශයකින්ම කුල දරුවන් සොයයි.
භාරකරුවන් මගින් අමතන්න.
විහාරාධිපති හිමි
0777-776930, 071-7606465

## භාවනා පුහුණු ආයතනයක්

පවත්වා ගෙන යාමට සුදුසු නිවහනක් පූජා කොට මහඟු පිනක් අත්පත් කර ගැනීමට කදිම අවස්ථාවක්.
එළඹෙන වස් කාලය ඉතා යහපති (කළුතර දිස්ත්‍රික්කය තුළ විශේෂයි)
විමසන්න : 071-8098911

ආරාමයක් සාදා ගැනීමට සිල්වත් ස්වාමීන් වහන්සේ නමක් පර්චස් 05 ක ඉඩම් කොටසක් සොයයි.
(කැලණිය, කඩවත, කිරිබත්ගොඩ, වත්තල) වඩාත් සුදුසුයි.
පූජා කිරීමට කැමති පිංවතුන් අමතන්න.
දුරකථන අංකය :
076-8375871

ඕස්ට්‍රේලියාවේ ලියාපදිංචි විහාරස්ථානයක
නේවාසිකව ආගමික කටයුතු (දහම් දෙසීම්, භාවනා කරවීම්) සිදු කළ හැකි ඉංග්‍රීසි දැනීම ඇති නීරෝගිමත් හිමිනමකගේ (ගුරුවරයාගෙන් වෙන්වී සිටින වුවද) ශාසනික සේවය සඳහා කරනු ලබන ගෞරවනීය ඇරයුමයි.
අධ්‍යාපන සුදුසුකම් ඇතුළු සියලු විස්තර පහත ලිපිනයට යොමු කරන්න.
එම්.පියසේන මහතා
69/12, 4 වෙනි පටුමග,
පරණ පාර, නාවල, රාජගිරිය.

දුෂ්කර ප්‍රදේශයක ඉදිවෙමින් පවතින චෛත්‍යයේ
ඇත් පවුර, වළාකුළු බැම්ම, පැති බැම්ම සහ අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා පිංවත් ඔබගේ කාරුණික සහයෝගය ලබාදෙන ලෙස ශාසනාලයෙන් යුතුව ඉල්ලා සිටිමි.
අමතන්න
070-5905720 / 071-9084454
076-4271870

## මහනුවර කැටවල - ලෙවුල ග්‍රාමයෙහි

දැනට අතහැර ගොස් තිබෙන විහාරස්ථානය භාරව කටයුතු කිරීමට හැකි සංඝයා වහන්සේ නමක් ගම්මුන් විසින් සොයයි.
සියලු විස්තර සහිතව ලිඛිතව විමසන්න.
බී. කොස්වත්ත,
21, ලෙවුල, කැටවල -
ලෙවුල, මහනුවර.

## "සසර දුකෙන් අත් මිදෙමුද ?"

කුරුණෑගල දිස්ත්‍රික්කයේ විහාරස්ථානයක වයස 55 ට වැඩි ඉසිඹු සුවයෙන් වෙසෙන දෙදෙනෙකුට පැවිදි වීමට අවස්ථාව ඇත. (කැපකරුවන්ද අවශ්‍යව ඇත) විමසීම් සවස 4 න් පසුව.
032-2059990
032-3011020
075-4866947

## මට්ටාකොටුව

මහවැව පදිංචි වයස අවුරුදු 33 ක තරුණයෙකු සඳහා (ඩිල්ෂාන් වාස්) B පොසිටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කිරීමට අවශ්‍යබව රාගම රෝහලේ විශේෂඥ වෛද්‍යවරු නියමකර ඇත.
B පොසිටිව් වකුගඩුවක් ලබාදීමට කැමති පරිත්‍යාග ශීලියෙකු වේනම් අමතන්න.
077-8552850
077-6736272

මීපේ අලුතින් ආරම්භ කරන ලද නිමලා වික්‍රමසිංහ වැඩිහිටි නිවාසයට
විශ්‍රාමික දෙමාපියන් බඳවා ගැනේ.
කාරුණික සාත්තු සේවය සමඟ ප්‍රනීත ආහාර සැපයේ.
TEL-
0769656827
034-3349474

බුදුපිළිම/ දේවපිළිම/ මියුරල්/ දියඇලි උද්‍යාන අලංකරණය ඇතුළු සියලු කලා නිර්මාණ,
කලා භූෂණ, කලා කීර්ති, කලා මානප.
දේශබන්දු චන්දන ශාන්ත.
077-5888992

## පන්සලක වැඩට කැමතිය

48 වියැති පිනට දහමට ලැදි හවස් වරුවේ රැකියාවක නියුතු අයෙක් උදයවරුවේ පන්සලක එදිනෙදා වැඩට උදව්කිරීමට කැමතිය. නැවතීමට පුළුවනි. කොළඹ දිස්ත්‍රික්කය විශේෂයි.
වැටුපක් උවමනා නැත විමසන්න.
071-9181552

## මහා පිං !

- නිර්මාංශික අවිහිංසා දහම ඩී.වී.ඩී තැටි දහම්පත් මගින් නොමිලේ ලබා ගන්න.
- මරණයට කැපවූ ගවයන් ඇතුලු සතුන් මරණයෙන් නිදහස් කිරීමේ අභයදාන පිංකමට ඔබත් දායක වන්න.

භාවනා හාමුදුරුවෝ.
071-7679254

## මෙම වස්සාන කාලය තුළදී

ආර්ථික දුෂ්කරතා ඇති දානය හිඟ විහාරස්ථානයකට
දානය පිළියෙල කර ගැනීම සඳහා බරපැනක් හෝ දනය පූජාකර නිවන් පතාගන්න.
අමතන්න : 0777-219155

වයස අවු. 78 ක් වූ මෙහෙණින් වහන්සේ නමකට උදව් උපකාර කිරීම සඳහා අවු. 60 ක දහමට ලැදි නිරෝගී කාරුණික කාන්තාවක් අවශ්‍යයි.
නිදහස් කෙනෙකු වෙත් නම් මේ අංකයට අමතන්න.
සාධාරණ වැටුපක්ද ගෙවිය හැකියි.
0753775857

## A⁺ හෝ O⁺ වකුගඩුවක් වුවමනා වී ඇත

A⁺ හෝ O⁺ වර්ගයේ වකුගඩුවක් ඉතා ඉක්මණින් අවශ්‍ය වී ඇත. වයස අවුරුදු 30 ත් 50ත් අතර, තවද ආගමික පූජක හිමිවරුන්ගෙන් ඉතා කාරුණිකව අයැද සිටිමි.
දුරකථන අංක : 0776734885

වෛද්‍යවරයෙකුගේ භාවනා මධ්‍යස්ථානයක නේවාසික පහසුකම් ඇත.
මාසිකව පරිත්‍යාග ලබාදිය යුතුය.
0772805005

ආරණ්‍යවාසී සිල්වත් භික්ෂූන් වහන්සේ නමක් සඳහා ත්‍රිපිටකය සහ රේරුකානේ ස්වාමීන් වහන්සේ විසින් රචිත පොත් කට්ටල පූජා කිරීම සඳහා පින්වත් ඔබට අවස්ථාව ඇත.
077-4786975

## මහා පිංකමක්

මීගමුව ආසන්න ප්‍රදේශයේ දනපතියෙකු විසින් පූජා කරන ලද ඉඩමක හිමි නමක් විසින් බෞද්ධ අබෞද්ධ දෙපිරිසටම අවශ්‍ය වන වැඩිහිටි නිවාසයක් ඉදි කරගෙන යනු ලැබේ. ඒ සඳහා ගොඩනැගිලි සහ බුද්ධ මන්දිරයක් අවශ්‍ය වී ඇත. මුදල් අවශ්‍ය නොවේ. පරිත්‍යාගශීලියෙක් ඉදි කිරීමක් කර දීමට හැකිනම් සංසාර ගත මහා පුණ්‍යකර්මයකි.
0777-820389

## B⁺ වර්ගයේ වකුගඩුවක් ඉක්මණින් අවශ්‍ය වී ඇත.

අමතන්න
071-8366056 / 077-3655476 / 091-2292338





මෙවර උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ සාකච්ඡා මණ්ඩපයට වැඩම කරන්නේ සියම් මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ කොළඹ නව කෝරළයේ ප්‍රධාන අධිකරණ සංඝ නායක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ උප සභාපති, කොළඹ ආනන්ද විද්‍යාලයේ විශ්‍රාමික ආචාර්ය ගල්කිස්ස බෞද්ධායතනාධිපති සද්ධර්ම කීර්ති ශ්‍රී ත්‍රිපිටකාචාර්ය ආචාර්ය දිවියාගහ යසස්සී නා හිමිපාණන් වහන්සේ ය.

# අවවාදයට වඩා ආදර්ශය උතුම් ය

උදාර දිවියක පිය සටහන්

**● අපේ හාමුදුරුවනේ, ඔබ වහන්සේගේ ජීවිතය සාර්ථක කර ගැනීමට කුඩා කාලයේ ලැබුණු ආභාසය සිහිපත් කරනවා නම්,**

මම අද පැවිදි වෙලා සිටියත්, මම මගේ ජීවිතයේ අතීතය සිහිපත් කරන්නේ ඉතාමත් ම සතුටෙන්. 1935 ජනවාරි 02 ද දකුණු පළාතේ දිවියාගහ සුන්දර ගම් පියසෙහි උප්පත්තිය ලැබීම නිසා දිවියාගහ යසස්සී යන නම ලැබීමට හේතු වුණා. මාතර අරඹේවත්තේ රත්නායක ලොකු මහතා වූ මාගේ ආදරණීය පියා හා ඩී. එල්.ඩී. ප්‍රැන්සිනා මාතාව වූ මාගේ ආදරණීය මැණියන් ගත කළ ආදර්ශවත් බව මගේ ජීවිතය ආලෝකමත් කළා. කෙතරම් ඉහළ අධ්‍යාපනයක් ලැබුවත්, කුමන ආකාරයේ පුද්ගලයන් ඇසුරු කළත් සියයට සියයක් අංග සම්පූර්ණ යහපත් ගුණධර්ම ඇති සාර්ථක මනුෂ්‍යයෙක් නිර්මාණය කළ හැකි යැයි විශ්වාස කරන්න අපහසුයි. ජීවිතය සාර්ථක කර ගැනීමට ඒ සියල්ලට ම වඩා බලපාන්නේ මව්පියන්ගේ ආභාසයෙන් ලැබුණු ගුණධර්මයි. මගේ ජීවිතය තුළ යම්කිසි යහපත් ගුණධර්මයක් තිබෙනවා නම්, එහි හිමිකරුවන් වන්නේ මාගේ මව්පියන් බව කෘතවේදී ව සිහිපත් කළ යුතුයි. මව්පියන් තුළ පැවැති ශ්‍රද්ධාවන්තබව, ගුණගරුක බව, මගේ සිත ශාසනය කෙරෙහි ඇලීමට විශාල බලපෑමක් ඇති කළා. කුඩා කාලයේ සිට මව්පියන් සමඟ විහාරස්ථානයට පැමිණීම, පින්කම්වලට සම්මාදම් වීම මගේ ජීවිතයට අතිශය සතුට දනවන කාරණාවක්. දොහොත් මුදුන් තබා වන්දනා කරන ආකාරය මවගෙන් ලැබුණු ආදර්ශයෙන් ම පුරුදු පුහුණු වුණා. අම්මා සමඟ වන්දනා කරන කොට සියලුම ගාථාවන් ශබ්ද නඟා කියවීමෙන් කටපාඩම් වුණා මිසක් ඒ වෙනුවෙන් වෙනම පොතක් කටපාඩම් කිරීමක් වුණේ නැහැ. ගෙදරදීත් උදේ, සවස බුදුන් වැඳීමට පුරුදු කළා. කුඩා කාලයේ සිටම මව්පියන්ගෙන් ලැබුණු ආභාසය නිසාම ආගම දහමට නැඹුරු වුණා.පන්සලේ ලොකු හාමුදුරුවන් බණ කියනවා බලාගෙන ඉඳලා ඇවිත් ඒ ආකාරයෙන් ගෙදරදී බණ කියන්න පටන් ගත්තා. වටහපත වෙනුවට දෙල් කොළය අතට ගත්ත ආකරය තවමත් සිහිපත් වෙනවා. ඒ කුඩා කාලය හරිම ආදර්ශවත් බවක් ජීවිතයට එකතු කළා. යහපත් දරුවෙක් මනා සේ හද වඩා ගැනීමට නම්, පාසල් අවධියටත් පෙර පුංචි කාලයේ සිටම ගුණධර්ම පුරුදු පුහුණු කළ යුතුයි.

අවුරුදු පහේදී මාගේ පියා මා දිවියාගහ බටහිර පාසලට ඇතුළත් කළා. පාසලේ ප්‍රධානාචාර්යවරයාට, පන්තියේ ගුරුතුමියට තෑගි බෝග වශයෙන් කැවිලි පෙවිලි සමඟ බුලත් අතක් දීලා වැඳීම සිරිතක්. අපි ඒ චාරිත්‍ර ධර්ම අනුගමනය කළා වාගේම එදා සිටි මව්පියන් දරුවන්ට චාරිත්‍ර නිවැරදි ව පුරුදු පුහුණු කළා. සිංහල බෞද්ධයන් වශයෙන් බුලත් අතකට බුලත් කොළ 40 තැබිය යුතු වුවත්, වර්තමානය වෙන විට බුලත් කොළ 10 ක් දීලා ගුරුවරයාට වඳින ක්‍රමයක් ඇතැම් අවස්ථාවල දකින්න පුළුවන්. එවැනි චාරිත්‍ර ධර්ම වර්තමාන සමාජයෙන් බොහෝ දුරට ඉවත්වේගෙන යනවා. ගුරුවරුන්ට වැඳුම් පිදුම් කරමින් නිසි ගෞරවය දැක්වීම අඩුයි. එදා ගුරුවරයෙක් අවවාදයක් ලබාදෙන අවස්ථාවේදී අත් දෙකම එකට තබාගෙන ඇහුම්කන් දුන්නා වගේම ඒ අවවාදය අකුරටම පිළිපදින ස්වභාවයක් තිබුණා. එක් පාර්ශ්වයකින් මව්පියන්, අනෙක් පාර්ශ්වයෙන් ගුරුවරු ගුණවත්කම් ඇතිකිරීමට කටයුතු කළා.

**● පැවිදි වීම වගේම අධ්‍යාපනය ලැබූ අවධිය අර්ථවත් වීමට බලපෑවේ කුමන ආකාරයේ කාරණාද?**

මාතර පොල්හේන ශ්‍රී පුරාණ විහාරස්ථානයෙන් පැවිදි ජීවිතයට අවශ්‍ය පෙර පුහුණුවීම් හොඳින් සිදු කළා. ඒ දවස්වල බොහෝ විට දනය ලැබුණේ නැහැ. එවැනි අවස්ථාවලදී පොඩි හාමුදුරුවන් වහන්සේලා සමඟ එකතුවෙලා ඉතාමත් උනන්දුවෙන් ,ශ්‍රද්ධාවෙන් ඒ කාර්යය ඉෂ්ට කළා. ලොකු හාමුදුරුවන්ගේ අවවාද අනුශාසනා ඒ ආකාරයෙන්ම පිළිපැදීමට වග බලා ගත්තා. ගුරුදේවෝත්තම ගණේගම අත්ථදස්සී හාමුදුරුවන් වහන්සේගේත්, දිවියාගහ විපුලතිස්ස හාමුදුරුවන් වහන්සේගේත්. ආචාර්යත්වයෙන් 1947 ඔක්තෝබර් 8 වෙනිද උතුම් වූ ප්‍රව්‍රජ්‍යා භාවයට පත් වුණා 1947 වර්ෂයේ සිට 1955 වර්ෂය දක්වා මාතර ශ්‍රී සුදර්ශී පිරිවෙනින් අධ්‍යාපනය ලබාගනිමින් සිටියදීම 1955 වර්ෂයේ දී අධිශීල සංඛ්‍යාත උපසම්පත්තියට පත් වුණා. ඒ කාලවකවානුව තුළ දීම විද්‍යෝදය පිරිවෙන මූලික කරගනිමින් ඉදිරි අධ්‍යාපන කටයුතුවල නිරත වුණා. විෂය දැනුමට පරිබාහිරව බොහෝ දැනුම් සම්භාරයක් ලබාගැනීම ජීවිතයට ශක්තියක් එක් කළා. එවකට පරිවේණාධිපති බද්දේගම පියරතන ස්වාමීන් වහන්සේ, වැඩ බලන පරිවේණාධිපති වැලිවිටියේ සෝරත ස්වාමීන් වහන්සේ යන දෙනමත්, කළුකොඳයාවේ පඤ්ඤාසේඛර හිමියන් , දෙහිගස්පේ පඤ්ඤාසාර හිමියන්, බලංගොඩ ආනන්ද මෛත්‍රෙය මහා නා හිමිපාණන් වහන්සේ වැනි උගත්කමින් පරිපූර්ණ මහා පඬිවරුන්ගේ ඇසුර ලැබීමත් ජීවිතයේ සාර්ථකත්වයට ඉවහල් වුණා. නායක හාමුදුරුවන් වහන්සේ මධ්‍යම රාත්‍රිය පහන්වෙන තුරු පොත්පත් පරිශීලනය කරමින් ශාස්ත්‍රීය කටයුතු නියැලීමෙන් ගත කළ ආදර්ශ සම්පන්න පැවිදි ජීවිතයෙහි ආභාසය ලැබීම භාග්‍යයක් කොට සලකන්න පුළුවන්. ගුණධර්මවලින් පරිපූර්ණ වූ ශ්‍රද්ධාකාමී යහපත් දරුවෙකු වශයෙන් ගොඩනැගීමට මව්පියන්ගේ ජීවතවල තිබූ ආදර්ශවත් බව බලපෑවා හා සමානව ම ගුරුදේවයන් වහන්සේලාගේ ඇවතුම් පැවතුම්, අවවාද අනුශාසනා පැවිදි ජීවිතයට ආලෝකයක් එක්කළා.

1959 වර්ෂයේ දී විද්‍යෝදය පිරිවෙන විශ්ව විද්‍යාලයක් වීමත් සමඟ විශ්ව විද්‍යාලය අධ්‍යාපනය ආරම්භ කරමින් 1962 දී උපාධිය ලබා ගත්තා.


**● ඔබවහන්සේ ගේ ආගමික ශාසනික සේවය වර්තමාන ශිෂ්‍ය පරපුරට ආදර්ශයක් එක්කරන්නේ කුමන ආකාරයෙන් ද?**

ගුරු පත්වීම ලබාගත් විගසම මම අධ්‍යාපනය ලැබූ මාතර ශ්‍රී සුදර්ශී පිරිවෙනේ වැටුපක් නොලබාම ආචාර්යවරයකු වශයෙන් සේවය කළා. වර්තමානය වන විට ඇතැම් පිරිසකට තමාට අධ්‍යාපනය ලබාදුන්. ගුරුවරයාත් අමතකයි. තමන් ඉගෙන ගත් විදුමාතාවට සේවයක් කළ යුතු යැයි ඇතැම් පිරිස් කල්පනා කරන්නේ නැහැ. එය එතරම් යහපත් තත්ත්වයක් නෙවෙයි. කොළඹ ආනන්ද විද්‍යාලය ඇතුළු රජයේ පාසල් විශාල ප්‍රමාණයක ගුරුවරයෙකු වශයෙන් විශාල සේවයක් ඉටු කළා. බොහෝ පාසල්වල බෞද්ධ සංගම් පිහිටුවමින් දරුවන්ගේ ගුණධර්ම වර්ධනය වන ආකාරයට බෞද්ධ ගුණධර්ම ක්‍රියාත්මක කළා.

උසස් පෙළ හදාරන ශිෂ්‍යයන් වෙනුවෙන් බෞද්ධ සංස්කෘතිය සඳහා ග්‍රන්ථ රාශියක් ද්, පාසල් දරුවන්ට අවශ්‍ය කරන ඉතිහාස විෂය සම්බන්ධ ග්‍රන්ථ ද රචනා කළා.

භික්ෂූන් වහන්සේ නමක් ලෙස සැමවිට ම අනුන්ගේ යහපත සඳහා කටයුතු කළ යුතු බව බුදුරජාණන් වහන්සේ වදාළ බුද්ධාවවාදය නිවැරැදි ව පිළිපැදිය යුතුයි. 1972 වර්ෂයේ සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ලේකම් වශයෙන් කටයුතු කරමින් ස්වාමීන් වහන්සේලා ඒකරාශි කරගනිමින් ඒ මාර්ගයෙන් විශාල ආගමික, ශාසනික, සාමාජික සේවාවන් රැසක් ක්‍රියාත්මක කළා. එංගලන්තය ,අමෙරිකාව, ජපානය, ආදි බොහෝ රටවල සංචාරය කරමින් ඒ හරහා විශාල කාර්ය භාරයක නියැළුණා. උදාහරණයක් වශයෙන් මොංගෝලියාවේ තිබෙන ආසියානු බෞද්ධ සාම සම්මේලනය හරහා ලෝක සාමය සඳහාත්, සාමය තුළින් නොයෙක් දරුවන්ගේ සුභසිද්ධිය සඳහාත් දරුවන් තුළ සාමකාමී මනසක් ගොඩනැගීමට අවශ්‍ය කටයුතුත් සම්පාදනය කළා. එම සේවය. අගය කරමින් මොංගෝලියානු රජය විසින් 1982 වර්ෂයේදී රන්පදක්කමක් පරිත්‍යාග කිරීමට කටයුතු කළා. ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ උප සභාපතිත්වය දරමින් ලෝකයට ම ථේරවාදී ධර්මය ප්‍රචලිත කිරීම සඳහා කටයුතු කළා. පන්සලක පටු වැඩ පිළිවෙළකට කොටු වෙනවා වෙනුවට විශාල වශයෙන් ආගමික, සාමාජික, ශාසනික මෙහෙවරක නිරත විය හැකියි. මිහිඳු මහරහතන් වහන්සේ ලංකාට වැඩම කළ දවසේ සිටම ස්වාමීන් වහන්සේලා සමාජයේ සුභ සිද්ධිය සඳහා අර්ථයෙන් , ධර්මයෙන් අනුශාසනා කරමින් සමාජය යහපත් තත්ත්වයට පත්කිරීමට කටයුතු කළා. එම තත්ත්වය තවදුරටත් ආරක්ෂා කළ යුතුයි.

හේමමාලා රන්දුනු



අම්බලන්ගොඩ,
කහව ගල්දූව
ගුණවර්ධන යෝගාශ්‍රමයේ
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමයේ මහා ලේඛකාධිකාරී
කම්මට්ඨානාචාර්ය
ත්‍රිපිටකාචාර්ය,
ත්‍රිපිටක විශාරද
**කහගොල්ලේ සෝමවංශ හිමි**

# දෙලොව සුවපත් කරන සීලය සහ සිහිය

**කවුරුත් සංවරකම ඇති කර ගත යුතු යි. එය බුදුරජාණන් වහන්සේ ක්‍රම පහකට දේශනා කර වදාළ සේක. එය අංගුත්තර නිකායේ පංචක නිපාතයේ පංච සංවර විනය සූත්‍රයේ සඳහන් වෙනවා. ශීල සංවරය, සති සංවරය, ප්‍රඥ සංවරය හෙවත් ඥාන සංවරය, ඛන්ති සංවරය, වීර්යය සංවරය යනුවෙනි. මේ සංවරය කොයි කවුරු වුණත් දියුණු කළ යුතු යි. එය මෙලොව, පරලොව සංසාරෙට ම ප්‍රයෝජනවත්. කාය සංවරය, වචී සංවරය, මනෝ සංවරය, ආදී සංවර තුනක් තිබෙයි.**

කයෙන්, ව චනයෙන්, සිතෙන් සිදුවන වැරැදිවලින් ඈත්වීම වශයෙනි. දස අකුසලයෙන් ඈත්ව දස කුසල් කිරීම සංවරකම යි. මෙහිදී බුදුන් වහන්සේ කරුණු පහක් ගෙනහැර දක්වා ඇත.

පළමුවැන්න ශීල සංවරය යි. ගිහි අයට ඇත්තේ පංචශීලය යි. පෝයට අටසිල් ගැනීම, සතුන් මැරීම, සොරකම, කාම මිථ්‍යාචාරය, බොරුව, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම ආදී කරුණු රකින්නට අපහසු නැහැ.

සවස් කාලයේ බොහෝ සෙනග මත් වතුර හල් වල පිරී සිටිනවා. බලන්න, කෙතරම් අවාසනාවක් ද? බුදු දහම ඇති කාලයක අසිහියෙන් ඉඳ, අසිහියෙන් මිය පරලොව ගොස් නරකාදියට වැටෙයි. ඒ නිසා මත්ද්‍රව්‍ය භාවිතයෙන් විශේෂයෙන් ඈත් විය යුතු යි. කවුරු වුණත් තම පියාණන් මත්වතුර භාවිත කරනවාට කැමැති නැහැ. අසල්වාසී පිරිසත් එයට කැමැති වන්නේ නැහැ. මෙලෙස මත් වතුර භාවිත කරන්නන් බේබද්දා යනුවෙන් හඳුන්වනවා. ඒ නිසා නුවණ මෙහෙයවා හොඳින් කා බී සිහි නුවණින් ජීවත්ව, සිහි නුවණින් අවසන් ගමන යා යුතු යි. එලෙස අපට ඉතිරි වන්නේ ජීවිතයේ කරන පින් දහම් පමණ යි. පන්සිල් කඩ කිරීමෙන් අවාසනාවන්ත ජීවිතයක් උදා වී මරණින් මතු සුගතියක් නොදැක නරකාදී දුකට පත් වෙයි. පන්සිල් රැකීමෙන් ඕනෑම සම්පතක් ලැබෙන බව ධර්මයේ පෙන්වා දෙනු ලබයි. එසේනම්, කවුරුත් නුවණ මෙහෙයවා පන්සිල් රැකගත යුතු යි. කාය, වාග් දෙකේ සංවරය පංචශීලය වෙයි. භික්ෂූන් වහන්සේලාට සාමණේර සහ උපසම්පද ශීලය වෙයි. භික්ෂුණීන් වහන්සේලාට සාමණේර සහ උපසම්පද ශීලය වෙයි. භික්ෂුණීන් වහන්සේලාට භික්ෂුණී සීලය වෙයි.

එසේනම්, ශීලය පිළිබඳ මනා වැටහීමකින් සිත, කය, වචනය සංවර කරගෙන කටයුතු කරන්න. සමාජයට හොඳ නම තබාගන්න කවුරුත් උත්සාහ කරන්න. පන්සිල් කඩ කරන්නන්ගේ ජීවිතයට ලොකු කැළලක්. ඔවුන්ට බේබද්දා, කුඩු කාරයා, ආදී කැත නාමයන් පට බඳිනවා. ඒ නිසා තමනුත්, ද රුවනුත් හොඳින් හදගෙන බුදුන් වහන්සේ පෙන්වා දෙන නිවැරැදි මඟ යන්න

දෙවැන්න සති සංවරය යි. එනම් සිහි කල්පනාව යි. බණ ඇසීම, දෙයක් සටහන් කිරීම, ගමන් බිමන් යාම, අධ්‍යාපනය හොඳින් හැදෑරීමට, රැකියාව කිරීම ආදිය සිහි කල්පනාවෙන් කළ යුතු යි. එහෙමනම් බාහිර සහ ආධ්‍යාත්මික අංශයට සිහි කල්පනාව ප්‍රධාන වෙයි. සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අර්හත් ආදී උත්තරීතර ධර්මයන් ලබන්නේ ද සිහි කල්පනාව මුල් කරගෙන යි. එසේනම්, බුදු දහමේ හැටියට සිහි කල්පනාවට ප්‍රධාන තැනක් ලැබෙයි. එසේනම් ශීල සංවරය සේ සති සංවරයත් හොඳින් දියුණු කර ගන්න. ශීලය සහ සිහිය මෙලොව මෙන් ම පරලෙව ගමන ද සුවපත් කරයි.

තෙවැන්න ඥාන සංවරය යි. එනම්, නුවණ යි. එසේනම්, කවුරු වුණත් සිහි නුවණින් වැඩ කටයුතු කළ යුතු යි. රැකියාවට, අධ්‍යාපනයට, ගෙදර දොර දෛනික වැඩකටයුතු ආදියට නුවණ ප්‍රධාන වෙයි. නුවණ නොමැති නම් ව්‍යංජනයකට ලුණු නැහැ වාගේ. රසවත් බව නැහැ. ඒ නිසා කවුරුත් සියලුම දේ නුවණින් පිරික්සා බලා කළ යුතු යි. බුදු දහමේ ප්‍රඥවට සුවිශේෂී තැනක් ලැබෙනවා. සැරියුත් මහ රහතන් වහන්සේ ප්‍රඥවෙන් අග්‍ර වූවා. පන්සිල්, අටසිල් රකින විටත්, දන් හැන්දක් බෙදුවත් සිහි නුවණ තිබිය යුතු යි. ධර්ම දේශනා, දානමය පින්කම් ලෝකයට පෙනෙන්න නොකළ යුතු යි. ඒ නිසා නුවණට තැනක් දී කටයුතු කරන්න මහන්සි ගන්න. බුදු ගුණ භාවනාවෙන් හොඳින් නුවණ ලැබෙයි. සියලු සංස්කාරයෝ අනිත්‍යය යි, දුක්ඛ යි යනුවෙන් මෙනෙහි කරද්දී හොඳින් නුවණ ලැබෙයි. හොඳම නුවණ ඇත්තේ සම්මා සම්බුදුරජාණන් වහන්සේට යි.

සිව්වන සංවරය ඉවසීම යි. එනම් ඛන්ති සංවරය යි. ගේ දොර වාසය කරන මව් පියන්, දරුවන් ඉවසීම හොඳින් දියුණු කිරීම හරිම වැදගත්. වාද භේද, අසමගිකම් ඉවතලා වාසනාවන්ත ජීවිතයක් ගත කරන්න පුළුවන්.

පස්වැන්න විරිය සංවරය යි. එනම්, උත්සාහය යි. කම්මැළිකම දුරලා බලවත් උත්සාහයකින් යුක්තව කටයුතු කළ යුතු යි. උත්සාහය නැතිනම් කරන කියන වැඩ කටයුතුවල සාර්ථකත්වයක් නැහැ. උත්සාහය නැතිනම්, ශීලය, සිහි නුවණ, හොඳින් පිහිටුවාගන්නට බැහැ. උත්සාහය නැති පුද්ගලයා 'මඩේ සිටවපු ඉන්නක්' වැනි යි. උත්සාහයට බුදු දහමේ විශේෂිත නාමයන් රාශියක් ඇත. උත්සාහවන්තයා ඉදිරියටම ගමන් කරනවා.

කාය සංවරය, වචී සංවරය, ම නෝ සංවරය හොඳින් දියුණු කළ විට ශීල සංවරය, සති සංවරය, ඥාන සංවරය, ක්ෂාන්ති සංවරය, විරිය සංවරය ලබෙනවා. මේ ගැන හොඳින් ඉගෙන ජීවිතයත් දහමට සම්බන්ධ කර සම්මා දිට්ඨියේ පිහිටා ගෙන කටයුතු කර, සතර අපා දුකෙහි බියකරු බව වටහාගෙන සුගතියේ ඇති වැදගත්කම, නිවනේ ඇති අති වැදගත්කම කල්පනාවෙන් උත්සාහයෙන් කවුරුත් වැඩකටයුතු කළ යුතු යි.

**වැඩිහිටි නිවාසයකට ආරණ්‍යවාසී හිමිනමක් අවශ්‍ය වී ඇත.**
බණ දහම් කිරීමට හැකි.
**ගාල්ල**
**0771550274**

**බණ දහමට දක්ෂ, උපසම්පදා තරුණ ස්වාමීන් වහන්සේ නමකට දිගටම වැඩ සිටීමට, හිමිනමක් නොමැති ස්ථානයක් හෝ පූජාකළ හැකි ඉඩමක් අමතන්න**
**071-6408419**

**O+ වර්ගයේ වකුගඩුවක් අවශ්‍යව ඇත.**
පරිත්‍යාගශීලි අයෙක් වෙතොත් අමතන්න.
**දු.අ. 0715605687, 070-1301914**

**වකුගඩුවක් අවශ්‍යව ඇත**
48 වියැති එක් දරු පියාට $B^+$ වර්ගයේ වකුගඩුවක් අවශ්‍යව ඇත.
$B^+$, $B^-$, $O^+$, $O^-$ වර්ගයේ පරිත්‍යාගශීලීයෙක් වෙතොත් අමතන්න.
**070-5980350**

**පැවිදි කිරීම සඳහා**
වාද්දුවේ මාවල පුරාණ විහාරස්ථානයට ගොවිකුල අවුරුදු 11 සිට 15 දක්වාවූ දරුවන් බලාපොරොත්තුවේ. අධ්‍යාපන කටයුතු සඳහා වගකීම භාරගනු ලැබේ.
**075-7117110**
**071-4401239**

**ආශ්‍රමයක් පූජා කිරීම සඳහා**
ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා සඳහා ගිලන් උපස්ථාන ආශ්‍රමයක් පවත්වාගෙන යාම සඳහා නිවසක් හෝ භූමියක් කොළඹ නගරය අවටින් භික්ෂූන් වහන්සේ නමක් සොයයි. පිං කැමැත්තෙකුට දායක විය හැක. පූජා කිරීමට කැමති කෙනෙක් විමසන්න.
**දුරකථන අංක 071-8420351**

**දැහැමි ජීවිතයක් ගතකරන මම පූජනීය ස්ථානයක පඩියට සේවයක් කිරීමට සොයමි.**
**078-6817323**

**පුත්තලම ප්‍රදේශයේ ආරාමයක මහණ වීමට**
කැමති අවුරුදු 35 - 55 අතර
**චරිතවත් කාන්තාවක් සොයයි**
0718122445

**වයස 29 ක තරුණියකට $B^+$ හෝ $O^+$ වකුගඩුවක් වහාම අවශ්‍යයි. කරුණාකර අමතන්න.**
**071-2756415**

අසාධ්‍ය රෝගියෙකු සඳහා
**$O^+$ හෝ $O^-$**
වර්ගයේ
නිරෝගී වකුගඩුවක් ඉතා ඉක්මණින් අවශ්‍යයි.
**අමත්නන**
**0777417367**

**වකුගඩුවක් අවශ්‍යයි**
B Positive / B Negative / O Positive / O Negative වර්ගයේ වකුගඩුවක් අවශ්‍යයි. පරිත්‍යාගශීලියෙකු වේ නම් අමතන්න.
**072-5269900**

**දුෂ්කර ප්‍රදේශයක ඉදිකිරීමේ කටයුතු යොදා ඇති බුදු මැදුරක් අලුත්වැඩියා කිරීම හා එහි චෛත්‍යයක් ඉදිකිරීම සඳහා ඒ වෙනුවෙන් සැදැහැවත් දානපතියන්ගේ නොමසුරු ආධාර උපකාර බලාපොරොත්තු වෙමි.**
**අශෝකාරාමය, නබඩෑව, ඇඹෝගම.**
T.P. 077-5039261

**උපකාරයක් බලාපොරොත්තු වෙමි**
**කරුණාවන්ත නෝනාවරුනි මහත්වරුනි**
මම හදවත් රෝගියෙක්මි. දැනට කලකට පෙර වූ පොරොන්දුවක ප්‍රතිඵලයක් වශයෙන් මට භාරයකින් නිදහස් වීමට උපකාරයක් අවශ්‍යව ඇති බැවින් මා ඔබ සැමගෙන් ඒ සඳහා උපකාරයක් බලාපොරොත්තු වෙමි. මට උපකාර කරන සැම කෙනෙකුටම ඉතා උතුම් පිනක් බව සලකන්න.
**දු/අ - 0713643736**
**ඉතාමත් දුබල තත්වයෙන් සිටින මා හට උපකාර කරන මෙන් ඉතා කාරුණිකව ඉල්ලමි.**

# එවන් සිනහ මල් දුටු සඳ වෙහෙස දුරු වුණා





කැලණිය විශ්ව විද්‍යාලයේ සිංහල අංශයේ අංශාධිපති පෑලියගොඩ විද්‍යාලංකාර පිරුවන්හි
**ආචාර්ය මල්වානේ චන්ද්‍රරතන හිමි**

**සමාජය යනු මිනිසුන් රැසකගේ එකතුවක් ය යන්න එතරම් ප්‍රාමාණික නිර්වචනයක් නොවේ. එකී සමාජය ජීවත් වන මානවයන් අතර අන්‍යෝන්‍ය සුහදත්වය මත සිදු වන ක්‍රියාකාරකම්වලින් යුක්ත වීම එය වඩාත්ම නිර්වචනය වන බව පැහැදිලි කරුණකි. ලෝකයේ ඉතා කුඩාම සමාජ ඒකකය වන්නේ පවුලයි.**

නිවහනක් තුළ ජීවත් වන මව, පියා සහ දරුවන් අතර මෙම කුඩාම සමාජ ඒකකය ක්‍රියාත්මක වෙයි. සදාදරණීය වූ මව් සෙනෙහස, පිය සෙනෙහස, දරු සෙනෙහස කුඩා නිවහනක් තුළ යහපත් ව පවතින්නේ නම්, එය මහා සමාජය සාදු සම්මත මාවතකට ප්‍රවේශ කරලීමේ ප්‍රධානතම හේතුවයි. නිවහනක් තුළ පවතින අන්‍යෝන්‍ය වූ දයාබර හැඟීම් පළුදුවන හැමවිට ම එය මහා සමාජය අපවිත්‍ර වීමට ඉතා තදින් ම බලපාන කරුණක් වන්නේ ය.

ප්‍රියශීලී මනසකින් අනෙකා දෙස බැලීමෙන් දැහැමි සමාජයක් නිර්මාණය කළහැකි බව බුදු දහම අප වෙත සදුපදේශයක් සම්පාදනය කරයි. එහි දී අවශ්‍ය වන ප්‍රධානතම ගුණාංග වන්නේ ඉවසීම හා විමසීමයි. ඉවසීමත් විමසීමත් මැනවින් පුරුදු කර තිබේ නම්, තමා මුහුණ දෙන ඕනෑම ප්‍රශ්නයකට සාර්ථක විසඳුම් ලබා ගත හැකි ය.

බුදු දහම උගන්වන මෙම ධර්මෝපදේශවලට අනුගතව රචනා කළ ගීතවලින් ද ගිනිගෙන දැවෙන ජීවිත සුවපත් කර ගැනීමට මහත් වූ පිටිවහලක් ලබා දෙයි. හෙන්රි කල්දේරා මහත්මා විසින් ගායනා කරන ලද මෙම ගීතය එයට කදිම නිදසුනකි.

සේවය නිමකොට තම නිවහනට පැමිණෙන ස්වාමියාට මිදුලේ තිබෙන ලොකු පාවහන් යුගලක සටහන් දක්නට ලැබේ. තමා නිවසේ නැති අවස්ථාවක තම නිවහනට කවුරුන් හෝ පැමිණ ඇති බව ඔහු තුළ මහත් සැකයක් උපදී. මෙවැනි අවස්ථාවල සමාජයේ බොහෝ උදවිය සිය බිරිඳගෙන් ඒ බව විමසමින් කුටුම්බය විනාශ කර ගන්නා අවස්ථා කොතෙකුත් අප අසා ඇත. එහෙත් මෙම කථකයා ඉක්මන් තීන්දු තීරණ ගැනීමට නො යයි. ඒ පිළිබඳ ඇඩි ඉවසීමෙන් හා විමසීමෙන් කරුණු සොයා බලයි. තම බිරිඳට සහෝදරයන් නොමැත. තමාගේ සොහොයුරා ද අසනීපයෙන් පසුවෙයි. එසේ, නම් වෙනත් පුද්ගලයෙකු තමා නිවසේ නැති අවස්ථාවේ පැමිණියාදැ යි යන සැකයක් හට ගනී. ඔහු දිනක් සැඟ වී සිට මේ පිළිබඳ ව සොයා බලයි. සිදුවී ඇත්තේ කුමක් ද? තම පුතු තමාගේ පාවහන් පලඳ මිදුලේ ඒ මේ අත ඇවිදියි. එය දුටු අවස්ථාවේ දී එතෙක් තම සිත තුළ හටගෙන තිබූ සැකය දුරු වී යයි. තමා මුහුණ දෙන ඕනෑම ප්‍රශ්නයක දී කලබල නොවී

අවුල් ව ගිය මනසින් යුතු මා නිවසට ගොඩවැදුණා
මගෙ නෙත ගත සිත වෙහෙසූ රහස හෙළිවුණා
මගේ පාවහන් පලඳ සුරතල් පුතු ඇවිදිනවා
පුංචි දෙතොල් අතරින් කිරි සිනහ මතුවුණා
එවන් සිනහ මල් දුටු සඳ වෙහෙස දුරුවුණා

ඉවසීමෙන් හා විමසීමෙන් කටයුතු කිරීමෙන් සියලු බාධක දියුණුවේ සාධක බවට පත්කර ගැනීමට හැකි බව බුදු දහම අපට පසක් කරයි. එසේ විමසා බැලීමේ දී ඉසවසීමේ කෙළවර ඉවසීම ම බව අපට අවබෝධ කරවයි. ඉවසීමට ලොව සීමා නැත. ඉවසීමේ සීමාව නම් වෛරයයි. එසේ ඉවසීමක් අපට බුදු දහම උගන්වන්නේ නැත. "ඉවසල ඉවසල බැරිම තැන එතනයි ඉවසිය යුතුම තැන" යන සනාතන දහම වෙත අපව රැගෙන යාමට කවියා ගත් උත්සාහය අතිශයින් ම ප්‍රශස්ත බව පැහැදිලි ය.

මෙම යථාර්ථවාදී දහමින් ඈත් වී වර්තමාන සමාජය කටයුතු කිරීමෙන් බොහෝ කුටුම්බයන් විනාශ වන අයුරු කො තෙකුත් දක්නට ලැබේ.

**මිදුලේ සුදු වැලි තලයේ මිරිවැඩි සඟලක සලකුණු**
**දැක මා හද පතුලේ සැකයෙකි උපදින්නේ**
**මා නිවසෙහි නැති අතරේ කවුරුන් හෝ පැමිණ තිබේ**
**කවුරුද ආවේ නිවසට කවුරුද ආවේ//**

**බිරිඳට සොහොයුරන් නොමැත මා සොයුරු ද අසනීපෙනි//**
**මගේ යහළුවෙක් නිවසට ආවද මන්දා**
**ඊයෙත් හැන්දෑ වරුවේ මා එනවිට මිදුල පුරා**
**තිබුණා මිරිවැඩි සලකුණු කාගෙද මන්දා**

**අවුල්ව ගිය මනසින් යුතු මා නිවසට ගොඩ වැදුණා//**

**මගෙ නෙත ගත සිත වෙහෙසූ රහස හෙළිවුණා**
**මගේ පාවහන් පලඳා සුරතල් පුතු ඇවිදිනවා**
**පුංචි දෙතොල් අතරින් කිරි සිනහ මතුවුණා**
**එවන් සිනහ මල් දුටු සඳ වෙහෙස දුරුවුණා//**

ගී පද රචනය - **ප්‍රේමතිලක පලිහවඩන**
ගායනය - **හෙන්රි කල්දේරා**

## සිරි සදහම් පැන විසඳුම්

**සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුරු ලියා එවා ගුණසේන සහ සමාගමෙන් පිරුවානා පොත් වහන්සේ නම් යුත් "මහ පිරිත් පොත් වහන්සේ" හිමිකර ගන්න.**

**සතිපතා ජයග්‍රාහකයින් පස්දෙනෙකුට ත්‍යාග තිළිණ කෙරේ.**

බුදුසරණ

සතියේ ප්‍රශ්නය - 27

මෙවර පෝ ද දම් දෙසුමෙන් කියැවෙන ජාතක කතාවේ නම කුමක්ද?

**පිළිතුර :** ..............................
**නම :** ..............................
**නිවසේ ලිපිනය :** ..............................
..............................
**දුරකතන අංකය :** ..............................

**ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.**

**ඇම්. ඩී. ගුණසේන - බුදුසරණ සිරි සදහම් පැන විසඳුම්, බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10**

# සෙංකඩගලපුර ඇසළ පෙරහර මංගල්‍යය

## ආගමික හා ජාතික සංස්කෘතික මංගල්‍යයක්

මහනුවර උපෝෂිත පුෂ්පාරාම විහාරද්වයාධිපති
මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ මහානායක
**තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහ නා හිමි**



සමස්ත ලෝකවාසී ශ්‍රද්ධාවත් බෞද්ධ මහජනතාවගේ අත්‍යන්ත පූජෝපහාරයන්ගෙන් සුපූජිත ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ ප්‍රමුඛස්ථානයේ තබා සෙංකඩගල පුරවරයෙහි වාර්ෂිකව පැවැත්වෙන ඇසළ මහා පෙරහර ශ්‍රී ලාංකේය ආගමික හා සංස්කෘතික පූජෝත්සවයන්ගේ මුදුන්මල්කඩ ලෙස චිරසම්භාවිත ය.

ගෞතම බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රී දේහය ආදාහනයෙන් අනතුරුව ඛේම නම් මහ රහතන් වහන්සේ විසින් ලබා ගන්නා ලද වාම ශ්‍රී දළදා වහන්සේ කළිඟු රට බ්‍රහ්මදත්ත රජුට භාර දෙන ලදුව, එම රජතුමා දන්ත ධාතුන් වහන්සේ රන් මිණිමුවා මණ්ඩපයක තැන්පත් කර, පුද පූජා පැවැත්වූ බවත්, ගුහසීව රජු දවස හේමමාලී හා දන්ත කුමරු විසින් ලංකාවට වැඩම කරවූ බවත්, එ දවස ලක්දිව රාජ්‍ය විචාළ කිත්සිරිමෙවන් රජතුමා අනුරාධපුරයේ අලංකාරවත් දාඨා ධාතු මන්දිරයක් කරවා දන්ත ධාතුන් වහන්සේ එහි වඩා හිඳුවා නිති පුද පූජා පැවැත්වූ බවත් දළදා ඉතිහාසයේ විස්තාරිත ය. ජීවමාන බුදුරජාණන් වහන්සේ මෙන් සලකා ශ්‍රී මේඝවණ්ණාභය රාජ්‍ය සමයෙහි පටන් (ක්‍රි.ව 301 - 328) මහා සංඝරත්නය මෙන් ම ශ්‍රී ලාංකේය ශ්‍රද්ධාවත් රජවරු හා බෞද්ධ මහා ජනතාව මහත් ගෞරවයෙන් දළදා වහන්සේ වන්දනාමාන කරති. විදේශීය ආක්‍රමණ පැවැති යුගවල දී පවා තම දිවි දෙවැනි කොට ආරක්ෂා කරන ලද ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ පළමුවැනි විමලධර්ම සූරිය රජු දවස පටන් අද දක්වා සෙංකඩගල පුරවරයෙහි අත්‍යලංකාර මන්දිරයක සකල ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පූජෝපහාර ලබමින් වැඩවසති.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමන් වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජ මා හිමියන් වහන්සේගේ ද අනුශාසනා ලබා නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි දේවාලයන්හි පෙරහරද දළදා පෙරහරට එක් කළ අතර, එදා සිට අද දක්වා දළදා පෙරහර ප්‍රමුඛස්ථානයේ තබා සතර දේවාලයන්හි පෙරහර ද දළදා පෙරහරට එක් වී ජාතික කලා සංදර්ශනයක ස්වරූපයක් ගෙන ඇත.

මෙලෙස ආගමික, ජාතික හා සංස්කෘතික වශයෙන් වැදගත් වූ දළදා පෙරහර මෙවර ලෝක ව්‍යසනයක් වූ කොරෝනා වසංගතය හේතුවෙන් ජනතාවට දැකබලා ගැනීමේ අවස්ථාව නොලැබුණ ද අසිරිමත් දන්ත ධාතුන් වහන්සේගේ පිහිටාශිර්වාදයෙන් සකල ලෝකවාසීන් පවතින ව්‍යසන තත්වයන්ගෙන් අත්මිදේවායි ප්‍රාර්ථනා කරමින් දළදා පෙරහර පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබීම අප කාගේත් සතුටට කරුණකි.

ඔබ සැමට දළදා සමිඳු පිහිටයි!

## දළදා හිමි අනුහසින් සැමට සෞභාග්‍යය

ශ්‍රී භයගිරි විජයසුන්දරාරාම විහාරද්වයාධිපති
ඓතිහාසික බදුලු මුතියංගණ රාජමහා විහාරාධිපති මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහානායක
**වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතන මහ නා හිමි**



ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ මෙරටට වැඩම කළ මුල් අවධියේ සිට ම උන්වහන්සේ විෂයයෙහි විවිධාකාර වූ පුද පූජා පැවැත්වීමට මෙරට රාජ රාජ මහාමාත්‍යාදීන් ඇතුළු රට වැසියෝ බොහෝසෙයින් උනන්දු වූහ.

මේ නිසාම දළදා වහන්සේ උදෙසා පෙරහර පැවැත්වීම් ද ආදි යුගයේ සිට ම ආරම්භ වූවක් බව පෙනේ. කිත්සිරිමෙවන් රාජ සමයේ දළදා මැදුරේ සිට අභයගිරි විහාරයට දළදා වහන්සේ ඉතා විසිතුරු පෙරහරකින් වැඩමවීමත් සමඟ මෙම දළදා පෙරහරේ සමාරම්භය සිදුවී ඇති බව වියතුන්ගේ මතයයි

වර්තමාන කාලය වන විට දළදා වහන්සේ උදෙසා සිදු කරන වාර්ෂික ඇසළ පෙරහර මංගල්‍යය , හෙළ බොදු සංස්කෘතියේ අභිමානය කියාපාන උසස් සංස්කෘතිකාංගයක් ලෙස විශ්ව කීර්තියට පත්ව ඇත. එහිලා අතීතයේ මෙරට සිටි රාජ රාජ මහාමාත්‍යාදීන් දක්වන ලද සුවිශේෂ අනුග්‍රහය මෙවන් පුද පූජා චාරිත්‍ර මෙරට ජන ජීවිතය තුළ තදින් මුල්බැස ගැනීමට හේතුවන්නට ඇත. ඒ නිසා අද වන විට මෙරට බෞද්ධ අබෞද්ධ කා තුළත් මෙම විසිතුරු පෙරහර මංගල්‍යය කෙරෙහි ඇත්තේ ඉමහත් ළැදියාවකි.

අවාසනාවන්ත ලෙස ලොවම සසල කරමින් ඇතිවී තිබෙන වසංගත රෝග දුර්භික්ෂය හේතුවෙන් සුපුරුදු පරිදි මෙවර මහජනතාවට පෙරහර නැරඹීමට අවස්ථාව නොලැබුණත් ශ්‍රී දළදා සමිඳුන් උදෙසා සිදු කරන්නා වූ පුද පූජාවන් සහ සිරිත් චාරිත්‍ර ඉටු කරමින් මෙවර ද පෙරහර මංගල්‍යය සිදු කිරීමට කටයුතු යොදා ඇත. සිංහල බෞද්ධයාගේ අභිමානය ලොවට ම කියාපාන මෙවන් උසස් සංස්කෘතිකාංග නොනැසී පවත්වාගෙන යෑම අප කාගේත් වගකීමයි.

අප රට ජාතියේ ආරක්ෂාව ගැන කල්පනා කොට යොදා ඇති නීති රෙගුලාසිවලට අවනතව මෙවර දළදා පෙරහර රූපවාහිනී විකාශනයන් ඔස්සේ නරඹන ලෙස සිහිපත් කරන අතර මෙම අසිරිමත් ඇසළ මංගල්‍යය හෙවත් දළදා පෙරහරේ අනුහසින් ලක්වැසි සැමට සෞභාග්‍ය උදා වේවා! යි ආශිංසනය කරම්හ.

## ත්‍රි සිංහලයේ අසිරිමත් මංගල්‍යය

මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ
**ප්‍රදීප් නිලංග දෑල**



ආගමික සංසිද්ධීන් පසුබිම් කොටගෙන බොහෝ රටවල ඒ වටා ගොඩනැගුණු සංස්කෘතිකමය හර පද්ධතීන් බිහි වී ඇති බව ලෝක ඉතිහාසය දෙස බැලීමේ දී මනාව පැහැදිලි වේ. ශ්‍රී ලංකාව තුළ ද මහින්දාගමනය, සංඝමිත් තෙරණින් වහන්සේ විසින් ජය ශ්‍රී මහා බෝධිය වැඩමවීම, දන්ත ධාතුන් වහන්සේ වැඩමවීම යන කරුණු හේතුකොට ගෙන සංස්කෘතිකමය හර පද්ධතීන් දේශීය සංස්කෘතියට බද්ධ වී ඇත.

ක්‍රි.ව 1593 දී පළමු වන විමලධර්මසූරිය රජතුමාගේ කාලයේ මහනුවරට වැඩම කරවන දළදා වහන්සේ හේතුකොටගෙන දළදා සංස්කෘතියට පෙරහර සංස්කෘතිය එක්වීම අපේ හර පද්ධතියට ඉතා තියුණු ලෙස කා වැදී ඇත. සිව් මහා දේවාල සඳහා මහනුවර පැවැති පෙරහර දළදා පෙරහරක් ලෙස හැඳින්විය නොහැකි බැවින් සියම් උප සම්පදාවත් සමගම ක්‍රි.ව 1753 දී පවත්වන ලද පළමු දළදා පෙරහර මේ වන විට මුළු ත්‍රි සිංහලයේම නොමැකෙන සලකුණක් බවට පත්වී ඇති අතර ජාත්‍යන්තරයට ද ඉතා ගැඹුරු ලෙස ආකර්ෂණය වී ඇත.

එදා මෙදා තුර පැවැති දළදා පෙරහර ගැන සමීක්ෂණයක යෙදෙන විට ඌව වෙල්ලස්ස කැරැල්ල මුල් කර ගනිමින් ඉංග්‍රීසීන් විසින් 1818 දී දළදා පෙරහර තහනම් කරන ලද බව පෙනී යන අතර මේ තහනම 1828 දක්වා පැවැත්වුණි. පසුව 1828 දී මැයි 29 වන දින වෙසක් දින එම තහනම අත්හිටවූ පසු දළදා ප්‍රදර්ශනයක් ද පවත්වා ජූනි මස 08 වන දින ඇසළ පෙරහර පවත්වන ලද බව ඉතිහාසයේ ද සඳහන් වේ. පළමු සහ දෙවන ලෝක යුද සමයේ ද ඉහතින් සඳහන් කළ තහනම් කාල සීමාවේ ද 1989 භීෂණ සමයේ ද වර්ෂ 1915 සිංහල මුස්ලිම් අරගලය පැවති අවස්ථාවේදී දළදා පෙරහර පැවැත්වීම පිළිබඳ ගැටලු මතු වී ඇති බව දැකිය හැකි ය.

අද වන විට ලෝකය පුරා ව්‍යාප්ත වී ඇති කෝවිඩ් - 19 වයිරස අභියෝගය පෙරහර පැවැත්වීමේදී ද අප හට අභියෝගයක් වී ඇත. අතිගරු ජනාධිපතිතුමන් ප්‍රමුඛ රජයේ ආරක්ෂක අංශ හා සෞඛ්‍ය අංශයෙන් ලබා දෙන ලද වෛද්‍ය උපදෙස් හා නීතිරීති මාලාවන්ට අනුකූලව ජනතා සහභාගීත්වයකින් තොරව අප හට මෙවර ඇසළ පෙරහර පැවැත්වීමට සිදු වූවද එම අභියෝගයට මුහුණ දෙමින් රටක් සහ ලොවක් බලා සිටින ත්‍රී සිංහලයේ අසිරිමත්ම බුද්ධාභිවන්දනය අභියෝගයන් හමුවේ වුවද පැවැත්වීමට හැකි වීම ගැන අපට සතුටු විය හැකි ය.

එදා මෙදා තුර දළදා මාළිගාවේ පුද සිරිත් හා පෙරහරට අනුගත සියලුම සම්ප්‍රදායන් හා සිරිත් විරිත් අකුරටම පිළිපදිමින් වෙනත් වසර වල පෙරහර ගමන් කළ මහනුවර නගරයේ සියලුම වීදි ආවරණය වන සේ මෙවරද ඇසළ පෙරහර පැවැත්වෙන බව ඉතා සතුටින් ඔබ සැමටම දැනුම්දෙනු කැමැත්තෙමි.

තවද ජනතා සහභාගීත්වයකින් තොරව පෙරහර පැවතුණ ද පෙරහරේ ගාම්භීරත්වය, පූජනීයත්වය හා සංස්කෘතික වටිනාකම් කිසිම අයුරකින් අඩුවක් කර නැත. අන්තර්ජාල චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ පුරා දින 10 තුළම ඇසළ මහා පෙරහර මංගල්ලය ජාත්‍යන්තරයට විකාශනය කරන අතර අප රට තුළ ද රූපවාහිනී නාලිකා ඔස්සේ ඔබට දිනපතා පෙරහර සජීවීව නැරඹිය හැකි බව ද සඳහන් කිරීමට කැමැත්තෙමි. අගෝස්තු මස 03 වන දින පැවැත්වෙන අවසන් රන්දෝලි මහා පෙරහර සියලුම රූපවාහිනී නාලිකාවල සජීවීව විකාශනය කිරීම පිණිස කටයුතු සූදානම් කර ඇත.

දළදා සමිඳු සරණින් අපේ රටටත්, මුළු ලෝකයටත් කෝවිඩ් - 19 වයිරසය අබිබවමින් සතුට සාමය සහ සෞභාග්‍යයෙන් පිරි ප්‍රභාශ්වර වූ හෙට දවසක් උදා වේවායි මම ප්‍රර්ථනා කරමි.

## බෞද්ධ සංස්කෘතික උරුමය හා පූජා චාරිත්‍ර ලොවට ප්‍රදර්ශනය කෙරෙන

# සෙංකඩගලපුර ඇසළ පෙරහර මංගල්‍යය



**සෙංකඩගලපුර දළදා පෙරහර හෙවත් ඇසළ පෙරහර මංගල්‍යය පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ විෂයෙහි සිදු කෙරෙන වාර්ෂික සතර මංගල්‍යයන් අතුරෙන් සුවිශේෂී පූජා මංගල්‍යයකි.**

දළදා පූජෝපහාරය, සිවුමහා දේවාලයන්හි දෙවියන්ට භක්ති ප්‍රණාමය දැක්වීම හා කලට වැසි ලබා සශ්‍රීකත්වය හා සෞභාග්‍යය ඇති කර ගැනීම අරමුණු කොට ගෙන මෙම උතුම් පෙරහර මංගල්‍යය වාර්ෂික ව පැවැත්වේ. ව්‍යවහාර වර්ෂ 310 වැන්නේ කිත්සිරි මෙවන් රජු දවස පටන් වසර එක්වා දහස් සත්සිය දස වසරක් සපුරන ජාතියේ ප්‍රෞඪත්වය හා බෞද්ධ සංස්කෘතියේ අනන්‍යතාවය විදහා දක්වන හෙළ මහා කලා මංගල්‍යය සේ දෙස් විදෙස් ජතී ජනයාගේ සිත්සතන් සැදැහැයෙන් පුරවන මෙම මංගල්‍යය චිරාගත සම්ප්‍රදායික පුදසිරිත්වලට අනුගත ව සුභ නැකැත් මුහුර්තීන්ට අනුව පැවැත්වේ. මෙවර පෙරහරේ විශේෂත්වය වන්නේ මහජනතාවගේ එක්රැස්වීමෙන් හා සහභාගිත්වයෙන් තොරව කොවිඩ් – 19 හෙවත් කොරෝනා වසංගත තත්ත්වය මගහරවා ගැනීම් වශයෙන් අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයෙන් හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුලු සෞඛ්‍ය අංශයන්ගෙන් ද, ත්‍රිවිධ හමුදාපතිවරු හා වැඩබලන පොලිස්පති ඇතුලු ආරක්ෂක අංශයන්ගෙන් ද ලැබුණු මෙම වසංගත තත්ත්වය මගහරවා ගැනීමේ නිරෝධායන නීති රීති හා උපදෙස්වලට එකගව හුදෙක් පෞරාණික දළදා පූජෝපහාර චාරිත්‍ර විධි ආරක්ෂා කර ගැනීමේ අභිලාෂයෙන් සෞඛ්‍යාරක්ෂිත නීති රීති සුරක්ෂිත කර ගනිමින් පැවැත්වෙන පෙරහර මංගල්‍යයක් වීම ය.

මෙම විසිතුරු ඇසළ පෙරහර මංගල්‍යයේ මූලික කටයුත්ත වනුයේ පෞරාණික සිරිත් ප්‍රකාර පණස වර්ගයේ කිරි වැහෙන ගසක එල නොදරන කොස් පැළයක් තෝරාගෙන එය වටා පිරිසුදු කොට වටතිර අඳවා වියන් බඳවා සඳුන් දියර ඉස දුම්මල අල්වා පහන් දල්වා පේකර අලුත්නුවර පොරෝකරුවා දෙහි ඇඹුල් ගා ස්නානය කොට ස්තෝත්‍ර ගායනා මැද්දේ ගස කපා හෙළීමයි. කැපූ ගසින් රියන් තුනක හෝ හතරක පමණ ප්‍රමාණයක් පිරිසුදු කොට සුදු රෙද්දකින් ඔතා පෙරහරින් ඇතෙකු පිටින් මහනුවර මහදේවාලය හෙවත් විෂ්ණු දේවාලයට රැගෙන ඒම සිරිතයි. එහිදී නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි යන සිවුමහා දේවාලයන්ට කොටස් කර සතර දේවාලවල බස්නායක නිලමේවරුන් හමුවේ බෙදා දෙන අතර, ඒ ඒ දේවාලයන්හි කපුවන් විසින් කප රැගෙන සුදු රෙද්දකින් ඔතාගෙන ඇතෙකු පිට නැගී පෙරහරින් වැඩමවීම සිදුකෙරේ. කප සිටුවීමට දේවාලයේ නියමිත ස්ථානය පිරිසිදු කොට වට තිර වියන් බැඳ, ගොක් කොළ මලින් සරසා වැස්සට අධිපති ඉන්ද්‍ර දෙවියන් සංකේත්වත් කොට දෙපස පොල්ගෙඩි දෙකක් මත තැබූ පහන් දල්වා ස්තෝත්‍ර ගායනා මැද්දේ කප සිටුවීම සුභමුහුර්තියෙන් සිදුකෙරේ. මෙවර එම කප් සිටුවීමේ මංගල්‍යය වර්ෂ 2020 ජූලි මස 21 වන කුජදින අලුයම 2 පසුවී විනාඩි 26 ට උතුරු දිශාභිමුඛ ව සිරිත් පරිදි පේකොට තබන ලද පණස වෘක්ෂයේ ශාඛාව ගෙන මහනුවර සිවු දේවාල ප්‍රධාන කොට ඇති සියලු දේවාලයන්හි කප සිටුවීම සිදු කිරීමෙන් පෙරහරේ කටයුතු ඇරඹේ. එසේ කප සිටුවීමෙන් අනතුරුව ඒ ඒ දේවාලයේ දුන්න ඊතලය සහිත දේවාභරණ කෙටි පෙරහරකින් වඩමවා කප වටා ප්‍රදක්ෂිණා කිරීම සිදුවේ. දේවාල අභ්‍යන්තර පෙරහර ඇතුළේ පෙරහර වශයෙන් ද භාවිත වේ. එය ඉතා කෙටි පෙරහරකි. පන්දම් විලක්කු ගෙන ප්‍රධාන කපුවා විසින් දේවාභරණ කප වටා වැඩමවීම එහි සිරිතයි. මෙහි අරමුණ වන්නේ පෙරහර මංගල්‍යය කිසිම උපද්‍රවයකින් තොරව සාර්ථකව පැවැත්වීමට හා සහභාගී වන කලාකරුවන් ඇතුළු සියලු දෙනාගේ ආයුරාරෝග්‍ය සම්පත්තිය හා සුභශාන්තිය වඩා වර්ධනය කරගැනීමත්, කලට වැසි ලැබ අස්වැන්න සරු වී රටේ සමෘද්ධිය සෞභාග්‍යය ඇති කර ගැනීමයි.

ඉන් අනතුරුව ජූලි මස 25 වන ශනිදිනෙන් ආරම්භ ව වීදි සංචාරය කෙරෙන කුඹල් පෙරහර පහක් ද, ජූලි මස 30 වන ගුරුදිනෙන් ආරම්භ වන රන්දෝලි පෙරහර පහක් ද, අගෝස්තු මස 03 වන සඳුදින අවසන් රන්දෝලි මහපෙරහර අවසානයේ මධ්‍යම රාත්‍රියෙහි ගෙඩිගේ විහාරයට පෙරහර කරඬුව වැඩමවන පෙරහරක් ද, පසුදින දහවල් පෙරහරක් ද පැවැත්වීමෙන් පසු පෙරහර ගෙවැදී, ඓතිහාසික සෙංකඩගලපුර ඇසළ පෙරහර මංගල්‍යය සමාප්ත වේ. අනතුරුව රටේ පාලක ප්‍රධානයා වන අතිගරු ජනාධිපතිතුමා වෙත පෙරහර සංදේශය පිළිගැන්වීම ද, පසු දා ශ්‍රී විෂ්ණු දේවාලයේ පැවැත්වෙන වළියක් නැටුම ද යන සුවිශේෂී කරුණු වලින් පෙරහරේ කටයුතු සපුරා අවසන් වේ.

ඇසළ පෙරහරේ පළමුව ගමන් කරනුයේ ශ්‍රී දළදා මාළිගාවේ පෙරහරයි. වර්තමානයේ මෙම පෙරහරේ වැඩමවනුයේ දළදා වහන්සේ නොව සධාතුක ධාතුන් වහන්සේලා තැන්පත් කළ පෙරහර කරඬුවයි. දෙවනුව නාථ, විෂ්ණු, කතරගම හා ශ්‍රී පත්තිනි දේවාල පෙරහර අනුපිළිවෙළින් ගමන් කරනු ලැබේ.

මෙකී පෙරහර ආරම්භ වූයේ කිත්සිරිමෙවන් මහරජු (ක්‍රි.ව 301 – 328) දවස දළදා වහන්සේ ලක්දිවට වැඩම වීමත් සමග ය. මහාවංශයේ සඳහන් වන අයුරු “රජ තෙමේ නව ලක්ෂයක් ධන විසඳ දළදා මහ පෙරහර කළේයි. “අවුරුදු පතා අභයගිරි විහාරයට වඩා ගෙන ගොස් දන්ත ධාතුවට මෙබඳු පූජා කරවයි. “නියෝග කළේය යන සඳහනෙන් එය සනාථ වෙයි.

පාහියංගේ දේශාටන වාර්තාවෙහි රජතෙමේ තුන් වන මස මැද දී (ඇසළ මස) බුදුරජාණන් වහන්සේගේ දළදාව පෙන්වනු ලැබේ. මෙයට දින දහයකට පෙරාතුව කීමෙහි බිනීමෙහි දක්ෂ මිනිසකු රජ ඇඳුම්, පැළඳුම්, හඳවා පළඳවා, මොනවට සැරසූ ඇතක්හු පිට නගවා, නුවර හැවිද අණ බෙර ගසා මෙසේ කියන්ට සලස්වයි. “බෝසතාණන් වහන්සේ අසෙකි කපක් මහත් වැර වඩා, පෙරුම් පිරූ සේක. සිය සැප පහසු නොතකා සිය රජය ද, සිය බිසව ද, දරුවන් ද, දන් දුන් සේක. තමන් ඇස් උගුල්ලා එය ඉල්ලා ආවුනට දුන් සේක. අද සිට දස දිනකින් ඒ බුදු රදුන්ගේ දළදාව එළියට වැඩමවා අභයගිරි වෙහෙරට පමුණුවනු ලැබේ. පින් කැමැති සියල්ලෝ මග සම කෙරෙත්වා. කොවේ, මහවේ සරසත්වා. පුද පිණිස මල් හා සුවඳ පිළියෙළ කෙරෙත්වා යනුවෙන් කෙරෙන විස්තරයෙන් එදවස ඇසළ පෙරහර සංවිධානය වූ ආකාරය කියැවෙයි. අනුරපුර රාජධානියෙන් අනතුරුව පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගඟසිරිපුර, කෝට්ටේ, සීතාවක යන රාජධානියන්හි ද නොකඩ කොට ඉපැරැණි චාරිත්‍රානුකූලව

> දළදා පූජෝපහාරය, සිවුමහා දේවාලයන්හි දෙවියන්ට භක්ති ප්‍රණාමය දැක්වීම හා කලට වැසි ලබා සශ්‍රීකත්වය හා සෞභාග්‍යය ඇති කර ගැනීම අරමුණු කොට ගෙන මෙම උතුම් පෙරහර මංගල්‍යය වාර්ෂික ව පැවැත්වේ.

පෙරහර මංගල්‍යයන් පැවැත්වූ අයුරු මූලාශ්‍රයන්ගෙන් හෙළිවේ.

ඇතැම් සතුරු උපද්‍රව සමයන්හි පෙරහර වීදි සංචාරය නොකළ ද මේ පෙරහර චාරිත්‍රයන් අඛණ්ඩ ව පවත්වාගෙන ඒමට අපේ මහතෙරවරුන් හා රජවරු, දියවඩන නිලමේවරු සමත්වූහ.

1592 වර්ෂයේදී පළමු වන විමලධර්මසූරිය රජු දවස ශ්‍රී දළදා වහන්සේ සෙංකඩගල පුර රාජධානියට වැඩම වීමෙන් අනතුරුව වර්තමානය දක්වා අඛණ්ඩ ව පවත්වාගෙන ආ බවක් දක්නා ලැබේ. මහනුවර රාජාවලියේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව 1747 – 1781) දවස ක්‍රි.ව 1753 දී දළදා පෙරහර පෙරටු කොට නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි සිව් මහා දේවාලය අනුපිළිවෙළට ගමන් ගන්නා ආකාරයට ඇසළ පෙරහර මංගල්‍යය පැවැත්වීම ආරම්භ කොට ඇත. එතැන් සිට වර්තමානයේ පවත්නා ආකාරයට දළදා මාළිගාව පෙරටුකොට සතර දේවාල ගමන් කිරීම චිරාගත සම්ප්‍රදායානුකූලව පැවැත්වීම සිරිතයි. මෙම මංගල්‍යය අපේ රජවරුන් හා ඔවුන්ගෙන් අනතුරුව අද දක්වාම දියවඩන නිලමේවරුන් විසින් ද නො කඩ කොට පවත්වාගෙන විත් අද දක්වාම, වර්තමානයට දායාද කොට ඇත.

දියවඩන නිලමේවරයෙකු සතු ප්‍රධානතම නිල කාර්යභාරයක් වන්නේ වාර්ෂික ඇසළ පෙරහර මංගල්‍යය චිරාගත සම්ප්‍රදායානුගත පුදසිරිත් වලට අනුගතවම පැවැත්වීමයි. වර්තමාන දියවඩන නිලමේතුමන්ගේ පසළොස් වසරක නිලකාලය තුළ චිරාගත සාම්ප්‍රදායික පුදසිරිත්වලට අනුගතව මහාවිහාර වංශික ස්‍යාමොපාලි මහා නිකායේ මල්වතු අස්ගිරි උභය මහා විහාරයේ අතිගරු මහානායක මාහිමිපාණන් වහන්සේලාගේ අවවාද අනුශාසනාවන්ට අනුකූලව මුළු හෙළයම අසිරිමත් කරවන මෙම පෙරහර මංගල්‍යය වඩාත් උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට තම දායකත්වය හා ඇපකැප වීම මැනවින් ලබා දීම ජාතියේ වාසනාවකි. ඇසළ පෙරහර මංගල්‍යයේ චිරාගත සාම්ප්‍රදායික පුදසිරිත් ආරක්ෂා කරගැනීම වනාහි දියවඩන නිලමේතුමෙකුගෙන් අපේක්ෂිත මූලික වගකීමකි.

එම වගකීම් සම්භාරය මැනවින් දැන හඳුනාගෙන සෙංකඩගලපුර ඇසළ පෙරහර මංගල්‍යයේ ඓතිහාසිකත්වයට, අභිමානත්වයට, අලංකාරයට හා උත්කර්ෂවත්භාවයට කිසිදු හානියක් නො වන අයුරින් වසරින් වසර මෙම දළදා පූජෝත්සව පෙරහර මංගල්‍යය අත්‍යන්තයෙන්ම පූජෝපහාර මංගල්‍යයක් වශයෙන් පැවැත්වීමට වර්තමාන දියවඩන නිලමේතුමන් සමත් වී තිබීම අගය කළ යුතුය. ඒ සඳහා එතුමන්ට මහාවිහාර වංශික ස්‍යාමොපාලි මහානිකායේ මල්වතු අස්ගිරි උභය මහා විහාරයන්හි අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේලා ප්‍රමුඛ, තේවාභාර නාහිමිපාණන් වහන්සේලාගේ මාර්ගෝපදේශනය හා ආශිර්වාදය නොමඳව ලැබිණ. ගෙවීගිය පහළොස් වසරක නිලකාලය තුළ වසරින් වසර විදේශිකයන් දහස් ගණනින් මෙම පෙරහර මංගල්‍යය නැරඹීමට පැමිණියේ එහි පවත්නා චිරාගත සම්ප්‍රදායික චාරිත්‍රයන් මැනවින් දැක බලා අධ්‍යයනය කොට ගවේෂණය කරන අතර, රසවින්දනය සඳහා ය. එබැවින් මෙම පෙරහර මංගල්‍යයේ දර්ශනීයත්වය හා ආකර්ෂණීයත්වය මැනවින් ආරක්ෂා කරගත යුතුව පවතී.

මෙම වර්ෂයේ කොරෝනා වංසගත තත්ත්වය හේතු කොට ගෙන සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් මැනවින් පිළිපදිමින් මහජනතාවගේ එක්රැස්වීමෙන් හා සහභාගිත්වයෙන් තොරව පෙරහර පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. සෙංකඩගලපුර ඇසළ පෙරහර මංගල්‍යය ආකර්ෂණීය හා දර්ශනීය මංගල්‍යයක් කර ගැනීමෙහිලා වඩාත් වැදගත් කාර්යභාරයක් ඉටුකරනුයේ නර්තන හා වාදන කලා ශිල්පීහු ය. එහෙත් ඔවුනට සමාජයේ ලැබෙන සමාජ තත්ත්වය හා පිළිගැනීම නිසි අයුරින් නොලැබීම හේතු කොට ගෙන අනාගතයට සිදුවිය හැකි බලවත් පාඩුව දැන හඳුනාගෙන, පාරම්පරික කලාශිල්පීන්ගේ ජීවන තත්ත්වය හා කලා කුසලතාවය ඉහළ නංවා ගැනීමේ පියවර රාශියක් වත්මන් දියවඩන නිලමේතුමාගේ නිල කාලය තුළ ගෙන ඇත. කලාශිල්පීන්ගේ ජීවනෝපාය නංවා ලීමට අවශ්‍ය පියවර ගන්නා අතර, ඔවුන්ගේ කලා කුසලතාවන් අගයමින් මූල්‍ය තිළිණ ප්‍රදානය, ඇඳුම් ආයිත්තම් සපයා දීම, වාද්‍ය භාණ්ඩ සපයා දීම මැනවින් ඉටු කරමින් මෙම කලාවන්හි නියැළී සිටීමට අවශ්‍ය අභිප්‍රේරණය ලබා දී ඇත්තේ ය. ඒ සමගම පාරම්පරික නැටුම් කලාවේ තිරපැවැත්ම අරභයා පාසල් සිසුන්ගෙන් තෝරාගත් නර්තන කණ්ඩායම් කිහිපයක් පාරම්පරික ප්‍රවීණ කලාකරුවන්ගේ අධීක්ෂණය හා මගපෙන්වීම මත පුහුණු කරවා පෙරහරට සහභාගි කරවා ගැනීමට පියවර ගැනීම එම උතුම් මංගල්‍යයේ අනාගතය නිසි සේ සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීමට ගත් මාහැඟි පියවරකි. එසේම මාළිගාව විසින් පුහුණු කළ දක්ෂ තරුණ නැටුම් කණ්ඩායම් කිහිපයක් පෙරහරට එක්කර ගැනීම තුළින් එහි විචිත්‍රත්වය වඩාත් ඔප්නංවා ගෙන ඇත.

හීලෑ අලි ඇතුන්ගේ හිඟය වසරින් වසර ඉහළ යාම නිසා පෙරහර මංගල්‍යයට අලිඇතුන් සහභාගි කරවා ගැනීමේ දුෂ්කරතාවය ශ්‍රී දළදා මාළිගාවේ පෙරහර මංගල්‍යයන්ට පමණක් නොව සෙසු පූජනීය පෙරහර මංගල්‍යයන්ට ද ඇතිවෙමින් පවත්නා බලවත් දුෂ්කරතාවයකි. එම දුෂ්කරතාව සමනය කර ගනු වස් එතුමා විසින් රජයේ අවධානය යොමු කරවා බුරුමය වැනි රාජ්‍යයන්ගේ අනුග්‍රහයෙන් මාළිගාවේ ඇත් පන්තිය වැඩිකර ගැනීමට පියවර ගත්තේ ය. ඇත්ගොව්වන්ගේ ජීවන තත්ත්වය නගාලමින් අලිඇතුන් මනාව රැකබලාගැනීමට පියවර ගෙන ඇත.

වර්තමාන දියවඩන නිලමේතුමා සෙංකඩගලපුර ඇසළ පෙරහරේ අසිරිමත්බව වඩා වර්ධනය කර ගැනීමට ඉටුකළ සේවාව අතිශයින් ම ප්‍රශංසා කටයුතුව පවතී. මෙම පෙරහර මංගල්‍යය දළදා පූජෝපහාර මංගල්‍යයක් වශයෙන් අසිරිමත් ලෙස පැවැත්වීමට දළදා සමිඳුන්ගේ සුභාශිර්වාදයෙන්, සිවුමහා දේවාලයන්හි දෙවිවරුන්ගේ පිහිටෙන් සැම සියලු දෙනාගේම සහයානුග්‍රහය නොමඳ ව ලැබේවායි ආශිංසනය කරමු.



ශ්‍රී දළදා මාළිගාවේ
දේශීය බෞද්ධ කටයුතු කාර්යාංශයේ ලේකම්
**කේ. මීගහකුඹුර**

# සිරි දළදා හිමි පූජෝපහාර

**සිරිලකට දළදා වහන්සේ වැඩමවීම ශාසන ඉතිහාසයේ ඓතිහාසික සිදුවීමකි. දළදා වහන්සේ වැඩම වූ තැන් පටන් මෙරට රාජරාජ මහාමාත්‍යාදීන් ගේ පටන් සාමාන්‍ය මහ ජනතාව ද එම උතුම් පූජනීය වස්තුව කෙරෙහි අප්‍රමාණ ගෞරවයක් දැක් වූ හ. ඒ සියල්ල ජීවමාන බුදුරජාණන් වහන්සේ කෙරෙහි දක්වන ගරු සැලකිලි හා සම විය.**



**ඌරුගමුවේ අස්සජි හිමි**

කුසිනාරා නුවර මල්ල රජදරුවන් ගේ උපවත්තන සල් උයනෙහි බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රී ශරීරය ආදාහනය කළ චිතකයෙහි ධාතුන් වහන්සේලා සත්නමක් සිඳී බිඳී විසිරී නොගොස් ශේෂ ව පැවතිණ. ලලාට ධාතුව, දෙ අකු ධාතු සහ සතර දළදාව එම ධාතුන් වහන්සේලා සත් නමයි. මෙම සතර දළදා වහන්සේ ගෙන් එක් නමක් තව්තිසා දෙව්ලොව සිළුමිණි සෑයෙහි ද එක් නමක් නාග ලෝකයෙහි ද තවත් එක් නමක් ගන්ධාර දේශයෙහි ද අනෙක් දළදා වහන්සේ කාලිංග දේශයෙහි ද තැන්පත් කෙරිණි.

දළදා වහන්සේ පිළිබඳ ලියැවුණු පැරණිම ග්‍රන්ථය වන පාලි දාඨාවංසයෙහි සඳහන් වන පරිදි ඛේම නම් රහතන් වහන්සේ බුදුරදුන් ගේ වම් දළදාව ආදාහන මළුවෙන් ගෙන කාලිංග දේශයෙහි දන්ත පුරයෙහි බ්‍රහ්මදත්ත රජු වෙත භාර කළ හ. රජු එම දළදා වහන්සේ ඉතා අනර්ඝ මන්දිරයක තැන්පත් කළේ ය. නොකඩවා ම පුද පූජාවන් ද පැවැත් වීය. එම රජු ගේ ඇවෑමෙන් ඔහු පුත් කාසි රජු ද එයින් පසු සුනන්ද රජු ද, එලෙසින් ම දළදා පූජාව පැවැත් වූ හ. කාලයා ගේ ඇවෑමෙන් දළදා වහන්සේ පිළිබඳ වගකීම පැවරුණේ ගුහසීව රජුට ය. එතුමා ස්වකීය රාජ පරම්පරාව අනුව යමින් දළදා වහන්සේ අසීමිත ගෞරවයකින් රැක ගත්තේ ය. ගුහසීව රජ දවස ලාභ සත්කාරයෙන් පිරිහුණු මිථ්‍යා දෘෂ්ටිකයෝ පාටලී පුත්‍රයෙහි රජ කළ පණ්ඩු නම් රජුට කේලාම් කියා ගුහසීව රජු කෙරෙහි වෛරයක් ඇති කළේ ය. එබැවින් ගුහසීව රජු දළදා වහන්සේත් සමග පාටලී පුත්‍රයට අල්වාගෙන එන ලෙස පණ්ඩු රජු නියම කළේ ය.

පසුව තොරතුරු විමසූ හෙතෙම දළදා වහන්සේ කෙරෙහි පැහැදී පුද සත්කාර පවත්වා නැවත ගුහසීව රජු දළදා වහන්සේ සමග කාලිංග දේශයට පිටත්කොට එවීය. එහි දී ඛීරධාර නම් රජු ගේ බෑණනු කෙනෙක් දළදා වහන්සේ තමා සන්තක කරගැනීම සඳහා ගුහසීව රජු සමග යුද්ධයකට පැමිණියේ ය. ගුහසීව රජු එම යුද්ධයෙන් ජයගැනීම පිළිබඳ ඇති වූ සැකය නිසා දළදා වහන්සේ ස්වකීය දියණිය වූ හේමමාලා කුමරිය ගේ ස්වාමි පුරුෂයා වූ දන්ත කුමරුට පවරා දුන්නේ ය. තමා යුද්ධයෙන් පැරදුණහොත් දළදා වහන්සේ රැගෙන ස්වකීය මිත්‍ර වූ ලංකාධිපති මහාසේන රජු වෙත යන ලෙස ඔහු ඉල්ලා සිටියේ ය.

හේමමාලා කුමරිය හා දන්ත කුමරු විසින් කිත්සිරිමෙවන් රජුගේ නව වන රාජ්‍ය වර්ෂයෙහි දී ලක්දිවට වැඩමවන ලද්දේ මෙම දළදා වහන්සේ ය. මෙය බුදුරජාණන් වහන්සේ ගේ යටි හණුවෙහි වම් දළදා වහන්සේ බව පාලි ලලාට ධාතුවංසයෙහි සඳහන් වේ. රාජධානි වෙනස්වීමේ දී හා සතුරු උපද්‍රව නිසා පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, බෙලිගල, දෙල්ගමුව, කෝට්ටේ ආදී ස්ථානවල වැඩසිට අද මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ වැඩ සිටින්නේ මෙකී දළදා වහන්සේ ය. දළදා වහන්සේ දූරාතීතයේ පටන් රටේ රාජ්‍ය උරුමයක් වූ අතර එම උරුමය සුරැකීම රටේ රාජ්‍ය නායකත්වයට සුදුසුකමක් සේ සලකනු ලැබිණි. බටහිර ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීහු පවා එම උරුමයට නිසි ගෞරවය දැක් වූ හ.

### දළදා සාහිත්‍යය

දළදා වහන්සේ සිරිලකට වැඩමවීම පිළිබඳ සම්පූර්ණ ඉතිහාස පුරාවෘත්තය ලියැවී තිබෙන පැරැණිම ග්‍රන්ථය ධර්මකීර්ති නමැති හිමිනමක් විසින් රචනා කරන ලද “පාලි දාඨාවංසය” යි. “දළදා සිරිත” නමැති ග්‍රන්ථයක් ද හයවන පරාක්‍රමබාහු රජු ගේ ආරාධනය අනුව රචනා කොට ඇත. එකී හතරවන පරාක්‍රමබාහු රජ දවස දක්වා දළදා වහන්සේට පුද පූජා පැවැත් වූ රජවරුන් ගේ තොරතුරු ඇතුළත් කොට කුරුණෑගල යුගයේ දී හෝ ඊට ආසන්න කාලයක ලියැවුණු තවත් ග්‍රන්ථයක් තිබේ.

20 පිටුවට....

# සිරි දළදා හිමි පූජෝපහාර

19 පිටුවෙන්...

එනම් "දළදා පූජාවලිය" යි. හතරවන විමලධර්මසූරිය රජු දක්වා රජවරුන් දළදා වන්දනාව සිදු කළ පුවත් විස්තර කරමින් "දළදා වරුණ" නමින් ලියැවුණු කුඩා ග්‍රන්ථයක් ද වෙයි. මේ හැර දළදා වහන්සේ ගේ ඉතිහාසය, පුද පූජාවන්, දළදා වර්ණනාවන් යනාදිය මුල් කරගෙන සිංහල හා පාලි යන භාෂාවන් ගෙන් ලියැවුණු තවත් ග්‍රන්ථ සමූහයක් ද තිබේ.

## දළදා තේවාව

දළදා වහන්සේ පිළිබඳ පවත්නා පුද සිරිත් රාශියක් ම මහනුවර ශ්‍රී දළදා මාලිගාව කේන්ද්‍රකර ගනිමින් එදාමෙදාතුර ක්‍රියාත්මක ව පවතියි. එහි දී ජීවමාන බුදුරජාණන් වහන්සේ විෂයයෙහි සිදුකරන ආකාරයට දළදා වහන්සේ උදෙසා සියලු ම පුද පූජා හා වත්පිළිවෙත් ඉටු කිරීම විශේෂත්වයකි. දළදා මැඳුර තුළ බුදුරදුන් ජීවමාන ව වැඩ වෙසෙතැ යි, බෞද්ධ ජනයා තුළ ඇති සැදැහැබර හැඟීම එහි දී මූලික වෙයි.

බුදුරදුන් ජීවමාන සමයේ ආනන්ද හිමි උන්වහන්සේ වෙනුවෙන් කළ උපස්ථානය බුද්ධ චරිතයෙහි විස්තර වෙයි. දළදා වහන්සේ වෙනුවෙන් සිදු කරනුයේ ද එවැනි ම උපස්ථානයකි. ශ්‍රී දළදා මාලිගාවේ සිදු කෙරෙන සියලුම පුද පූජා හා සිරිත් විරිත් එම පිළිගැනීමට යෝග්‍ය වන අන්දමින් සංවිධානය වී පවතියි. සියලුම දළදා පුද පූජා, ඒවා පැවැත්වෙන කාලය අනුව ප්‍රධාන කොටස් තුනකට වර්ග කළ හැකි ය.දෛනික පුද පූජා හෙවත්දිනපතා පවත්වන පුද පූජා ,සප්තාහික පූජා හෙවත් සතියකට වරක් සිදු කෙරෙන පුද පූජා, වාර්ෂික පුද පූජා වශයෙනි

## දෛනික පුද පූජා

දළදා වහන්සේ උදෙසා දිනකට තුන් වරක් පුද පූජා පැවැත්වේ.

අලුයම පූජාව, නව පෑ පූජාව, හැන්දෑ පූජාව, අලුයම පූජාව වශයෙනි.

අලුයම 5.15 ට පමණ හේවිසි වාදනය කෙරෙයි. එය අලුයම් දූරය ලෙස හැඳින්වේ. පෙ.ව. 5.30 ට අලුයම තේවාව ආරම්භ වෙයි. එයට තේවාව භාර නායක ස්වාමීන් වහන්සේ හා දෙවැනි ස්වාමීන් වහන්සේ ද වැඩම කරති. දළදා තේවාවට උපකාරී වන තේවාකාර ධුර කිහිපයකි.

වට්ටෝරුරාල, ගෙපරාල, කත්තියනරාල, හක්ගෙඩිරාල, පල්ලේමාලේරාල හා දෙරකඩ ආරච්චි ආදී ලෙසිනි.

දළදා වහන්සේ වැඩසිටින මාලිගාවේ දොරවල් විවෘත කිරීමෙන් අනතුරුව චාරිත්‍රානුකූල දළදා තේවාවන් රැසක් සිදු කෙරෙයි. අවසානයේ දී එහි ප්‍රධාන කාර්යයක් ලෙස බුදුරදුන් ගේ අග්‍ර උපස්ථායක ආනන්ද හිමි සිදු කළ උපස්ථානය ම සිහිපත් කරගෙන තේවාවෙහි නියුතු ස්වාමීන් වහන්සේලා දෙනම ගෙන් එක් නමක් බුද්ධ උපස්ථානය සිදු කරයි. එහි දී ඇල් පැන්, උණු පැන්, දැහැටි දඬු, අට පිරිකර, අවාන, විජිනිපත යනාදී උපකරණ පිළිවෙලින් පූජා කෙරෙයි. තේවාව අවසන්වීමෙන් පසු මහ ජනතාවට දළදා වහන්සේ වන්දනා කිරීමට අවස්ථාව ලැබෙයි. අනතුරුව අලුයම 6.00 ට ආහාර බුද්ධ පූජාව පැවැත්වෙයි. මෙම පූජාවට හාල් සේරු 32 ක බත් දානය ද, ව්‍යංජන 32 ක් ද, අවුල්පත් ද සූදානම් කෙරේ. එය මුළුතැන් පූජාව ලෙස නූතනයේ හැඳින්වෙයි.

## නව පෑ පූජාව

නව පෑ පූජාව සඳහා මාලිගාවේ දොරවල් විවෘත කරන්නේ පෙ.ව. 9.30 ට ය. නව පෑ පූජාව ඇරඹෙන්නේ පෙ.ව. 10.00 ට ය. මෙම පූජාව සඳහා ද හාල් සේරු 32 ක බත් දානය ද, ව්‍යඤ්ජන 32 ක් ද, අවුල්පත් ද සූදානම් කෙරේ. පෙ.ව. 11.00 ට පමණ නැවත දොරවල් වසනු ලැබේ.

## හැන්දෑ පූජාව

හැන්දෑ පූජාව ආරම්භ වන්නේ ප.ව. 6.15 ට පමණ මාලිගාවේ හේවිසිකරුවන් විසින් හැන්දෑ දූරය වාදනය කරනු ලැබීමෙන් පසුව ය. මෙම තේවාවෙන් පසු ප.ව. 7.00 ට පළමු ගිලන්පස පූජාවත්, තවත් විනාඩි 30 කට පසු දෙවන ගිලන්පස පූජාවත් පැවැත්වෙයි. පසුව වන්දනාකරුවන්ට දළදා වහන්සේ වඳින්නට ඉඩ දී මාලිගාවේ දොරවල් වැසීම චාරිත්‍රය යි. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා අතින් සිදු වූ අතපසුවීමක් මෙලෙස ගිලන්පස පූජා දෙකක් පැවැත්වීමට මුල් වී ඇත. නිතිපතා පූජාවට සහභාගි වන රජතුමා දිනක් හැන්දෑ පූජාවට පැමිණෙන විට ගිලන්පස පූජාව අවසන් වී තිබී ඇත. වරක් දොර වැසූ පසු යළි රජුටවත් ඇතුළු මාලිගය විවර නොකරන බැවින් යළි ගිලන්පස පූජාවක් පැවැත්වීමට අවසර දෙන ලෙස රජු නායක හිමියන්ගෙන් ඉල්ලීමක් කර ඇත. උන් වහන්සේගෙන් එයට අවසරය ලැබුණු අතර දෙවැනි ගිලන්පස පූජාවක් පැවැත්වීමේ චාරිත්‍රය එදා සිට අඛණ්ඩ ව පවත්වා ගෙන එනු ලැබේ.

## සප්තාහික පූජාව

සප්තාහික පූජාව යනු සතියකට වරක් සිදු කෙරෙන පූජාව යි. සැම බදාදා දිනක ම මෙම සප්තාහික පූජාව සිදු කෙරෙයි. නානුමුරයට සූදානම් කළ සුවඳ පැන් ද , බොල පැන් ද (උණු පැන්) උඩු මාලයටත්, පල්ලේ මාලයටත් වියන් යටින් වැඩමවාගෙන යති. නියමිත වේලාවට නානුමුරය ඇරඹෙන බව හක්ගෙඩිය පිඹීමෙන් පිටත සිටින්නන්ට දන්වනු ලැබේ. දළදා කුටියේ සිදුකෙරෙන නානුමුරයට සහභාගි වනුයේ තේවා කාරක හිමිවරුන් දෙනම හා තේවාවට උපකාර කරන වට්ටෝරුරාල පමණකි. එදිනට ආලත්ති අම්මලා සහ කවිකාර මඩුව සහභාගි වීම ද විශේෂත්වයකි. නානුමුර කිරීමෙන් අදහස් වන්නේ දළදා වහන්සේ ස්නානය කරවීමයි.

## වාර්ෂික පුද පූජා

දළදා වහන්සේ මුල් කරගෙන සතර මහා මංගල්‍යය නමින් හැඳින්වෙන ප්‍රධාන පූජාවක් වාර්ෂික ව සිදු කෙරේ. ඒවා නම්,

අලුත් සහල් මංගල්‍යය, අලුත් අවුරුදු උත්සවය, ඇසළ මංගල්‍යය හා කාර්තික මංගල්‍යය යි. අලුත් සහල් මංගල්‍යය සැම වසරක ම දුරුතු පොහෝ දින සිදු කෙරේ. සිංහල හා දෙමළ අලුත් අවුරුද්දට කෙරෙන චාරිත්‍ර ශ්‍රී දළදා මාලිගාවේ දී සිදු කිරීම අලුත් අවුරුදු මංගල්‍යය යි. සැම වසරක ම ඉල් පොහොය දා කාර්තික මංගල්‍යය සිදු කෙරේ. ඉල් පොහෝදා රාත්‍රියේ පහන් පූජා කරන ප්‍රදීපෝත්සවය කාර්තික මංගල්‍යය යි.

මෙම සතර මහා මංගල්‍යයෙහි වඩාත් උත්කර්ෂවත් ම අවස්ථාව ඇසළ මංගල්‍යය යි. ඇසළ මංගල්‍යය තුළින් සිදු කෙරෙනුයේ වාර්ෂික පෙරහර මංගල්‍යය පවත්වා දළදා වහන්සේට ආවේණික සාම්ප්‍රදායික උත්සව හා පුද පිළිවෙත් අඛණ්ඩ ව පවත්වාගෙන යාම යි. අද පැවැත්වෙන ආකාරයේ ඇසළ මහා පෙරහර ආරම්භ වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේ දී ය.

කප් සිටුවීමෙන් පසුව දින පහක් පෙරහර පැවැත්වෙන්නේ දේවාල භූමියේ ය. සය වැනි දින කුඹල් පෙරහර ආරම්භ වන අතර සතර දේවාලයේ පෙරහර සුභ නැකතින් පිටත් වී දළදා මාලිගාවේ ප්‍රධාන දොරටුව අසලට පැමිණ මාලිගාවේ පෙරහර හා ඒකාබද්ධව ගමන් කරයි.

කප් සිටුවීමෙන් එකොළොස්වන දිනයෙහි රන්දෝලි පෙරහර ආරම්භ වේ. දින පහක් පුරා පැවැත්වෙන රන්දෝලි පෙරහරේ උත්කර්ෂවත් අවස්ථාව එළඹෙන්නේ එහි අවසන් රාත්‍රියේ ය. මෙම ඇසළ මහා පෙරහර ගමන් කරන පිළිවෙළ අනුව එය ප්‍රධාන කොටස් පහකින් සමන්විත ය.

දළදා මාලිගාවේ පෙරහර, නාථ දේවාලයේ පෙරහර, විෂ්ණු දේවාලයේ පෙරහර, කතරගම දේවාලයේ පෙරහර හා පත්තිනි දේවාලයේ පෙරහර යනුවෙනි.

අවසන් රන්දෝලි මහ පෙරහර වීදි සංචාරය කිරීමෙන් පසු සතර දේවාලයේ පෙරහරදිය කැපීම සඳහා ඓතිහාසික ගැටඹේ තොටට යයි. දළදා පෙරහර සධාතුක කරඬුවත් සමග අස්ගිරි මහා විහාරයීය ගෙඩිගේ රාජමහා විහාරය වෙත ප්‍රවේශ වෙයි. මෙම විහාරය "ගමන් මාලිගය" ලෙස ද හැඳින්වෙයි. මෙහි දී අස්ගිරි මහානායක මාහිමි විසින් සධාතුක කරඬුව භාරගෙන පසුදා දහවල් පෙරහරෙන් දළදා මාලිගාවට වැඩම කරවනතුරු දළදා මාලිගාවේ දී සිදු කරන ආකාරයට ම සියලු පුද පූජාවන් පවත්වනු ලබයි. පසුදින දළදා කරඬුව මාලිගාවේ තැන්පත් කිරීමෙන් පසුව දියවඩන නිලමේතුමා ප්‍රමුඛ සතර දේවාලවල බස්නායක නිලමේවරුන් රජු බැහැදැකීම සඳහා යාම අනිවාර්ය ය. පුරාතන සිරිතට අනුව යමින් දැනට එම නිලධාරීහු මහනුවර රජ ගෙදර දී ජනාධිපතිතුමන් හමු වී මෙවර පෙරහර ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත් වූ බවත් ලබන වසරේ ද එලෙසින් ම පෙරහර පවත්වන බවත් ප්‍රකාශ කරති.

මෙසේ දළදා වහන්සේ හා සබැඳි ඓතිහාසික කතා පුවතක් ද පුද සිරිත් රැසක් ද පවත්නා බව මෙහි දී සාකච්ඡා කෙරිණි. තව ද මෙම දළදා වහන්සේ ගේ භාරකාරත්වය දරනුයේ මහනුවර මල්වතු–අස්ගිරි මහා විහාරයන් හි ශ්‍රීමත් මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා දෙනම විසිනි. එම උභය විහාරවල තේවාභාර ස්වාමීන් වහන්සේලා වසරින් වසර මාරුවෙන් මාරුවට පුරාණ චාරිත්‍ර විධි එලෙසින් ම පවත්වා ගනිමින් අද දක්වා ම එම කටයුතු ඉටු කරති. උභය විහාරවල භික්ෂූන් වහන්සේලා මාරුවීම සිදුවන්නේ වස්සාන සමයේ ආරම්භයත් සමග යි. එසේම දියවඩන නිලමේතුමා විසින් දළදා මාලිගාවේ ගිහි භාරකාරත්වය උසුලනු ලැබෙයි. වසර පහකට වරක් නව නිලමේවරයෙකු පත් කිරීම සිදු කෙරෙයි.



# දළදා වහන්සේ වැඩසිටි රාජධානි සහ පුදබිම්

**බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙහි පිහිටි සම සතළිස් දන්තයන් අතුරෙන් ප්‍රධාන දළඳ සතරක් පිළිබඳ තොරතුරු ඓතිහාසික මූලාශ්‍රයන්හි සඳහන් වේ. ලක්දිව ලියැවී ඇති ධාතු වංශකතා අනුව ඉහත සඳහන් දළඳ වහන්සේලා අතුරෙන් දෙකක් ලංකාවේ පිහිටියේ ය.**

එම විස්තර අනුව එයින් එකක් සෝමනුවර සෝමවති නම් ස්තූපයෙහි නිධන් කොට ඇත. (ධාතුවංසය පි. 33-34) දැනට මහනුවර සෙංකඩගල පුරයේ දළඳ මාළිගාවෙහි තැන්පත් ව වැඩසිටින්නේ අනෙක් දළඳ වහන්සේ ය. මුලදී කාලිංග දේශයේ තැන්පත් කරන ලදැයි සලකන මෙම දළඳ වහන්සේ බුදුරජාණන් වහන්සේගේ යටි වම් දළඳව ය. ලංකාවේ අන්තිම සිංහල රාජධානිය වූ සෙංකඩගල පුරයෙහි බෝගම්බර වැවට උතුරුදිගින් පැරැණි රජ මාළිගාවට සමීප ව දකුණු පසින් පිහිටා ඇති අලංකාර සුවිසල් මන්දිරය වන දළඳ මාළිගයෙහි විශේෂ ගරු බුහුමන් හා ආරක්ෂක විධි විධාන සහිතව දළඳ වහන්සේ තැන්පත් කර ඇත. දළඳ මාළිගයේ උඩුමහලේ වැඩසිටින මාළිගය" නමින් හැඳින්වෙන විශේෂ කුටියක් ඇත. මෙම විශේෂ කුටියට පිවිසිය හැක්කේ දළඳ තේවා කාර්යයෙහි යෙදෙන භික්ෂූන් වහන්සේලා සහ ඒ තේවා කාර්යයන්ට සම්බන්ධ මාළිගාවේ සේවකයන්ට පමණි.

(අපේ සංස්කෘතික උරුමය – ප්‍රථම කාණ්ඩයට ශ්‍රී දළඳ වහන්සේ පිළිබඳ මහාචාර්ය කඹුරුගමුවේ වජිර නා හිමි ලියූ ලිපිය පි. 278 මධ්‍යම සංස්කෘතික අරමුදල – 1995)

එවක ඉන්දියාවේ කාලිංග දේශයේ වැඩ සිටි දළඳ වහන්සේ උරුම කරගැනීම පිණිස එරට රජුන් අතර ඇති වූ අරගලයක් නිසා දළඳ වහන්සේ ආරක්ෂාව පිණිස දන්ත කුමරු හා හේමමාලා කුමරිය විසින් දළඳ වහන්සේ රැගෙන ලංකාවට පැමිණියහ. ඉන්දියාවේ තාම්‍රලිප්තියෙන් නැව් නැඟී රාජකීය යුවල ගොඩ බැස්සේ සිංහල ද්වීපයෙහි ලංකාපට්ටන නම් ස්ථානයට යි. ලංකාපට්ටනයෙන් අනුරාධපුරයට පැමිණි දන්ත සහ හේමමාලා දෙදෙනා මේඝගිරි විහාරයට පැමිණ තාවකාලික ව දළදා වහන්සේ එහි තැම්පත් කළහ. මේ පුවත ඇසූ එකල අනුරාධපුරයේ රජ කළ සිරි මේඝවර්ණ රජු (ක්‍රි.ව.301-328) ඉමහත් සොම්නසින් මේඝගිරි විහාරයට පැමිණ ගෞරව භක්ති පූර්වකව දළඳ වහන්සේට වැඳ පුද පිළිගෙන අලංකාර රථයක වඩා හිඳුවා මහ පෙරහරින් රජ ගෙදරට වැඩමවා රජුගේ සිංහාසනය මත තැන්පත් කළේ ය. අනතුරුව ඇතුළු නුවර මාහැඟි දළඳ ගෙයක් ඉදිකරවා දළඳ වහන්සේ එහි වඩා හිඳුවීය. වාර්ෂිකව අනුරාධපුරයේ අභයගිරි විහාරයට දළඳ වහන්සේ වැඩමවා ප්‍රදර්ශනය කර දළඳ පෙරහරක් ද පැවැත් වීය. අනුරාධපුරයේ රජ මාළිගය අසලම දළඳ මාළිගය ද ඉදි කරන ලදී. දළඳ වහන්සේ තැන්පත් කිරීම සඳහා රජ මාළිගය අසලම දළඳ මාළිගය ද

> රාජධානි මාරුවන විට ඒ ඒ රාජධානි ආශ්‍රිත රජ මාළිගා අසල දළදා මාළිගා ඉදිවීම දැකිය හැකි විය. මේ නිසා පොළොන්නරු සමයේ උදාවීමත් සමඟ දළදා වහන්සේ රාජ්‍ය උරුමයේ ප්‍රධාන සංකේතය බවට පත්වූහ. මේ අනුව පොළොන්නරු රාජධානිය ආරම්භ වීමෙන් පසුව දළදා වහන්සේ උදෙසා මහාර්ඝ වූ දළදා මැදුරක් ඉදිකරවා නිරන්තරයෙන් පුද පූජා පැවැත් වූ අයුරු මහා වංශයේ දෙවැනි කොටසේ සඳහන් වේ.

සැදීමේ සම්ප්‍රදාය පමණක් නොව රාජ මාළිගයට මෙන් ම දළඳ වහන්සේ තැන්පත් කළ විහාරයට දළඳ මාළිගය යන නාමය ද භාවිතය එසේ ඇරඹුණි. මෙකල ලංකාවට පැමිණි චීන ජාතික පාහියන් හිමියෝ ද දළඳ පෙරහර පිළිබඳ සිය වාර්තාවල සඳහන් කරති. මින් පසුව රාජධානි මාරුවන අවස්ථාවලදී දළඳ වහන්සේ ද එම රාජධානිවල රජ මාළිගය අසලම දළඳ මාළිගා නිර්මාණය කර ජීවමාන බුදුරජාණන්වහන්සේට මෙන් පුද පූජා පැවැත්වීමේ චාරිත්‍ර වාරිත්‍ර ද ඇති විය. අනුරාධපුර රාජධානිය බිඳවැටීමෙන් පසු තවදුරටත් එය රාජ්‍ය මධ්‍යස්ථානයක් වශයෙන් පවත්වා ගෙන යෑම අනාරක්ෂිත යැයි සැලකූ සිංහල පාලකයෝ එකොළොස් වැනි සියවසේ දී පොළොන්නරුව සිය රාජ්‍ය මධ්‍යස්ථානය කරගත්හ. අනුරාධපුර සමයේ රජවරුන්ට ජනතා සහයෝගය ලබාගැනීමේ දී මෙන්ම විශේෂ පුද පූජාවලට හා ගෞරවයට ලක්විය. රාජධානි මාරුවන විට ඒ ඒ රාජධානි ආශ්‍රිත රජ මාළිගා අසල දළඳ මාළිගා ඉදිවීම දැකිය හැකි විය. මේ නිසා පොළොන්නරු සමයේ උදාවීමත් සමග දළඳ වහන්සේ රාජ්‍ය උරුමයේ ප්‍රධාන සංකේතය බවට පත්වූහ. මේ අනුව පොළොන්නරු රාජධානිය ආරම්භ වීමෙන් පසුව දළඳ වහන්සේ උදෙසා මහාර්ඝ වූ දළඳ මැදුරක් ඉදිකරවා නිරන්තරයෙන් පුද පූජා පැවැත් වූ අයුරු මහා වංශයේ දෙවැනි කොටසේ සඳහන් වේ. මෙකල වටදගෙය නමින් හැඳින්වෙන්නේ එම දළඳ මාළිගය යි. මහවිජයබාහු රජු (ක්‍රි.ව. 1070-1110) චෝල පාලනයෙන් රට මුදවා ගැනීමෙන් පසුව ඒ රජුගේ රාජ්‍ය පාලනය තහවුරු කර ගැනීම සඳහා බුදුරජාණන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ සහ පාත්‍රා ධාතුව පොළොන්නරුව අගනගරය කරා ගෙන ආවේය. මෙම ගොඩනැගිල්ල දන්තධාතු මන්දිරය බව හඳුනා ගැනීම එතරම් අපහසු නොවේ. එයට හේතුව රජුගේ මරණයෙන් පසුව පැවති කලබලකාරී යුගයන්හි දී දළඳ වහන්සේ ආරක්ෂා කිරීම සඳහා යොදවන ලද වේලයික්කාර භට හමුදාව විසින් කරවන ලද නුදුරෙහි ඇති ද්‍රවිඩ ශිලා ලිපිය ඒ බව හඳුන්වා දෙන බැවිනි. මෙම ගොඩනැගිල්ල අයිතිය රෝහණයේදී ලබාගෙන සිය අගනුවර වූ පොළොන්නරුව කරා නැවත ගෙනැවිත් එහි තැන්පත් කිරීම උදෙසා මහාපරාක්‍රමබාහු රජු විසින් ඉදිකරවන ලදැයි සැලකෙන මුල් මන්දිරය නැවත ප්‍රතිසංස්කරණය කිරීමක් විය හැකි ය. (පොළොන්නරුව –මධ්‍යකාලීන ලක්දිව අගනගරය – මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න. පි.155-156 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි. 1998)

විජයබාහු රජු ගෙන් පසුව ලංකාව එක්සේසත් කර පොළොන්නරුවේ රාජධානිය පිහිටුවා ගැනීම සඳහා මහාපරාක්‍රමබාහු රජතුමාට බලවත් සටන් ගණනාවක් කිරීමට සිදුවිය. සතුරන්ට එරෙහිව සටන් කර ජයගත් නමුදු දන්ත ධාතූන් වහන්සේ සහ පාත්‍රා ධාතුව තමාට අයත් කර ගැනීමට පරාක්‍රමබාහු රජුට නොහැකි විය. අවසාන මොහොත දක්වාම මානාභරණ අත්පත් කරගෙන සිටි දළඳ වහන්සේ හා පාත්‍රා ධාතුව මානාභරණගේ මරණින් ඔහු සුගලා දේවියට අයිතිය. මෙම අවස්ථාවේ දී මානාභරණ මරණයට පත් වූ නිසා රුහුණේ නායකයෝ පරාක්‍රමබාහු රජුගේ ආධිපත්‍යය නොපිළිගෙන සුගලා දේවියගේ නායකත්වය ඇතිව රෝහණ දේශයේ සිය බලය තහවුරු කර ගැනීමට සටන් වැදුණේ ය. මොවුන් රාජ්‍ය උරුමය සඳහා මෙබඳු ක්‍රියාමාර්ගයක් අනුගමනය කළේ පරාක්‍රමබාහු රජුගේ බලය ගැන නොදැනීම නිසා නොව රාජ්‍ය බලය ස්ථාවර වීමට අවශ්‍යයෙන් ම තිබිය යුතු දළඳ වහන්සේ සුගලාදේවිය සතුව පැවතීම නිසා ය.

පොළොන්නරුවෙන් පසුව රාජධානිය දඹදෙණියට මාරු විය. අගනුවර ම දළඳ මාළිගය ඉදිකිරීමේ සිරිත අනුගමනය කරමින් දඹදෙණියෙහි දළඳ මාළිගයක් ඉදිකිරීම ප්‍රඥාගෝචර නොවන බව තුන්වන විජයබාහු රජතුමා (ක්‍රි.ව. 1232-1236) කල්පනා කළේ ය. රට රජ සේනා සන්නද්ධ ව සිටි මාඝ රජුගෙන් එල්ලවිය හැකි තර්ජන හේතු කොට ගෙන මායා රටේ පැවති අවිනිශ්චිත දේශපාලන පරිසරය නිසා එසේ සිතීමට දඹදෙණියේ රජ වූ තුන්වැනි විජයබාහු රජු පෙළඹුණි. මේ අනුව තුන් වන විජයබාහු රජතුමා දළඳ මාළිගය ඉදි කර වූයේ බිල්ලසේල කඳු මුදුනෙහි ය. "බිල්ල සේල" යනු සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වර්තමාන බෙලිගල ලෙස නිසැකව හඳුනා ගෙන ඇත. මේ බව චූලවංශයෙහි සහ පූජාවලියෙහි ද සඳහන් වේ. දඹදෙණියේ රජවරුන් විසින් බෙලිගල ඉදිකරවන ලද ගොඩනැගිලි වල නටබුන් පුරාවිද්‍යා ගවේෂණවලින් හෙළි වී ඇත. මෙහි දළඳ මාළිගයක නටබුන් සොයාගෙන තිබේ. (කෑගලු වාර්තාව H.C.P. බෙල් පි.25-8 හා පුරාවිද්‍යා පාලන වාර්තාව ආචාර්ය සෙනරත් පරණවිතාන පි. 14-1946- කොත්මලේ සඟවා තිබූ දන්ත ධාතූන් වහන්සේ නැවත ලබා ගෙන එය තැන්පත් කිරීම සඳහා ඉහත සඳහන් කළ පරිදි බෙලිගල දළඳ මාළිගයක් ඉදිකිරීම ගිහි – පැවිදි දෙපක්ෂයේ ම ගෞරවාදරය විජයබාහු රජු වෙත යොමුවීමට හේතු වූ පියවරක් බව නිසැක ය. (මධ්‍යකාලීන ලංකා ඉතිහාසය. මහාචාර්ය අමරදාස ලියනගමගේ පි. 146- අධ්‍යාපන අමාත්‍යාංශය 1989) තුන්වන විජයබාහු රජුගෙන් පසුව දඹදෙණියේ රජ වූ දෙවැනි පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1236-1270 බෙලිගල වැඩහුන් දළඳ වහන්සේ දඹදෙණියට වැඩමවා දඹදෙණිය පර්වතය මතුයෙහි දළඳ මාළිගාවක් ඉදිකොට එහි තැන්පත් කළේය. අතිශය භක්තිමත් පාලකයෙකු වූ දෙවැනි පරාක්‍රමබාහු රජතුමා සිය රාජධානියෙහි වැදගත් මධ්‍යස්ථානයන්හි වෙහෙර විහාර කරවා ඒ තැන් කරා දළඳ වහන්සේ මහ පෙරහරින් වැඩමවා ප්‍රදර්ශනය කිරීම හා පුද පූජා පැවැත්වීම ද කළේ ය. (අපේ සංස්කෘතික උරුමය ප්‍රථම කාණ්ඩය පි. 27-28 මධ්‍යම සංස්කෘතික අරමුදල – 1995)

**මෙම ලිපියේ ඉතිරි කොටස තිකිණි අව අටවක (11) පෝදා පත්‍රයේ පළවේ.**



පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂ
**සිරිසමන් විජේතුංග**
පුරාවිද්‍යා Msc පර්යේෂණ



# සෝමවතී චෛත්‍ය රාජයාණන් වහන්සේ

**සම්බුද්ධ ශාසනයේ පවත්නා අටමහා කුසල් අතර ප්‍රධාන කුසලය සිදු කෙරෙන කඨින චීවර පුණ්‍යෝත්සවය පැවැත්වීමේ ආරම්භක අවස්ථාව වන භික්ෂූන් වහන්සේ වස් විසීම මෙම 04 වන දින සිදු කරනුයේ අසීමිත භක්ත්‍යාදර ගෞරවයෙනි.**

වැඩිවශයෙන් භික්ෂූන් වහන්සේ වස් විසීම සිදු කරන්නේ ඇසළ පොහෝ දින වුවත් මෙම වර්ෂයේ වස්සාන ඍතුව උදාවන්නේ ද ජූලි මස 20 වන දින හෙයින් වස් සමාදානය වස්සාන ඍතුවේදීම සිදු විය යුතු නිසා මෙම අගොස්තු මස 03 වන දිනට යෙදෙන නිකිණි පුර පසළොස්වක පොහෝ දින ලෝකවාසී සියලුම ථේරවාදී භික්ෂූන් වහන්සේ පොහොය කොට පසු දින වස් සමාදානය සිදු කරති.

එම නිසාම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දකුණු දළදා වහන්සේ වැඩවසන සෝමවතී චෛත්‍ය රාජයාණන් වහන්සේ අභියස පවත්වනු ලබන ශ්‍රී දකුණු දළදා පෙරහර සිහිත ඇසළ උත්සවය මෙම වර්ෂයේදී ජූලි මස 03 වන දින පැවැත්වීමට තීරණය කළත් ලෝකයේම පවත්නා කොරෝනා නැමති වසංගතය නිසා භික්ෂූන් වහන්සේ සහිත මහජනතාව එකී වසංගතයෙන් බේරා ගැනීමේ පරම පවිත්‍ර චේතනාවෙන් ශ්‍රී දකුණු දළදා පෙරහර කල්දමා ඇසළ උත්සවය පමණක් පවත්වමින් ඒ සියල්ලම ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මගින් ලෝකයාට ශ්‍රවණය කිරීමට සැලැස්වීමත්, සර්ව රාත්‍රි පිරිත් සජ්ඣායනාව පහන් වන තෙක් දේශනා කොට සකල ලාංකීය ජනතාවටත් සකල ලෝකයාටත් තුණුරුවන්ගේ සහ දළ දා සමිඳුන්ගේ ආශීර්වාදය ලබා දීමට අති ගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ද ආශිර්වාද පෙරටුව කටයුතු සූදානම් කර ඇති බව මෙහිලා සතුටින් සිහිපත් කරමු.

සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී දකුණු දළදා වහන්සේ නිදන් කොට ඇති බුදුරැස් විහිදෙන සෝමවතී චෛත්‍ය රාජයාණන් වහන්සේ පොළොන්නරුවේ සිට කිලෝමීටර් 40 පමණ ඈතින් ඉපැරණි සේරු නුවර රජ කළ සිව රජු විසින් පරිත්‍යාග කරන ලද මහවැලි ගඟ අසබඩ, එදා සේරු නුවරට ද ඉන් පසුව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට අයත් වූ ද වර්තමානයේ උතුරු මැද පළාතට අයත් භූමි භාගයක සේරු පර්වතය (වර්තමාන කන්දකාඩු පර්වතය) සමීපයෙහි පිහිටා ඇත.

එදා මහවැලි ගඟෙන් එගොඩ මුළු ප්‍රදේශය ම දක්ෂිණ ප්‍රදේශය නමින් හැඳින් වූ අතර නැගෙනහිර දෙසින් සේරු නම් සුවිශාල ප්‍රදේශයක් ද, දකුණු දෙසින් ලෝණ නම් සුවිශාල ප්‍රදේශය ද කන්දඋඩරට ගිරි නම් සුවිශාල ප්‍රදේශයක් ද පැවතුණි.

කාවන්තිස්ස රජුගේ නැගෙණිය වන සෝමවතී දේවිය හා කැලණි තිස්ස රජුගේ බෑණා වන ගිරි අභය කුමරු, ස්වර්ණමාලී නම් ස්වකීය දියණිය හා එම ගිරි ජනපදය ද දුටුගැමුණු කුමාරයාට භාර කොට සේරු ජනපදයේ සිට ශිව රජුවෙත පැමිණියේ ය. ශිව රජු ඉමහත් සතුටට පත්ව මහවැලි ගඟෙන් බස්නාහිර එළාරයන්ගේ රාජධානිය තිබූ නිසාත්, මහවැලි ගඟ සීමාකොට ස්වකීය සේරුනුවරින් කොටසක් පරිත්‍යාග කළේ ය. සෝම නමින් එම නගරය සකස් කොට ඉතා දර්ශනීය වූ නගරයක් ඉදිකොට වාසය කළ බව සිංහල ධාතුවංශය, පාලි ධාතුවංශය, ජිනකාලමාලි ආදී ග්‍රන්ථයන්හි දැක්වේ.

මෙහිදී සුවිශාල ජනපදයක් වූ සේරුනුවර ම ගිරි අභය රජු හා සෝමවතී දේවිය සේරුනුවර පර්වතයට සහසම්බන්ධ ව චෛත්‍යයක් ඉදි කොට දකුණු දළදා වහන්සේ තැන්පත් කළ බව සඳහන් වේ. "මහා දෙවත්ථේරස්ස සිස්සො මහින්දත්ථෙරො නාගහව



සෝමවතිය රජමහා විහාරාධිපති
මහා විහාරවංශික
ස්‍යාමෝපාලි මහා නිකායේ
මල්වතු මහා විහාර
පාර්ශ්වයේ
නියෝජ්‍ය ලේඛකාධිකාරි හා
වැඩ බලන ලේඛකාධිකාරී
**පහමුණේ සුමංගල හිමි**

දක්ඛිණදාඨං ගහෙත්වා තම්බපණ්ණියං සෙරුනගරං පරිහරිත්වා ගිරිඅභයස්ස සෙරුනගර පබ්බතන්තරෙ චෙතියං ඨපෙසි." "පාලි ධාතුවංශය".

සිංහල ධාතු වංශයේ සඳහන් වන්නේ නුවරට නොදුරු ළං නොවූ සල් වනයක මහා අරිට්ඨ තෙරුන් වහන්සේගේ වංශයෙහි මිහිඳු නම් ථෙරනමක් සමග සැටදෙනකුන් වහන්සේලා සමග වැඩවසන මොහොතේ උන්වහන්සේලා දැක වැඳ උන්වහන්සේලා සමග සාකච්ඡා කොට විහාරස්ථානය ඉදිකිරීමට අවසර ලබා ගත් බව සිංහල ධාතු වංශයෙහි 33 පිටුවෙහි "අභය රජ.... නුවරට නොදුරු නොළං තැන මහත් වූ සල්වනයකි. රම්‍ය වූ භූමි භාගයක් දැක සතුටුව එතැන් හි වාසය කරන්නා වූ මහා අරිට්ඨ නම් තෙරුන් වහන්සේගේ වංශයෙහි වූ මිහිඳු නම් එක් තෙර කෙනෙකුන් වහන්සේ නායක කොට ඇති සැටදෙනකුන් වහන්සේ දැක වැඳ ඔවුන් වහන්සේලාගේ ඉරියා පථයෙහි පැහැදූ මිහිඳු තෙරුන් වහන්සේ හා කථා කරන්නේ ස්වාමීනි, නුඹ වහන්සේට මෙතැන් හි විහාරයක් කරවනු අභිප්‍රාය ඇත්තෙමෙයි කීයේ ය.තමන් වහන්සේ පරිහරණය කරන්නා වූ බුදුරදුන්ගේ දකුණු දළ දා වහන්සේ දෙවා වදාළ සේක.මහත්වූ පූජාකොට දාගැබට වඩමා ඉතා සිත්කළු වූ දියබුබුළක් බඳු වූ ආකාර ඇති කෛලාස කූඨ පර්වතයසේ ඉතා ධවල වූ දාගැබ කරවූයේ ය. එතැන්හි පංචාවාසයකින් යුක්ත වූ විහාරයක් ද කරවීය." ආදි වශයෙන් සුවිශාල චෛත්‍යයක් ද ,විහාරයක් ද තෙරුන් වහන්සේලාට තවත් විහාර හැටක් ද කරවූ බව සඳහන් වන අතර, එම සියලුම ගොඩනැගිලිවල නටබුන් සෝමවතී චෛත්‍ය රාජයාණන් වහන්සේ නැගෙනහිර දෙසින් අභිනව මහවැලි නදිය හා පර්වතය දක්වාම විහිදී ඇත. චෛත්‍යරාජයාණන් වහන්සේට වැඳුම්පිදුම් කිරීමට වෙනත් ස්ථානවල දක්නට නොලැබෙන මල් ආසනත්, කුඩා මළුව සහිත ආරක්ෂක විහාරයත් හා ඒ වටා සුවිශාල විහාරස්ථාන පෝය සීමා ආදිය ද

> ගජබා රජතුමාට යුද්ධ ජයග්‍රහණයෙන් පසුව සෝමවතී විහාරයෙහි වැඩ විසූ භික්ෂූන් වහන්සේ " ගාමිණී අභය යුද ජී" යන ගෞරව නාමය පිරිනැමූහ. එතුමා රාජකීය ඇළක් කපා ඒ ඇළෙන් වැඩ කරන කුඹුරු මෙම සෝමවතී විහාරයට පූජා කළ බව දිග්ගලේ පර්වත ලිපියක ක්‍රි. ව.112 දී ගජබා රජතුමා විසින් සටහන් කර ඇත.

නටබුන් මෙන්ම චෛත්‍යරාජයා වටා තවත් පරිවාර චෛත්‍ය නටබුන් වී ඇති අයුරින් මෙම විහාර සංකීර්ණයේ ඓතිහාසික මෙන් ම ඉමහත් වටිනාකම මෙයින් පැහැදිලි වේ.

චෛත්‍ය රාජයා සමීපයෙහි සෙල්ලිපි 03 ක් හා දිග්ගල නම් එරික්සෝන් ගලෙහි සෙල්ලිපි 08 ක් පමණ දැනට ඇති ඒවායින් කීපයක් කියවීමට නොහැකි තත්වයට විනාශවී ඇත. එම සෙල්ලිපිවලින් එදා දේවානම් පියතිස්ස රජතුමන්ගේ සහෝදර මහානාග කුමාරයා රෝහණයට යන විට එතුමාගේ නමින් ම මෙම විහාරස්ථානය ඉදිකොට භික්ෂූන් වහන්සේලා වැඩ විසූ බව "පජින නක අරබ" පශ්චිම නාගාරාමය" යනුවෙන් ද මෙම විහාරස්ථානයේ මුල් නම විය. එම විහාරස්ථානයේ ම සෝමවතී දේවිය හා ගිරි අභය කුමරු මෙම චෛත්‍යරාජයා හා සංඝාවාස හැටක් ඇතුළු විහාරාරාංග කළ බවත් එම සියලුම විහාරාරාංගවල නටබුන් සෝමවතී චෛත්‍ය රාජයාට නැගෙනහිර දෙසින් අලුත් මහවැලි ගඟ ළඟ ඇති කන්දකාඩු පර්වතය දක්වා විහිදී ඇති බව දක්නට ලැබේ.

එසේම විහාරස්ථානයෙහි පරිභෝජනය සඳහා අඩපිටි නම් ගම දිග්ගලේ ඇති පර්වත ලිපියක ද, රජතුමාගේ රජ්ලි නම් කුඹුරු යායෙන් කිරිය සියයක් හෙවත් අක්කර 800 ක් පූජා කර ඇති බව චෛත්‍යරාජයාගේ ප්‍රාකාර බැම්ම සමීප පුවරු ලිපියේ සඳහන් වේ.

ගජබා රජතුමාට යුද්ධ ජයග්‍රහණයෙන් පසුව සෝමවතී විහාරයෙහි වැඩ විසූ භික්ෂූන් වහන්සේ "ගාමිණී අභය යුද ජී" යන ගෞරව නාමය පිරිනැමුවහ. එතුමා රාජකීය ඇළක් කපා ඒ ඇළෙන් වැඩ කරන කුඹුරු මෙම සෝමවතී විහාරයට පූජා කළ බව දිග්ගලේ පර්වත ලිපියක ක්‍රි.ව.112 දී ගජබා රජතුමා විසින් සටහන් කර ඇත. ක්‍රි.ව. 164 දී කනිට්ඨ තිස්ස රජතුමා තොටුපොළ 03 ක බදු චෛත්‍ය ස්ථානයට ලබා දෙමින් රජතුමාගේ වැවේ වැඩවලින් විහාරයේ රාජකාරී කරන පිරිස නිදහස් කොට විධිමත් ලෙස රාජකාරී කරන ලෙස සැලැස් වූ බවත් මෙම දාගැබේ හා පෝය සීමාවෙහි සංවර්ධන කටයුතු සිදු කිරීමටත් නියම කර ඇත. නියමාකාර ලෙස රාජකාරී නොකළහොත් කහවණු 500 ක දඩයක් (වර්තමාන මුදලින් කෝටි 40 ක මුදලක්) නියම කර ඇති අතර, ස්ථානයෙහි නඩත්තුවෙන් පසු ඉතිරිවන මුදල් භික්ෂූන් වහන්සේලාගේ සිව්පසය සඳහා යෙදවිය යුතු බවට ආඥා පැන වූ පර්වත ලිපියක් ද වේ. එම කරුණු ම සඳහන් චෛත්‍ය රාජයා සමීපයේ ඇති පුවරු ලිපියක් ද පිහිටු වීමෙන් පෙනී යන්නේ මෙම ස්ථානයෙහි තිබෙන ඉමහත් වටිනාකමයි. එකම කරුණු ශිලා ලේඛන දෙකක ලියා ඇති බවට මෙතෙක් ලෝකයේ කිසිදු තැනකින් හමුවී නොමැති වීම ද මෙම ස්ථානයේ ඇති සුවිශේෂත්වය විදහාපාන්නකි.

පොළොන්නරු යුගයේදී බු.ව. 1700 දී මහාපරාක්‍රම බාහු රජතුමාගේ බිසව වන ලීලාවතී රැජින දෙළොස් දහස් රටින් (ගිරුවා පත්තුවෙන්) ඇඹුල්පත් ගම පූජා කර ඇති බවට සඳහන් ශිලා ලේඛනයක් චෛත්‍ය රාජයා සමීපයේ පවතී. මහාපරාක්‍රම බාහු රජතුමා ගිරිතලා වැවේ සිට කඳුරුවඩමන් වැවට ජලය ගෙනගොස් ඒ වැවෙන් සෝමවතී නමින් ඇළක් ඉදි කර ඇති බව මහාවංශයේ 79 වන පරිච්ඡේදයේ සඳහන් වේ. ක්‍රි.පූ. 02 වන සියවසේ සිට ක්‍රි.පූ. පළමු වන සියවස දක්වාම "පශ්චිම නාගාරාමය" යන නාමයත්, පළමු සියවස වන විට "මණිඅගිය" යන නාමයත්, එතැන්පටන් පොළොන්නරු යුගය වන විට "සෝමවතී" යන නාමයත් යන නම් තුනකින් කලින් කල මෙම සෝමවතී චෛත්‍ය රාජයා හඳුන්වා ඇති බව උක්ත කරුණුවලින් පැහැදිලි වේ.

ශ්‍රී දකුණු දළදා වහන්සේ මෙම සෝමවතී චෛත්‍ය රාජයා තුළ වැඩ වසන බවට විශ්වාස කළ හැක්කේ චෛත්‍යරාජයාණන් වහන්සේ තුළින් බුද්ධ රශ්මි මාලා විහිදීමත්, ෂඩ්වර්ණ රශ්මියෙන් බබළන සතරාකාර කරඬු චෛත්‍ය රාජයාණන් වහන්සේ තුළින් මතු වීමත්, බුදු රජාණන් වහන්සේගේ රූපයත්, බ්‍රහ්ම, විෂ්ණු, ඊශ්වර ආදී දෙවිවරුන් ගේ රූපත්, සුදු ඇතුන්, සුදු අශ්වයන් චෛත්‍ය රාජයා තුළින් මතුවීමත් ආදි ආශ්චර්යයමත් දේ දැකීමට ලැබී ඇති අතර, ඒ සියල්ලම ඡායාරූප ගතකර විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් ඔස්සේ මුළු ලෝකයාටම දැකබලා ගැනීමට සලස්වා ඇති අතර චෛත්‍යරාජයා තුළින් හේවිසි, ගණ්ඨාර, මිණිගෙඩි ආදී මධුර නාදයත්, පිරිත් දේශනා කරන ශබ්ද ඇති වීමෙන් අසන දකින හැම දෙනාම අපමණ ශ්‍රද්ධාවෙන් යුතුව අප වෙතින් මේ පිළිබඳ නිරන්තරයෙන් විමසීම් කරති.

මෙවන් ආශ්චර්යමත් සිද්ධීන් දැකීමට හා ඇසීමට ලැබීම නිසා ම මෙම සෝමවතී චෛත්‍ය රාජයා 1946 වර්ෂයේ දී මුස්ලිම් හා සිංහල සැදැහැවත් ජනතාවගේ දැනුම් දීම හා ඉල්ලීමත් අනුව මේ පිළිබඳව විධිමත් ලෙස කරුණු සොයා බලා සත්‍යතාවය වටහා ගැනීමෙන් පසුව මහනුවර මල්වතු මහා විහාරයේ කාරක සභික සිරිමල්වත්තේ ශ්‍රී පියරතන නාහිමි, ගරුතර පහමුණේ ශ්‍රී ගුණානන්ද අනුනාහිමියන් ඇතුළු මල්වතු මහා විහාරයීය මහා සංඝරත්නයත්, එකී සිංහල හා මුස්ලිම් සැදැහැවත් පිරිසත් පොළොන්නරුවේ සිට කි.මි. 40 ක් පමණ දුරගෙවා මහා ඝන කැලයේ හේවිසි ශබ්ධය හා ගිනි ජාලාවක් දැක ඒ ඔස්සේ ගොස් ගරා වැටීතිබූ සෝමවතී චෛත්‍ය රාජයා සොයා ගත්හ.

එතැන් පටන් එළිපෙහෙළි කටයුතු සිදු කොට 1966 වසරේදී මුල්ගල් තබා 1981 වර්ෂයේ දී කොත් පැළඳවීමේ උත්සවයෙන් පසු 1983 වර්ෂයේ පටන් ත්‍රස්තවාදී ග්‍රහණයට හසු වුව ද ත්‍රස්තවාදීන් විසින් චූඩාමාණික්‍ය ගලවා චෛත්‍යරාජයා සමීපයෙහි දමා පලාගිය අතර, අප විසින් යුද හමුදාවේ ආරක්ෂාව ඇතිව එම චූඩා මාණික්‍ය ලබාගෙන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා රජයේ අනුග්‍රහයෙන් 2002 වර්ෂයේ දී නැවතත් පැළඳ වීය.

# අසිරිමත් බෝධි රෝපණයක්



**වට අඩි 20 ක් සහ උස අඩි 60 ක් පමණ වූ මේ බෝධීන් වහන්සේ නො වැළැක්විය හැකි හේතුවක් නිසා තිබෙන ස්ථානයෙන් ඉවත් කරනු ලැබීමට නියමිත ය.**


එසේ විනාශ වන්නට ඉඩ නොදී මේ වනස්පතිය ආරක්ෂා කරලීමට පරිසර හිතකාමී පිරිසක් ඉදිරිපත් වී ඇත. ඔවුන් බලාපොරොත්තු වන්නේ මේ පූජනීය වස්තුව වෙනත් ස්ථානයක ගෞරවණීය ලෙස නැවත සිටුවීමට ය. ඒ සඳහා සුදුසු ස්ථානයක් සංවිධායක පිරිස් සොයති.

බෝධීන් වහන්සේ නමක් නොමැති විහාරස්ථානයක් නම් වඩාත් සුදුසු වන බව ද පවසිති. මේ සඳහා සියලු වියදම් දරන්නේ ආචාර්ය ඕමල්පේ සෝභිත හිමියන් ගේ උපදෙස් පරිදි ඇඹිලිපිටිය ශ්‍රී බෝධිරාජ පදනම මගිනි. මේ පිළිබඳ සියලු විස්තර 0776564124/071393 0088/0764851111 දුරකථන අංකයන්ගෙන් විමසිය හැකි බවද ආචාර්ය ඕමල්පේ සෝභිත හිමියෝ දන්වා සිටිති.

# අරුත් දැන නිතියෙන
# වඳිමු මව්පිය දෙදෙන අඳුරින

**දසමාසේ උරේකත්වා - පෝසෙසි වුද්ධිකාරණං**
**ආයු දීඝං වස්ස සතං - මාතු පාදං නමාමහං**

දස මසක් කුසෙහි තබාගෙන මා ආරක්ෂා කළ මෑණියනි, මගේ වැඩීම පිණිස, හෙවත් සියක් වසක් ජීවත් වීම පිණිස මා පෝෂණය කළ මෑණියනි, මම ඔබ දෙපා වඳිමි.



**වුද්ධිකාරො අලිංගිත්වා චුම්බිත්වා පියපුත්තකං**
**රාජ මජ්ඣං සුපතිට්ඨං පිතු පාදං නමාමහං**

පියාණෙනි, පුත්‍ර වූ
මා වැළඳගෙන සිඹ
සැනසුවේ ඔබයි.
ආහාරපානාදිය දීමෙන්
රජුන් මැද මනාව
පිහිටීමට ශක්තිය
දුන්නේ ද ඔබයි.
පියාණෙනි, මම ඔබ
දෙපා වඳිමි.

## දෙවියන් වෙනුවෙන් පූජා කෙරෙන

# රුහුණු කතරගම මහා දේවාල පෙරහර



කතරගම රාජ මහා විහාරාධිපති

**කොබවක ධම්මින්ද හිමි**

**ඇසළ මාසය ,ලොව්තුරා බුදු පියණන් වහන්සේට මෙන්ම දෙවියන් උදෙසා ද වතාවත් තබන්නා වූ මාසයක් යැයි බොදුණුවන් පමණක් නොව හින්දු භක්තිකයෝ ද විශ්වාස කරති.ඒ නිසාම සතා සිව්පාවුන්ගෙන් පිරි ගිය ,මිනිස් පුළුටක ස්ථිර වාසස්ථානයක් නැති මහා වනයට ,මාස ගණනාවකින් වැහි පොදක් නැති මුඩු බිමක, භක්තියෙන් දෙවියන් පුදන්නට බොහෝ දන පාද යාත්‍රා කළහ. දෙවියන් වැඳ පුදා බාර හාර ඔප්පු කිරීමට පැමිණෙන ඔවුන් ගේ රිදුම් දෙන දෙපාවාරුවට ඇත්තේ දෙවියන් ගේ ආශිර්වාදය පමණක් ම යැයි ඔවුහු විශ්වාස කළහ.**

කතරගම දෙවිඳුන් වැඳ පුදා ගෙන රාත්‍රිය ඒකාලෝක කරන කතරගම පෙරහර දැක බලා ගැනීම ද මේ සම්ප්‍රදායේ තවත් සිරිතක් මය.

රුහුණු කතරගම මහා පෙරහරේ අවසන්දිනය වන අද ,අතීතයේ රජ දරුවන් කරා විහිදෙන රුහුණු කතරගම මහා දේවාලයේ පෙරහර මංගල්‍යය ඉතිහාසය විමසා බැලීම ද හරි අපූරු ය.

දුටු ගැමුණු රජ දවස දක්වා දිවෙන කතරගම පෙරහර මංගල්‍යයට මූලික සාධකය වූයේ එළාර,දුටු ගැමුණු ද්වන්ධය ය.යුද්ධයට පෙර දුටු ගැමුණු රජු ,කතරගමට පැමිණ අෂ්ඨඵල බෝධීන් වහන්සේට බාර හාර වී, මෙම බෝධීන් වහන්සේට අධිගෘහිත වූ දෙවි කෙනෙකු වෙත්නම් මා හට ආශිර්වාද කරන්නේ නම් එම දෙවියන් වෙනුවෙන් දිව්‍ය මාළිගාවක් සදා දෙන්නේ යැයි පොරොන්දු වී තිබේ.එය සනිටුහන් කරමින් දේවාලය ඉදිරිපිට කොළ අතුවලින් කුඩා කොටුවක් සාදා දෙවියන් ට ආරාධනා කර ,එහි වැඩ සිටින සේ පවසා තිබේ.

මෙම ද්වන්ධයෙන් ජයගත්තා දුටු ගැමුණු රජු, රට එක් සේසත් කරමින් කතරගමට පැමිණී අතර සිය පොරොන්දුව ඉටු කරමින් කතරගම දේවාලය ඉදිකොට ඇති අතර, එය රන්කොත් මාළිගය ලෙසද හඳුන්වා ඇත.

එහිදී දෙවියන් ට ගරු කරමින් වසර පුරා පෙරහර මංගල්‍යය තුනක් පැවැත් වූ බව ද ,පළමු පෙරහැර, බක්මහා මංගල්‍යය ලෙස ද දෙවැන්න ඇසළ මංගල්‍යය ලෙස ද,ඉන්පසු ඉල්මහා මංගල්‍යය ලෙස ද, පෙරහර තුනක් පවත්වා ඇත. එම චාරිත්‍ර ය අදටත් ඉටු කරමින් බක්මහ පෙරහර මංගල්‍යය එක් දිනක ද, ඉල් මහා මංගල්‍යය එක්දිනක් ද ඇසළ පෙරහර මංගල්‍යය දින පහළොවක් ද පුරා පැවැත් වීම සිදුකෙරේ.

දුටු ගැමුණු රජු විසින් සිදු කළා වූ එම පැරණි චාරිත්‍රයන් එලෙසම සිදු කරන්නට රජතුමා රාජ නීතියක් ද පනවා ඇති අතර රුහුණු කතරගම මහා දේවාලයේ පෙරහර මංගල්‍යය ඉර හඳ පවතිනා තාක් කල් පවත්වන්නට අණ කර තිබේ.

අදටත් මහා දේවලය ඉදිරිපිට අතු පන්දලමක් සදා "මාදං" කොළවලින් සැරසු මඩුවක් සෑදීම සිදු වෙයි.මෙහිදී සිදු කරන තවත් චාරිත්‍රයක් නම් වාර්ෂික ව මෙහි කොළ අතු අලුත් කරන අතර පෙරහර ආරම්භ කොට දින හයක් ගතවූ පසුව මෙහි අලුතින් කොළ බැඳීම සිදු කෙරේ.

ඒ වගේම දුටු ගැමුණු රජු විසින් කතරගම දේවාලයේ වැඩ කටයුතු ඉටු කිරීම සඳහා පන්සිය පස් දෙනෙකුට රාජ කාරී පැවරීම ද සිදු කොට තිබේ.මේ සඳහා කපු මහතුන් හා ලේකම් වරු දෙදෙනෙකු ලෙස එය පත් කර ඇති අතර කිසියම් කෙනෙකු රෝගා තුර වුව හොත් ඒ සදහා ආදේශකයකු ලෙස මෙලෙස දෙදෙනෙකු පත් කර ඇත.

පෙරහර සංස්කෘතිය තුළ කතරගම කිරි වෙහෙර හා කතරගම දේවාල ය අතර ඇත්තේ ද මනා සබඳතාවයකි..පිරිත් තිලය කිරි වෙහෙර රාජ මහා විහාරයට පවරා ඇති අතර, දේවාලයෙහි සිදුවන සියලු ආගමික කටයුතු වල මූලිකත්වය සිදුවන්නේ කිරි වෙහෙර විහාරය මුල් කරගෙන ය.රුහුණු කතරගම මහා දේවාලයේ සියලු පෙරහර වීථි සංචාරයට පෙර කිරිවෙහෙර විහාරස්ථාන ස්වාමීන් වහන්සේලා ගේ පිරිත් ආශිර්වාද ලබා ගැනීම ද මෙහි සම්ප්‍රදායකි.

කිරි වෙහෙර සමඟ ඇති තවත් සබඳතාවක් නම් අවසාන පෙරහර කිරි වෙහෙර විහාර මළුවට පැමිණ, පුද පූජා පවත්වා, රාජ්‍ය මට්ටමින් සංදේශය, දිස්ත්‍රික් ලේකම් තුමාට පිළිගැන්වීමෙන් එය නිමාවට පත් කෙරේ.

එමෙන්ම රුහුණු කතරගම මහා දේවාල පෙරහරේ බොදුණු සම්ප්‍රදාය ඇති බවට මතුවන අනෙක් සාධකය නම් පෙරහරේ ධාතු කරඬුව වැඩම කිරීම ය.මෙහිදි හෙළි වනුයේ පන්සල හා දෙවොල අතර ඇති සබඳතාවයි.

පෙරහර ආරම්භකොට හයවනදින ප්‍රධාන තිලමේ පෙරහරට එක් වීම සිදු කෙරේ.එමෙන් ම සති පිරිත් දේශනය ද ආරම්භ වෙන අතර දේව දූත මෙහෙය මෙන්ම දෙරකඩ අස්න ආදී සියලු චාරිත්‍ර ඉටු කිරීමෙන් පසු පිරිත් පැන් ලබා දීම ද පෙරහර සංස්කෘතියේ අංගයකි.

දුටු ගැමුණු රජ දවස කතරගම දෙවියන් උදෙසා වීථි සංචාරය වූ පෙරහරේ ගමන් ගත්තේ එක් ඇතෙකු ,නැටුම් ශිල්පීන් දෙදෙනෙකු ,පන්දම් කරුවන් දෙදෙනෙකු හා කොඩි දෙකක් මෙන්ම තිලමේ තුමා පමණ ය.එහෙත් පසු කාලීන ව පෙරහර ට විවිධ විචිත්‍රාංග එක් වෙමින් වීථි සංචාරය වූ අතර කාන්තා පිරිමි භේදයක් නොමැති ව ශිල්පීන් එක් වීම ද දකින්නට ලැබුණි.

කතරගම දෙවිඳුන්ගේ ආශිර්වාදය පතා දෙවියන් වෙනුවෙන් පූජා කෙරෙන රුහුණු කතරගම මහා දේවාල පෙරහර ලක්දිව ඉතිහාසයේ පැරණිම පෙරහර ලෙස ද හැඳින්වෙයි.

**වසන්ත ජයසිංහ ආරච්චි**



# ඊර්ෂ්‍යා කළොත් ඇති දේත් නැති වෙයි

## පන්සිය පනස් ජාතක පොතේ ඇතුළත් 'දුම්මේධ ජාතක කතාව' ඇසුරිනි

**"ඊර්ෂ්‍යාව බොහෝ අපරාධයන්ගේ මූල බීජය වේ. එයින් තමාට ඇති ධන සම්පත් පවා නැති වී යන්නේ ය."**



එදා මෙන් ම වර්තමානයේත් මිනිස් සමාජය බෙහෙවින් ම පාප සිතිවිලි වලින් පිරී පවතිනවා. ආත්මාර්ථකාමී මිනිස් සමාජයක ඉපිද ආගමක් දහමක් නැති අමුතුම සත්ව කොට්ඨාසයක් වෙලා ජීවත් වන එකම පිරිස මේ මිනස් සමාජය වෙන්නට ඇති කියලා වෙලාවකට සිතෙනවා. ඒ තරමට ම ඊර්ෂ්‍යාවෙන් ක්‍රෝධයෙන් හිත් දූෂ්‍ය වෙලා. කෙනෙකුගේ දියුණුවීම, රූප ශ්‍රීය, බලය, සමාජ තත්වය දැකලා සතුටු නොවී ඉවසා ගත නොහැකි, දරා ගත නොහැකි පිරිසක් අප අතරේ සිටිනවා. ඔවුන් කෙසේ හෝ මාන බලන්නේ අනෙකාව පීඩාවට පත් කොට තමන් නැඟී සිටීමට පමණයි.

එවැනි මිනිසුන් අද පමණක් නොව එදත් මේ සමාජයේ ජීවත් වුණා. භවත් ගෞතම බුදු රජාණන් වහන්සේ වැඩ සිටි සමයේ ද එවැනි ලාමක වූ කෙලෙස් ධර්මයක් වන ඊර්ෂ්‍යාවෙන් පීඩිත ව බුදු රජාණන් වහන්සේට පවා හිරි හැර කරන්නට යෙදුණු දේවදත්ත හාමුදුරුවෝ වගේ අයත් සිටියා. දවසක් බුදු රජාණන් වහන්සේ දම් සභා මණ්ඩපයට වැඩම කරන අවස්ථාවක වැඩිමහලු භික්ෂූණී වහන්සේලා දේවදත්ත හාමුදුරුවන්ගේ එවැනි පාප කර්මයක් ගැන කතා බහ කරමින් සිටයා.

බුදු රජාණන් වහන්සේ "මහණෙනි මා එන්නට පෙර ඔබ කුමන කරුණක් ගැන කතා කරමින් සිටියා ද?" යි විමසුවා

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අප මහණකමට නුසුදුසු කතාවක් නම් කළේ නැහැ. දේවදත්ත ස්ථවිරයන් වහන්සේ ඔබ වහන්සේගේ දෙතිස්මහා පුරිෂ ලක්ෂණ, අසූ අනුව්‍යංජන ඝ්‍යාමප්‍රභා ආදිවූ රූප ශ්‍රී දැකත් මෛත්‍රියෙන් තොරව ඊර්ෂ්‍යාව උපදවා තමාටත් එවැනි රූපයක් නැතැයි සිතා තථාගතයන් වහන්සේ නසන්නට සැරසෙනවා.

ඒ ගැනයි අප මේ කතා කරමින් උන්නේ" කියලා, රැස්ව සිටි භික්ෂූණී වහන්සේලා පිළිතුරු දුන්නා.

"මහණෙනි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ දැන් පමණක් නොව පෙර සසරේ අප එකට ඉපිද හමු වුණ ආත්ම භාවයන්වලදීත් මේ විදියටම මා කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් කටයුතු කොට මා නසන්නට සැරසුණා. කියලා තථාගතයන් වහන්සේ මතක් කළා.

එවිට භික්ෂූණීගෙන් එම දේශනාවට ආරාධනා ලැබුණු බුදු පියාණන් වහන්සේ අතීතයේ දී දේවදත්ත හාමුදුරුවෝ ඊර්ෂ්‍යාවෙන් තමන් නසන්නට සැරසුණු කතා පුවත ගෙනහැර වදාළා.



අනුරාධපුර කුට්ටම්පොකුණ විහාරාධිකාරී
ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**කිවුලතලාවේ සමිත හිමි**

යටගිය දවස මගධ රටේ රජගහ නුවර මගධ නම් රජ කෙනෙකුන් රාජ්‍ය විචාරණ සමයේ අප මහා බෝසතාණන් වහන්සේ ඇත් කුලයක ඉපිද ශරීර වර්ණයෙන් ස්වේත වර්ණ වී විසිතුරු වූ රූප ශ්‍රීයෙන් අලංකාර ව එම මගධ රජ්ජුරුවන්ට වාහනය වී සිටිනා සේක. එක දවසක් මගධ රජ්ජුරුවෝ සර්වාලංකාරයෙන් සරසන ලද මංගල හස්ති රාජයාගේ පිටට නැඟ ආඩම්බරයෙන් මහත් වූ සෙනඟ පිරිවරාගෙන පෙරහරින් වීදි සංචාරය සඳහා පිටත් වුණා. ඒ යන අතරවාරයේ මඟ දෙපස සිටින රට වැසියන් මංගල හස්තියා දැක සතුටු සිතින්" මෙවැනි ආරෝහ පරිනාහ රූපශ්‍රියක් ඇති ඇත් රජෙකු චක්‍රවර්ති රජ කෙනෙකුන්ටම මිස මෙවැනි රජ කෙනෙකුට සුදුසු නොවන්නේ යැයි" ඇත් රජුම වර්ණනා කළා. එම වර්ණනාවන් රජතුමාට ද ඇසුණා. රජතුමා සිතන්නේ "රට වැසියන් මා වර්ණනා කළේ නැහැ. තරිසන් සතෙකු වූ ඇතු වර්ණනා කළා. මේ ඇත් රජු නැසිය යුතු" යැයි සිත සිතා මහත් ඊර්ෂ්‍යාවක් සමඟ ද්වේෂයක් ඇත් රජු කෙරෙහි ඇති කරගෙන තමයි එදා රජතුමා ගමන නිමා කළේ. ඊර්ෂ්‍යාවෙන් පීඩිත වූ සිත ද්වේෂයෙන් ගිනිගෙන දැවෙද්දී ම පෙරළා රජ ගෙට පමිණි රජතුමා ඇත් ගොවුවා කැඳවා ඇතු නසන්නට කතිකා කරගත්තා. ඒ අනුව ඇත් ගොවුවා විසින් ම ඇතු නහවා නැසීමට අණ දුන්නා. එයට එකඟ නොවුණු ඒ පින්වත් ඇත් ගොව්වා ඇතු නැසීමට අකමැති බව සඟවා රජතුමාට මෙහෙම කව්වා "රජතුමනි, රජගහ නුවර පිහිටි වේපුල්ල පර්වතයට ඇතු නැංවිය යුතුයි.

එහි දී ඇතු නසන්නෙමි." ඉන් පසුව ඇතු නහවා සරසාගෙන පර්වත මුදුනට නැංගා. රජතුමාත් අමාත්‍ය මණ්ඩලය පිරිවරාගෙන පර්වත මුදුනට නැංග ඇතු ප්‍රපාතය ආසන්නයේ තුන් පයින් සිටුවන්න යැයි ඇත් ගොව්වට කිව්වා. එයින් ඇතා ප්‍රපාතයෙන් පහළට වැටෙතැයි රජතුමා සිතුවා. එහෙත් ඇතා වැටුණේ නැහැ. පසුව ඉදිරිපස අත් ඔසවා පසුපස පා දෙකෙන් සිටුව වයි අණ දුන්නා. එයින් ද ඇතු වැටුණේ නැහැ. තවත් කේන්ති ගත් රජතුමා ඇතාව තනි කකුලෙන් සිටුව වයි කීවා. එසේ කළත් ඇතා නොවැටෙන නියාව දැක ඇතාගේ සතර පයම ඔසවා ප්‍රපාතය දෙසට මෙහෙය වන්න යැයි ඇත් ගොව්වාට අණ කළා.

එවිට ඇත් ගොවුවා සිතන්නේ "දැන් රජ්ජුරුවන් වහන්සේ ඇතා නැසීමේ ප්‍රයෝගයක් කළා. මෙයින් ඇතු ගලවා ගතයුතුයි" සිතා ඇත් ගොව්වා ඇතාගේ කන්තල ළඟට කිට්ටු වී රහසින් ඇතුට මෙහෙම කිව්වා. "ඇත් රජුනි, අප මහ රජතුමන් ඔබ නසන්නට උත්සහ කරනවා. එනිසා ඔබට හැකිනම් මෙතනින් අහසට පැන නැඟී බරණැස් නුවරට පලා යන්න." ඒ ක්ෂණයෙන් ම පෙර කරන ලද පින් බලයෙන් ඍද්ධි බලය පහළවී පුළුන් රොදක් අහසට පාවී යන්නාක් මෙන් ඇතා අකාශයට පැන නැංගා. එවිට ඇත් ගොව්වා ද ඇතු පිටට නැඟ මගධ රජු දෙසට හැරී "රජතුමනි, ඔබ වැනි පින් මද රජෙකුට පහළ වන ඇතකු නොවෙයි මේ. මෙවන් හස්ති රාජයෙකුගෙන් නුඹට කුමන ප්‍රයෝජනයක් ද? නුඹ වැනි නිවට රජෙකුට මංගල වාහනයට සුදුසු නොවෙයි." කියා බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ගේ අංගන සමීපයෙහි අහසෙහි සිටියා. ඒ ආශ්චර්යය දුටු රට වැසියන් මහත් සන්තෝෂයට පැමිණ බරණැස් රජුට දැන්වූවා. රජතුමා වහ වහා එතැනට පැමිණ "මා නිසා මගේ සේවයට පැමිණි ඇතෙක් වී නම් බිමට බසීවා" යි. ආරාධනා කළා. එවිට ඇතු බිමට බැස්සා.

ඒ වෙලාවේ ඇත් ගොව්වා ඇතු පිටින් බැස රජුට වැන්ද. "දරුව, මෙවන් මහානුභාව සම්පන්න ස්වේත වර්ණ හස්තියෙකු අරගෙන කුමට ආවේද?" යි බරණැස් රජතුමා ඇසුවා.

එවිට ඇත් ගොව්වා මගධ රටේ දී වුණ සියලු පුවත් පවසා සිටියා. "දරුව, නුඹ කළ දේ යහපත් ක්‍රියාවක්. මේ හස්ති රාජයාත්, ඔබවත් බරණැස් රාජ්‍යට පිළිගන්නවා." යැයි කියා නුවර අලංකරණය කළා. ඇත් ගොව්වා ලවා ඇතු නහවා කවා පොවා සර්වාලංකාරයෙන් සරසා මහත් හරසර ඇතිව පෙරහරින් මංගල හස්ති වාහනයට පමුණුවා තනතුරු ද පදානය කළා. පසුව බරණැස් රාජ්‍ය තුන් කොටසකට බෙදලා හස්තියාට එක කොටසකුත් තව කොටසක් ඇත් ගොව්වාටත් දුන්නා. ඉතිරි කොටස බරණැස් රජු ගෙන දැහැමෙන් සෙමෙන් රාජ්‍ය පාලනය කොට තිදෙනාම කර්ම ආයුෂ විඳ පරලොව ගියා.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් සාරිපුත්‍ර ස්ථවිරයෝ යි. ඇත් ගොව්වා නම් ආනන්ද ස්ථවිරයෝ යි. ඊර්ෂ්‍යාවෙන් ද්වේෂයෙන් පිඩිත ව මහත් අපරාධයක් කරන්නට සැරසුණු මගධ රජු මෙකල දේවදත්ත ස්ථවිරයන් වෙයි. එසමයෙහි ස්වේත වර්ණ ඇත් රජුව උපන්නේ බුදුවූ මම් ම වේ" දැයි වදාරා බුදු රජාණන් වහන්සේ ඒ අතීත ජාතක කතා දේශනාව නිමවා වදාළා.



# සොබාදහමේ පාඩම



මාලඹේ ඔස්ට්‍රියෝ රෝහලේ
මාහාචාර්ය
**සාගර කරුණාතිලක**

**අද අප ගත කරන කාලය පිළිබඳ අප සැමටම තියෙන්නේ ජිවිතය පිළිබඳ අවිශ්වාසක් ය.කවුරුත්, කෙදිනකවත් නොසිතූ මොහොතක ඇති කළ රෝග කාරකයක් මුළු ලෝකයකටම තර්ජනය වුණා.**

එතැනදි සිදු වුයේ කුමක් ද?.ලෝකයේ තමන් ධනවාදීන් යැයි,බලවත් යැයි හීන මානයෙන් පෙළුණු බොහෝ රටවල් මේ රෝගය ඉදිරියේ දණින් නැමුණා. ඒ වගේම තමන් ගේ ජිවිතය පිළිබඳ නියත බියක් නිර්මාණය වුණා.මේ ගෝලීය උවදුරෙන් මිනිස් සංහතියට ම විශාල පණිවිඩයක් සොබා දහම ලබා දී තියෙනවා.

කතාවක් තියෙනවා "ගින්නේ තරම දන්නේ පිච්චෙන කෙනා" යැයි කියා

එහි සත්‍යතාවයක් තියෙනවා.මෙහි බරපතළකම දැනුණේ එම බේදවාචකය ඉදිරියේ අසරණ වුණ මිනිසුන් ය.අප බොදුණුවන් විදිහට ජිවිතය දෙස බලන්නට මෙ සොබා දහම අපූරු පාඩමක් අපට කියා දුන්නා.අපට මේ රෝග කාරක වලින් මිදෙන්නට කරන්න හැකි එකම දේ අධ්‍යාත්මික ශක්තියට එකාග්‍ර වීම යි.

බුදු රජාණන් වහන්සේ ගේ කාලයේදී පවා මෙවැනි වසංගත උවදුරු දක්නට ලැබුණ.විශාලා මහා නුවර තුන් බිය වැනි බේදවාචක බුදුන් වහන්සේ සමනය කළේ අකාලික වූ ධර්මයෙන්.

සත්තකින් ම මේ ලිපියෙන් මා අදහස් කළේ අපිට හැකිනම් ආධ්‍යාත්මයෙන් පෝෂිත හදවතක් නිර්මාණය කරගන්න ට අද බොහෝ ලෙඩ රෝග වලට වගේම ව්‍යසනවලට නිශ්චිත ව අපිට ප්‍රතිකාර සොයා ගන්නට පුළුවන්.

"සොබා දහම ට නොවන අවනත ලොවේ කිසිවක් නැහැ" කියන්නේ ඒ නිසයි. පසු ගිය කාල වකවානුවේම අප කළ සමහර දේ ස්වභාදහම බොහොම ඉවසීමෙන් දරා සිටියා.කෙතරම් විනාශකාරී ක්‍රියාවන් මිනිසුන් මේ සොබාදහම ඉදිරියේ කළාද? නමුත් එක් නිමේෂයක දී සොබාදහම අපට මේකට උත්තර දෙනවා.

මෙන්න මේ නිසයි අප මෛත්‍රී භාවනාව වැඩිය යුත්තේ.එමගින් අපිට පුළුවන් එම කරුණාවේ බලය විශ්වය ට මුදා හරින්නට බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය එයයි.

උන්වහන්සේ කියා දුන්නා භව රෝග පවා නැති කරගෙන නිවන විමුක්තිය සොයා ගන්නා ආකරය.අද අප සියලු දෙනාට ම ධර්මය පිළිබඳ හොඳ අවබෝධයක් තියෙනවා.ධර්ම කරුණු දන්නවා.නමුත් එය ප්‍රායෝගික ව ජිවිතය තුළ ක්‍රියාත්මක කරන්න අප දන්නේ නැහැ. කරුණාව, දයාව, මෛත්‍රිය, උපේක්ෂා ව, මුදිතාව හරි හැටි අවබෝධයෙන් කළ හැකි නම් විශ්වීය ආදරයට, ප්‍රේමයට අපට ඒකාග්‍ර වෙන්න පුළුවන්.

ඒත් අද අප සුළු දේටත් කිපෙනවා. ප්‍රචණ්ඩ වෙනවා.නිතරම අප සිටිනුයේ අපේ අභ්‍යන්තරයෙන් ඈවෙමින්.

ඒ නිසා අප කළ යුතු එකම දේ අභ්‍යන්තර ශක්තිය දියුණු කරන එකයි. අපට හැකිනම් කෙනෙකුට කරුණාව ,දයාව,මෛත්‍රිය,අනුකම්පාව දක්වන්න අපිට හැකියාව උදාවෙයි විශ්වයේ අපරිමිත වූ කරුණාවට එකතු වෙන්න. විශ්වයේ මෛත්‍රියට එකතු වෙන්න.තමන් ගේ හදවත මෛත්‍රියෙන් පුරවා ගන්න කෙනාට පුළුවන් තමන් ට සෙත් පතනව වගේම තම දෙමව්පිය අසල්වාසීන්ට පමණක් නොව සමසත ලෝකයාට ම සෙත් පතන්න.ඒ නිසා බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය තුළ ජිවත් වෙන්න හැකිනම් ජිවිතයට එල්ල වෙන ඕනෑම රෝගයකින් සුවපත් වීමේ හැකියාව අපට උදාවෙනවා. එමෙන්ම බොහෝ කර්මජ රෝගයන් පවා නැති කර ගන්නට නම් මෛත්‍රියෙන් පිරුණු සිතක් හදාගන්න. ආධ්‍යාත්මික ශක්තිය ඇති කරගන්නේ කෙසේ ද යන්න අපි ඉදිරියට කතා කරමු.

**වසන්ත ජයසිංහ**

Part - 1

# The Practice of Bhavana for the Beginners

Currently many people talk about different methods of Bhavana (meditation) and follow various methods. Among these methods, Buddhist bhavana takes a special place. 2540 years ago, the Buddha, the noblest of all beings, emphasized the importance of bhavana in His Teachings. Many people found deliverance from "suffering" by following it. Hence, all Buddhist methods of bhavana are known for positive results.

Even though these methods were formulated two and half thousand years ago, they are appropriate for today's world because the nature of the human mind, then, does not differ much from now. Scientific knowledge and the environment around us many change daily. However, there is hardly any change in the nature of the human mind. Craving, hatred, and delusion have remained components of the human mind since time immemorial.

In this publication, there are a few methods of easy to follow Buddhist bhavana, through which positive results can be achieved. If one, follows them methodically, one many find relief irrespective of geographical, cultural and social boundaries. It has to be remembered that relief from suffering is something that can be realized only by practicing rather than reading.

The Bhavana of reflection on death should not be understood as something unpleasant n life that is not worthy of thought. The awareness of inevitable death is more realistic than considering it an ugly theme. As it helps one to understand the value of humanity through the control of mind and character, one should not be afraid of understanding the reality of life.

**Identifying Self**

When one identifies one's own "self" one is able to find a suitable methods of Bhavana and achieve positive results. Like a pathologist who studies the root cause of a disease, the Buddhist Teachings show the ideal method of bhavana for the individual. Talking to an experienced master, one is able not only to recognize the type of self by gaining in-depth knowledge through the Dhamma, but also to define the type of self for selecting the method of bhavana.



Battaramulla
Siri Sudassanarama
sadaham senasuna
**Ven. Dr. Mirisse Dhammika thero**


There are six different types of minds explained in the Dhamma.

They are:

Mind disposed to lust - Rager charita
Mind disposed to hatred - Dosa charita
Mind disposed to delusion - Moha charita
Mind disposed to faith - Suddha charita
Mind disposed to intellect - Buddha charita
Mind disposed to agitation - Vitakka charita

According to Buddha's Teachings every human being carries certain traits from each of above types except those who have achieved arahantship (sainthood). However, the traits of any one type may become dominant in an individual. Therefore, one has to select the method of bhavana according to the dominant type of traits.

In a positive environment with instruction from the right teacher, one is able to commence on the path of bhavana and experience the serenity and calmness both mentally and physically.





# ද්‍රෝණයක් ධාතූන් වහන්සේ තැන්පත් ස්වර්ණමාලි සෑ රදුන් වහන්සේ

**ලංකාවේ බෞද්ධ ස්තූප 05**

*සයිංසු යස්මිං සුගතස්ස ධාතුං*
*නිම්මාය රංසුජ්ජල බුද්ධ රූපං*
*සුවණ්ණමාලීනි පතීත නාමං*
*වන්දාමහං ථූපවරං මහාග්ඝං*

*ස්වර්ණමාලී යන ප්‍රමණීත නාමයෙන් මේ උතුම් දාගැබේ සර්වඥ ධාතූන් වහන්සේලා නිදන් ව ඒ රශ්මියෙන් බබළන බුද්ධ ප්‍රතිමාවකි. එවන් උතුම් මහා දාගැබ් වහන්සේ වන්දනා කරමි.*

**අනුබුදු මිහිඳු මා හිමියන් ආගමික ස්ථාන ඉදිකිරීම් සිදුවන ස්ථාන හතක මල් මිට බැගින් ඉසූ බවත්, එකල් හි භූමිය කම්පනය වූ බවත් මහා වංශයේ සඳහන් ය.**

රුවන්වැලි සෑ භූමිය එසේ කම්පනය වූ කල්හි දේවානම් පියතිස්ස රජතුමාගේ මුණුපුරෙකු වන දුටුගැමුණු මහ රජතුමා මෙම ස්ථානයේ මහා ස්තූපයක් කරවන බව මිහිඳු මා හිමියෝ පැවසූහ. ඒ අවස්ථාවේ දී රජතුමා ඒ බව ශිලා ස්ථම්භයක සටහන් කොට ස්ථාපනය කළහ.

“දුටුගැමුණු නම් මහා පින් ඇති නරපති තෙමේ අනාගතයෙහි ද්‍රෝණයක් සර්වඥ ධාතූන් වහන්සේලා නිදන් කොට මනෝරම්‍ය වූ එක්සිය විසි රියන් උස ස්වර්ණමාලි නම් මහා ස්තූපයක් කරවන්නේ ය. නොයෙක් මිණි රුවනින් හෙබියා වූ ලෝවාමහාපාය නම් නව මහල් පොහෝ ගෙයක් කරවන්නේ ය. මෙම වාක්‍ය රජගෙයි කරඬුවක බහා තිබූ රන්පතක ලියැවී තිබුණි. දුටුගැමුණු රජතුමා රුවන්වැලි සෑය ගොඩ නැඟුවේ මිරිසවැටිය සහ ලෝවාමහාපාය ඉදිකිරීමෙන් අනතුරුව ය. නව මහල් ලෝවාමහා ප්‍රාසාදය නම් වූ උපෝසථාගාරය කරවා සත් දිනක් පුද පූජාවන් පැවැත්වූයේ ය. එයින් අපමණ ප්‍රීතියට පත් වූයේ ය. ඉන් අනතුරුව දුටුගැමුණු නිරිඳුන් ලක්ෂයක් රන් කහවනු වියදම් කොට උඩ මළුවේ වැඩ සිටින ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට බෝධි පූජාවක් කරවී ය. ඉන් අනතුරුව නුවර ඇවිදින කල මහා සෑය පිහිටන බිමෙහි සිටුවන ලද ශිල ස්ථම්භය දැක කියවන්නට ලැබුණේ ය. මිහිඳු මහ රහතන් වහන්සේ ගේ අනාගත වාක්‍ය කියවා රජතුමා මහත් සතුටට පත් වූයේ ය.

මේ මහා භද්‍ර කල්පයෙහි බුද්ධත්වයට පත් වූ කකුසඳ, කෝණාගම, කාශ්‍යප සහ ගෞතම නම් සතර බුදුරජාණන් වහන්සේලාගේ පාද ස්පර්ශයෙන් මේ ස්තූප භූමිය පාරිශුද්ධත්වයට පත්ව ඇති බව විශ්වාස කෙරේ. අප ගෞතම බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්ව අටවන වර්ෂයේ දී කැලණියට වැඩම කළහ. එම අවස්ථාවේ දී අනුරාධපුර මහමෙවුනා උයන පිහිටන ස්ථානයට පැමිණි බුදුරජාණන් වහන්සේ රුවන්වැලි මහ ස්තූපය ඉදිවන පුණ්‍ය භූමියේ මොහොතක් සමවත් සුවයෙන් වැඩ සිටියහ.

අනාගත වාක්‍ය කියවා මහත් ප්‍රීති ප්‍රමෝදයෙන් යුතු රජතුමා එදින රාත්‍රියේ රාජ භෝජන වළඳ, ලොවට උතුම් මහා සෑය කරන්නට සිතමින් සේසත යට සයනය කරමින් කල්පනා කරන්නට වූයේ ය. “මම ගෞතම බුදුරජාණන් වහන්සේගේ ද්‍රෝණයක් ධාතූන් වහන්සේලා තැන්පත් කොට මහා සෑයක් කරවන්නට තරම් පින් ඇත්තෙක්මි. ඒ උතුම් ක්‍රියාව මට මහත් ලාභයක් ම වන්නේ ය. ආක්‍රමණික ද්‍රවිඩයන්ගෙන් රට බේරා ගැනීමේ දී මාගේ අතින් මේ රට වැසියා පීඩාවට පත් විය. එම නිසා ලක්වැසි කිසිවෙකුටත් පීඩාවක් නොවෙන සේ අය බදුවලින් නො පෙළන්නෙමි. දැහැමින් උපයන ලද වස්තුවෙන් මහා සෑය කරවන්නට ඇත්නම්, එය කොතරම් අගනේ දැ යි‘ සිතමින් සිටියේ ය.

රාජ සේසතෙහි විමනක් තනා සිටි දෙව්දුව රජතුමාගේ මේ පුණ්‍ය සිතිවිල්ල දැනගත් අතර, එය දෙවියන්ට සැළ කරන ලදී. සිරිලක පිහිටුවන්නා වූ මහා සෑය සෑදීමට දුටුගැමුණු මහා රජතුමාට උපකාර වීම පිණිස දෙව්ලොව දෙවියන් අතර මහත් ස්තූප ඝෝෂාවක් පැන නැංගේ ය. එම අවස්ථාවේ දී දෙදෙව් ලොවට අධිපති ශක්‍ර දේවේන්ද්‍රයා විශ්ම කර්ම දෙව්පුතුන් හට අණ කරන්නේ ය. “ගෞතම සසුනෙහි පහන් ව සිටින දුටුගැමුණු නරනිඳු මහා සෑය කරවන්නට සිතමින් සිටින්නේ ය.

ඒ නිසා තෙපි එහි ගොස් අනුරාධපුරයෙන් යොදුනක් දුරින් පිහිටි ගම්භීර නම් නදිය අසබඩ මහා සෑයට ගඩොල් මවන්නැ‘යි පවසා සිටියේ ය. පසුදා උදෑසන වැද්දෙක් දඩයම් බල්ලන් රැගෙන වනයට පිවිසියෝ ය. එවිට එහි භූමාටු දෙවියෙක් තලගොයකුගේ වෙස් ගෙන වැද්දාට පෙනෙන්නට සැලැස් වී ය. තලගොයා පසුපස පන්නමින් ගිය වැද්දාට විශ්ම කර්ම දිව්‍ය පුත්‍රයා මවන ලද ගඩොල් දැකීමට ලැබුණි.


තලගොයා නොපෙනී ගියේ ය. එම ගඩොල් ගොඩ දෙස බලා වැද්දා මෙසේ සිතුවේ ය. “අප මහ රජතුමා මහා ස්තූපයක් කරවන්නට කැමැත්තෙන් ඉන්නවා. මෙය නම් රජතුමාගේ අදහසට ගැළපෙන පඬුරකි. මේ බව නම් දැනුම් දිය යුතුයි“ සිතා වැද්දා දුටුගැමුණු රජතුමාට මේ බව සැළ කරන ලදී. දුටුගැමුණු රජතුමා වැද්දා පැවසූ ප්‍රිය වචනය අසා මහත් සතුටට පත්විය. ඔහුට බොහෝ තෑගි භෝග ද පිරිනැමී ය.

දීපා පෙරේරා

# ප්‍රහේලිකා අංක 14

බුදුසරණ
ත්‍යාග අනුග්‍රහය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කේ. එල්. ඒ. රණසිංහ විසිනි.**



**හරහට**

1. තම රූ සපුව ගැන මානයෙන් බුදුරදුන් ඉදිරියට යාමට මැලි වූ කුමරියයි.
5. දයකයින් මාසික ව ගමේ විහාරස්ථානයට පුදනු ලබන දනය මෙනමින් හැඳින්වෙයි.
6. ගමේ බෞද්ධයින් පුදපූජා සඳහා රැස්වන මධ්‍යස්ථානයයි.
7. හින්දු ආගමේ සඳහන්වන ප්‍රධාන දෙවිකෙනෙකුගේ නමයි
9. ආයුර්වේදයෙහි එන දියර ප්‍රතිකාරකයකි.
11. බුදුන් වහන්සේ සුර අසුර යුද්ධය ගැන මෙම සූත්‍රයෙහි දී සඳහන්කර වදරති.

**පහළට**

2. තම රූ සපුව ගැන පලකළ මතය ගැන මෙම බමුණු දියණිය බුදුරදුන් කෙරෙහි වෛර බැඳගත්තා ය.
3. රජ මැදුරට යෙදෙන නමකි.
4. බුද්ධාදී අටතැනක් ගැන මෙවන් සිතිවිලි ඇතිවීම ද නීවරණයකි.
8. “පරිච්ඡේද” යන්න සඳහා භාවිත කරන තවත් නමකි.
9. දගැබක බිම් මට්ටමේ ඇති වළලු තුන මෙනමින් හැඳින්වෙයි.
10. අකුසල්වල විපාක වශයෙන් නිරයෙහි දී මේවා විඳින්නට සිදුවෙයි.

**පිරුවානා පොත් වහන්සේ, සප්ත බොජ්ඣංගය, මහාචාර්ය වල්පොළ රාහුල හිමියන් විසින් රචිත බුදුන් වදාළ ධර්මය ඇතුළු ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**

## කොළඹ තරුණ බෞද්ධ සංගමය
# ධම්ම, අභිධම්ම, පාලි (සිංහල) විභාගය - 2020

කොළඹ තරුණ බෞද්ධ සංගමය මඟින් වාර්ෂිකව පවත්වනු ලබන ධම්ම, අභිධම්ම, පාලි (සිංහල) විභාගය 2020 නොවැම්බර් මස 14 සහ 15 යන දිනයන් හි පැවැත්වේ. මේ සඳහා දහම් පාසල්වල හා පිරිවෙන්වල සිසුන් සහ ගුරුවරුන්ට ද, වයස සීමාවකින් තොරව පෞද්ගලික අයදුම්කරුවන්ට ද ඉදිරිපත් විය හැකි ය. මෙම විභාගයේ ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත්වීම බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ ඩිප්ලෝමා විභාගයට ඇතුළත් වීමට සුදුසුකමක් ලෙස පිළිගෙන ඇත. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය – 2020.08.31 වේ. අදාළ අයදුම්පත් සඳහා මුද්දර ගසන ලද ලිපිනය සහිත ලියුම් කවරයක් (9" x 4") පහත දක්වා ඇති ලිපිනයට එවීමෙන් ලබාගත හැකි ය. සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන), කොළඹ තරුණ බෞද්ධ සංගමය, 70, ඩී.එස්. සේනානායක මාවත, කොළඹ – 08



බුද්ධ ශාසන කාර්ය සාධක මණ්ඩලය මඟින් පසුගිය ද සංවිධානය කරන ලද මාධ්‍ය හමුවක දී සුදුසු නායකයන් පමණක් මෙවර පාර්ලිමේන්තුවට තෝරා පත්කර යැවීමට යෝජනාවක් ඉදිරිපත් විය. කොළඹ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ පැවැති එම මාධ්‍ය හමුවට තිරිකුණාමලයේ ආනන්ද මහ නා හිමි, බුද්ධ ශාසන කාර්ය සාධක මණ්ඩලයේ සභාපති දිවියාගහ යසස්සී නා හිමි ඇතුළු ගිහි පැවිදි විද්වතුන් රැසක් සහභාගී වූහ.

## බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුන

පෙරවරු 6.00 – 07.00 සීල සමාදනය, 07.00 – 07.30 තෙරුවන් වන්දනාව, 08.15 – 10.00 භාවනාව, 10.00 – 11.00 ධර්ම දේශනාව, 11.00 – 11.30 තෙරුවන් වන්දනාව පෙරවරු වැඩසටහන් මෙහෙයවීම ආචාර්ය මිරිස්සේ ධම්මික නා හිමි, පස්වරු 12.30 – 1.00 සූත්‍ර සජ්ඣායනාව පස්වරු 1.00 – 2.00 ධර්ම දේශනාව විතාරණ්දෙනියේ මේධානන්ද හිමි, 2.00 – 3.30 ධර්ම සාකච්ඡාව දෙරොව්වේ ඥාණරතන හිමි, 4.00 – 5.00 ධර්ම දේශනාව අනුරාධපුර ප්‍රසන්නඥාණ හිමි, 5.00 – 6.00 ධර්ම දේශනාව අලුත්වල ධම්මසති හිමි, රාත්‍රී 7.00 – 8.00 වස් ආරාධනා පින්කම

## රද්දොළුව ශ්‍රී අමර මහා විහාරස්ථානය

සීදුව – රද්දෙළුව ශ්‍රී අමර මහා විහාරස්ථානයේ මේ වසරේ වස් ආරාධනා කිරීමේ පින්කම විහාරාධිපති, පණ්ඩිත ගෞරව ශාස්ත්‍රවේදී සීදුවේ සුමනවංස නා හිමියන්ගේ මෙහෙයවීමෙන් පුන් පොහෝ ද (3) පස්වරු 5.00 ට විහාරස්ථානයේ දී පැවැත්වීමට සංවිධානය කර ඇත.

මෙම වසරේ මහා සංඝ රත්නයට වස් පින්කමේ ප්‍රධාන දයකත්වය රද්දෙළුගම සී.ආර්. නානායක්කාර මහතා හා විමලා නානායක්කාර මහත්මිය ඇතුළු පවුලේ දූ දරු පිරිස විසිනි.

මෙම වස් කාල සීමාව තුළ සෑම ඉරිද දිනක ම සෑමට ආශිර්වාද පතා පස්වරු 6.00 ට අටවිසි බුද්ධ පූජා, බෝධිපූජා, තුන්සූත්‍ර, ධම්මචක්ක සූත්‍ර, ජයපිරිත්, දේශනා ඇතුළු පිරිත් සජ්ඣායනා කිරීමට කටයුතු යොදා ඇත.

## සේරුවාවිල මංගල රාජමහා විහාරයේ නිකිණි මහ පින්කම

බුදුරජාණන් වහන්සේගේ ලලාට ධාතුන් වහන්සේ කේශ ධාතුන් වහන්සේලා වැඩසිටින ඓතිහාසික සේරුවාවිල මංගල රජමහා විහාරයේ 96 වැනි වාර්ෂික ලලාට ධාතු නිකිණි මහා පින්කම අගෝස්තු 26 සිට සැප්තැම්බර් 02 දක්වා උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට කටයුතු යොදා ඇත. මීට සමගාමීව සේරුවාවිල මංගල රජමහා විහාරයේ හිටපු විහාරාධිපති දඹගස්ආරේ ශ්‍රී සුමේධංකර නාහිමියන්ගේ 36 වැනි ගුණ සමරුව මහ සේරුවිල සරණකිත්ති අනු නා හිමියන්ගේ 04 වැනි ගුණසමරු පින්කම ද පැවැත්වේ.

මෙම කාලය තුළ දිනපතා සති පිරිත් දේශනාව, ලලාට ධාතු පූජාව සහ විශේෂ ධර්ම දේශනා ද පැවැත්වේ. 26 ද සති පිරිත් දේශනාවෙන් පින්කම් මාලාව ආරම්භ කෙරේ. 27 සිට 31 දක්වා ලලාට ධාතු පූජාව, විදුලි ආලෝක පූජාව, ධර්ම දේශනා සහ සති පිරිත් දේශනාව නිමා වීමෙන් පසු අපවත්වී වදාළ මහා සංඝ රත්නයට හා වියෝ වූ දයකකාරකාදීන් සිහිකර සියක් නමක් උදෙසා දානමය පින්කමකි.

සැප්තැම්බර් (01) ද පොහෝ දින ආගමික වැඩසටහන, දේවදූත පෙරහර ,දෙරකඩ අස්න, අනුශාසනාව, මල් වෙඩි සංදර්ශනය පැවැත්වේ. සැප්තැම්බර් 02 වැනිද වාර්ෂික පින්කම් මාලාව නිමාවට පත්කරන බව විහාරාධිපති, නැගෙනහිර තමන්කඩුව දෙපළාතේ ප්‍රධාන සංඝ නායක, දෙම්පේ පාළුගම භාවනා මධ්‍යස්ථානාධිපති ආචාර්ය මුංහේනේ මෙත්තාරාම හිමියෝ සඳහන් කරති.

## ධම්ම නිකේතනාරාමයේ දී දම් දෙසුමක්

කොළඹ 05 ග්‍රීන්ලන්ස් වලව්වේ පදිංචි ව සිටි ලයනල් චාල්ස් ද ෆොන්සේකා පියාණන්ගේ අවුරුදු 106 ජන්ම දිනය පිරීම නිමිත්තෙන් පුතු කැලුම් ද ෆොන්සේකා අබේසේකර මහතා විසින් බුද්ධ ප්‍රතිමා වහන්සේ සමඟ ආසනය දංකොටුව යෝගියාන වැකඩ ධම්ම නිකේතනාරාම විහාරයට නිකිණි පොහෝ දින පූජා කිරීමට නියමිත ය. මීගමුව, අඟුරුකාරමුල්ල, අබේසේකරාරාම විහාරාස්ථ දූවමොට්ටාවේ මහින්ද හිමි විසින් පෙරවරු 10 ට ධර්ම දේශනාවක් ද, සිල්වතුන්ට කැලුම් මහතා විසින් ධර්ම දානය පිණිස බුදුසරණ පුවත්පත් බෙදදීම ද සිදුකෙරේ.

## හුණුපිටිය ශ්‍රී විජය සුන්දරාරාමය

වත්තල හුණුපිටිය ශ්‍රී විජය සුන්දරාරාම පුරාණ විහාරස්ථානයෙහි පෝද පෙරවරු 6.00 සිට පසුද පෙරවරු 6.00 දක්වා දන, සීල, භාවනා ධර්ම දේශනා ඇතුළු වැඩ සටහන් රාශියක් පැවැත්වීමට වීතදෝෂි සමිතිය, දයක සභාව, කාන්තා සමිතිය කටයුතු යොද ඇත. වාර්ෂික වස් ආරාධනා පින්කම මෙවරත් රාත්‍රී 7.00 පැවැත්වේ. වැඩ සටහන්, විහාරාධිපති වලවෙල හේමානන්ද නා හිමියන්ගේ අනුශාසනා පරිදි දේවගොඩ පියරතන, බුත්කන්දේ රතනජෝති, ගොමඩියේ චන්ද්‍රරතන, ඇලපිටිවල නන්දවිමල , ලෝලුගස්වැව සුමනවංස යන හිමිවරුන් ද ගාල්ලේ සුධම්මචාර දසසිල් මාතාව ද වැඩ සටහන්වලට වැඩම කිරීමට නියමිත ය.

## පෝය ලබන සහ ගෙවෙන වේලාවන්

### නිකිණි පුර පසළොස්වක

අගෝස්තු 02 ඉරිද අපර භාග 09.29 න් පසළොස්වක ලබා 03 සඳුද අපර භාග 09.28 න් පෝය ගෙවේ. සඳුද සිල්

### නිකිණි අව අටවක

අගෝස්තු 11 අඟහරුවාද පූර්වභාග 09.07න් අව අටවක පෝය ලබා 12 බදාද පූර්වභාග 11.16 න් ගෙවේ. අඟහරුවාද සිල්

### නිකිණි අමාවක

අගෝස්තු 18 අඟහරුවාද පූර්වභාග 10.39 න් අමාවක පෝය ලබා 19 බදාද පූර්වභාග 08.11 න් පෝය ගෙවේ. අඟහරුවාද සිල්.

### බිනර පුර අටවක

අගෝස්තු 25 අඟහරුවාද අපරභාග 12.22 පුර අටවක පෝය ලබා 26 බදාද පූර්වභාග 10.39 න් ගෙවේ. අඟහරුවාද සිල්

## පිහිට පතයි



ගෝනවිල, එළිවිල, අංක 677/5 හි පදිංචි අයි. එම්. හිරුණ මිහිරංග බණ්ඩාර (11) දරුවා තැලසීමියා රෝගයට ගොදුරුව ඇතිබව කියයි. ඔහුට ඇටමිඳුළු බද්ධ කිරීමේ ශල්‍ය කර්මයක් කිරීමට වෛද්‍යවරු නිර්දේශ කර ඇති බවද කියයි. ශල්‍ය කර්මයට විශාල මුදලක් වැයවන බැවින් උපකාර කරන ලෙස දරුවාගේ මව්පියන් ඉල්ලීමක් කරයි. වැඩි විස්තර 0772530389 හෝ 0760324330 විමසිය හැක. ඔබගේ ආධාර වෙල්පල්ල ලංකා බැංකුවේ ගිණුම් අංක 76198969, පන්නල සම්පත් බැංකුවේ ගිණුම් අංක – 116652082847 හෝ පන්නල කොමර්ෂල් බැංකුවේ ගිණුම් අංක 8008232546 ගිණුමට මුදල් බැරකළ හැකි බවද කියයි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

කළුතර, නැබොඩ පදිංචි රසෝධ්‍යා සෙව්වන්දි (30) දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඇයට "බී හෝ ඕ පොසිටිව්" වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව වෛද්‍ය නිර්දේශය බවද ඇය කියයි. පරිත්‍යාගශීලියෙකු වේ නම් 0711 795588 දුරකතනයට දැනුම් දිය හැකි අතර, මුදලින් ආධාර කළ හැකි අයෙකු වේ නම් නැබොඩ මහජන බැංකුවේ ගිණුම් අංක 249 – 2 – 001 – 0002 4438 ගිණුමට මුදල් බැර කළ හැකි බවද කියයි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

අවු. 35 – 55 අතර පරිත්‍යාගශීලී අයෙකුගෙන් "බී හෝ ඕ" වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය වී ඇති බව කියයි. 071 4059854, 077 4280422 දුරකතනයෙන් විමසිය හැකිය.

වේයන්ගොඩ, වදුරව අංක 213/5 හි පදිංචි දිලාන් ධනුෂ්ක (25) දරුණු වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඔහුට හැකි ඉක්මනින් "ඕ පොසිටිව් හෝ ඕ නෙගටිව්" වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව වෛද්‍ය නිර්දේශය බවද කියයි. පරිත්‍යාගශීලියෙකු වේ නම් 071 4988568/ 071 6692336 දුරකතනයෙන් විමසිය හැක.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

කළුතර දකුණ දූවේ දීපාරාම පුරාණ විහාරාධිපති විශ්‍රාමික විදුහල්පති ශාස්ත්‍රපති කළුතර පුඤ්ඤසිරි හිමියන් වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. උන්වහන්සේට "ඕ පොසිටිව්" වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව ද කියයි. පරිත්‍යාගශීලීන් වෙතොත් පහත දුරකථන අංකවලට අමතන ලෙස ඉල්ලා සිටියි. 071 807 4388, 071 83 62577, 077 381 5390

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

බොරල්ල, ගෝතමී පාර, නව මහල් නිවස අංක 24/150/ඒ 4/2/2 හි පදිංචි සමන් චන්දිම හෙට්ටිආරච්චි නැමති අය වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඔහුට "ඒ හෝ ඕ" පොසිටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය වී ඇති බව ද කියයි. පරිත්‍යාගශීලියකු වේ නම් 0722143570 දුරකතනයෙන් විමසිය හැක. මුදලින් ආධාර කළ හැකි නම් ලංකා බැංකුවේ ගිණුම් අංක 85891363 ට මුදල් බැර කළ හැකි බවද කියයි.

## කෙලෙස් නිවීමෙන් නිවී සැනසුණ

# සෝණා රහත් තෙරණිය

**සෝණා තෙරණිය ගෞතම බුදු සසුනේ අත් නොහළ වීර්යය ඇති භික්ෂුණීන් වහන්සේ අතරින් අග තනතුරු ලැබුවා.**

එතුමිය මීට බොහෝ කාලයකට පෙර ලොව පහළ වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ බුදු සසුනේ එක් භික්ෂුණියකට අත් නොහළ වීර්ය ඇති භික්ෂුණීන් වහන්සේ ලෙස අග තනතුරු පිරිනමනවා දැක, මම ද මතු දවසක වීර්යය ඇති භික්ෂුණීන් අතරින් අග තනතුරු ලබම්වා! යි ප්‍රාර්ථනා ඇතිව බොහෝ පින්දහම් කළා.

දෙව් මිනිස් දෙගතියේ උපත් ඇය මේ බුදු සසුනේ සැවැත් නුවර නිවසක ඉපදුණා. ඇගේ නම සෝණා යි. තරුණියක් වූ කල ඇය විවාහ වුණා. ඇයට පුතුන් දස දෙනෙක් ලැබුණා. එ නිසා ම බහු පුත්‍රිකා යන නමින් ඇය හැඳින්වූවා. රන් කඳක් වගේ පුතුන් දස දෙනෙකු සිටි නිසා සෝණා ජීවත් වුණේ ඉතා තේජස්ව යි. තමන් වයසට ගියාම එක දරුවෙක් හෝ බලයි කියන බලාපොරොත්තුව ඒ අම්මාගේ සිතේ තිබුණා.

සෝණාගේ ස්වාමියා බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අසා බුද්ධ ශාසනයේ පැවිදි වුණා. දැන් මේ අම්මා ස්වාමියාත් නොමැතිව දරුවන් දස දෙනෙක් හදාවඩා ගන්න මහන්සි වෙනවා. ඒක ඇයට ලෙහෙසි වැඩක් වුණේ නැහැ. ඉතාම අමාරු වුණා. ඒ දරුවන්ට අධ්‍යාපනය දෙන්න, ගේ දොර හදා දෙන්න, රැකියා සොයා දෙන්න, විවාහ කර දෙන්න ආදී ලෙස ඇය මත විශාල වගකීමක් පැවරී තිබුණා. කෙසේ හෝ බොහෝ කරදර මැද දරුවන් ලොකු මහත් කළා. මානසික පීඩාවලට මුහුණ දෙමින් සිත ශක්තිමත් කරගෙන හිටියා. ස්වාමියාට බණින්නේත් නැතිව, හිතේ හයියෙන් ජීවිතයට මුහුණ දුන්නා. දරුවන්ගේ කල වයස ආ විට ඔවුන් විවාහ කර දී දරුවන්ට දේපළ සමසේ බෙදා දුන්නා. ඒ අම්මා තමන් වෙනුවෙන් කිසිවක් ඉතිරිකර ගත්තේ නැහැ.

කාලයක් ගතවුණා. බාල පුතාත්, ඒ ලේලියත් කියනවා "අම්මා ඇයි අප ළඟම ඉන්නේ? තවත් දරුවෝ නව දෙනෙක් ඉන්නවානේ. ඒ ගෙවල්වලටත් යන්න" කියලා.

ඒ අම්මා එළියට බැහැල තව දරුවෙක් ළඟට ගියා. ටික කලක් යද්දී ඒ පුතත් කිනවා "ඇයි අම්මා අපට වැඩිපුර දේපළක් දුන්නේ නැහැනේ. තවත් පුතාලා ඉන්නේ. ඒ අය ළඟටත් යන්න" කිව්වා. ඇය ඒ නිවසෙනුත් එළියට බැස්සා.

තමන්ට නැගිටින්න අත දීපු අම්මා නේද මේ කියා ඒ දරුවෝ අමතක කළා. දරුවෝ කුඩා කාලයේ උකුලට රැගෙන නළවපු අම්මාට අද රැයක් ගත කරන්න ඒ දරුවන්ගේ නිවසේවල ඉඩ මදිවෙලා. ඇය නිවසින් නිවසට යනවිට ඒ හැම නිවසක ම දොරවල් වැහුණා. ඇයට දැන් හරි වෙහෙස යි. එහෙත් ඇය දරුවන්ට දොස් කිව්වේ නැහැ. වෛර කළෙත් නැහැ. එක දරුවෙකුගේ වැරැදි අනෙක් දරුවාට කිව්වෙත් නැහැ. ඇයට සිදු වූ අසාධාරණය කාටවත් කිව්වෙත් නැහැ. බුදුරජාණන් වහන්සේ වදාළේ සාධාරණ අසාධාරණකම් සොයන්න එපා කියල යි. තමන්ගේ ජීවිතයට අසාධාරණකම් දිගට ම එනවිට ඒ අසාධාරණ සංසාරයෙන් නිදහස් වීමම යි හොඳ. දුක් කරදර එක දිගට එනකොට ඒ කරදර සංසාරයෙන් නිදහස්වීමම යි හොඳ. වෙන කෙනෙකුට ඇඟිල්ල දිගු කරනවාට වඩා හොඳයි කෙළවරක් නැති මේ සසරෙන් එතෙර වන එක. විසඳුම ඒකයි. ඒ කාලයේ දරුවෝ මගේ වටේ දැවටී දැවටී හිටියා. ඥාතීන්, යාළුවෝ මට හිටියා. අද කවුරුත් නැහැ. මට යසස තිබූ කාලයේ උදම් වුණෙත් නැහැ. අයස තිබෙන කාලයේ කම්පා වෙන්නෙත් නැහැ" සෝණා අම්මා සිතුවා.

ඇය දැන් වයස නිසා අතපය වාරු නැහැ. දුර්වල යි. කායික දුකත්, මානසික දුකත් මැද සියලු දෙයට කම්පා නො වී ඇය විසඳුමකට ආවා. ඒ තම ස්වාමියා පැවිදි වූවා සේ ඇයත් භික්ෂුණී ආරාමයකට ගියා. නමුත් එතැනත් ඇයට ලෙහෙසි වුණේ නැහැ. එතැන සිටි භික්ෂුණීන්ගේ බොහෝ වැඩ කරන්න සිදුවුණා. දර පැලුවා, වතුර උණු කළා. පැන් පහසු වෙන්නට වතුර පිරවූවා. අතුපතු ගෑවා. දවස පුරාම ඇයට වැඩ තිබුණා. ඒ සියල්ල ම ඇය ඉවසුවා. පසු කලෙක ඇය පැවිදි වුණා. දැන් ඇය සෝණා භික්ෂුණිය යි. නමුත් ඒ භික්ෂුණියට ආරාමයේ වැඩවල අඩුවක් තිබුණේ ම නැහැ. දරුවෝ මට මෙහෙම කළ නිසයි මට මෙහෙම වුණේ කියා ඇය සිතුවේ නැහැ. සිනාමුසු මුහුණෙන් වැඩ කළා. පින ගැන සිහි කරමින් වැඩ කළා.


මේ භික්ෂුණිය සිතුවා "මම මේ බුද්ධ ශසානයේ පැවිදි වුණේ මේ ධර්ම මාර්ගය පුරුදු කර ගන්නයි. ඒ නිසා මම ඒ මාර්ගයත් පුරුදු කරන්න ඕනෑ" සිතා රාත්‍රියට උඩු මහලෙන් පහතට බැහැලා එතැන තිබෙන කණුවක් අල්ලාගෙන තමන්ගේ ශරීරයේ තිබෙන්නා වූ දෙතිස් කුණුපයන් සිහි කරමින් සක්මන් භාවනාව කරනවා. ඇයට මළුවක සක්මන් කරන්න වාරු නැති නිසා ඇය කණුව වටේ සක්මන් කළා. "මේ මහ පොළොවට පස්වෙලා යන කයක්. කුණුප කොටස්වලින් යුතු කයක් දරාගත් නිසානේ මට මේ දුක යැයි" සිතමින් සක්මන් කරනවා. ඇය කායානුපස්සනා භාවනාව රිසි සේ මෙනෙහි කරනවා. ඇය තමන්ට වූ අසාධාරණය සිතමින් නොවේ නිදි වරන්නේ. අසාධාරණය තිබෙන මේ සංසාරයෙන් මිදෙන ආකාරය සිතමින් නිදි වරා භාවනා කරනවා.

දිනක් ඇයගේ සිත ධර්ම අවබෝධයට මෝරා තිබුණා. අපගේ භාග්‍යවතුන් වහන්සේ එදා මහා කරුණා සමාපත්ති ඥානයට සමවැදී ලෝකය දෙස බැලුවා. මඩ ගොඩේ මැණිකක් සැඟ වී තිබුණත් මඩ සෝදන විට මැණික මතු වෙන්නා සේ උන්වහන්සේ මේ තෙරණිය දුටුවා. එතුමිය දුර ඈත රටක සිටියත් මේ බියකරු සසරින් මිදෙන්නට ගන්නා වීර්යය දුටු භාග්‍යවතුන් වහන්සේ රශ්මි දහරාවක් එවා ගාථාවක් වදාළා.

"පින්වත් භික්ෂුණිය, යමෙක් උතුම් දහම නො දකිමින් අවුරුදු සියයක් ජීවත්වේද, ඉන් ඵලක් නැත. නමුත් දහම දකිමින් එක දිනක් හෝ ජීවත්වෙන තැනැත්තා ගේ ජීවිතය අවුරුදු සියයක් ජීවත්වන තැනැත්තාට වඩා ශ්‍රේෂ්ඨ වන්නේ ය". ඒ ගාථාව ශ්‍රවණය කළ ඒ භික්ෂුණිය සියලු කෙලෙසුන් නසා අරහත්වයට පත්වුණා.

දිනක් එතුමිය තමාගේ ජීවිතය පිළිබඳ උදානයක් වදාළා

- සුරූපී සිරුරකින් යුතු මම දරුවන් දස දෙනෙක් බිහි කළෙමි. පසුව මගේ ශරීරය දුර්වල ව දිරාගිය දරකඩක් මෙන් විය. මම භික්ෂුණී ආරාමයට ගියෙමි.
- මෙහෙණින් වහන්සේලා මට ස්කන්ධ ධාතු, ආයතන ගැන වදාළා. ඒ දේශනාව අසා මම හිස මුඩු කර පැවිදි වුණා.
- මම සික්ඛාමානාවක් (ත්‍රිවිධ ශික්ෂාවේ හික්මෙන්නී) ලෙස සිටිද්දී ම දිවැස පිරිසුදු කර ගත්තේ. මම කලින් විසූ ආත්ම භාවයන් දකිමි.
- එකඟ වූ සිතින් භාවනා වඩමි. කෙලෙස් නිවීමෙන් නිවුනෙමි. මේ පංචස්කන්ධය මම දුටුවා. ඒවා තිබෙන්නේ මුල් රහිතව යි. ජරා උපතට නින්ද වේවා. දැන් නැවත උපතක් මට නැත.



නයනා නිල්මිණී

# පහන් සිතක කවි

සංස්කරණය
**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

## උතුම් පොහෝ දින

කසුප් සමිඳු මුල් වී බුදු බණ සැකසූ
පළමු දහම් සංගීතිය සිදු කෙරුණු
අබිදම් විනය සුතුරය තුන් පිටක මතු
පරපුර වෙතට නිති තිසි ලෙස දුන් මහරු
උතුම් පොහොය දිනය යි නිකිණිය සොඳුරු
අනඳ සමිඳු ලැබ අරහත් බව ඔකඳින්
උතුම් රහත් සමිඳුන් හා එකතු වෙමින්
පළමු වරට දම් සංගීතිය කරමින්
දහම් විනය රැකගත් යුරු සිහි කරමින්
අදත් නිකිණි සඳ ඇත අහසේ දිලෙමින්
පින්බිම සේරුවිල වෙත දන රැස් වෙන්නේ
ලලාට ද වැඳ පින් රැස්කර ගන්නේ
පසුවස් එළඹුමත් නිකිණියෙ සිදු වෙන්නේ
නිකිණි පොහොය එලෙසිනි වැදගත් වෙන්නේ



මාලබේ
**කේ. ඩබ්ලිව්. සිරිසේන**

### මනුස්සකම

| | |
|---|---|
| දහමින් විනා අදමින් වැඩ නොකළ | යුතු |
| අන් සතු දෙය එපා ඇති දෙය තමා | සතු |
| නො සොයා කිසිම දිනයක අන් අයගෙ | තතු |
| රට දැය නඟා පෙරට ම යා යුතු ය | මතු |
| බාධක කම්කටොළු නිති පසුකර | ලන්න |
| නැණ ගුණයෙන් ඔබ දිවිමග | බබළන්න |
| නින්ද ප්‍රශංසා සමසේ පිළි | ගන්න |
| අටලෝ දහම අනුව ම ජීවත් | වන්න |

ගලේවෙල
**එච්. එච්. ආනන්ද සමරසිරි**

### කවි කිවිඳියනට සතර පෝ දාටම දහම් තුටු පඬුරු

බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස ඉල් පුර පසළොස්වක පෝදා සිට දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදාට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.

බුදුසරණ
**පහන් සිතක කවි**
BCC

සම්පූර්ණ නම :- ..........................................................
ලිපිනය :- ..........................................................
දුරකථන අංකය :- ..........................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.

# සදහම් අරණ



සංස්කරණය
**නයනා නිල්මිණී**

පැන විසඳුම් ජයග්‍රාහිකාව

## ආමිස පූජාව

බෞද්ධයන් තුළ උසස් චින්තනයක් ඇති කිරීම උදෙසා බුදු දහමේ ප්‍රතිපත්ති දෙකක් හඳුන්වා දී ඇත. ඒ ආමිස පූජාව සහ ප්‍රතිපත්ති පූජාවයි. එයින් ආමිස පූජාව ලෙස බුද්ධාදී උත්තමයන් වහන්සේලාට ආහාර පාන, වස්ත්‍ර, ගන්ධ, දීප, ධූප, පුෂ්ප ආදිය පූජා කිරීම දැක්විය හැකි ය. බෞද්ධයන් වන අප ආමිස පූජාව පිළිබඳ වටහා ගැනීම අත්‍යවශ්‍ය වෙයි. නිර්වාණගාමී මාර්ගයට ළඟා වීමට ආමිස පූජාව උපකාර වෙයි. පුරාණයේ පටන් අද දක්වා බෞද්ධයන් විසින් ගෞරවයෙන් කරන ලද පින්කමක් ලෙස ආමිස පූජාව හැඳින්විය හැකි ය. ආමිස, ප්‍රතිපත්ති පූජා දෙක ම අපගේ නිවන් මග සම්පූර්ණ කර ගැනීමට ඉවහල් වෙයි. විහාර භූමියේ ශාසන කටයුතුවල දී නිරන්තරයෙන් අපගේ නෙත ගැටෙන ආමිස පූජාව අපගේ සිත ප්‍රබෝධමත් කරයි. මල්, පහන්, සුවඳ දුම් ආදී සියලු පුද පූජාවන් වත් පිළිවෙත් සිදුකරනු ලබන්නේ බුදුරජාණන් වහන්සේ ආමිස පූජාවෙන් පිදීමට ය.

**ලක්ෂිකා ධනංජනී වික්‍රමරත්න**
අවසාන ශ්‍රේණිය
ශ්‍රී අභිනවාරාම දහම් පාසල – ඇලපාත දකුණ

### නිකිණි පෝය ද



| | |
|---|---|
| බුදුහිමි පිරිනිවී තෙමසක් ගත | වූ ද |
| මහා කසුප් මහරහතුන් පෙරටු | එද |
| පළමු දහම් සංගීතිය ඇරඹුණ | ද |
| තුන් පිටකයේ සැලසුම නිකිණි | පෝද |
| සිව් ඉරියව් මගහැර වැඩඋන් | සැනෙක |
| අනඳ තෙරුන් අරහත් පල ලැබූ | සේක |
| දියත පතළ දළදා පෙරහර | මෙළක |
| නිකිණි පොහොය සිහිවටනෙකි හැම | දක |

**බදුල්ලේ සුබිත හිමි**
ශ්‍රී බෝධිරාජ විහාරය, කතරගම

## සක්මන් භාවනාවේ අනුසස්

බුදුරජාණන් වහන්සේ සක්මන් භාවනාවේ අනුසස් මෙසේ වදාළ සේක. දුර ගමන් යා හැකි වෙයි, වීර්ය වැඩීමට ශක්තිය ලැබෙයි. ආබාධ අඩුවෙයි, අනුභව කළ දනය සුවසේ දිරවයි, සක්මන් භාවනාවෙන් උපදවා ගත් සමාධිය බොහෝ කල් නොනැනසී පවතී.

**මහආරගම සුදස්සන හිමි**
03 වන වසර
ශ්‍රී / සුමන සාමණේර ආයතනය, හඳපානාගල

බුදුසරණ **සදහම් අරණ**
**ළමා සමාජය**

සම්පූර්ණ නම :- ..........................................................
පාසල / දහම් පාසල :- ..........................................................
ඉගෙනුම ලබන ශ්‍රේණිය :- ..........................................................
ලිපිනය :- ..........................................................
දුරකථන අංකය :- ..........................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.

## ළමා ප්‍රහේලිකා අංක 20

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | න් | 3 | ■ |
| ■ | | ■ | 4 | 5 ම |
| 6 | න | | ■ | |
| 7 | | ■ | 8 බ | |
| ල | ■ | ■ | | ■ |

**ප්‍රථම ජයග්‍රාහකයා සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ ලේකම් කේ.කේ. සුගතපාල මහතාගේ අනුග්‍රහයෙන් වටිනා ත්‍යාගයක් පිරිනැමේ.**

### හරහට

1. මෙම ඉන්දියානු ලෙන් විහාර බෞද්ධ චිත්‍ර සඳහා ප්‍රසිද්ධ ය.
4. සිදුහත් කුමරුන්ට නම් තැබීමට පැමිණි බමුණන්ගෙන් පළමුවැන්නා ය.
6. ත්‍රිපිටකයෙන් එකකි
8. බුදුන් වහන්සේ මේවා දසයකින් ශක්තිමත් වූ බව කියැවේ.

### පහළට

2. ඈත පෙරදිග පිහිටි බෞද්ධ රටකි
3. ලංකාවෙන් ගෙනගිය මෙම දෙවඟනගේ අගනා ප්‍රතිමාවක් ලන්ඩන් කෞතුකාගාරයේ ඇත.
5. බුද්ධ පරිනිර්වාණය සිදු වූයේ මෙම රජුන්ගේ රාජ්‍යයේ දී ය.
6. නියමිත වේලාවෙන් පිටත ආහාර ගැනීම මෙම භෝජනය ලෙස දැක්වේ.
8. දේව ධර්මය ලෙස හඳුන්වන ගුණාංග දෙකෙන් එකකි.

**අංක 19- ප්‍රහේලිකා ජයග්‍රාහකයෝ**

- **ගම්පළ සුමේධ හිමි**
  **04 වන ශ්‍රේණිය, සිරි නිවාස දහම් පාසල – ගම්පළ**
- **මාධව නිලූෂ නිර්මාල්**
  **අංක 70, රිදීගම පාර, මල්ලපිටිය– කුරුණෑගල**

| | | | | |
|---|---|---|---|---|
| 1 කා | ල | 2 ය | ■ | 3 ප |
| ය | ■ | 4 ම | ශූ | ර |
| ■ | ■ | ක | ■ | ස |
| 5 සු | 6 බ | ■ | 7 කෝ | තු |
| ■ | 8 ක් | ලේ | ශ | ■ |

## පැන විසඳුම්


දයාවංශ ජයකොඩි සහ සමාගම

**පහත සදහම් ප්‍රශ්නයට පිළිතුර පැහැදිලි ව ලියා අප වෙත එවන්න.**

අපි පරිසරයට ආදරය කරමු යන මතෘකාව යටතේ කෙටි රචනාවක් නිර්මාණාත්මක ව ලියා අපවෙත එවන්න.

..........................................................................

ජයග්‍රාහී දරුවෙකුට දයාවංශ ජයකොඩි සහ සමාගමෙන් දහම් පඬුරක් පිරිනැමේ.



## දිවැස් ඇති භික්ෂූන් වහන්සේ අතුරින් අග්‍ර වූ

# අනුරුද්ධ මහ රහතන් වහන්සේ

**අසූමහා ශ්‍රාවකයන් වහන්සේ අතර අනුරුද්ධ මහ රහතන් වහන්සේ දිවැස් ඇති භික්ෂූන් වහන්සේ අතුරින් අග්‍රස්ථානය ලැබීමට භාග්‍යවන්ත වූහ. ඒ උදෙසා උන්වහන්සේ සසරේ කල්ප ලක්ෂයකට පෙර පදුමුත්තර බුදුන් වහන්සේගේ කාලයේ දී සිදු කළ පින්කම් විශිෂ්ඨ ය.**

පදුමුත්තර බුදුන් වහන්සේ සදහම් දෙසද්දී එක්තරා ධනවත් සැදැහැති කුල පුත්‍රයෙක් දුටු දසුන පින්බර ය. ඒ පදුමුත්තර බුදුන් වහන්සේ වෙතින් එක්තරා භික්ෂූන් වහන්සේ නමක් දිවැස් ඇති භික්ෂූන් වහන්සේ අතුරෙන් අග තනතුර ලබා ගත් අවස්ථාව යි. ඒ සුවිශේෂී භික්ෂූන් වහන්සේ නමක් යැ'යි සිතූ ඔහුට ද මෙවැනි ම අග තනතුරක්, මතු බුදු වන බුදුන් වහන්සේ නමකගෙන් ලැබීමේ බලවත් අදිටන ඇති විය. ඒ උදෙසා මෙමකුල පුත්‍රයා සසර භවයන්හි කළ පින්කම් අපමණ ය.

දිනක් පදුමුත්තර බුදුන් වහන්සේ ප්‍රමුඛ මහා සඟරුවන තම නිවසට වඩමවා ප්‍රණීත ආහාරපානයෙන් දන් පිදුවේ ඉමහත් ශ්‍රද්ධාවෙනි. සත් දවසක් ම මෙලෙස දන් පුදා අවසන් දිනයෙහි වදාළ අනුමෙවෙනි බණෙන් පසුව පදුමුත්තර බුදුන් වහන්සේගේ ශ්‍රී පාද මූලයේ වැඳ වැටුණුමොහු මෙසේ පැවසුවේ ය.

ස්වාමීනි,මා මෙලෙස සත් දිනක් මුළුල්ලේ ම ඉමහත් ශ්‍රද්ධාවෙන් දන් පිරිනැමුවේ පින්බර අරමුණක් උදෙසා ම යි. ඔබ වහන්සේ සත් දිනකට පෙර යම් භික්ෂූන් වහන්සේ නමකට දිවැස් ඇති භික්ෂූන් වහන්සේ අතුරෙන් අග්‍රස්ථානය ලබා දුන් දසුනෙන් මම අපරිමිත සතුටට පත් වුණෙමි. මට ද අනාගත බුදුවරයෙකුගෙන් මෙලෙස දිවැස් ඇති භික්ෂූන් වහන්සේ නමක් වීමේ අදහස ඇති විය . ඒ උදෙසා මා සත් දිනක් මුළුල්ලේ ම බුද්ධ ප්‍රමුඛ මහ සඟරුවනට දන් දුන්නේ ඉමහත් ශ්‍රද්ධාවෙනි. මෙහිදී පදුමුත්තර බුදුන් වහන්සේ දිවැසින් බලා මෙයින් කල්ප ලක්ෂයකට පසුව බුද්ධත්වයට පත්වන ගෞතම බුදුන් වහන්සේගේ කාලයේ මෙම කුල පුත්‍රයාගේ පැතුම ඉෂ්ඨ සිද්ධ වන බවට නියත විවරණ ලබා දුන්නහ.

එයින් අපමණ සතුටට පත්වූ මෙම කුල පුත්‍රයා සසරේ දෙව් මිනිස් ලොව සිය දහස් වර භවයන්හි උපත ලබමින් දිවැස් ලැබීමට සමත් වන 'ප්‍රදීප පූජා' ආදී පින් දහම් කරමින් පිරූ පාරමී දම් අපමණ ය.

පින් දහම් නිසා දිගු සසරක ඇති සැපයත්, දෙව් – මිනිස් සුගතිගාමී භවයන්හි උපත ලබන අකාරයත් මෙයින් පසක් වේ. කෙසේ වෙතත් තම උත්තුංග අරමුණු උදෙසා ම සසර භවයන්හි පින්දහම් කළ එතුමා කාශ්‍යප බුදුන් වහන්සේගේ කාලයේ බරණැස් නුවර කෙළෙඹියෙක් ව උපත ලබා කළ පින්කම ද අසිරිමත් ය. වැටි දහසකින් සපිරි පහන් මාලාවක් රැය පහන් වන තුරා ම තම හිස මත තබාගෙන,කාශ්‍යප බුදුන් වහන්සේගේ ධාතූන් වහන්සේ නිදන් කළ, යොදුනක් පමණ සුවිසල් දාගැබක් වටා සක්මන් කළේ ඉමහත් ශ්‍රද්ධාවෙනි.

තවත් ආත්ම භාවයක දී දිළිඳු කුලයක උපත ලැබූ මෙතුමා අන්නභාර නාමයෙන් සුමන සිටුවරයාගේ ඇසුරෙහි වාසය කළේ ය. දිනක් උපරිට්ඨ පසේ බුදුන් වහන්සේ සත් දිනක් නිරෝධ සමාපත්තියට සම වැද අවසන් දිනයේ පිණ්ඩපාතය පිණිස අන්නභාර අසලට වැඩම කළේ ඔහු කෙරෙහි වූ අනුකම්පාවෙනි. මේ නිසා අන්නභාර දුගියා කරගත් පින්කම ඉමහත් ය. තමන්ටත් , තම භාර්යාවටත් අනුභව කිරීමට වෙන් ව තිබූ ආහාර කොටස පිණ්ඩපාතයට වැඩම කළ පසේ බුදු රදුන්ට පිදුවේ ඉමහත් ශ්‍රද්ධාවෙනි. මේ දසුනෙන් සතුටට පත් වූ සුමන සිටු ගෙදර සේසත වසන දේවතාවෝ තෙවරක් ම සාධු නාද නැඟුහ. ඒ සාධු නාදය ඇසුණු සිටුතුමා ද දානයේ පින අනුමෝදන් ව, අන්නභාර දුගියාට කහවුණු දහසක් පිදී ය. මේ සුපින්බර පුවත ගැන දැනුම්වත් වූ රටේ රජතුමා ද අන්නභාර දුගියාට කහවුණු දහසක් බැඳි පියල්ලක් පිදී ය. එදිනම අන්නභාර දුගියා මහා ධන සිටු තනතුරු ලබා නොයෙක් සැප සම්පත් විඳ ජීවිතාන්තය දක්වා ම බොහෝ පින්කම් කර නැවත දෙව්ලොව උපත ලැබුවේ ය.

මේ අනුව විමසා බැලීමේ දී අන්නභාර සසර භවයන්හි අපමණ පින් දහම් කළත් දුගී ව උපදින්නට ඇත්තේ තමන් කළ අකුසලයක් නිසා විය හැකි ය. එහෙත් ශ්‍රද්ධාවන්ත අන්නභාර දුගියා එක් දිනකින් සිටුවරයෙක් වන්නට ඇත්තේ තමා කළ කුසලයේ බලය නිසයි. ඒ ආත්ම භාවයේ ම පළ දෙන එම කුසලය, හෝ අකුසලය දිට්ඨධම්ම වේදනීය කර්මය වශයෙන් බුදු දහමේ හැඳින් වේ.

මෙලෙස දෙව්ලොව උපත ලැබූ අන්නභාර සිටුතුමා සසරේ අවසන් ආත්ම භාවයේ දී මිනිස් ලොව උපත ලබුවේ අනුරුද්ධ නාමයෙනි. අමිතෝදන ශාක්‍ය රජු තම පියාණන් වහන්සේ ය. ගෞතම බුදුන් වහන්සේගේ සුළු පියාණන්ගේ පුතණුවන් ය. මහානාම ශාක්‍ය රජුගේ බාල පුතණුවන් ය.

ඉමහත් යස ඉසුරු මධ්‍යයේ හැදී වැඩුණු එතුමා 'නැත' යන අර්ථයවත් නොදත් පින්වත් කුමාරයෙකි. එතුමා දිනක් තම යහළුවන් සමඟ කෙළි දෙලෙන් වාසය කරද්දී , ඔට්ටුවකට කැවුම් පොදියක් පොරොන්දු වී එය තම මෑණියන් වහන්සේගෙන් ඉල්ලුවේ ය. තමන් බලාපොරොත්තුවන සැම දෙයක් ම ලබා ගැනීමට කුමාරයා පින්වන්ත ය. ඒ නිසාම 'නැත' වදන කුමරුට ඒත්තු යන්නේ ම නැත. එදා තම මෑණියන් කැවුම් පිරී ගිය බඳුනක් කුමරුට පිරිනැමී ය. පසුව එහි කැවුම් අවසන් ව ගිය ද කුමරුට 'නැති' වදන තේරෙන්නේ ම නැත. ඒ නිසාම ඔහුසේවිකාවට පවසන්නේ 'නැති කැවුම්' රැගෙන එන ලෙස යි. කුමරුගේ මෑණියන් කුමරුට 'නැත' අර්ථය ඒත්තු ගැන්වීමට හිස් කැවුම් බඳුන වසා සේවිකාව අත යැවී ය. මේ දසුනින් දෙව් බඹුන් බොහෝ දුකට පත්වූයේ කුමාරයා අධික පින්වන්ත වූ නිස යි. ඒ නිසාම දිව්‍ය ඕජාවන්ගෙන් සපිරි රසවත් කැවුම් බඳුනක් කුමරුට ලැබීමට සැලැස්වී ය. මෙය නොදත් සේවිකාව එහි කැවුම් නැති බව පවසා හිස් කැවුම් බඳුන කුමරු අතට පිරිනැමී ය. එහෙත් පින්වන්ත අනුරුද්ධ කුමරු බඳුන විවර කරද්දී ම සුවඳවත්, රසවත් කැවුම් එහි පිරී තිබිණි. වෙනදාටත් වඩා රසවත් වූ කැවුම් අනුභව කළ කුමරු තම මෑණියන්ට පැවසුවේ 'නැති කැවුම් ඉතා රසවත්' බව යි. තවත් අවස්ථාවක බත් ලැබෙන්නේ කොහෙන්දැ'යි ඇසූ විට බත් පිණිස ලැබෙන හාල් කුඹුරෙන් ලබා ගන්නා බව එක් අයෙක් පැවසුව ද, කුමරු පැවසුවේ බත් ලැබෙන්නේ පිඟානෙන් බව යි. මෙලෙස 'නැත' අර්ථයවත් නො අසන්නට තරම් අනුරුද්ධ කුමාරයා පින්වන්ත වූයේ සසරේ කළ පින්කම්වල බල මහිමය යි.

දිනක් කිඹුල්වත් පුරයට වැඩම කළ බුදුන් වහන්සේ ශාක්‍ය කුමාරවරු පිරිසක් සසුන් ගත කරවූහ. එහිදී මහානාම ශාක්‍ය 'රජු අනුරුද්ධ කුමාරයාගෙන් මෙසේ විමසී ය. අනුරුද්ධය, බොහෝ ශාක්‍ය කුමාරවරු සසුන් ගත වන බැවින්, අපගේ පවුල්වල ද යම් කිසිවෙක් පැවිදි වී නැති නිසාත්, ඔබ පැවිදි වන්නට කැමැති ද? නැතිනම්, මා පැවිදි වන්නේ දැ'යි විමසී ය. එහිදී සසුන් ගත වීමට කැමැති වූ අනුරුද්ධ කුමරු තම යහළු කුමාරවරුන් වන භද්දිය, දේවදත්ත, ආනන්ද, භගු, කිම්බිල, උපාලි සමඟින් පැවිදි වූහ. අනුරුද්ධ තෙරණුවෝ ,අග්‍රශ්‍රාවක සැරියුත් මහ තෙරුන් වහන්සේගෙන් කමටහන් ලබා චේතිය රටෙහි පාචීන වංස මිගදාය වනයට වැඩම කළහ. ඒ දිගු සසරක අවසානය වන උත්තරීතර නිවන් මඟ උදෙසා බවුන් වඩන්නට ය. එහිදී උන්වහන්සේට අග කොටස පැකිළෙන බව දිවැසින් දුටු අසම සම බුදුන් වහන්සේ අහසින් ම වැඩම කර මහා ආර්ය වංශ ප්‍රතිපදාව වදාළ සේක. නැවත බුදුන් වහන්සේ භේසකලා වනයට වැඩම කරන මොහොතේ ම අනුරුද්ධ තෙරුන් වහන්සේ සියලු කෙලෙසුන් නසා රහත් වූහ. එතැන් සිට ම දන් වළඳන අවස්ථාව හැර සැම මොහොතක ම නිබඳව ම ආලෝකය වඩා දිවා රෑ දෙකෙහි ම දිවැසින් සත්ත්වයන් දෙස බලමින් වාසය කරන බැවින් උන්වහන්සේ ලැබූ තනතුර සුවිශේෂී ය. ඒ ගෞතම බුද්ධ ශාසනයේ දී දිවැස් ඇති භික්ෂූන් අතුරෙන් අග්‍රස්ථානය ලැබීම යි.

ධර්ම සංගායනාවන්ට ද තමන් වහන්සේගේ මෙහෙවර ඉටු කරමින් අවුරුදු එකසිය පනහක් ආයු ලබන්නට භාග්‍යවත් වූ උන්වහන්සේ මෙයින් කල්ප ලක්ෂයකට පෙර පදුමුත්තර බුදුන් වහන්සේගෙන් නියත විවරණ ලබා, ඒ උතුම් අදහස උදෙසා සසර භවයන්හි පිරූ පාරමී දම් බල මහිමය මෙලෙස ගෞතම බුදු සසුනේ දී ඉෂ්ඨ සිද්ධ වීම විශිෂ්ඨ ය.

ජම්මික ප්‍රබෝධනී වැලිකල

## කලයාණි රාජමහා විහාරය

පෙරවරු 6.00 – 06.30 සීල සමාදන හා උදෑසන බුද්ධ පූජාව ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරයේ කෘත්‍යාධිකාරී ශාස්ත්‍රවේදී රත්දිලිගම මහින්ද හිමි, 8.00 – 9.00 භාවනාව ශ්‍රී කල්‍යාණි උභය රාජමහා විහාරාධිපති, කැලණි විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නා හිමි, 09.00 – 10.00 ධර්ම දේශනාව කරවිලකොටුවේ ධම්මතිලක හිමි, 10.00 – 11.00 ධම්මපදයෙන් බිඳක් ශාස්ත්‍රවේදී කැලණියේ ශාසනවංස හිමි, 11.00 – 11.30 දිවා බුද්ධ පූජාව ගොඩපොල නන්ද හිමි, පස්වරු 2.00 – 3.00 වෛද්‍ය දේශනය, 03.00 – 04.00 ධර්ම දේශනාව කරඳටියන සෝමින්ද හිමි, 04.00 – 05.00 ධර්ම දේශනාව ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරයේ කෘත්‍යාධිකාරී ශාස්ත්‍රවේදී රත්දිලිගම මහින්ද හිමි, 05.00 – 06.00 භාවනාව ශ්‍රී කල්‍යාණි උභය රාජමහා විහාරාධිපති, කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නා හිමි, 06.00 – 06.30 වස් ආරාධනා පින්කම, 06.30 – 07.00 ගිලන්පස බුද්ධ පූජාව කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දෙතියායේ පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත හිමි, 07.00 – 08.00 ධර්ම දේශනාව ඇතිමලේ සීලානන්ද හිමි.

## රද්දොළුව ශ්‍රී අමර මහා විහාරය

සීදුව – රද්දොළුව ශ්‍රී අමර මහා විහාරස්ථානයේ අගෝස්තු මස 03 වෙනි සඳුදා දිනට යෙදී ඇති නිකිණි පුරපසළො ස්වක පුන්පොහොය නිමිත්තෙන් පින්කම් මාලාවක් විහාරාධිපති, පණ්ඩිත ගෞරව ශාස්ත්‍රවේදී සීදුවේ සුමනවංස නා හිමියන්ගේ මෙහෙවීමෙන් පැවැත්වේ.

පුන් පොහොය දින අලුයම 5.00 ට ශ්‍රී දළද වහන්සේ, අටවිසි බුදුරජාණන් වහන්සේලා උදෙසා ප්‍රණීත කිරි ආහාර පාත්‍ර 32 ක් පූජා කිරීම, උදෑසන 6.00 ටෙ අෂ්ඨාංග උපෝසථ සීලයෙහි පිහිටුවීම හා අනුශාසනාව විහාරාධිපති සීදුවේ සුමනවංස නාහිමි "උදෑසන 6.45 ට ආහාර බුද්ධ පූජාව හා තෙරුවන් වන්දනාව, පෙරවරු 8.00 සිට 9.00 දක්වා ධර්ම දේශනාව, ගෞරව ශාස්ත්‍රවේදී ඇඹිලිපිටියේ සාරද හිමි, 9.00 සිට 10.45 දක්වා ධර්ම සාකච්ඡාව, කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අශෝක ප්‍රියදර්ශන මහතා ධර්මාචාර්ය ගෞරව ශාස්ත්‍රවේදී ඒ.එන්. ඉන්ද්‍රසේකර මහතා ධර්මාචාර්ය අනුර සිරිමාන්න මහතා ශාස්ත්‍රපති නිල් ධර්මප්‍රිය බණ්ඩාර මහතා , ධර්මාචාර්ය කේ.ඒ.එස්. ආර්. දයානන්ද මහතා , 10.45 ට ශ්‍රී දළද වහන්සේ, අටවිසි බුදුරජාණන් වහන්සේලා උදෙසා මුල්තැන් බුද්ධ පූජා පූජා කිරීම

පස්වරු 12.00 සිට 12.30 දක්වා සක්මන් භාවනාව, 12.30 සිට 1.30 දක්වා ජාතක ධර්ම දේශනාව, 1.30 සිට 2.30 දක්වා භාවනාව සහිත ධර්ම දේශනාව, මොණරාගල සෝමසාර හිමි, 3.00 සිට 4.00 දක්වා ධර්ම දේශනාව, ශාස්ත්‍රපති ඇල්ලේ ඉන්ද්‍රජෝති හිමි, 5.00 වස් ආරාධනා පින්කම, 6.00 ට විශේෂ ආශිර්වාද අටවිසි බුද්ධ පූජාව සහිත පහන් පූජා , බෝධිපූජා, පින්කම සහ තුන්සූත්‍රය, ගිරිමානන්ද සූත්‍රය, ධම්මචක්කපවත්තන සූත්‍රය , ජය පිරිත් දේශනා පැවැත්වීමට සංවිධානය කර ඇත.

## පෝදා පින්කම්

## ගල්කිස්ස බෞද්ධ ආයතනයේ වස් ආරාධනය

ගල්කිස්ස වටරප්පල පාර, බෞද්ධ ආයතනයෙහි විහාරාධිපති ආචාර්ය දිවියාගහ යසස්සි නා හිමියන් ප්‍රධාන සංඝරත්නයට වස් ආරාධනා කිරීමේ පින්කම මේ මස 03 වන ද (පෝද) පස්වරු 6 ට එම විහාරස්ථානයේ දී සිදු කෙරේ. මෙවර වස් ආරාධනය කරනු ලබන්නේ දෙහිවල, අත්තිඩිය, වැවපාර නිලන්ති අනෝජා ප්‍රනාන්දු මහත්මිය සහ මල්වත්ත පාරේ පදිංචි රාජිනී ද සිල්වා මහත්මිය ඇතුළු පවුලේ පිරිස විසිනි. මෙම පෝ දින සිට පොහොය දිනයන්ට අමතරව සැම සෙනසුරාද දිනකම පස්වරු 5 ට විශේෂ ධර්ම දේශනා මාලාවක් වස්කාලය පුරාම සිදු කිරීමට කටයුතු යොද ඇත.

## කුප්පියාවත්ත ජයශේඛරාරාමය

කොළඹ 10 කුප්පියාවත්ත, ශ්‍රී ජයශේඛරාරාමයේ මහා විහාරස්ථානයේ මේ මස පසළොස්වක පොහෝද අමරපුර සිරිසද්දම්මවංශ මහානිකායේ ධීරානන්ද පාර්ශවයේ ප්‍රධාන අධිකරණ සංඝනායක, ත්‍රිපිටකාචාර්ය, තලල්ලේ සිරිමහින්ද නා හිමියන්ගේ ප්‍රධාන අනුශාසකත්වයෙන් පැවැත්වේ.


එදින පෙරවරු 6.00 – 06.30 දක්වා උපෝසථ ශීලය හා කෙටි අනුශාසනාව විහාරාධිපති තලල්ලේ සිරිමහින්ද නාහිමි 7.00 – 7.30 දක්වා සම්බුද්ධ පූජාව හා තෙරුවන් වන්දනාව, විහාරාධිපති තලල්ලේ සිරිමහින්ද නා හිමි, 8.00 – 9.00 දක්වා භාවනාව ශාස්ත්‍රවේදී කන්තලේ සුමිත්ත හිමි, 9.15 – 10.15 දක්වා ධර්ම දේශනය කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ ආචාර්ය ශාස්ත්‍රපති, බූලනවැවේ, වජිර බුද්ධ හිමි, 10.30 – 11.00 දක්වා දහවල් බුද්ධ පූජාව, විහාරාධිපති තලල්ලේ සිරිමහින්ද නා හිමි, පස්වරු 12.15 – 12.45 දක්වා සෙත් පිරිත් දේශනය, 2.15 – 3.15 දක්වා ධර්ම දේශනය 3.30 – 4.30 දක්වා දම්සක් පැවැතුම් සූත්‍ර දේශනාව තලල්ලේ සිරිධම්මදේව හිමි, 4.30 – 5.30 දක්වා ධර්ම දේශනය 6.00 ට සිල් පවාරණය රාත්‍රී 6.45 – 7.45 දක්වා ගිලන්පස පූජාව හා අටවිසි බුද්ධ පූජාව.

## කොබවක ශ්‍රී සුමනාරාම විහාරය

කොබවක ශ්‍රී සුමනාරාම මහා විහාරාධිපති දෙල්මැල්ලේ ශ්‍රී සුමනරතන හිමියන්ගේ අනුශාසනා පරිදි මේ මස 03 වෙනි පෝය ද වස් ආරාධනා පින්කම හා තවත් පින්කම් රැසක් කොබවක ශ්‍රී සුමනාරාම මහා විහාරස්ථානයේ දී පැවැත්වේ.

පෙරවරු 8.30 ට ධර්ම දේශනාව හොරණ ශ්‍රී පූර්වාරාම මහා විහාරාධිපති ශාස්ත්‍රපති පණ්ඩිත උඩුගල්මොටේ සිරිවිමල හිමි, 10.00 ට සදහම් වන්දනාව හා දහවල් සම්බුද්ධ පූජාව හොරණ ශ්‍රී අනුලාරාමවාසී, ආදළුවේ සුබෝධනී මෙහෙණින් වහන්සේ 2.30 ට උපදේශන වැඩසටහන පරගොඩ කිතුලගොඩ කනිෂ්ට විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති පේමරතන ගමගේ මහතා සවස 4.00 ට වස් ආරාධනා පින්කම කොබවක පදිංචි ඒ.ටී. ගාමිණී මහතා ප්‍රධාන පවුලේ පිරිස විසිනි. රාත්‍රී 7.00 ට ගිලන්පස බුද්ධ පූජා, බෝධි පූජා පින්කමකි.

## පොත් පුවත්



### සඳ කිඳුරයි සඳ කිඳුරියි

(සඳ කිඳුරු ජාතකය)




**කර්තෘ – දමයන්ති ජයකොඩි**
**ප්‍රකාශකයෝ – දයාවංශ ජයකොඩි සහ සමාගම**

දමයන්ති ජයකොඩි කතුවරිය ලියූ අලුත්ම බෞද්ධ ග්‍රන්ථය "සඳ කිඳුරයි සඳ කිඳුරියි" (සඳ කිඳුරු ජාතකය) ග්‍රන්ථය මේ මස 11 වනද කොළඹ 10, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවතේ දයාවංශ ජයකොඩි සහ සමාගමේ පොත් ප්‍රදර්ශනාගාරයේ දී නිකුත් කෙරේ.

අප ගෞතම බෝධිසත්වයන් වහන්සේගේ එක් භවයක විස්තර කෙරෙන සඳ කිඳුරු ජාතකයට දරු දැරියන්ට මෙන්ම වැඩිහිටියන්ට ද රස විඳිය හැකි සුන්දර කතා වස්තුවකි. ළමා මනසට කතාවේ රසවත් බව වටහා දීමට ජාතකයේ පින්තූර ද යොද ඇත.

### විදු ඇස් පාදන බුදු රැස්




**කර්තෘ – චාමික මුණසිංහ**
**ප්‍රකාශකයෝ – සාහිත පොත් පියස**

චාමික මුණසිංහ කතුවරයාගේ නවතම කෘතිය "විදු ඇස් පාදන බුදු රැස්" (තුන්කල් දැක්ම) ග්‍රන්ථය පසුගියද එළිදැක්විණ.

සාහිත්‍ය පොත් පියස මගින් ප්‍රකාශයට පත්කරන ලද එම ග්‍රන්ථයෙන් උදම් රළ, වසංගත හා මෘංග සංඥ, ලෝක විනාශය හා ලෝකෝත්පතිතිය, දියසෙන් බලය, සහස්සී ලෝකවාසීන් සප්ත සූරියෝද්ගමනය ඇතුළු විවිධ ව්‍යසන සහ අනාවැකි සටහන් යනාදී මාතෘකා තිස්හයක් පාඨකයාට රුචිපරිදි විස්තර කිරීමට කතුවරයා උත්සාහ කර තිබේ.

## ජයග්‍රාහී ප්‍රහේලිකාව

බුදුසරණ
ත්‍යාග අනුග්‍රහය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

| | | | | | |
|---|---|---|---|---|---|
| ■ | 1 නි | 2 කා | ය | ■ | 3 රා |
| ■ | ■ | ළු | ■ | 4 දේ | ව |
| 5 මී | ග | දා | ය | ■ | ණා |
| ලි | ■ | යි | ■ | 6 යි | ■ |
| න් | ■ | ■ | 7 කා | ලා | 8 ම |
| 9 ද | ඹු | ල් | ල | ■ | ස |

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය ත්‍යාග අනුග්‍රහයෙන් පළවන ප්‍රහේලිකා අංක 13 හි ජයග්‍රාහිකාව වූයේ **හබරාදූව හරුමල්ගොඩ, කහටගහවත්ත, නො. 60 හි ජී. එච්. කරුණාවතී මහත්මිය යි.**




බුදු සරණ

THE BUDDHIST TV

# පාලි පාඩම

39 - කොටස



සැකසුම
කොටනෙලුවේ පුඤ්ඤානන්ද හිමි


## නාළිකෙර තරු - පොල් ගස

1. අග්ගිජාලන = ගිනිදැල්වීම
2. අපරිණත = නොමේරූ
3. උදක = ජලය
4. කප්පරුක්ඛන = කල්ප වෘක්ෂය
5. ඛන්ධ = කඳ
6. ගුළ = හකුරු
7. ඝනීකත්වා = ඝනකොට
8. ඡදන = පියස්ස/වහල
9. ඡාදෙන්ති = වසත්, සෙවිලි කරත්
10. ඡින්දිත්වා = කපා
11. දාරුසාරු = ලීයේ අරටුව
12. පක්ඛිපති = දමයි
13. පරිණත = මේරූ
14. පුප්ඵකොස = කොළපුව
15. පුප්පවණ්ට = මල් නැට්ට
16. ඵාණිත = පැණි
17. මධුර = මිහිරි
18. මිඤ්ජා = මදය
19. යොජේති = යොදයි, යොදවයි
20. වණ්ට = නැට්ට
21. වායෙත්වා = වියා
22. ව්‍යඤ්ජන = ව්‍යංජනය
23. සණ්හෙත්වා = හීන් කොට
24. සදිස = සමාන වූ
25. සමුද්දාසන්න = මුහුදට ළං වූ
26. සාර = සාරය, යුෂය
27. සම්පාදෙති = සම්පාදනය කරයි
28. සුක්ඛ = වියළි

ලංකායං සමුද්දාසන්න - පදෙසෙසු බහවො නාළිකෙර තරවො සන්ති. නාළිකෙරො ලාංකිකානං කප්පරුක්ඛ සදිසො. තස්සපණ්ණානි වායෙත්වා ගෙහානි ඡාදෙන්ති.
අපරිණතානං ඵලානං මධුරං උදකං පිවිත්වා මිඤ්ජං ඛාදන්ති. පරිණත ඵලානං මිඤ්ජං සණ්හෙත්වා ඛීරං ගහෙත්වා ව්‍යඤ්ජනෙසු පක්ඛිපන්ති. පුප්ඵානං සාරං ගහෙත්වා සුරං සම්පාදෙන්ති. තමෙව සාරං පචිත්වා ඵාණිතං ලභන්ති. ඵාණිතං ඝනීකත්වා ගුළං සම්පාවදෙන්ති.
තරුනො ඛන්ධං ඡින්දිත්වා දාරුසාරං ගහෙත්වා ගෙහඡදනාදීනි කරොන්ති. සුක්ඛානි පුප්ඵකොස - වණ්ටානි පණ්ණානි ච අග්ගිජාලනාය යොජේන්ති.

**මෙම පාඩම මෙම සතියේ සිකුරාදා සහ ඉරිදා රාත්‍රී 8.45ට බෞද්ධයා රූපවාහිනියෙන් ද (The BuddhistTV) සඳුදා සවස 3.30ට බෞද්ධයා ගුවන් විදුලියෙන් ද විකාශනය වේ. ඔබට පසුගිය වැඩසටහන් සියල්ල අන්තර් ජාලයෙන් ද නැරඹිය හැකි ය. ඒ සඳහා පිවිසෙන්න. Magadhi (මාගධී) හෝ Kotaneluwe thero (කොටනෙලුවේ හිමි) යනුවෙන් සොයන්න.**

## දුටුගැමුණු රජතුමා -02



# රජු කළ පවට මුහුදු ගොඩ ගැලයි

**නිර්දෝෂී කැලණිතිස්ස රහත් තෙරණුවෝ උණු තෙල් කටාරමෙහිලා මෘතදේහය මුහුදට විසි කිරීමට අණ කිරීම පිළිබඳ රජතුමා බොහෝ පසුතැවීමට පත්විය. තමන් විසින් කරගන්නා ලද ආනන්තරිය පාප කර්මයේ විපාක සුළුපටු නොවන බව වටහාගත් රජතුමා ඉමහත් කම්පාවට පත්විය. හදිසි කෝපය නිසා තමන් විසින් කළ වරද පවසා භික්ෂූන් වහන්සේලාගෙන් සමාව අයැද සිටියේය.**

මුහුද ප්‍රචණ්ඩ වී ඇතැයි ද, එම නිසා මුහුද ගොඩ ගැලීමේ ලකුණු පහළ වී ඇතැයි රාජ පුරුෂයෝ රජතුමාට දැනුම් දුන්හ. එය ඇසූ රජු ගේ සිතට සැකයක් මතුවිය. තද කුණාටුවක් හෝ සුළි සුළඟක් නැතිව මුහුද රළු වෙන්නේ කෙසේද? තද වැස්සක් නැතිව ගං වතුරක් ඇතිවෙන්නේ කෙසේද?

මුළු නගරයම වසාගෙන පැතිරී යන අඳුර දුටු රජතුමා ගේ සිතට බියක් දැනිණි. තිස්ස රහත් තෙරණුවෝ නිරපරාදේ ඝාතනය කොට මුහුදට විසි කිරීමෙන් දෙවිවරු කෝපයට පත් වී මුළු රටත්, තමන්වත් විනාශයට පත් කිරීමට සූදානම් වන්නේ දැයි සැකයක් රජතුමාට ඇතිවිය.

රට තුළ හමාගිය දැඩි සුළං තත්ත්වය හේතුවෙන් ජනයා සන්නිපාත ශාලාවට එක් රැස්වී සිටියහ. දැඩි සුළඟේ පීඩනය දරාගත නොහැකි ව ඇතැම් පිරිස් බිම දිගාවී ගෙන මර ලතෝනි දෙමින් ජීවිතය බේරා ගැනීමට නිරර්ථක උත්සාහයක නිරත වූහ. කාන්තාවන් පිරිසක් තමන් හැඳ සිටි ඇඳුමෙන්ම තම දරු මල්ලන් වඩාගෙන තමාටත් වඩා තම දරු මල්ලන්ගේ ජීවිත රැක ගැනීමට දැඩි උත්සාහයක යෙදුණහ. මේ සියලු සිදුවීම් දැක බියට පත්ව සිටි රජතුමා මාලිගයට රැස්ව සිටි පුරෝහිත බමුණන්, ඇමැතිවරු ප්‍රමුඛ රාජ සභාවෙන් අදහස් විචාළේ ය. රැස්ව සිටි පිරිස අතරින් ඉදිරියට පැමිණි මණිනාග සිටුතුමා මෙය ලංකා ඉතිහාසය තුළ කිසි දිනක සිදු නොවූ සිදුවීමක් බව පැවසුවේ ඉමහත් සිත් තැවුලෙනි. ගෙවල් දොරවල් යට කරමින් මුහුද ගොඩට ගලාවිත් තිබුණේ ය. එහි ප්‍රභලත්වය කෙතරම් ද යත් වරායේ නැංගුරම් ලා තිබූ චීන හා ග්‍රීක නැව් දෙකක් මුහුදු බත්වී තිබිණි. මුහුදු රකුසා මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් ගිලගෙන තිබුණේ ය. මේ නිසා පවුල් දහස් ගණනක් අනාථ විය. නිවාස දහස් ගණනක් විනාශ විය. ජීවිත බේරාගත් පිරිස ගෙවල් දොරවල් අතහැර හැඳිවත පිටින්ම පලායමින් සිටියහ. මෙම කුණාටුව නතර වන සේයාවක්වත් පෙනෙන්නට නොමැති බව ප්‍රකාශ කර සිටියේ ය.

එද මුහුද ගොඩ ගැලීම මහා ව්‍යසනයක් වූවයි සිතන්නට තුඩු දෙන්නේ, අප ජීවිත කාලය තුළ සිදුවූ සුනාමි ව්‍යසනය සිහියට නැඟීම නිසා ය. 2004 දෙසැම්බර් 6 වැනිද මුහුද ගොඩ ගලා ලංකාව ඇතුළු ආසියාතික රටවල් ගණනාවක ලක්ෂ සංඛ්‍යාත ජීවිත හා දේපළ විනාශයට ලක්වන තෙක් කිසිවෙක් කැලණිතිස්ස රජු දවස මහුද ගොඩ ගැලීම විශ්වාස නොකළහ.

රජතුමා ඉතාමත් වේදනාවෙන් යුතුව කල්පනා කරන්නේ තමා කළ අපරාධයට තමාට දඬුවම් නොදී මුළු රටම විනාශ කිරීමේ තේරුම කුමක්ද කියා ය. සිදුවන විපත දරාගත නොහැකි වූ රජතුමා මෙම විනාශයෙන් රට බේරා ගැනීමට තමාට කළ හැකි යම් දෙයක් ඇද්දැයි පුරෝහිත බමුණන්ගෙන් හා ඇමැති මණ්ඩලයෙන් විමසා සිටියේ ය.

**අයන්ති විතාන**

## පූජා නගරයේ පින්බර ආශ්‍රමය

# ශ්‍රී අංගීරස යෝගාශ්‍රමය

**බොදු අභිමානයක මං සලකුණු ගොඩනැගෙන ඓතිහාසික රජරට රාජධානියේ අනුරාධපුර පූජා නගරය කේන්ද්‍ර කොට ගනිමින් මෙම පූජා භූමිය ඉදි කොට තිබේ. එක් පසෙක ද්‍රෝණයක් ධාතූන් වහන්සේලා වැඩ සිටින ස්වර්ණමාලී සෑ රජුන් වහන්සේ ද අනෙක් පස ජය ශ්‍රී විජය ශ්‍රී මහා බෝ සමිඳුන් ද , දකුණු අකු ධාතූන්වහන්සේ වැඩ සිටින ථූපාරාම සෑ රජුන් වහන්සේ ගේ ආනුභාවය ද, පැතිරෙන සීමා මායිමේ පුණ්‍යවන්ත වූ ඉහළ කරඹෑව ශ්‍රී අංගීරස යෝගාශ්‍රමය, හුදකලා වන පරිසරයක ඉදි කොට තිබේ.**



භාවනානුයෝගීන් සඳහා සුදුසු පරිසරයක් ලෙස නිස්කලංක පුණ්‍ය භූමියක් වන මෙහි එක් පසෙකින් දක්නට ඇත්තේ ඉහළ කරඹෑව වැවත්, ඊට යාබද ඇති කුඹුරු යායත් ය.ශ්‍රී මහා බෝධීන් වහන්සේ ගේ ආනුභාවය ලද භාස්කම් සහිත ශාඛා බෝධීන් වහන්සේ නමක මෙම පුණ්‍ය භූමියේ වඩා හිඳුවා ඇත.සිව් දෙසින් ඇසෙන පිරිත් හඬ මධ්‍යයේ,රාත්‍රියේදී රුවන්වැලි මහා සෑය,මිහින්තලා පුදබිම ,අභයගිරිය ඉතාමත් අලංකාර ලෙස මම පුන්‍යභූමියට දැක ගත හැකි දසුන් ය. සුන්දර පරිසරයක පිහිටි මෙම පුණ්‍ය භමියෙහි , කුටි සෙනසුන් ,භාවනා ශාලාව,ධාතු මන්දිරය,ධර්ම ශාලාව ඉදිකොට ඇති අතර මොණරුන්,වලි කුකුළ න් මෙන්ම, ආදී සිව්පාවුන් නිතර දක්නට ලැබෙන දසුනකි. අද පුර පසොළොස්වක පොහෝ දින සර්වඥධාතූන් වහන්සේලා තැන් පත් කරන ධාතු මන්දිරය හා නිම කරන ලද භාවනා ශාලාව සසුන ට පූජා කිරීම සිදු කෙරෙන අතර ඒ සඳහා චමින්ද බණ්ඩාරනායක,ගයානී බණ්ඩාරනායක මහත්මිය සහ දියණියන් දෙපළ ඇතුළු පවුලේ සියලුදෙනාත්



මිලිනා කුමාරි මහත්මිය ඇතුළු පවුලේ සියලුදෙනා

චිත්‍රා මංගලිකා මහත්මිය ඇතුළු පවුලේ සියලුදෙනා

සනත් බණ්ඩාර ඇතුළු සියලුදෙනාගේත් ,සමස්ත ලංකා දහම් සුවද පදනමේ දායකත්වයෙන් මෙම පුණ්‍යකර්මය සිදු කරන බව ශ්‍රී අංගීරස යෝගාශ්‍රමයේ විහාරාධිපති මහව කල්‍යාණඥාණ හිමියෝ පවසති.

**වසන්ත ජයසිංහ**






## පිරිවෙනටත් බුදුසරණ

අප රටේ පුරාතන සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය වූ පිරිවෙන මුල්කරගෙන එහි සුවිශේෂී අනන්‍යතාව මේ යැයි විදහා දක්වමින් දිගහැරෙන "පිරිවෙන" පිටුව සතිපතා බුදුසරණ පුවත්පත තුළින් ඉදිරිපත් කෙරෙයි. ඒ අනුව ලංකාවේ 829 ක්වූ පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු පුවත් හා පිරිවෙන් අධ්‍යාපනය හා අදාළ සුවිශේෂී ලිපි සඳහා මෙම පිටුව වෙන් කෙරෙන අතර සියලු ලිපි, තොරතුරු හා ඡායාරූප සඳහා මෙම පිටුව වෙන් කෙරේ.

**පිරිවෙන්වලට අදාළ පුවත්, ඡායාරූප සහ ලිපි අප වෙත යොමු කරන්න.**
budusarana@lakehouse.lk
**බුදුසරණ කර්තෘ මණ්ඩලය , ලේක්හවුස්, කොළඹ**



ජාතික පිරිවෙන් උපදේශක
ශාස්ත්‍රපති
**දෙඩම්පහළ**
**ශ්‍රී රාහුල හිමි**

# සිව්පසයෙහි තෙවැදෑරුම් සතුට

සිව්පසය, භික්ෂූන් වහන්සේ නමකගේ පැවැත්ම පිණිස අත්‍යවශ්‍යම කරුණකි. ඒ සිව්පසය ලබන භික්ෂූන් වහන්සේ තුන් ආකාරයකින් සතුටු විය යුතු ය. පළමුවැන්න යථාලාභ සන්තෝෂය යි. ඒ කියන්නේ සිව් පසය ලැබුණු පරිදි සතුටු වීම යි. සිව්පසය නොලැබුණා යැ'යි දුක් වන්නේ ද නැතිව, නීරසව ලැබුණා යැ'යි වෙනසක් ද නැතිව ඒ, ඒ ආකාරයට ලැබෙන සිව් පසයෙන් සතුටු වීමට පුරුදු වීම ය. දෙවැන්න යථාබල සන්තෝෂය යි. එනම්, තමන්ට ලැබුණු සිව්පසය රෝගයකට බෙහෙතක් දීමෙන් පහසුව ලැබෙන පරිද්දෙන් ඒ, ඒ ප්‍රත්‍ය පිළිබඳ ව, තමන්ට ලැබෙන දනාදී දේ පිළිබඳව සතුටු වීම ය. රස පිණිස නොවේ. අසීමිත ව කුස පුරවා ගැනීමට ද නොවේ. කුසගිනි, ක්ලාන්ත, කැරකිලි ආදිය දුරු කරගෙන මේ නිවන් මඟ පූර්ණය කර ගැනීමේ අරමුණ ඇතිකර ගැනීම ය.

තෙවැන්න සාරුප්ප සන්තුට්ඨී යයි. එයින් අදහස් වන්නේ තමන්ගේ තත්ත්වයට ගැළපෙන පරිදි සිව්පසයෙහි හුරු වීම යි. තමන්ට ලැබෙන චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස කියන මේ සිව් කරුණු සමහරු විශාල වශයෙන් බලාපොරොත්තු වෙති. කොපමණ දුන්නත් මදි ස්වභාවයක් ඇත. එසේ නොවී තමන්ට ගැළපෙන ලෙස සිව්පසය පිළිබඳ ව සතුටු විය යුතු ය. මහණ දම් පුරන භික්ෂූන් වහන්සේ මේ සිව් පසයට සුදුස්සෙක් වන්නේ තමන් වහන්සේ හරියට ශ්‍රමණ දම් පුරනවානම් පමණි. එසේ නැතිනම් ශ්‍රමණයන් වහන්සේ මැද (සංඝයා වහන්සේ මැද) වෙස් අරගෙන සිටින ශ්‍රමණ වේශධාරියෙක් බවට පත්වීම යි. එමනිසා ලොකු හාමුදුරුවෝ, පොඩි හාමුදුරුවෝ යැ'යි වෙනසක් නැතිව සිව් පසය පිළිබඳ මේ තුන් ආකාර සතුට භුක්ති විඳිය යුතු ය.

# පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීමට
# මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ සහයෝගය

**ශ්‍රී ලාංකේය සම්භාව්‍යය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය පිරිවෙන් අධ්‍යාපනයයි. ශාසන භාරධාරී තෙරුන් වහන්සේලා මෙන් ම රජුන් තැනූ කේන්ද්‍රීය අධ්‍යාපනය පන්සල මුල් කොටගත් අධ්‍යාපනය පිරිවෙන් අධ්‍යාපනයයි. ආසියාකරයේ සංවර්ධනය වෙමින් පවතින රටවල පමණක් නොව බටහිර ධනවත් රටවල වුව ද සංකීර්ණ ස්වරූපයේ අධ්‍යාපනික ප්‍රශ්න පාසල තුළින් ම විසඳිය නොහැකි බැව් අතීත අත්දැකීම් විසින් පෙන්වා දී ඇත.**



පිරිවෙන් අධ්‍යාපනයේ හුදකලා බව, උදාසීනතාව හෝ සීමිත අධ්‍යාපන රටාව ආධ්‍යාත්මික ගුණ වගාවෙන් තොරව ධනයෙන් හා සංඛ්‍යාවෙන් මහත් ව වැඩෙන ටියුටරි අධ්‍යාපන ක්‍රමය පෝෂණය කිරීමෙහි ලා බලගතු හේතුවක් විය හැකි ය. ගිහි පැවිදි පෞරුෂ සංවර්ධනය කෙරෙහි හෝ සදාචාරාත්මක දියුණුව කෙරෙහි ටියුටරි අධ්‍යාපනයෙන් ප්‍රමාණවත් සේවයක් වන බැව් පිළිගත හැකි නොවේ. මෙවැනි ප්‍රතිවිරෝධී බලවේගයන්ට සාර්ථකව මුහුණ දීමට නම් පිරිවෙන් අධ්‍යාපනය ද ජාතික අධ්‍යාපන ක්‍රමය තුළට ජයග්‍රාහී ලෙස ප්‍රවිශ්ට වී අනභිබවනීය තත්ත්වයක් එය තුළ ප්‍රතිෂ්ඨාපනය කර ගත යුතුව පවතී. එය කළ හැකි වනුයේ පටු ක්ෂේත්‍රයකට පමණක් සීමා වී පවතින අධ්‍යාපන ක්‍රමය භික්ෂු චර්යා ධර්මවලට මෙන් ම රටෙහි සංවර්ධන අවශ්‍යතාවලට ද ගැලපෙන පරිදි විවිධාංගීකරණයක් තුළිනි. නිකරුණේ විනාශ වෙමින් පවතින වටිනා මානව හෝ භෞතික සම්පත් මැනැවින් අනාවරණය කර ගැනීමට තරම් අවබෝධ ඥනයක් හා විවේක බුද්ධියක් ප්‍රතිපත්ති සම්පාදකයන්ට අවශ්‍යයෙන් ම තිබිය යුතු ය. සිංහල රජ දවසේ සිට පොදු ජනතාවගේ හදවතට හා බුද්ධියට වඩාත් සමීපව තිබූ පන්සල හා පිරිවෙන මෙරට ජනතාව නිවැරදි මාර්ගයකට අවතීර්ණ කරනු ලැබූයේ අධ්‍යාපනය තුළිණි. වැවයි දාගැබයි සංකල්පය තුළ ආර්ථික හා ආගමික සුසංගතතාව මත පැරැණි ගැමි සමාජය පිරිවෙන් අධ්‍යාපනය විසින් යථායෝග්‍ය ලෙස මෙහෙයවන ලදි.තත් ස්වරූපයන්ට අනුගත වෙමින් වර්තමාන රජය පිරිවෙන් අධ්‍යාපනයේ උන්නතිය උදෙසා ගනු ලැබ ඇති පියවර රැසකි. ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වත්මන් ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගේ සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වත්මන් අග්‍රාමාත්‍ය අතිගරු මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ පූර්ණ අනුග්‍රහය සහ මඟ පෙන්වීම මත පිරිවෙන් අධ්‍යාපන උපදේශක දෙඩම්පහළ සිරි රාහුල හිමිපාණන් වහන්සේගේ උපදේශකත්වයෙන් සහ වත්මන් පිරිවෙන් අධ්‍යක්ෂ වටිනාපහ සෝමානන්ද හිමිපාණන් වහන්සේගේ නියාමනයෙන් මේ වන විට පළාත් මට්ටමෙන් ගරු ආණ්ඩුකාර තුමන්ලා සහ පළාත් ප්‍රධාන ලේකම්වරු , පළාත් අධ්‍යාපන ලේකම්වරු මෙන් ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු ඇතුළු අධ්‍යාපන බලධාරීන්ගේ සහයෝගය ඇතිව පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව මධ්‍යම පළාතේ එවැනි සුවිශේෂී සාකච්ඡාවක් පසුගිය දා එනම් 2020/07/17 වනදින මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී, මධ්‍යම පළාත්

ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ ගමගේ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සහ ගරු මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් නන්දන ගලබොඩ මැතිතුමන් මෙන් ම මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ඒ.ජී.ටී.කේ ඒකනායක මැතිතුමන් මධ්‍යම පළාත් සංස්කෘතික අධ්‍යක්ෂතුමිය ඇතුළු මධ්‍යම පළාතේ සියලුම කලාප අධ්‍යක්ෂ තුමන්ලා සහ තුමියන්ලා මෙන් ම අධ්‍යාපන බලධාරීන් සහභාගී වූහ.

ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවයේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝ සභික මහෝපාධ්‍යාය, විශ්‍රාමලත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ( පිරිවෙන් ) පූජ්‍යපාද හේනේපොල නන්ද සිරි අභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශවයේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝ සභික නියෝජ්‍ය ලේඛකාධිකාරී මහා විහාර පිරිවෙන්පති ජනාධිපති උපදේශක පූජ්‍යපාද නාරම්පනාවේ ආනන්ද අභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුළුව අධ්‍යාපන අමාත්‍යංශයේ පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ හිමිපාණන් වහන්සේ ප්‍රධාන අධ්‍යාපන අමාත්‍යංශයේ නිලධාරී ස්වාමීන් වහන්සේලා මෙම අවස්ථාවට වැඩම කළහ.එහි දී පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේ සහ සහකාර අධ්‍යක්ෂ කන්තලේ විජිතවංශ ස්වාමීන් වහන්සේ විසින් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ වර්තමාන තත්වය සහ පළාත් අධ්‍යාපන අමාත්‍යංශයෙන් පිරිවෙන් පද්ධතියට දැක්විය යුතු සහයෝගය පිළිබඳ කරුණු දැනුම්වත් කළ අතර පළාත් අධ්‍යාපන ලේකම් තුමන් සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තුමන් මෙන් ම සංස්කෘතික අධ්‍යක්ෂ තුමිය ඇතුළු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මහත්ම මහත්මීන් කරුණු රැසක් ඉදිරිපත් කරන ලදී.

මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ ගමගේ මැතිතුමන් කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටියේ 2021 වසරේ සිට වාර්ෂික පිරිවෙන් අධ්‍යාපන සැලසුම් වෙනුවෙන් මධ්‍යම පළාත් සභා ප්‍රතිපාදන මඟින් මිලියන 30ක ප්‍රතිපාදන මුදලක් ලබාදීමටත් මධ්‍යම පළාත් පිරිවෙන් සම්පත් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යැමට අවශ්‍ය සුදුසු ස්ථානයක් ලබාදීමටත් පියවර ගන්නා බවයි. එසේ ම පිරිවෙන් පද්ධතියේ උන්නතිය වෙනුවෙන් ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක් ම ගන්නා බව ද ප්‍රකාශ කරන ලදී.

**කොටනෙළුවේ පුඤ්ඤනන්ද හිමි**
**ඌරුගමුවේ අස්සජී හිමි**

බුදුසරණ

# මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ ඉතිහාසය



**ශ්‍රී දළදා වහන්සේ ආරක්ෂා කර ගැනීමට හා උන්වහන්සේට වැඳුම් පිදුම් පැවැත්වීමට සැදැහැවතුන් ගෙන ඇති උත්සාහය දළදා ඉතිහාසය තුළ සටහන් වී ඇත. දහනව වැනි සියවසේ විසූ ඉංග්‍රීසි ජාතික වෛද්‍යවරයෙකු වූ ජෝන් ඩේවි විසින් රචිත 'ලංකාවේ අභ්‍යන්තරය එහි ජනතාව හා දිවයිනේ චාරිකා පිළිබඳ විස්තරයක්' නැමැති ග්‍රන්ථයේ දළදා මාළිගාව වූ කලී රාජ්‍ය පිළිබඳ පූජනීය ස්ථානයයි.**




පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ ඉතිහාසය අධ්‍යයනාංශයේ

**මහාචාර්ය එන්. ඒ. විමලසේන**


බුදුරජාණන් වහන්සේගේ වාම දන්ත ධාතූන් වහන්සේ මෙහි ඇති හෙයින් රටේ ඇති අති උත්තම පූජනීය ස්ථානය මෙයයි. මුළු දිවයිනම දළදා වහන්සේට පූජා කොට තිබේ. "ලෝකයේ පවත්නා අනර්ඝතම වස්තුව මෙය යැයි යහපත් බෞද්ධයෝ කල්පනා කරති." යනුවෙන් දක්වා තිබීමෙන් දළදා වහන්සේ අති පූජනීය වස්තුවක් බවට පත් වී තිබුණ බවට ගම්‍යමාන වේ.

මහනුවර දළදා මාලිගාව ස්ථාපිත කිරීමට ප්‍රථමයෙන් අනුරාධපුරය, පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොල සහ කෝට්ටේ යන අග නගරවල දළදා මාලිගා පිහිටා තිබූ බවට සාහිත්‍ය මූලාශ්‍ර සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් සනාථ වේ. මහාවංසයේ සහ එළුදළදා වංසයේ සඳහන් විස්තර අනුව මහනුවර රාජධානියේ ප්‍රථමයෙන්ම දළදා මන්දිරයක් ඉදිකරනු ලැබුවේ

පළමුවැනි විමලධර්මසූරිය (ක්‍රි.ව. 1592-160) රජතුමා විසිනි. සිය රජ මැඳුර ආසන්නයේ ඉදිකළ මෙම මන්දිරය දෙමහල් විය. නැවත එය ඔහු විසින්ම තෙමහල් මන්දිරයක් බවට පත් කළ බවට එළුදළදා වංසයේ සඳහන් වෙයි. සෙනරත් රජතුමාගෙන් අනතුරුව රාජ්‍යයට පත් දෙවැනි රාජසිංහ රජු සතුරන් මැඩ රට සාමයෙහි පිහිටුවා පැරණි දළදා මැඳුර පිහිටි තැන දෙමහල් දළදා ගෙයක් කරවී ය. අවුරුදු 31ක් පමණ වූ සුළු කාල පරිච්ඡේදයක් ඇතුළත නැවත දළදා මාලිගාවක් ඉදි කිරීමට සිදුවුණේ පෘතුගීසි ආක්‍රමණයන්ගේ ප්‍රතිඵල වශයෙන් ඇති වූ විනාශය නිසා විය හැකි බව මහාචාර්ය කුඹුරුගමුවේ වජිර හිමියෝ විශ්වාස කරති. මින් අනතුරුව දෙවැනි විමලධර්මසූරිය රජු ද දළදා මන්දිරයක් ඉදිකරවූ බව මහාවංසයේ සඳහන් වේ. එය මනෝඥ වූ කර්මාන්තයන්ගෙන් බබළන අලංකාර තෙමහල් මන්දිරයක් ලෙස හඳුන්වා ඇත. 18 වැනි සියවසේ මුල් භාගය වනවිට මේ මන්දිරය මුළුමනින් ම වාගේ දිරාපත් වී ගෙන යන තත්ත්වයකට පත් වී තිබිණි. මේ නිසා වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු එම තෙමහල් මන්දිරය දෙමහල් කොට තැනවීය. ඉන් පසුව බලයට පත් විජය රාජසිංහ රජු දළදා පූජා කටයුතුවල යෙදුණු අතර දළදා මැඳුර විචිත්‍ර වස්ත්‍රයෙන් අලංකාර කරවී ය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ද දළදා මැඳුර සකසා අලංකාර කරවීය. ශ්‍රී රාජාධිරාජසිංහ රජු ද පෙර රජුන් මෙන්ම දළදා පූජා කටයුතු කඩ නොකළ අතර සිංහලයේ අන්තිම රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දළදා මැඳුරට නවාංගයක් එක් කරමින් පත්තිරිප්පුව ඉදි කරවීය. මහනුවර දළදා මන්දිරය පිළිබඳ ව මහාවංසයේ හා එළුදළදාවංසයේ සඳහන් මෙම ඓතිහාසික විස්තර අනුව දැනට පවත්නා දළදා මැඳුර ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු දවස ඉදි කළ මන්දිරය ලෙස සඳහන් කළ හැකි ය.

දළදා මන්දිරය ඉදිකර ඇත්තේ නගරයට නැගෙනහිර පසින් වූ රාජකීය ගොඩනැගිලිවලින් සමන්විත උස් භූමියක ය. දැනට මේ භූමි භාගයට නැගෙනහිර පසින් වූ උඩවත්ත කැළය, දකුණු පසින් බෝගම්බර වැව ද, උතුරු පසින් පැරණි රාජ මාලිගාව ද, බස්නාහිර පසින් නාථ දේවාලය ද පිහිටා තිබේ. මෙලෙස දළදා මාලිගය මූලික කොට ඒ වටා බිහි වූ කලා නිර්මාණ විවිධත්වයක් ගනී. විශේෂයෙන් ලාංකේය ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර කලාව, මූර්ති කලාව, කැටයම් කලාව සහ වෙනත් සෙසු සුළු කලා නිර්මාණ රාශියක් මේ ඔස්සේ වැඩි දියුණු වූ බව පෙනේ. බෞද්ධාගමික සංකල්පීය පසුබිමක් තුළ ඒ සියලූ දෑ වර්ධනය විය. මෙසේ බිහි වූ නිර්මාණ අතර දළදා මාලිගාවේ ප්‍රවේශය, සඳකඩ පහණ, වාහල්කඩ, ඇත් රූ කැටයම් යුගල, ප්‍රධාන දොරටුව අභියස පිහිටි ආලින්දය, කිඹිහි මුහුණක් සහ මකර තොරණකින් සමන්විත ශෛලමය උළුවස්ස, හේවිසි මණ්ඩපය, පල්ලේමාලය, පත්තිරිප්පුව, දළදා මාලිගාවේ අභ්‍යන්තර ස්තූපය, දළදා මාලිගය, දළදා මාලිගයේ පහළ මාලයේ ගල් උළුවස්ස, ගන්ධ කුටිය සහ සිතුවම් කලාව සඳහන් කළ හැකි ය. මෙහිදී පත්තිරිප්පුව දළදා මාලිගයේ වාස්තු විද්‍යාත්මක සෞන්දර්යය හොඳින් ධ්වනිත වන ගෘහ නිර්මාණයක් ලෙස සැලකිය හැකි ය. වර්තමානයේ මහනුවර දළදා මාලිගයේ සංකේතයක් වශයෙන් ද මෙය භාවිතයට ගැනෙනු දැකිය හැකි ය.

පත්තිරිප්පුව දළදා මාලිගයට පසුකාලීන ව එක් කළ කොටසක් බව මීට ඉහතදී සඳහන් කර ඇත. අටපට්ටම් හැඩැති පත්තිරිප්පුව ද්විත්ව පාදමක් මත ගොඩනැගුවකි. එහි මුල්ම පාදම දිය අගලට යට වී ඇති අතර, දිය අගලින් මතුවී පෙනෙන කොටස ආයතාකාර බොරදමකින් හා අධෝවෘත්ත පද්මයක ආකාරයෙන් ද, ඍජු මුහුණතකින් හා උද්ධෘත පද්මයක කොටසකින් ද සමන්විත වේ. ඊළඟ කොටස එකිනෙකට ඉහළින් පිහිටි බොරදම් තීර තුනකින් ද, අධෝවෘත්ත පද්මයෙන් ද, කෙළින් මුහුණතින් ද, කුමුදු බොරදමින් ද, උද්ධෘත පද්මයෙන් ද කෙළවර වේ. ඒ මත බිත්තියක් මෙන් ඍජුව නැඟී යන කොටසකි. එහි සරල බව නැති කිරීමට සමාන්තර ව්‍යාජ ස්ථම්භ පිහිටුවා ඇත. මෙහි අටපට්ටම් පාදමේ එක් පැත්තක හරි මැද කීර්ති මුඛයක් සහිත මකර තොරණක් නිරූපණය වේ. එය සකස් කර ඇත්තේ ඇතුළට පිවිසිය හැකි ව්‍යාජ දොරටුවක ආකාරයකට ය. ඉන්පසු බිත්තිය ඉහළට නැගීයයි. එය සරල ය. එහෙත් හරස් අතට විහිදී යන කුමුදු බොරදම් නිසා චාම් බව නැති වේ. මෙය අටපට්ටම් හැඩැති ගෘහයක් වන බැවින් ඒ සඳහා පිවිසීමට දොරටු අටක් ඇත. අටපට්ටම් හැඩැති සුවිසල් කුලුනු අටක් මත වහල රඳා පවතී. මෙම කුලුනු මුල සහ අග එක ලෙස සකස් කළ ද්විත්ව කුලුන හිස්වලින් සමන්විත ය. මේ කුලුනුවල පහත කොටස නයිපෙනවලින් ද, ඉහළ කොටස බෝපත් කාගුල් යන චිත්‍ර මෝස්තර රටාවන්ගෙන් ද අලංකෘත වී තිබේ. මෙහි වහළ කෙළවර වන්නේ කැණීමඩලෙනි පියස්ස සඳහා භාවිත කළ පරාල ද රිද්මයානුකූල රටාවන්ට අනුව කැටයම් කර තිබෙනු දැකිය හැකි ය. පත්තිරිප්පුව මහල් දෙකකින් සමන්විත අතර, පහත මාලයට පිවිසීම සඳහා දොරටු තුනක් දක්නට ලැබේ. එය දෙපසින් දොරටු දෙකක් සහ ඇතුළතින් පහතට බැසීමට ලී තරප්පුවක් වශයෙනි. පත්තිරිප්පුවට පිවිසීමට මාර්ග දෙකක් ඇත. එකක් පල්ලේ මාලයේ ඉදිරිපස ආලින්දයෙන් පිවිසිය හැකි අතරම අනික වන්නේ ශෛලමය මකර රුව සහිත ප්‍රධාන දොරටුවට දකුණු පසින් පිහිටි දොරටුවයි.

වර්තමානය වනවිට පත්තිරිප්පුව දළදා මාලිගයේ පුස්තකාලය ලෙසට භාවිත වන අතර එහි වටිනා පුස්කොළ පොත් සහ අවශේෂ කෘතීන් ගණනාවක් තැන්පත් කොට ඇත. ආනන්ද කුමාරස්වාමි සඳහන් කරන ආකාරයට පත්තිරිප්පුව භාවිත කර ඇත්තේ රජතුමාට සහ බිසෝවරුන්ට දළදා පෙරහර නැරඹීමට ය. ඒ අනුව දළදා මාලිගයේ ඓතිහාසික ප්‍රවෘත්තිය ඉදිරිපත් කළ හැකි අතර මෙම දළදා මාලිගයට පැමිණෙන ශ්‍රද්ධාවන්තයින්ට විරල වස්තුවක් මෙන්ම ඒ වෙනුවෙන් සිදු කෙරෙන විරල ගණයේ වත්පිළිවෙත් සහිත ජීවමාන ඉදිරිපත් කිරීමක් මෙන්ම ජීවිතයේ අතිශයින්ම සංවේදී අත්දැකීමක් ද වන්නේ ය.


වර්ෂ 2020ක් වූ අගෝස්තු 03 සඳුද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.